# සුදු වැද්දා

ආර්. එල්. ස්පිට්ල් විසිනි

අනුවාදක: ජයවීර විජයපාල



චිත්‍ර: රැල්ෆ් ටොම්සන්

ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
ග්‍රන්ථ ප්‍රකාශකයෝ
41 ඇල්ස්ටන් පෙදෙස කොළඹ 2

# පටුන


| | | පිටු |
|---|---|---|
| | කර්තෘ ගෙන් | x |
| | අනුවාදක ගෙන් ... ... | xii |
| 1. | ඇතා ගේ පෙළහර ... ... | 1 |
| 2. | වන යහළුවෝ ... ... | 11 |
| 3. | සුදු ගෝනා ... ... | 21 |
| 4. | වෙද හාමුදුරුවෝ ... ... | 30 |
| 5. | කපිතාන්වරු දෙදෙනා ... | 41 |
| 6. | අනාවැකිය ... ... | 45 |
| 7. | රන් සුරය ... ... | 55 |
| 8. | බකුසු හුව ... ... | 60 |
| 9. | රාජ උදහස ... ... | 72 |
| 10. | දඬුවම ... ... | 84 |
| 11. | දුර්ග තරණය ... ... | 95 |
| 12. | වන රජදහන ... ... | 105 |
| 13. | වැද්ද සහ කුමරිය ... ... | 115 |
| 14. | උලමා හැඬීම ... ... | 130 |
| 15. | ඇත ගමේ කම්මල ... ... | 143 |
| 16. | වැදි ලෙණ හැර යාම ... ... | 150 |
| 17. | නියහලා අලය ... ... | 160 |
| 18. | වන කෙළවර ... ... | 167 |


Scanned with CamScanner

# චිත්‍ර


ඇතා හැන්ස් ඔසවාගෙන මහ නගරය ද ඉක්මවා ඉදිරියට ගමන් කරන්නට විය ... ... ... 8

හබක අසලට පැමිණි කොටියා, ඒ නුපුරුදු වස්තුව දෙස සැකයෙන් මෙන් බලන්නට විය ... ... 19

සුදු ගෝනා හැන්ස් පිට තබාගෙන විල් තෙර තැනි තලාව ඔස්සේ දික් පිම්මේ දුවන්නට විය ... ... 24

"චෝ! චෝ! චෝ! චි හෙච්චා! චි කෙරියා! පලයව් අහකට!"යි රනි යටි ගිරියෙන් කෑ ගසමින් වලසුන්ට පහර දෙන්නට වූවාය ... ... ... ... 31

මිදුලෙහි සිටගෙන හුන් රොඩී ගැහැනිය වෙත එඩ්මන්ට් සිය අත දිගු කෙළේය ... ... ... 51

නුගේ සිටි නාගයාට හැන්ස් සිය අත්ලෙන් වතුර පෙවුවේය 64

රජු වළල්ල දෙස නෙත් හෙළේ එක වරකි... ... 88

ලේනාත් තලගොයාත් මේ ගස් බෙනය අසලට අවුත්... 110

දිනක් සෙල්ලා කිසියම් සලකුණක් පිරික්සීමට බිමට නැඹුරු වූයේය ... ... ... ... 126

බල්ලා පසු පස ගමන් කළ ඔවුනට බිම වැටී සිටි තරුණියක් දක්නට ලැබිණි ... ... ... 161

# කර්තෘ ගෙන්

මෙම කතාව මනස්කල්පිත එකක් වුව ද එය ගොතා ඇත්තේ සත්‍ය කරුණු පසුබිම් කර ගෙනය.

සිංහලේ රජු පිළිබඳවත් ඔහුගේ රාජ සභාව හා මාලිගය පිළිබඳවත් මෙහි දැක්වෙන කරුණු, වර්ෂ 1696 දී පළකරන ලද රොබට් නොක්ස් ගේ An Historical Relation of Ceylon නමැති ග්‍රන්ථයෙන් උපුටාගත් ඒවාය. රොබට් නොක්ස් ලංකාවට පැමිණෙන විට හේ දහනව හැවිරිදි නැවියෙකි. ඔහු සේවය කළ නැවේ මහ කුඹ ගස අබලන් වී තිබුණු හෙයින් ඒ සඳහා ගසක් කපා ගැනීමට ඔවුන්ගේ නැව ලංකාවේ නැගෙනහිර වෙරළෙහි පිහිටි එක්තරා බොක්කක නැංගුරම්ලෑවාය. නොක්ස් ගේ පියා මෙම නැවේ කපිතන්වරයා විය. ගොඩ බට පියා සහ පුතා සිංහලේ රජු ගේ රාජ පුරුෂයන් විසින් කන්ද උඩරට රාජධානියට අල්ලා ගෙනයනු ලැබුවෝය. කන්ද උඩරට රාජධානිය මහා ගිරි සිඛරයන් ගෙන් හා මහ වනයෙන් වටවී තිබුණි. මේ ගිරි සිඛරයන් හා මහ වනය හරහා කිසිවකුට රාජධානියෙන් ගැළවී පලා යාමට නොහැක. සියලුම යුරෝපීය ජාතීන්ට අයත් වූවෝ රජු ගේ සිරකරුවන් වශයෙන් සිටියහ. රජු විසින් ගම් නියම් ගම්වල පදිංචි කරනු ලැබූ මොවුහු සුළු සුළු රැකියාවල් කොට ජීවත් වූහ. මොවුන් ගෙන් බොහෝ දෙනෙක්ම ස්වකීය ජීවිතාන්තය දක්වා එසේ ජීවත් වූහ.

එහෙත් රොබට් නොක්ස් දහනව වසක් පමණ රජු ගේ සිරකරුවකු වශයෙන් ගමක ජීවත් වී සිය මිතුරකුත් සමග පලා ගියේය. ඔවුහු එවකට වෙරළ බඩ පිහිටි ලන්දේසීන්ට අයත් අරිප්පු නම් ස්ථානයට පැමිණියෝය. අවසානයේ ලන්දේසීන් ගේ උපකාරයෙන් නොක්ස් ආපසු එංගලන්තයට ගියේය. ඔහු එංගලන්තයට පැමිණ නොබෝ කලකින් ම ඔහුගේ සම්භාවනීය ඉතිහාස කෘතිය රචනය කොට පළ කළේය. එවකට ලංකාවේ ජීවත් වූ මිනිසුන් ගැනත් එහි ස්වාභාවික සෞන්දර්යය ගැනත් සත්‍ය තොරතුරු මෙම පොත්වලින් අපට කියවිය හැක. නාලිනී කුමරිය පිළිබඳව මෙම පොතෙහි එන සිද්ධිය පාරම්පරික සිංහල ජන කතාවල ඇති රත්න වල්ලි කතාව ඇසුරෙන් ගොතන ලද්දකි.

මෙහි එන ඕලන්ද සහ පෘතුගීසි ජාතික කපිතාන්වරු දෙදෙනාද ඓතිහාසික චරිත දෙකකි. එඩ්මන්ට් වැන් ස්ටියර්වෙල්ට් සිංහලේ

Scanned with CamScanner

රජු ගේ සිරකරුවකු වශයෙන් සිටිය බවක් ලන්දේසි රාජ්‍ය ලේඛනවල සඳහන් වේ. එමෙන්ම ගැස්පා පිගේරා, සුප්‍රසිද්ධ පෘතුගීසි යුද්ධ නිලධාරියෙකි. කොළඹ අල්ලා ගැනීම සඳහා ලන්දේසීන් පෘතුගීසීන්ට විරුද්ධව යුද වැදුණු විට හත් මසක්ම පෘතුගීසීහු බලවත් සටනක් කළහ. ගැස්පා පිගේරා මේ හත් මස තුළ ලන්දේසීන්ට විරුද්ධව නිර්භීත සටනක යෙදුණේය. එහෙත් පෘතුගීසීන්ට යටත් වීමට සිදු විය. කොළඹ කොටුව ලන්දේසීන් විසින් අල්ලා ගනු ලැබූ වේලෙහි කොටුව තුළ පහර කා ඉතිරිව සිටියේ ගැස්පා ඇතුළු සිය දෙනකු පමණි. කොටුව තුළ හුන් භට පිරිස් සුනු විසුනු වී ඇතැයි සිතූ ලන්දේසීහු ගැස්පා ඇතුළු පිරිස කොටුවෙන් එළියට පිවිසෙනු දැක විස්මයට පත් වූහ.

මෙහි ඇතුළත් වැද්දන් හා මහ වනය පිළිබඳ විස්තර ලේඛකයා ගේ පෞද්ගලික අත්දැකීමෙන්ම ලබා ගන්නා ලද ඒවාය. කතාවේ විස්තර වන සමහර සිද්ධීන් ද එසේමය.

මේ අනුව මෙම කතාව බොහෝ සෙයින් සත්‍ය කරුණු වටා ගෙතුණු කෘතියක් බැවින් එය හුදු මනස්කල්පිත එකකට වාඩා වැදගත් වනු නොඅනුමානය.

ආර්. එල්. ස්පිට්ල්

වර්ෂ 1957 ජූලි.
කොළඹ

# අනුවාදක ගෙන්

ලංකාවේ වනගත ජීවිතය අලලා ලියැවුණු නවකතා සිංහල සාහිත්‍යයෙහි ඇත්තේම නැතැයි කිව යුතුය. මෑත දී පරිවර්තනය කරන ලද කෘතීන් දෙක තුනක් හැරෙන්නට සිංහල ලේඛකයකු අතින් ලියැවුණු එවැනි නවකතා මෙතෙක් බිහි නොවීම කනගාටුවට කරුණකි. ජෝන් ස්ටිල්, ලෙනඩ් වුල්ෆ්, ආර්. එල්. ස්පිට්ල් වැනි අයට Jungle Tide, Village in the Jungle, Savage Sanctuary, Vanished Trails ආදී උසස් සාහිත්‍ය කෘතීන් බිහි කිරීමට ශක්තියක් ඇති වූයේ නම් මේ රටේම හැදුණු වැඩුණු සිංහල ලේඛකයන්ට එවැන්නක් කිරීමට නොහැකි මන්දැයි සිතා බැලිය යුත්තකි.

මෙතෙක් බිහි වී ඇති සිංහල නවකතා බොහොමයක්ම එකම මාදිලියකින් ලියැවී ඇති බව කිව යුතු නොවේ. ලෝකයේ සෙසු පාඨකයන් මෙන් සිංහල පාඨකයෝ ද විවිධ මාදිලි ඔස්සේ ලියැවුණු නවකතා, කෙටි කතා වැනි සාහිත්‍ය කෘතීන් කියවීමට ආශා ඇත්තෝ වෙති. වෙසෙසින් මෙවැනි වන කතා ප්‍රිය කරන පාඨක පිරිස ඉතා විශාලය. හැමදම එකම විදියේ සාහිත්‍ය කෘතීන් කියවීමෙන් පාඨක රුචිය හීන වේ. ඉන් සාහිත්‍යයේ ද දියුණුවක් නැත. අප පාඨකයන් තුළ භින්න රුචිකත්වයක් ඇති කිරීමට නම් මෙ වැනි කෘතීන් පමණක් නොව සමුද්‍ර ජීවිතය, සංග්‍රාම ජීවිතය ආදී විවිධාකාර ජීවිතයන් ඔස්සේ කතා නිපදවීමට සිංහල ලේඛකයා මහන්සි ගත යුතුය.

මා මේ පොත පරිවර්තනය කිරීමට තෝරා ගත්තේ හුදෙක් එහි ඇති රසවත්කම නිසාම නොව, යන්තමින් හෝ ඉහත කී කරුණුවලට සිංහල ලේඛකයන් ගේත් පාඨකයන් ගේත් සිත් සතන් යොමුකරවීමේ අටියෙනි. මෙහි එන කථා ශරීරය මෙතෙක් සිංහල පාඨකයාට මුණ නොගැසුණු විදියේ රසවත් එකකි. වැදි ජීවිතය වඩ වඩාත් පාඨකයා ගේ මනසට ළං කිරීමේ අදහසින් මෙහි සමහර තැන්වල ඇතුළත් කොට තිබෙන වැදි වදන් මා විසින්ම සොයා ගෙන බහාලන ලද ඒවා ය. මේ වදන් වහරන අයුරු හැදෑරීමේ දී පාකර් මහතා ගේ Ancient Ceylon නමැති කෘතිය උපකාරී විය. මෙහි මුල් කෘතියේ ගැබ්වී ඇති රස උගුලුවා ගැනීමේදී, වේයන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ ආචාර්‍ය ඇස්. ස්ටිවන් සේරම් මහතා ගෙන් ලැබුණු අනුපම සහාය

නොවන්නට, මෙ වැනි කෘතියක් සිංහල පාඨකයන් හමුවේ තබන්නට මා අපොහොසත් වන්නට තිබුණි. මෙහි සැකසිය යුතු තැන් බොහොමයක් සකසා නොයෙක් උපදෙස් දීමෙන් මට කළ උපකාරය වෙනුවෙන් ඒ මහතාට මගේ මහත් භක්තාදර ස්තුතිය පිරිනැමෙමි.

මේ පොත ප්‍රකාශයට පත් කිරීම සඳහා භාරගත් ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමයේ ග්‍රන්ථ ප්‍රකාශක අංශයට ද මගේ ස්තුතිය පිරිනැමෙමි.

ජයවීර විජයපාල

වේයන්ගොඩ, දඩගමුවේ
'ජයගිරිහි' දිය.
1962 ජනවාරි

## මේ පොතෙහි

| | |
|---|---|
| හැන්ස් | හැන්ස් වැන් ද මීර් නමැති ඕලන්ද ජාතික තරුණයෙක් |
| දිකුද් | හැන්ස් ගේ මිත්‍රයකු වන ඇතෙක් |
| රන්දුනා | හැන්ස් එකතු වූ වැදි පවුලේ නායකයා |
| පෙමා | රන්දුනා ගේ පුතා |
| රනි | රන්දුනා ගේ දියණිය |
| සුදු ගෝනා | හැන්ස් ගේ මිත්‍රයකු වන ගෝනෙක් |
| බිම්බි | වැදිරියක් |
| ටිකී | මුගටියෙක් |
| දියා | අඳුන් දිවි දෙනක් |
| වෙද හාමුදුරුවෝ | ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේ නමක් |
| ගැස්පා පිගේරා | පෘතුගීසි කපිතාන්වරයා |
| එඩ්මන්ට් වැන් ස්ටියර්වෙල්ට් | ඕලන්ද කපිතාන්වරයා |
| නොක්ස් | රොබට් නොක්ස් |
| සිමන් ද බස්ටෝ | ලන්දේසීන්ට විරුද්ධව සටන් කරද්දී මියගිය පෘතුගීසි හේවායෙක් |
| ඩේමියන් පියතුමා | කතෝලික පූජකවරයෙක්, ගැස්පා ගේ හිතවතෙක් |
| අලුතලාව | රාජ සභාවේ තරුණ නිලමේ කෙනෙක්, කපිතාන්වරුන් ගේ මිත්‍රයෙක් |
| ගවරාන් | දකුණු ඉන්දියාවේ දමිළ පඬිවරයෙක් |
| සාමත් | කපිතාන්වරුන් ගේ මැලේ ජාතික ආවතේවකයෙක් |
| නාලිනී | රජතුමා ගේ ලේලිය |
| රජතුමා | කන්ද උඩ රජ්ජුරුවෝ (2 වැනි රාජසිංහ රජ, 1635–1687) |
| සෙල්ලා | රජ වාසලට මස් සපයන වැද්ද |
| නීල | නාලිනී ගේ මස්සිනා |

හමු වෙත්

Scanned with CamScanner

# 1

## ඇතා ගේ පෙළහර

එක් මැදියම් රැයක ලක්දිව මහවන මැද ඇතෙක් ද කොලුවෙක් ද එක්ව නිදා ගත්හ. මුළු දවසින්ම ඇතකු නිදා ගන්නේ ඉතා ටික වේලාවකි. එද, රැහැයියකු පවා නොහඬන නිහඬ පාලු මැදියම් රැයේය.

ගත වූ දින කොලුවාටත් ඇතාටත් වැඩ බහුල මහත් වෙහෙස ගෙන දුන් දවසක් විය. දවසින් වැඩි හරියක් ඔවුන් ගත කළේ බිහිසුණු ගිරි සිඛරයන් පසු කොට කන්ද උඩරට සිට පහළ මහ වනයට බැසීමෙනි. මිනිසකුට පවා අමාරුවෙන් වුවද පහළට බැසිය නොහැකි භයානක ප්‍රපාතයන් ගෙන් මේ හස්තියා පහළට බැස්සේය. ඇතැම් තන්හි ඌ පස්සා ගාත්හි දණ නමා ගැටිවලට තද කරගෙන ටික ටික පහළට ලිස්සුවේය.

කොලුවා ගේ ගමන ඇතා ගේ අඩි පාර ඔස්සේ විය. මේ ඇතාත් කොලුවාත් අතර ඇත්තේ සුළුපටු සම්බන්ධයක් නොවේ. භයානක මරණයකට ගොදුරු වන්නට සිටි කොලුවා මේ හස්තියා විසින් බේරා ගන්නා ලද්දේ මීට පැ කිහිපයකට පෙරය.

දුඹුල් සුදු පැහැති සිරුරින් ද තඹවන් හිස කෙසින් ද යුතු, එළඹ සිටි යොවුන් වියෙහි වූ කොලුවා කොටි සමකින් සැරසී වනදේවතාවකු මෙන් ඇතා සමග දින ගණනක් ම මහ වනයේ සැරිසැරුවේය. දවසේ ඉර මුදුන් වේලෙහි දිකුද් නමැති මේ ඇතා මහ ගස් සෙවණකට වී උගේ විශාල කන් සලමින් මැස්සන් ගෙන් බේරීමට වලිගය ද ඒ මේ අත ගසමින් කල් ගෙවයි. මේ අතර හැන්ස් නමැති මේ සුදු කොලුවා කෑම සොයමින් කැලෑ වදී. අල වර්ග, මීවද හා තලගොයින් වැනි සතුන් ඔහුගේ ආහාර විය. ලොකු සතුන් දඩයම් කිරීමට ඔහුට ශක්තිමත් තියුණු ආයුධ නොතිබුණි.

සවස දෙකට පමණ දිකුද් වෙත පැමිණෙන හැන්ස්, රාත්‍රියේ කරන සංචාරයට සූදානම් වීමක් වශයෙන් ගසක් යටට වී හොඳට නිදගනී. දිකුද් අහර ගන්නේ රාත්‍රි කාලයටය. ඒ ගසින් මේ ගසින්

Scanned with CamScanner

ස්වකීය හොඬින් ළපටි කොළඅතු කඩමින්, ඒවා නිවිහිල්ලේ කට තුළට දමා වික විකා දිකුද් ඉදිරියට යයි. හැන්ස් ද ඇතා සමග ගමන් කරයි. හැන්ස් විඩාවට පත් වී සිටිනු දකින ඇතා උගේ හොඬින් ඔහු ඔසවා පිට උඩ තබා ගනී. හැන්ස් නිදි කිරමින් පිට උඩට වී සිටී. මැදියම් රැයේ දී මොවුන් දෙදෙනා මහ වන මැද නින්දට වැටෙති. එහෙත් දිකුද් පැයකින් හෝ දෙකකින් අවදි වී යළිත් කොළඅතු කන්නට පටන් ගනී. හැන්ස් දිගටම නින්දේ පසුවෙයි.

අලුයම වලිකුකුළන් ගේ හැඬලීමෙන් අවදි වන හැන්ස් තම සගයා අසල නැති බව දකී. ඔහු, ඇතා විසින් අතු කඩා දමන ලද ගස්වල සලකුණු අනුව උෟ සොයා යයි. මේ අතර ඔහු ද සිය ආහාරයට සුදුසු යමක් සොයා ගනී. පැ කීපයක් ගමන් කිරීමෙන් පසු ඔහුට ඇතා හමුවෙයි. හැන්ස් හට ඇතා හමු නොවුව හොත් ඔහු හූ හඬ දෙයි. මහ වනය හරහා දෝංකාරය නංවමින් පැතිර යන ඒ හූ හඬට සවන් දෙන ඇතා ඊට පිළිතුරු වශයෙන් කුංචනාද කරයි. යම් විටෙක හැන්ස් ප්‍රමාද වුවහොත් පළමුකොට නාද කරන්නේ ඇතාය.

මිනිසා තද නින්දට වැටෙන මහ රෑ, දළු රිකිලි බුදිමෙහි ඉමක් නොදන්නා මේ දැවැන්ත සිවුපා රජුත් සමග සැතැපුම් දහයක් හෝ සමහර විට ඊටත් වැඩි ගණනක් මහ වනයේ ගමන් කිරීම, වනචාරී කොල්ලකුට වුවද ලෙහෙසි පහසු කාරියක් නොවේ.

දිනක් හැන්ස් ඇතා පිටින් යමින් සිටියේය. මෙසේ ගමන් ගත් ඔවුනට එක් මංසන්දියක් හමුවිය. හැන්ස් ඇතාට ඉදු මග හුදකලාව යන්නට හැර තමා අතු-පාරෙන් ගමන් කරන්නට පටන් ගත්තේය. වැඩි වේලාවක් යන්නට ප්‍රථම හේ විශාල ගල් කුළක් වෙත පැමිණියේය. අත්තක ආධාරයෙන් පැද්දී එහි නෙරා ගිය ගැටයක් මතට පැන ගත් හැන්ස් අබියස වූයේ ගල් ලෙණක දෙර වසා වැවුණු රැක් ගොමුවකි. හෙතෙම අතුවල එල්ලීගෙන ලෙණ දෙර රැක් ගොමුව මුලට පැන්නේය.

මහල්ලෙක් ද තරුණයෙක් ද තරුණ වියේ කෙල්ලන් දෙදෙනෙක් දැයි මිනිස් පවුලක් ලෙණ ඉදිරියේ වාඩි ගෙන සිටියහ. ඔවුන්ගේ සිරුරු අඳුන්වන් විය. හැන්ස් ගේ පතනයෙන් ඇතිවුණු ශබ්දයෙන් තැති ගැනුණු ඔවුහු වහා හුන් තැනින් නැගී සිට හැන්ස් දෙස විස්මයාකූලව බැලුවෝය. පත් වූ බියෙන්

එකට පොදි ගැසුණු ඔවුහු ගල් ලෙණෙහි දෙරටුව හරහා සිට ගෙන හැන්ස් දෙස බලා ගත් වනම හුන්හ.

''මොකද මේ? මෙපමණ කලක් නොරට ගොස් සිට ආ මේ මට කදිම පිළිගැනීමක් නෙ මේ ගොල්ලන්නෙ''යි හැන්ස් ඔවුන්ගෙ හැසිරීමෙන් විස්මයට පත් වී හඬ නැගුවේය.

එහෙත් ඔවුහු බිය පත් වූවන් මෙන් ඔහු දෙස බලා සිටින්නට වූහ. මඳ වේලාවකින් ඔවුන්ගේ බිය සහිත හැඟීම් තුළින් විස්-මයත් සැකයත් මුසු හැඟීම් නැගී එන්නට විය.

''රන්දූනා! ඇයි බයවෙලා වගේ? පෙමා! බොට කෙල්ලක් ලැබිල වගේ නේද?''යි හැන්ස් ඔවුන් තව තවත් පුදුමයට පත් කරමින් තෙපලේය. ''රනී! බොට මාව හඳුනන්ට බැරි ද?''යි ඔහු තවත් කෙල්ලක් දෙසට හැරී කෑගැසුවේය.

සියල්ලන්ගේ ම සැක දුරු වෙන්නට විය. ඔවුහු හැන්ස් වටා පොදි කමින් ඔහු අත පත ගාන්නට වූහ.

''අපේ හුදු හූරා නොවෙ ද මේ ඇවිල්ලා ඉන්නෙ!''යි ඔවුහු ප්‍රීතියෙන් හඬ නැගුවෝය.

මහලු රන්දූනා සහ ඔහුගේ පුත් තරුණ පෙමාත් ගීයක් ගයමින් ඔහු වටා නටන්නට වූහ.

මා මිනි මා මිනි මා දෙයියා
හුදම හූරා බලන්නෝ
මම දූවගෙන ආවේ මේ
තනන් තන්දිනා තනන් තදිනානේ

''මං හිතුවේ මේ හුදු හූරා ගේ අවතාරයක් වත් ද කියල''යි රන්දූනා කීවේය. ''හඳවල් කොච්චරකට ඉස්සර ද අපේ හුදු හූරා අපව දලා ගියේ!''

''අම්මේ අපි හිතුවෙ ඇච්චො මැරිල කියලයි''යි පෙමා කීවේය.

මේ අඳුන්වන් මිනිසුන් දෙස හැන්ස් මහත් ආදරයකින් බලා සිටියේය. තුන් වසක් හැන්ස් හට මොවුන්ගේ ගල් ලෙණ විනා අන් කිසිදු නිවහනක් නොවිය. මේ පුදුම මිනිසුන් විසින් හැන්ස් පුහුණු කරනු ලැබූ දඩ ශිල්පයෙන් හා වනයෙහි ඇවිද පලවැල ආදිය එකතු කිරීමෙන් ද ලබා ගත් ආහාරයක් හැරෙන්-නට අන් කිසිම දෙයක් ඔහුට ඒ තෙවස තුළ නො ලැබුණි. ඔවුන්

Scanned with CamScanner

විසින් ඔහුට දෙන ලද පුහුණුවෙන් ඔහු විසින්ම දඩයම් කරනු ලැබූ වන සතුන් ගේ සම් හැරෙන්නට අන් කිසිවක් ඔහුගේ ඇඳුම්වලට අයත් නොවිය. කොටින් කියතොත් ඔහු මේ වන චාරි මිනිසුන් ගේ ම එකකු මෙන් ජීවත් වූයේය. ඕලන්ද ජාතිකයකු වූ මේ කොලුවා පාසල් ජීවිතයෙන් හොරා පැන ගොස් නැවක සේවය කරද්දී, ලංකාවේ වෙරළට කිට්ටුව එම නැව අනතුරකට මුහුණ පා විනාශ විය. එහෙත් කොලුවා කෙසේ හෝ පීනා අවුත් වෙරළට වැදුණේය. ඔහු පුරා අවුරුද්දක් ම වන වැදි ඉබාගාතේ ඇවිද්දේය. ඔහු අත කිසිදු ආයුධයක් නොවිය. එහෙත් ඔහු සතුන් විසින් කනු ලැබූ ගෙඩි වර්ග තෝරා කමින් කිසියම් විදියකින් හෝ ජීවිතය රැක ගත්තේය.

දිනක් ඔහුට මහ වනයේ දී කනට පුරුදු යම් බඳු වූ ශබ්දයක් ඇසෙන්නට විය. එය මිනිසකු යමකින් යමකට තට්ටු කරන ශබ්දයක් විය. ඔහු ඊට සවන් දෙමින් ඒ දෙසට ගියේය. මෙහිදීය ඔහුට රනී මුණ ගැසුණේ. ඈ කිසියම් ගෙඩි වගයක් ගලක් උඩ තබා තලමින් ඒවා ඒ අසල පිහිටි දිය හෙබකට වීසි කරමින් සිටියාය. මෙම තැළුණු ගෙඩිවල විෂයෙන් මත් ව දියඹෙහි සිටි මාලුවෝ උඩට ආහ. රනී ගේ නෑදෑයන්ට බියෙන් හැන්ස් සැඟවෙන්නට තැත් කළ ද ඔහු ඔවුන් අතට හසු විය. ඔවුන් හැන්ස් මරන්නට තැත් කරද්දී, සිය පියා ගේ අත දරුණු ලෙස සපා කෑමෙන් රනී ඔහු මරණින් ගළවා ගත්තා ය.

මේ සිද්ධියෙන් හැන්ස් දරුණු ලෙස තුවාල ලැබීය. එසේ වුවත් මේ වනවාසී මිනිසුන් ගේ අනුකම්පාවට ලක් වූ ඔහු, කල් යෑමේ දී ඔවුන් සමග ඉතා කුලුපග විය. ඔවුහු ඔහුගේ තුවාල සුව වන තෙක් ඔහු හොඳින් රැක බලා ගත්හ. හැන්ස් මඳ කලෙකින් ඔවුන්ගේ ම එකකු මෙන් හැදුණේය, වැඩුණේය. කෝටු දෙකක් එකට මැදීමෙන් ගින්දර ලබා ගන්නා සැටි ඔවුහු හැන්ස් හට ඉගැන්වූහ. දුනු හී භාවිත කරන අයුරු ද හේ උගත්තේය. සැතපුම් ගණනකට ඈතින් පිහිටි කුඩා ගමක සිටි කම්මල්කරුවකු වෙත මුව මස් ගෙන ගොස් දී ඒ වෙනුවට ඊතල තනවා ගන්නා සැටි ද ඔවුහු ඔහුට කියා දුන්හ.

වැද්දෝ යන නාමයෙන් හඳුන්වනු ලබන මොවුහු ආදිම ශිලා යුගයේදී ඉන්දියාවේ සිට ලංකාවට ස්ථල මාර්ගයෙන් ම සංක්‍රමණය වූ ඕස්ත්‍රලොයිඩ්[1] නම් මනුෂ්‍ය වර්ගයට අයත් වූවෝය. දඩයමින් ජීවත් වූ මොවුහු මහ වනය තුළ පිහිටි ගල් ගුහාවල කණ්ඩායම් වශයෙන් වුසූහ. මෙම වැදි කණ්ඩායම්වලට ස්වාභාවික මායිම්වලින් වෙන් වූ දඩයම් තිබුණි. වැද්දන් සමග

1. Australoid

ජීවත් වෙමින් ආදි කල්පික ජීවන ක්‍රමයට ඇබ්බැහි වූ හැන්ස්, ඉතා ඉක්මනින් ඔවුන්ගේ භාෂාවත් 'විද්‍යාවනුත්' උගත්තේය. කුරුල්ලන් සහ වෙනත් වන සතුන් ගේ ඇසුරින් කෑමට සුදුසු පලතුරු වර්ග ඔහුට හඳුනා ගත හැකි විය. එහෙත් ඔහු තනිව වනයේ හැසිරෙද්දී කෑමට සුදුසු, වඩා හොඳ පලතුරු වර්ග ඔහු විසින්ම හඳුනා ගන්නා ලද්දේය. විෂ සහිත පලතුරු වර්ග සහ අල වර්ග ගැන ද ඔහු දැන ගත්තේය. හේ සතුන් ලුහු-බැඳීමෙහි දක්ෂයෙක් වූවා පමණක් නොව හොඳ දුනුවායෙක් ද විය. නැවියකු වශයෙන් කලක් සිටීමෙන් ඔහු තුළ ඇති වී තිබුණු නිර්භීතකම ඔහුට මේ වනගත ජීවිතයට පිටුබලයක් වූයේය. ඔහු මී කැඩීම සඳහා වැල්වල සහ අතුවල එල්ලී බිහිසුණු කඳු බෑවුම් හා කඳු විවරයන් තරණය කළේය.

වන සතුන් හීලෑ කිරීමේ පුදුම හැකියාවක් තමා තුළ ඇති බව වනයේ තනිවම හැසිරෙන කාලයේ දී හැන්ස්ට අවබෝධ විය. වැඳිරියක් ද අඳුන් දිවි පැටවෙක් ද සුදු ගෝනෙක් ද ඔහුගේ වන මිතුරන් අතර වූහ. කලක් ගත විය. හැන්ස්ට සිය පරණ වන මිතුරන් යළිත් දක්නා රිසියක් ඇතිවිය. දැතේ ඇඟිලි දෙවරක් පා තමා ආපසු එන්නේ දින කීයකින් දැයි වැඳි පවුලේ අයට දන්වා, හැන්ස් සිය වන මිතුරන් දක්නට පිටත්ව ගියේය. සති ගණන් මාස ගණන් ඉක්මී ගියේය. එහෙත් හැන්ස් ආපසු නාවේය.

''අපි හූරා හැම තැනම සෙව්වා. කොටින් කියනව නම් අපි කවදවත් ගියේ නැති රටවලටත් ගිහින් සෙව්වා'' යි වැද්දෝ කීහ.

''අර බලන්ඩ. අර ගහේ තියෙන කැපුම් පාරවල්. අපි ගණන් ගත්තා ගණන් ගත්තා ඒත් ඉවරයක් නෑ'' යි ලෙණ ඉදිරිපිට පිහිටි විශාල ගසක ලකුණු වගයක් පෙන්වමින් රනී කීවාය.

''අපි හිතුවා ඇව්වො කෙරියාට[1] වත් අහු වුණා ද කියල. ඒත් ඇව්වොට දුන්ගායි[2] මොරියන් කෙක්කයි[3] හුරු හින්ද අපි ඒක විස්වාස කළේ නෑ'' යි පෙමා කීවේය.

''අපි හිතුවා ඇව්වො අපව දලා ඇව්වොගෙ නෑදැයන් ළඟට යන්ට ඇති කියල'' යි රනී කීවාය. ''අනේ හූරට දැන් බඩගිනි ඇති. කතා කරන්ට ඉස්සර වෙලා මං මොකුත් හඳ ගෙන එන්නම්'' යි කී රනී ඔහුට කෑමට දෙයක් පිළියෙල කරන්නට වූවාය.

1. වලහා 2. දුන්න 3. ඊතලය

මද වේලාවකින් රන් වියලි මුව මස් කුට්ටි කිහිපයක් සහ පුලුස්සන ලද අල වගයක් කැන්ද කොළයක තබා ඔහු ඉදිරියෙන් තැබුවාය.

හැන්ස් ඇය වෙත කෘතඥ පූර්වක බැල්මක් හෙළිය. ''අපොයි! මේ සේරම මම කන්නම්, මං දවස් ගාණක් ගස්වල පොතු ඉතරක් කාලා ජීවත් වුණා.''

හැන්ස් කෑම කා අවසන් වූ විට ඔහුගේ ගමන ගැන විස්තර ඇසීමට වැද්දෝ ඔහු වටා බිම හිඳ ගත්හ. හැන්ස් සිය කතාව පටන් ගත්තේය. සියා කෙනකු රස කරමින් කියන අද්භූත කතාවක් අසා සිටින කුඩා ළමුන් මෙන් වැද්දෝ ඔවුන්ගේ කටවල් අයා ගෙන ඔහුගේ කතාවට සවන් දී සිටියෝය. ඇත්ත වශයෙන්ම එය අද්භූත කතාවක් බඳු විය.

''මං සුදු ගෝනා ඉන්න වනාතට ගිය වේලාවේ ඌ උගුලකට අහු වෙලා ඉන්නව මං දැක්කා. ඉතිං මං කරපු වැඩේ, රෑ බෝ වෙලා ගිහින් ඌව උගුලෙන් ගැළෙව්වා. එතකොටම දඩයක්-කාරයො වගයක් මා වෙතට දුවගෙන ආවා. ඔවුන් මාව අල්ලා ගත්තා. ඒත් ගෝනා බේරිලා කැලේට වැදුණා. ඒ මිනිස්සු මාව අල්ලා ගෙන කන්ද උඩරට රජ්ජුරුවන් ළඟට අරන් ගියා.''

මේ බව ඇසූ වැද්දෝ බියෙන් කෑගැසුවෝය. ඔවුන් අසා තිබෙන හැටියට කන්ද උඩරට ආශ්චර්යවත් රාජධානියේ සිටින සිංහලේ රජු දුර්දාන්ත දුෂ්ට යක්ෂයෙකි. එවැනි බිහිසුණු පුද්ගල-යකු ඉදිරියට හැන්ස් ගෙන යනු ලැබී යයි ඔවුන් ඉදිරියේ මේ කතා කරන හැන්ස් ගෙන්ම ඇසීම ඔවුනට අදහා ගත හැකි නොවන තරම් දෙයක් විය.

හැන්ස් සිය කතාව යළිත් පටන් ගත්තේය. ''රජ්ජුරුවො මගෙන් නොයෙක් විදියේ ප්‍රශ්න ඇසුවා. මුහුදු බත් වුණු නැවකින් බේරිලා ගොඩට ඇවිත් මම කැලේ ජීවත් වෙනවා කිව්වාම රජ්ජුරුවො පුදුම වුණා. එතරම් කාලයක් කැලේ ජීවත් වෙලත් මං තවත් ජීවතුන් අතර ඉඳීම ගැන රජ්ජුරුවො පුදුම වුණා. මට හිතෙන්නෙ රජ්ජුරුවො, මාව පුදුම සතෙක් හැටියට මාලිගාවේ තියා ගන්ට හිත හද ගත්තා. මාලිගාවේ හිටියා මගේම රටේ කෙනෙක්. එයා රජ්ජුරුවො හිරබාරයට ගත්තු යුද්ධ නිලධාරි-යෙක්. රජ්ජුරුවන් ගේ හමුදාව පුරුදු කරන්නයි, මාලිගාව මුර තියන්නයි තමයි ඔහුට නියම වැඩේ. එයා තමා මගේ කතාව සිංහලෙන් රජ්ජුරුවන්ට කියා දුන්නේ.

Scanned with CamScanner

''ඊට පස්සෙ බොහොම හොඳට මට සංගරහ ලැබුණා. මාලිගා මලුවෙ සිර කාමරයකයි මට ඉන්නට වුණේ. ඒ වුණාට හුඟක් නිදහස තිබුණා. අර ඕලන්දක්කාර නිලදරියාට තමා මාව බාර දීල තිබුණෙ. රජ්ජුරුවො යටතේ පෘතුගීසි යුද්ද නිලමේ කෙනකුත් හිටියා. එයා ඕලන්දක්කාරය ගෙ ගජ යාළුවා. එයත් නිතර ආවා මාව බලන්ට. අපි තුන් දෙනා බොහොම ඉක්මනට අඹ යාළුවො වුණා.

''රජ්ජුරුවො බොහොම ආසයි හොයාගන්ඩ අමාරු වන සතුන් ඇති කරන්ට. මාස ගාණක් ගියාට පස්සෙ දවසක් රජ්ජුරුවො මට අණ කළා දඩයක්කාරයනුත් එක්ක ගිහින් සුදු ගෝනාව අල්ල ගෙන එන්ට කියලා. නමුත් මං බෑ කිව්වා.

''රජ්ජුරුවො මට තර්ජනය කළා. මගේ යාළු එඩමන්ට්වයි ගැස්පාරුයි, ඒ කියන්නෙ අර යුද්ද නිලදරීන් දෙන්නා ගෙන්වලා මාව ඊට නම්මා ගන්ට බොහොම වීරිය කළා. නමුත් මං කොහොමද අප්පොච්චො ඒකට එකඟ වෙන්නෙ! ඇයි මං කැලේ තනියම ජීවත් වෙනකොට ඒ සුදු ගෝනා මගේ සහෝ-දරයෙක් වගේ නොව හිටියේ. ඉතින් එහෙව් කොට මං කොහොමද ඌට හතුරුකම් කරන්නෙ! මගෙ මුරණ්ඩු ගතිය ගැන රජ්ජුරුවන්ට බොහොම කේන්ති ගියා. මාව ඇතකු ලව්වා පාගලා මරා දමන්ට රජ්ජුරුවො අණ කළා.''

මෙය ඇසූ වැද්දෝ සංත්‍රාසයෙන් මුමුණන්නට වූහ. රනි දෑතින් ඇගේ මුහුණ වසා ගත්තාය.

''මගේ අත පය බැඳලා මාව වදක බිමේ දිගා කළා. මම උඩ බැලුවා. එතකොටම මට පෙනුණා දිග උල් යකඩ කොපු දැමූ දළ ඇතකු මා ළඟට එනවා. උගේ පිට උඩ මිනිහෙක් හිටියා. ඒ බිහිසුණු ඇතා මා සුනු විසුනු කරන බව දැනගත් මම ඇස් දෙක පියා ගෙන ඊට සූදනම් වුණා. ඒත් සිදුවුණේ මහ පුදුම දෙයක්!''

හැන්ස් සිය කතාව නවතා බලාගත් වනම බලා සිටියේය. ඔහුට ඒ සිද්ධිය යළි මැවී පෙනෙන්නට විය. හේ බියෙන් ඇලලී ගියේය. සිදු වූ ආශ්චර්යවත් දෙය ගැන ඔහු කල්පනා කරන්නට විය.

''ඇතා උගේ හොඬින් මාව ඉව කළා. ඌ ඇත් ගොව්වාට මෙල්ල වුණේ නැහැ. ඇත් ගොව්වා ඇතාට හෙණ්ඩුවෙන් ඇන්නා. ඒකට ඇතාට බොහොම කේන්ති ගියා. උගේ පිට උඩ හිටිය ඇත් ගොව්වාව හොඬින් ගත්තු ගමන්ම බිම දලා පාගලා

Scanned with CamScanner



ඇතා හැන්ස් ඔසවාගෙන මහ නගරය ද ඉක්මවා ඉදිරියට ගමන් කරන්නට විය

පොඩි පටටම් කළා. ඊට පස්සෙ සිදු වුණු දේ මගේ පණ තිබෙන තුරා අමතක වෙන්නෙ නැහැ.''

ස්වකීය හොඩින් හැන්ස් ඔසවා ගත් ඇතා, ඔහු රැගෙන, භීතියෙනුත් විස්මයෙනුත් ඇලලී, කුමකින් කුමක් සිදු වන්නට යන්නේ දැයි නොසැලී බලා හුන් මහා ජනකාය මැදින් අනභිභවනීය යෝධයකු සේ ගමන් කොට, මහ නගරය ද ඉක්මවා ඉදිරියට ගමන් කරන්නට වූයේය.

''කන්ද උඩරටට ඇතුළු වන ගිරි දුර්ගයන් ඔස්සේ ඌ මා පිට තබා ගෙන ඇවිත් අතර මඟ දිය ඇල්ලක් දැක දිය බොන්නට නතර වුණා. මං ඇතා පිටින් බැහලා සතා හොඳට පරීක්ෂා කළා. ඌව මීට ඉස්සර වෙලා දැකලා පුරුදු බවක් මට හැඟුණා. ඇතා උගේ පස්සා කකුල එස වූ විට මං දැක්කා උගේ පතුලෙ තිබුණු ලොකු තුවාල කැලලක්. බොලා මුණ ගැහෙන්ට බොහොම ඉස්සර මට හමු වූ ඇතෙක් ඌ. මට ඌ හමුවෙන කොට උගේ පතුලේ හීයක් ඇනී විශාල තුවාලයක් තිබුණා. ඌ ඒ තුවාලය නිසා මහා වේදනාවක් විඳිමිනු යි සිටියේ. කෑම නැතුව උගේ ඇට කටුත් පෑදිලා තිබුණා. ඌ දැකපු මට බොහොම දුක හිතුණා. ඉතින් මං උගේ පයේ ඇනී තිබුණු හීය ගළවලා කැලෑ කොළ වගයක් තුවාලයට බැන්ද. ඊට පස්සෙ ඇතා මා එක්ක යාළු වුණා. අපි කලක් කැලේ ඇවිදිමින් එක්ව ජීවත් වුණා. පස්සෙ අපි දෙන්නා වෙන් වුණා. යළිත් අපි දෙන්නා හමු වුණේ වදක බිමේදීයි.''

හැන්ස් සිය කතාව අවසන් කළ විට වැද්දෝ පුදුම වී බලා සිටියහ. මෙම කතාව ඔවුන්ගේ පුරාණ දේව කතාන්තරයක් මෙන් ඔවුනට හැඟුණි. හැන්ස් දෙවියකු මෙන් ඔවුනට දැනුණි.

''අනේ මං නං මීට පස්සෙ බොටුකඳාගේ[1] පයට නං විදින්නෙ නෑ'' යි රන්දුනා කීවේය.

කන්ද උඩරට රජ වාසල පිළිබඳ හැන්ස් කී පුදුම කතා අසමින් වැද්දෝ බොහෝ වේලාවක් ඔහු වටා ගත කළහ. රජ වාසල තිබුණු මහඟු වස්තු ගැනත් එහි ගම්භීරත්වය ගැනත් වරින් වර රජ වාසලෙහි පැවැත් වුණු අසිරිමත් උත්සව ගැනත් විස්මය ජනක ඇත් පෙළපාළි ගැනත් ඔහු වැද්දන්ට විස්තර කළේය. රජ වාසල ගැන හැන්ස් කී කතාවලින් රන්දුනාට සහ පෙමාට ඉතාමත් රසවත් වූයේ, රජ වාසලට මස් සැපයූ, දුනු ශිල්පයෙහි කෙළ පැමිණි සෙල්ලා නමැති වැද්ද අභිභවා, දුනු හරඹයකින් හැන්ස් ජය ගැනීම පිළිබඳ පුවතය.

1. ඇලියා

''ඒ අතින් අපේ හුදු හූරාට කිට්ටු කරන්ට කෙනෙක් නෑ'' යි රන්දුනා කීවේය.

''මහමැහි කෙළියට[1] කඳු බෑවුම්වලට බහින්ටත් ඒ වගේ මයි'' පෙමා කීවේය.

හැන්ස් හට වන ශිල්ප උගැන්වූවෝ වැද්දෝ වූහ. හැන්ස් ගේ වන ශිල්ප කුශලතාව වැද්දන් අභිභවා ගියේය. එහෙත් වැද්දන් ඔහු ගැන ආඩම්බර වූවා මිස ඊට ඊර්ෂ්‍යා කළේ නැත.

කතා බහ අවසන් කළ ඔවුහු නින්දට වන්හ. සමහරෙක් ලෙණ තුළත් සමහරෙක් එළිමහනෙහිත් මුව සම් හා කොළ අතු ආදිය අතුරා ගෙන නිදා ගත්හ. ලෙණ ඉදිරිපිට විශාල ගිනි මැලයක් විය. කණමැදිරියන් ගන අඳුරින් වැසී ගත් මහ වනයේ ඒ මේ අත පියාඹන අයුරු හැන්ස්ට පෙනුණි. රෑහැයියෝ රැව් දෙන්නට වූහ. එහෙත් නිසල වන මෝහනයෙන් ඔවුන් ගේ සිත් වැසී ගියේය. තමා ගෙදර අවුත් සිටින බව හැන්ස් ගේ සිතට වැටහුණි.

අලුයම අවදි වූ හැන්ස් හට රනි පෙර ද සවස ඈට වූ උගුලකට අසුවුණු සාවකු ඊතලයකින් හම ගසන සැටි දක්නට ලැබුණි. එදෙස බඩගින්නෙන් මෙන් බලා සිටින බල්ලන් වෙත රනි හාවා ගේ බොකු බඩවැල් ආදිය වීසි කළාය.

හාවා හම ගසන රනි දෙස හැන්ස් බලා සිටියේය. ඉකුත් ද රාත්‍රියෙහි ඇගේ මුහුණෙහි තිබූ ශෝකාකුල භාවය පහවී ගොස් තිබිණි. ඈය කෙරෙහි අමුතු එළියක් ඇති බැව් ඔහුට පෙනුණි. ඈය තුළ තමා කෙරෙහි යම් පමණ ආදරයක් ඇත්නම් එපමණ ම ආදරයක් ඈය කෙරෙහි තමා තුළ ද ඇති බව ඔහුට වැටහුණි.

පසු ද හැන්ස්, තමන් විසින් දඩයම් කරන ලද මුවකු ද දුන්නක් හා හී මිටියක් ද, වාඩි වී පොතු විටක් සපමින් හුන් රන්දුනා ගේ දෙපා ළඟ වැදි සිරිතට අනුව තබා රනි විවාහ කර දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේය. එතෙක් කිසිදු පියකු විසින් එ වැනි ප්‍රීතියකින් හා අභිමානයකින් යුතුව සිය දියණිය තරුණයකුට විවාහ කර දෙනු නොලද්දේ යයි කිව යුතුය.

---

1. බඹර කැඩීම

# 2

## වන යහළුවෝ

ඝන තුරු වදුලු අතරින් අරුණාලෝකය මහ වනය තුළට පෙරෙද්දී කුරුල්ලෝ උන් ගේ සුපුරුදු ගීත ගයන්නට වූහ.

වලිකිකිළියක් අකුලක් අස්සේ වියලි කොළ ඒ මේ අතට පහුරු ගා වැලි තලයක් පාද ගෙන ඒ මත පාත් වූවාය. මුවෙක් ද මුව දෙනක් ද අකුල් අතර වූ පිනි සහිත මකුළු දැල් බිඳ දමමින් සෙමින් සෙමින් රිංගා ගියෝය.

මඳ නිසලතාවක් පැතිරිණි. රූය මුවල්ලේම, අලින්, මීමුන්, මුවන් ආදි සතුන් විසින් පාදන ලද මහක් ඔස්සේ රනි ද හැන්ස් ද ඉදිරියට යමින් සිටියෝය. හැන්ස් ගේ එක් උරයක එල්ලා ගත් පොරොවකි. අත දුනුහීය. රනි අත කුඩා පොරොවක් සහ වියලි මුවමස් පොදියක් ද විය. දුර ගමනක් යන්නකු මෙන් හැන්ස් ගමන් කළේය.

''කොයිබද අපි මේ යන්නේ?'' යි රනි ඇසුවාය.

''අර සුදු ගෝනයි මගේ අනෙක් වන මිතුරනුයි ඉන්න විල් තෙරට'' යි හැන්ස් පිළිතුරු දුන්නේය.

දින ගණනක් මහ වනය හරහා ගමන් කිරිමෙන් පසු ඔවුන් දෙදෙනා විල් තෙර වෙත පැමිණියෝය. එය වෙනද තිබූ සැටියෙන්ම තිබුණි. ඕලු, නෙළුම්, මානෙල් හා පන් පඳුරු අතර මීහරක් ලැග සිටියෝය. විල්තෙර තැනි තලා බිමෙහි ලස්සන මුව රංචු ගැවසෙමින් සිටියෝය. වනයේ අන් තැනක දී හැන්ස් විසින් මුවන් විද මරණු ලැබුව ද මෙහි දී ඔහු ඒ ගැන සිතුවේවත් නැත. විල් තෙර ඔහුට අබය බිමක් බඳු විය. ඔහු විල අවට පැතිරුණු පිරිසිදු වාතය වේගයෙන් ආශ්වාස කළේය. එහි සුපුරුදු ගතියෙන් ඔහුගේ ගතත් සිතත් පිනා ගියේය. කලකට පෙර, හැන්ස් ද ඔහුගේ කුලුපග බිම්බි නමැති වැදිරිය ද පිපාසයෙනුත් බඩ සයිනුත් මිය යන්නට සිටිය දී දිකුද් විසින් ඔවුන් ගෙන එන ලද්දේ මෙතැනටය. දෙදෙනා විලෙන් දිය බී පණ රැක ගත්හ.

විල් තෙර ඇත කෙළවරෙහි විශාල තුරු වදුලකින් අඳුරු වූ තැනක ඇතකු සිට ගෙන සිටිනු හැන්ස් හට දක්නට ලැබිණි. ඔහු හඩක් නැගිය. ඇතා උගේ දවැන්ත හිස ඔවුන් දෙසට

Scanned with CamScanner

හැරවූයේය. කන් විදහා යෝධ ගමනින් ඌ ඔවුන් වෙත පිය නගා එන්නට පටන් ගති. රනී බියෙන් තැතිගෙන හැන්ස් ගේ අත වැරෙන් අල්ලා ගත්තාය. එහෙත් හැන්ස් ඇය අස්වසා ඒ විශාල සතා ඔවුන් වෙත ළඟා වන තෙක් බලා සිටියේය. ඔවුන් අසලට පැමිණි ඇතා හැන්ස් වෙළා ගෙන ආදර දක්වූයේය.

"මෙහෙ එන්න රනී. මේ මගේ ජීවිතය ගැළ වූ දිකුද්" යි කී හැන්ස් රනී ගේ බිය පහ කළේය.

රනී ඉව කළ ඇතා උගේ හොඬ ඇගේ බඳ වටා යවා ඇය ඉහළට ඔසවා ඒ මේ අත පද්දවා යළිත් බිම තැබුවේය. ඇතා විසින් රනී ඔසවනු ලැබූ විට, ඌ එද උගේ ඇත් ගොච්චාට කළ හදිය හැන්ස්ට සිහි විය. ඔහු බියෙන් තැති ගත්තේය.

"දැක්ක ද රනී, ඌ අපට කොච්චර ආදරේ ද! දැන් අපි දෙන්නම උගේ යාළුවෝ" යි ඇතා රනී බිම තබනු දැකීමෙන් මහත් සැනසිල්ලට පත් හැන්ස් සිනා සෙමින් කීවේය.

එය අනුමත කරන්නාක් මෙන් ඇතා යළිත් හැන්ස් වෙත හොඬ දිගු කළේය.

"ඌ අපව පිට උඩ නංවා ගෙන ඇවිදින්න යන්නයි ඔය කතා කරන්නෙ. එන්න, මං බොට උගේ පිට උඩට නගින්න උදව් කරන්නම්."

"අනේ, මට නම් බෑ" යි රනී බියෙන් කෑගැසුවාය.

"ඒකට කමක් නැහැ දිකුද්. අපි බෝත් එක්ක පයින් එන්නම්" යි කී හැන්ස් සිය අතක් උගේ හොඬ මත තබා ගෙන ඌත් සමග ගස් සෙවණකට ඇදුණේය. රනී ඔවුන් අනුගමනය කළාය. එහෙත් ඇගේ සිත්හි තිබූ චකිතය පහවී ගොස් නො තිබුණි.

"මොකද උගේ දළ බාගෙට කපලා?" යි රනී ඇසුවාය.

"රජ්ජුරුවන්ට අයිති ඔක්කොම ඇත්තුන් ගෙ දළ ඔය විදියට කපා දමනවා. එහෙම කපා දලා යකඩ කොපු සවිකරනවා" යි හැන්ස් ඇතා ගේ දළ අතගාමින් කීවේය.

රනී වෙව්ලා ගියාය. "අපොයි එද වෙන ඇතෙක් එහෙම ඇව්වො ළඟට ආව නම් ඇව්වොව ආයිත් අපට බලන්ට හම්බ වෙන්නෙ නැහැ" යි කී ඇ මඳ කුලුපග ගතියක් පෙන්වමින් ඇතා ළඟට කිට්ටු වූවාය.

එදින සවස් වන තෙක් ඔවුහු ඇතා සමග ගත කළහ. ඉක්බිති ඇතා විලට බැස එහි වැඩී තිබුණු උස් තණ වර්ග බුදින්නට

වූයේය. ඌ කැලෑ කොළ අතු බුදින්නට මහ වනයට වදින්නේ රාත්‍රී කාලයටය.

හැන්ස් තනිව මහ වනයේ සිටිද්දී බොහෝ විට රාත්‍රිය ගත කළ එක්තරා නුග ගසක් විය. ඔහු රනිත් කැටුව එය වෙත ගියේය. මේ නුග රුක ඔහුට ගෙයක් මෙන් විය. කුරුල්ලන් සහ වෙනත් වන සතුන් සමග හැන්ස් මෙහි ගත කළ දවස් බොහෝ විය. නුග රුකෙහි විශාල මුලක් යට තිබුණු බෙනයක හැන්ස් ගේ සුරතලකු වූ ටිකී නමැති මුගටියා වාසය කළේය. ඌ වෙන ද මෙන් හිස බෙනයෙන් පිටතට දමා බලා සිටියේය. හැන්ස් ගේ ඇමතීමෙන් ප්‍රීතියට පත් මුගටියා බෙනය තුළ හුන් උගේ බිරියත් දරු කැලත් පෙරළා ගෙන එළියට ආවේය. හැන්ස් ඌ අතට ගෙන උගේ ලොම් සහිත පිට පිරිමදිමින් ඌ හුරතල් කරන්නට විය. ටිකී හැන්ස්ට සිය ආදරය ඇහවීමට ''ටික්! ටික්! ටික්!'' යි හැඬුවේය.

''මේ පුංචි එකා දවසක් මේ ගහ යට දී මගේ පණ බේරුවා. ඔව්, දවැන්ත නාගයකු ගෙන් මූ මාව බේරා ගත්තා'' යි මුගටියා දෙසත් තමා දෙසත් පුදුමයෙන් බලා සිටි රනි අමතා හැන්ස් කීවේය.

මහ වනයෙහි විශාල පෙදෙසක් වසා පිහිටි නුග ගසේ විශාල අතුවලින් දවැන්ත මුල් පොළොවට ඇදී තිබුණි. ඔවුන් එද රාත්‍රිය ගත කළේ මේ මුල් වලින් වට වූ කුටියක් බඳු ඉඩකය.

අලුයම, කෝපයට පත් වඳුරකු ගේ ගෙරවීමකින් හැන්ස් අවදි විය. තුරු වදුලු අතර තවමත් අඳුර පැතිරී තිබුණි. හුන් තැනින් එළියට විත් උඩ බැලූ ඔහුට නුග ගස උඩ හුන් වඳුරකු සිය බිරිය සමීපයට හොරෙන් පැමිණි වඳුරු නාම්බකුට, ලොම් පුප්පා, දත් විලිස්සා, රුදුරු බැල්මක් හෙළාගෙන සිටිනු දක්නට ලැබුණි. උදෑසන මහ වනය පණ ලබන්නේ මෙවැනි සිද්ධීන්ගෙනි.

''ආ, ඒ බෝද? බෝ තවත් අනික් උන්ට කරදර කර කර ඉන්නව නේද? බෝ හරි දූනමුතු යකා'' හැන්ස් වඳුරකු දෙස බලා කෑ ගැසුවේය.

මේ කලබලයට හේතු වූ වැදිරිය හැන්ස් ගේ කට හඬ ඇසීමෙන් වහා ඔහු වෙත පැන ගෙන ආවාය.

''මොකද බිම්බි මේ කලබලේ?'' කී හැන්ස්, වැදිරිය ගසින් බිමට පනිත් ම අල්ලා ගත්තේය. ''මෙන්න රනී බෝ හඳුනන කෙනෙක්'' යි කියමින් හැන්ස් වැදිරිය ඇය අතට දුන්නේය.

හැන්ස්ට ප්‍රථමයෙන්ම වැද්දන් මුණ ගැසෙද්දී බිම්බි ඔහු සමග වූවාය. හැන්ස් රජු ගේ අධ්‍යක්ෂකාරයන් විසින් අල්ලා ගනු ලැබුවේ ඔහු මේ වැදිරියන් සමග විල් තෙරට ආ අන්තිම අවස්ථාවේදීය.

''දැන් අපට අපේ යාළුවන් ගෙන් තුන් දෙනෙක්ම හමුවුණා. හරි, ඉතින්, හමුවන්නට සිතා ගෙනම ආ එක්කෙනා ගැන සොයා බලමු'' යි හැන්ස් යෝජනා කළේය.

''අර ලස්සන සුදු ගෝනා ද? අනේ මට හරි ආසයි ඌ බලන්ට'' රනි කීවාය.

''රනි මාත් එක්ක යමුකො අද. සමහර විට හෙටත් හොයන්ට වෙයි. එහෙමත් හොයලා හමුවුණේ නැත්නම් බෝ මෙහේ නැවතෙන්ට, මං ගිහින් ඌ සොයා ගෙන එන කල්. බොට අමාරුයි නොව එච්චර දුර ඇවිදින්ට.''

පුරා සතියක් ම හිරු උදවේ පටන් ඇඳිරි වැටෙන තෙක්ම හැන්ස් විල් සෙව්ව ද ඉක්මවා මහ වනයේ සුදු ගෝනා සෙව්වේය. එහෙත් ගෝනා හමු නොවීය.

හැන්ස්හට සුදු ගෝනා මුලින්ම මුණ ගැසුණේ ඌ කොටියන් දෙදෙනකු සමග මාරාන්තික සටනක යෙදී සිටියදීය. එක් කොටියෙක් උගේ තියුණු අංවල ඇමිණී සිටියේය. එහෙත් අනෙකා ගෝනා ගේ පිට උඩට පැන උගේ බෙල්ල සපා ගෙන හුන්නේය. හැන්ස් තමා අත තිබුණු යකඩ පොල්ලකින් කොටියා මෙල්ල කොට ගෝනා බේරා ගත්තේය. ඉන්පසු ඔහු ඌට සාත්තු සප්පායම් කොට ඌ හීලෑ කර ගත්තේය.

සුදු ගෝනා සොයා ගැනීමට අසමත් වූ හැන්ස්, ඌ යටකී විදියේ ඉරණමකට ගොදුරු වන්නට ඇත්දැයි සිතා බිය වූයේය. මේ දුලබ සතා වෙනුවෙන් ඔහු එද ඉදිරිපත් වූයේ ජීවිත පරිත්‍යාග-යෙනි. සමහර විට, මෑත දී වැටුණු වැසි නිසා වැඩුණු තණ බිම් සොයා ඌ වෙනත් පෙදෙසකට යන්නට ඇතැයි ද ඔහු සිතුවේය.

රනී ගේ ශාන්ත සමාගමයත් රාත්‍රියට ඔවුන් මෙන්ම නුග ගසට එන මුගටියාත් යහළු වඳුරනුත් නිසා හැන්ස් ගේ සිතට සැනසීම ඇති විය. දවල් කාලයේ පැය ගණනක් විල්ලිහිණි එකකු දෙන්නකු පිට ඇතිව විලේ සැරිසරමින් ඕලු නෙළුම් ආදී රස පලු පත් බුදින දිකුද් දැකීම ද ඔහු සිත සතුට වැඩි කළේය.

දැන් තුරු වදුලු මලින් පිරෙන, වට සරන මී මැස්සන් ගේ ගුමු නාදය ඇසෙන කාලය ඉක්මී ගොස්ය. මොර, කෝන් ආදී ගඩා-

Scanned with CamScanner

ගෙඩි වර්ග සුලබව ඇත්තේ ඈත පිහිටි ගිරි වන පෙත්වලය. ගෙඩා ගෙඩි ආදියට අමතර ආහාරයක් වශයෙන් හැන්ස්ට එහි දී ඉත්තෑවකු හෝ කබල්ලෑවකු හෝ දඩයම් කරගන්නට හැකිවනු නියතය. වඳුරෝත් හැන්ස් හා රනිත් ඒ වන පෙත් බලා පිටත් වූහ.

හැන්ස්, බිම්බි ගෙන ගියේ ඔහු උරහිස තබා ගෙනය. උදේ තවම මොකුත් නොකෑ බිම්බි බඩගිනි වී දඟලන්නට වූවාය. මග පසෙක සිහින් වැලක් පෙන් වූ රනි එහි අලවත් හාරා බලන්න දූයි ඇසුවාය. හැන්ස් ඇට අල හාරන්නට ඉඩ දී ගසකට හේත්තු වී බලා සිටියේ තමා බිම තැබූ වැඳිරිය රනි වෙත වහා දිව ගොස් අල කුරුල්ලකු උදුරා ගන්නා සැටිය.

''අද කන්නට දෙයක් නැතිව හාමතේ මේ කැලේ ඉබාගාතේ ගිය මට මේ බිම්බි කන්නට සුදුසු දේ නොපෙන්නුවා නම් මා අද ජීවතුන් අතර නෑ'' යි හැන්ස් බිම්බි දෙස බලා තොල් මතුළේය.

හැන්ස් ගේ සිත අතීතය කෙරෙහි යොමු විය. ඕලන්දයේ ආර්නම් නුවර පාසල් ශිෂ්‍යයකු වශයෙන් තමා ගත කළ කාලය ඔහුට සිහි වූයේය. පාසලේ දී පංතියේ ගුරුවරයා තමාට අඩම්-තේට්ටම් කළ සැටිත් නොයෙක් ඇනුම් බැණුම්වලට තමා මුහුණ පෑ සැටිත් ඉක්බිති ගුරුවරයාට මුහුණ හරහා පහරක් දී ගෙදරින් ද පැන ගොස් ඇම්ස්ටර්ඩෑම් නුවරට අවුත් නැගෙනහිර ඉන්දියා කොදෙව් බලා පිටත් වන්නට තිබුණු නැවක අතවැසි කොල්ලකු හැටියට බැඳුණු සැටිත් ඔහුගේ මනසෙහි යළිත් මැවී පෙනෙන්-නට විය.

හත් මසක් තිස්සේ මුහුදේ යාත්‍රා කිරීම කොතරම් ත්‍රාසජනක ද? අතර මහ මහ මුහුදේ බිහිසුණු කුණාටුවලට මුහුණ පෑ ඔවුන්, ජීවිතයත් මරණයත් අතර කළ සටන් බොහෝයි. මහ මුහුදේ අධික උෂ්ණ, නිසල පෙදෙස්වලට මැදි වූ ඔවුහු සති ගණන් සාගින්නෙන් පෙළුණෝය. මාස ගණන් රෝගාතුරව සිටියෝය. අන්තිමේ දී ගල් පරයක හැපුණු නැව සුනු විසුනු වී ගියාය. නැවේ සුන්බුන් සමග හැන්ස් ලංකාවේ පාළු වෙරළකට පාවිය. වෙරළට සේන්දු වූ ඔහු සිහි මුළාවූවකු මෙන් වැල්ල දිගේ ගොඩට බඩ ගෑවේය. අනතුරුව ක්ලාන්ත වූ හේ මළාක් මෙන් වැද හොත්තේය. එද රාත්‍රියෙහි මුහුදින් ගොඩට ආ කැස්බෑක් හැන්ස් වැද හෝනා තැන් සිට අත පොවන හරියේ බිජු ලෑවාය. ඔහුගේ පණ රැකුණේ මේ කැස්බෑ බිජුවලිනි.

වෙරළෙහි කෑමට තරම් දෙයක් නොතිබුණු හෙයින් ද කිසි ද මිනිස් වාසයක් ළඟක නො වූ හෙයින් ද ඔහු කොයි අත යා යුතු

දැයි නොදන බියෙන් ගැහෙමින් මහ වනයට වැදුණේ දෙවියන් කෙරෙහි පමණක් විශ්වාසය තබාගෙනය.

වල් ඌරන්, ඉත්තෑවුන් හා කුරුල්ලන් විසින් බුදිනු ලැබූ දේවල් ආහාරයට ගනිමින් ඔහු කෙසේ හෝ දිවි රැක ගත්තේය. නියං කාලය එළඹියේය. හැන්ස් පිපාසයෙනුත් බඩසයෙනුත් පෙළෙන්නට විය. බිම්බිට අයත් වඳුරු රැළ ඔහුට මුණ ගැසුණේ මේ අතරදීය. එවකට කුඩා වැදිරි පැටවකුව හුන් බිම්බි විශාල ගල් තලාවක පිහිටි ගැඹුරු දිය වළක වැටී සිටියාය. හැන්ස් වැදිරි පැටවා ගොඩට ගත්තේය. මහත් කාංසි ගතියෙන් කල් ගෙවූ හැන්ස් හට ඒ කාංසිය මඟ හරවා ගැනීමට මේ වැදිරි පැටවා ඉවහල් විය. වැදිරියට ඔහුගේ කතා බහ නොවැටහුණත් ඔහු ඇයට සිය හැඟුම් පළ කළේය. රුදුරු කොටියා ගොරවන හඬත් බොටකඳා කුංචනාද කරන හඬත් හැන්ස් තුළ ජනිත කළ බිය මේ වැදිරිය ගේ සමාගමය නිසා තුනී විය. ඔවුන් දෙදෙනා ඔවුනොවුන් ගේ බිය එකිනෙකා සමඟ සමසේ බෙදා ගත්හ.

බිම්බි හැන්ස් ගේ හුදු වන මිතුරියක්ම නොවූවාය. කෑ යුතු අල මුල් පලු පත් මේවායයි හැන්ස් දැන ගත්තේ ඇගෙනි. නියං කාලයේ දී සාගින්නෙන් පෙළෙන විට අල හාරා ගෙන කන සැටි හැන්ස් හට ඇ පෙන්වා දුන්නාය. කන්නට සුදුසු පලවැල ද ඈ ඔහුට පෙන්නුවාය. ඒවා රසයෙන් තොර වුව ද සාගතයක දී කුස පුරවා ගැනීමට මහඟු ආහාර විය.

ගසකට හේත්තු වී බිම්බි දෙස බලා හුන් හැන්ස් හට, නුදුරින් සතුන් කෑගසන හඬ ඇසෙන්නට විය. ඔහු තිගැස්සිණි. ඔහු ගේ ඉරියව්ව වෙනස් වුණි. "හික්! හික්! හික්! හික්!" යි වූ හඬින් ඒ ශබ්දය බිය හා අනතුරු අඟවන්නක් විය. කෑරලෙක් හඬමින් උස් පහත් වෙමින් පියාඹා ගියේය. අනතුරක් ළඟ ම තිබෙන බව අඟවමින් දඬු ලේනෙක් වේගයෙන් කෑගසන්නට විය. රනී හැන්ස් වෙත දිව ආවාය. කොටියකු ඔවුන් සිටින දෙසට එන බව ඔවුහු දැන ගත්හ.

බියෙන් ගැහෙමින් ඇඹරෙමින් බිම්බි නැග සිටි ගසට රනී ද නැංවූ හැන්ස් ගස මුල සිටියේය. හැන්ස් ද ගසට නොනැංග හොත් තමා ද බිමට බසින බවට රනී තර්ජන කරන්නට වූයෙන් ඔහුට ද ගසට නැඟීමට සිදු විය. මෙතෙක් රනී ගේ තුරුල්ලේ වෙව්ලමින් හුන් බිම්බි හැන්ස් වෙත පැන ඔහු ඇඟ බදා ගත්තාය. බියපත් වඳුරන් ගේ කෑගැසීම ළඟ ළඟම ඇසෙන්නට විය. එක් වඳුරු රංචුවක් කෑගසමින් හැන්ස්, රනී සහ බිම්බි සිටි ගස අසල වෙනත් ගසකට ආවේය. ඒ සමඟ කොටියෙක් ද උඩ බලමින් සෙමින් සෙමින් ආවේය.

හී පාරක් නොවදින මානයේ කොටියා නතර විය. කොටියා හදිසියේම මහ හඬින් ගොරවා වඳුරන් සිටි ගසට නගින්නට මෙන් ගස පහුරු ගාන්නට විය. හොඳටම බියපත් වූ වඳුරෝ කෑගසමින් ගසින් ගසට පනින්නට වූහ. මේ අතර එක් අවාසනාවන්ත වඳුරෙක් බිම ඇද වැටුණේය. කොටියා බිම වැටුණු වඳුරා වෙත වහා පැන්නේය. දිග නිය සහිත පයින්, කොටියා වඳුරා ගේ සිරුර පාගා ගෙන උගේ හිස පොඩි කළේය. ඉක්බිති මළ කඳ, අසල පඳුරක් ළඟට ඇද ගෙන ගිල දමන්නට විය.

''රංචුවේ හිටියා නම් ලෙහෙසියෙන්ම කොටියාට අසු වෙන්ට තිබුණේ බොයි බිම්බි, නේද?'' යි වඳුරා ගිල දමා වනය තුළට ඇදෙන කොටියා දුටු හැන්ස් තම ඇකයේ වෙව්ලමින් සිටි බිම්බි දෙස බලා කීවේය. වඳුරෝ රංචු පිටින් අවට ගස්වල රැස් වූහ. ඒ ඒ රැළට අයත් වඳුරෝ කිසි විටෙක අන් රැළකට එක් නොවූහ.

වඳුරන් ගේ භයානකම සතුරා කොටියාය. කොටියා වඳුරු මසට බලවත් ආශාවක් දක්වන බව පෙනේ. ඌ නිතර වඳුරන් හැසිරෙන පලතුරු සෙවණ යට හොල්මන් කළේය. ගඩාගෙඩි වාරය හොඳට පුරුදු කොටියා ඒ කාලයට නිතරම වඳුරන් ගැවසෙන තුරු වදුලු අසල සැඟවී බලා සිටී. කොටියා නොයෙක් උපක්‍රම යොදා වඳුරන් අල්ලයි. ඇතැම් විටක දිය වළට දිය බීමට එන වඳුරන් රැක සිට කුරුමානම් අල්ලා මරා ගනියි. සමහර අවස්ථාවල ඌ ගසකට නැඟ මළ එකකු මෙන් විශාල අත්තක් මත වැද හෝනේය. අවට රැස්වන වඳුරෝ, මළාක් මෙන් සිටින කොටියා දෙස කුතුහලයෙන් බලා සිටිති. එහෙත් කොටියා නොවේ උගේ ලොම් ගසක් වත් සොලවනුයේ. මළ කොටියෙකැයි සිතා ඌ අසලට එන වඳුරන් ගෙන් එකකු ඌ ඩැහැගන්නේ මෙවැනි කපටි කම්වලිනි.

''අපි මේ කොටියට මොකක් හරි කරන්ට ඕනෑ. ඒත් මොනව ද අපි කරන්නෙ? ඌ හරිම කපටියා. කොයි වෙලාවෙත් මාව මග හරිනවා'' යි දිනක් හැන්දෑවේ ගල් ලෙණක නවාතැන් ගත් හැන්ස් රනී අමතා කීවේය.

''ලොකු හබකයක් අටවමු'' යි මඳ වේලාවක් කල්පනා කළ රනී කීවාය.

''අන්න වැඩේ! ඒක තමයි කරන්ට ඕනෑ. හාවො, ඉත්තෑවො වගේ පුංචි එවුන්ට හබක අටවන්ට පුළුවන් නම් මොකද ලොකු සතෙකුට ලොකු හබකයක් අටවන්ට බැරි! රනී නුවණක්කාරි'' යි හැන්ස් ප්‍රීතියෙන් කීවේය.

Scanned with CamScanner

රනි සතුටින් සිනා සුණාය. මෙවැනි පැසසුමක් හැන්ස් ගෙන් තමාට ලැබීම ඈ විශාල දෙයක් කොට සැලකුවාය.

ඊ ළඟ තෙදින තුළ ඔවුහු හබක ඇටවීමට අවශ්‍ය දේ රැස් කළහ. විශාල ලී කරු, ලොකු වැල් හා මහා කළු ගල් කිහිපයක් ද, ඔවුහු කොටියා ගේ ගොදුරු බිමක් අසලට ගෙනාවෝය. ඔවුනට සැඟවී බලා සිටිය හැකි විශාල කෝන් ගසක් යට හැන්ස් හබක අටවන්නට විය. ශක්තිමත් ලී දඬු යොදා තැනූ මැස්සක් බඳු හබක හැන්ස් විසින් වැල්වලින් මනාව බැඳ සකස් කරන ලද්දේය.

හබක අටවා අවසන් විය. අඩි හයක් පමණ දිග පළල ඇති, වහලක පලයක මෙන් හැඩය ඇති හබකෙහි ශක්තිමත් ලී දඬු මත විශාල ගල් පටවා තිබුණි. හබකෙහි එක් පැත්තක් බිමට හේත්තු වී තිබුණු අතර, යන්තම් සෙලවීමක දී බිම පතිත වන සේ අනෙක් පැත්ත උඩට උස්සා ඒ මැදින් මුක්කුවක් ගසා තිබුණි. හබක යටින් තබනු ලබන ගොදුර කන්නට එන ඕනෑම සතකු පොඩි පට්ටම් වී යන තරම් හබක බරෙන් යුක්තවිය.

හැන්ස් ගේ ඊළඟ කටයුත්ත වූයේ, කොටියාට සුදුසු ගොදුරක් එහි ගෙනැවිත් තැන්පත් කිරීමය. ඒ කොටියා විසින්ම දෙ දිනකට පෙර මරා අඩක් කා දමන ලද වල් ඌරු කුණක් ඔහුට හමු විය. පණුවන් ගසා තිබුණු ඌරු කුණෙහි, ඇටකටු පමණක් ඉතිරි වන තෙක් මස කා දැමීමට කොටියා නැවතත් එන බව හැන්ස් දැන ගත්තේය. ඔහු ඌරු කුණ වැලකින් බැඳ හබක වෙත ඇදගෙන ආවේය. එය ඇද ගෙන ආ පාරෙහි ඌරු කුණ ඇතිල්ලීමෙන් කොටියාට ලෙහෙසියෙන්ම එය ඇති තැනට පැමිණිය හැක. හැන්ස් දිග රිටක් ගෙන ඌරු කුණ හබක යටටම තල්ලු කළේය.

කෝන් ගෙඩි ඇඹුල් රසය. එහෙයින් ඔවුහු අවට ගස්වලට නැඟ කෑමට වඩා රසැති පැණි මොර එකතු කර ගෙන කෝන් ගස උඩට අවුත් ඒවා කමින් හබක වෙත නෙත් හෙළා ගෙන සිටියෝය.

ඔවුහු ගසේ සුව පහසු අතු විටපවල වාඩි ගත්හ. රනි අඹරන ලද පට්ටා ලනු පොටක් බිම්බි ගේ ඉණ වටා බැඳ එහි කෙළවර අත්තක ගැට ගැසුවාය. එකතු කර ගත් මොර ගෙඩිවල පැණි උරන ඔවුහු වරින් වර කළු පැහැති කුඩා මොර ඇට බිමට දමති. ඒවායින් සට සට යන හඬ නැඟුණේය.

සවස්කරයේ කොටියා සෙමින් සෙමින් ඒ දෙසට එනු හැන්ස්ට දක්නට ලැබුණි. ඔහු මෙතෙක් වේලා බලා සිටියේ මේ මොහොත එළඹෙන තෙක්ය. හබක අසලට පැමිණි කොටියා



හබක අසලට පැමිණි කොටියා ඒ නුපුරුදු වස්තුව දෙස සැකයෙන්
මෙන් බලන්නට විය

ඒ නුපුරුදු වස්තුව දෙස සැකයෙන් මෙන් බලන්නට විය. හබක අසල බිම දිගා වුණු කොටියා හකු ලෙව කමින්, වරින් වර හබක අස්සේ තිබුණු ඌරු කුණ වෙත ද එබිකම් කරන්නට විය. ඌරු කුණෙන් වහනය වූ තද කුණු මස් ගඳින් උගේ සිත තදින් ම ඒ වෙත ඇදෙන්නට විය. වැදහෝනා තැනින් නැගී සිටි කොටියා ඉතා ප්‍රවේසමින් හබක තුළට ඇතුළු විය.

සැණෙකින් හබක කොටියා මත ඇද වැටුණේය. භයානක ගෙරවීමක් හබක තුළින් ඇසෙන්නට විය. නොකඩවා බෙරිහන් දෙන්නට වූ කොටියා හබකින් ගැලවීමට මහත් තැතක් දරන්නට වූයේය. හබක මත තිබුණු ගල් සමහරක්, කොටියා ගේ දඟලීමෙන් ඉවතට පෙරළී ගියේය. එහෙත් ඊමත තිබුණු විශාල ගල් එසේම තිබුණි. මඳ වේලාවකින් කොටියා වේදනාවෙන් නැඟූ හඬ සිඳී යන්නට විය. අන්තිමේදී කිසිදු හැලහොල්මනක් හබක තුළින් නිකුත් වූයේ නැත.

වුණු සිද්ධිය කෙරේ හැන්ස් ගේ සිත කොතෙක් දුරට ඇදී ගොස් තිබුණා ද යත්, බිම්බි හිඳ ගෙන සිටි අත්තෙන් ඇය පෙරළී ගොස් රනි ඉණ බැඳ අත්තේ ගැටලා තිබූ ලනු පොට නිසා බිමට නොවැටී එල්ලී ගෙන බියෙන් තතනන හැටි ඔහුට පෙනුණේ දැන්ය.

''බෝ ඇ අත්තේ ගැට ගහලා තිබුණු එක හොඳට ගියා'' යි කී හැන්ස් රනි දෙස ආදරයෙන් බැලුවේය.

''මට බිම්බි ගැන සැක හිතුණා. ඒකයි මං එහෙම කළේ'' යි රනි කීවාය.

හබක අස්පස් කිරීමට හැන්ස් එළි වෙත තෙක් බලා සිටියේය. වඳුරෝ රංචු පිටින් මේ අමුතු දර්ශනය නැරඹීමට අවට ගස්වලට රොක් වූහ. කොටියා මත පතිත වී තිබුණු හබක මත තිබුණු විශාල ගල් ඉවතට පෙරළා දැමූ හැන්ස් හබක ඔසවා ඉවතට විසි කළේය. හබකට යට වීමෙන් කොටියා ගේ සිරුර තැළී පොඩි වී තිබුණි.

මළ කොටියාට වුවද බිය වූ වඳුරෝ ගස් උඩට වී ඒ දෙස බලා සිටියහ. එහෙත් හැන්ස්, කිසි සැකක් නැතිව කොටියාගේ මළ කුණ ඉවතට අදිනු දුටු වඳුරෝ වහ වහා ගස්වලින් බැස ඒ දෙසට එන්නට වූහ. උන් මළ කොටියා ගේ වලිගයෙනුත් රැවුලිනුත් අදින්නට වූහ. සමහර වඳුරෝ මළ කොටියා ගේ සිරුර මත නැගී එහි මොළොක් සුව පහස විඳිමින් වාඩි ගත්හ.

බිම්බි ඇගේ නෑදෑයන් ගෙන් වෙන් කරවීමට අසතුටු වූ හැන්ස් සහ රනි ඇය රැළට එක් කොට ඇට ආයුබෝවන් කීහ.

Scanned with CamScanner

# 3

## සුදු ගෝනා

සුදු ගෝනා හමු නොවීම ගැන හැන්ස් කනස්සල්ලටත් නොඉවසිල්ලටත් පත් විය. විල් තෙර අවට වන පෙදෙසින් ඉවත්ව යාමට පෙර අන්තිම වරට සුදු ගෝනා සෙවීමට තැතක් ගත යුතු බව හේ කල්පනා කළේය. එහෙත් කලින් විල් තෙර අවට මහ වනය දෙවනත් කරමින් ගෝනා සොයා පලක් නොලද හැන්ස්ට ඌ නැවතත් සොයා ගැනීම ගැන සැක ඇති විය. වනයෙහි වෛවර්ණයෙන් මුවාවන අනෙක් වන සතුන් මෙන් නොව, සුදු ගෝනා, දුටු කල පහසුවෙන්ම අඳුනා ගත හැකි සතෙකි.

රනි නුගේ වෙත රැඳ වූ හැන්ස් ගෝනා සොයා යන්නට විය. වන සතකුටත් වඩා නිහඬව ඔහු වනය පුරා ඇවිදින්නට විය. කලාතුරෙකින් ඇසෙන බිහිසුණු සතකු ගේ තර්ජනාත්මක ගෙරවීමක් හෝ අනතුරකට භාජන වූ අන් සතකු ගේ මර ළතෝනියක් හෝ හැරෙන්නට මහ වනය පුරා පැතිර පවත්නා පාළුව භයංකර විය.

සවස් භාගයේ හැන්ස් කැලෑ රොදකින් වැසුණු වැව් කණ්ඩියකට නැගුණේය. වැවේ අනෙක් පැත්තේ ඌරන් සහ ගෝනුන් ලැග සිටින බව හේ දත්තේය. ඔහු ගේ බලාපොරොත්තුව සපල විය. දිග අං තට්ටුවක් සහිත ගෝනකු සහ ගෝන දෙනක මඩේ ලැග සිටිනු ඔහුට දක්නට ලැබුණි. ඔහු ඉතා සෙමිනුත් නිහඬ වත් ඔවුන් වෙත ළං වෙන්නට විය. ඔහු කොතරම් නිහඬව උන් වෙත ළං වූයේ ද යත් උන් එකකුදු ඔහු දුටුවේ වත් උන්ට කිසිදු ශබ්දයක් ඇසුණේ වත් නැත. ඉඳ හිට කරන කන් සෙලවීමක් හැරෙන්නට උහු නිවිගිල්ලේ මඩේ ලැග සිටියහ. ගසකට මුවා වී බලා හුන් හැන්ස් හට ගෝනා, ගෝන දෙන ගේ මුහුණ ලෙවකන සැටි පෙනුණි.

හැන්ස් වියලි කෝටු කැබැල්ලක් ‘සටස්’ යනුවෙන් කැඩුවේය. අනතුරක්දෝ යි ගෝන්නු හිස් ඔසවා බැලූහ. උහු සිය දික් වූ කන් ශබ්දය නිකුත් වූ දෙසට යොමා ගෙන නොසැලී බලා උන්හ. අනතුරක් අසල මානයේ නැති බව තේරුම් ගත් උහු යළිත් කලින් සිටි ඉරියව්වට වන්හ. හැන්ස් මඩ වගුර වෙත කුඩා ගල් කැටයක් වීසි කළේය. ගෝන්නු මඳ වේලාවක් හිස් ඔසවා බලා සිට ඇතින් පිහිටි ඉවුර දෙසට ගියෝය. නැඟී සිටි

Scanned with CamScanner

ගෝනා එඩිතර ලීලාවකින් හිස ඔසවා ඉව අල්ලා ඕනෑම සතුරකු වෙත මුහුණ දෙන්නට මෙන් හඬ නැගුවේය.

ගෝනා ගේ හැඬීමට පිළිතුරු දීමට මෙන් ලක්ෂණ කළු පැහැති අඳුන් දිවියෙක් හිරු රැසින් නැහැවුණු මහ වනය තුළින් එළියට ආවේය. අඳුන් දිවියා ගෝනා අසලට ම අවුත් නැවතුණේය. එය සුපුරුදු සිද්ධියක් බඳු විය. ගෝනා ද කිසිදු අමුත්තක් නැතිව සිටි වන ම සිටියේය. මේ මඩ තවරා ගෙන වෙස් වළා සිටින්නේ අනිකකු නොව තමා මෙතරම් දිනක් සෙවූ තම මිත්‍ර සුදු ගෝනා බව හැන්ස් හට වැටහුණේ අන් කිසිදු ගෝනකු, දිවියකු ළඟට එන තෙක් බලා නොසිටින බැවිනි. මේ අඳුන් දිවියා ද හැන්ස් ගේ වන මිතුරන් ගෙන් එකෙකි. දියා නමින් හැන්ස් ඌ ඇමතීමට පුරුදුව සිටියේය.

මුවා වී හුන් තැනින් හැන්ස් එළියට ආවේය. එවිට සතුන් දෙදෙනා ඔහු දෙස බලා සිට ඔහු අබිමුවට ආහ. ඔහු ගෝනා ගේ සිනිඳු ලොම් සහිත ගෙල වටා අත දමා ඌ හුරතල් කළේය. ඉක්බිති ඔහු අඳුන් දිවියාගේ ලොම්වලින් ඒ මේ අත අදින්නට වූයේ ඌ සෙල්ලමට ඇද ගැනීමටය. ක්‍රීඩාශීලී දිවියා හැන්ස් ගේ ඇඟට පනින්නටත් ඔහු වටා දුවන්නටත් විය. වරක් ඌ ඔහුගේ උරය මතට පැන්නේය.

''වරෙන් දියා, මාව බොහෝ දඩයම ළඟට අරන් පලයන් මට සති ගණනකින් නොලැබුණු මුව මස් ගඳක් බෝ ළඟින් එනවා'' යි හැන්ස් දිවියා ඉවතට දමමින් කීවේය. ඔහු මහ වනයේ තනිව ජීවත් වෙද්දී මේ අඳුන් දිවියාත් සමග හවුලේ දඩයම් කරගත් සතුන් අනුභව කළේය.

හැන්ස් ගේ වචන වැටහීමෙන් දෝ අඳුන් දිවියා වනය තුළට යන්නට විය. හැන්ස් ඌ පසු පස ගියේය. අඩක් කා දැමූ මුව පොව්වකු ගේ මළ කඳක් අසලට පැමිණි දිවියා නතර විය. තම හීයක තලයෙන් ඉන් මස් කුට්ටියක් ගලවා ගත් හැන්ස් එය වැලකින් එල්ලා ගෙන ගෝනා සහ දිවියාත් සමග සැතපුම් ගණනක් ඔබ්බෙන් පිහිටි විල් තෙර වෙත යන්නට විය.

හැන්ස් ගේ වන මිතුරන් දුටු රනී ප්‍රීතියෙන් හා පුදුමයෙන් බලා සිටියාය. ඈ අඳුන් දිවියන්ට බිය වුවත් දියා ඇගේ ගල් ලෙණෙහි ද ජීවත් වූ එකකු බැවින් ඌට බිය නොවූවාය. මේ මඩ තැවරුණු වන සතා රජකු විසින් ආසා කරනු ලැබූ ඒ සුදු ගෝනා නම් වන්නට නොහැකි යයි ඈ සිතුවාය.

''මේ තමා මගේ සුදු ගෝනා'' යි හැන්ස් උගේ පිටට තට්ටු කරමින් කීවේය. ''මට ජේන හැටියට බෝ ඌ ගැන ඒ තරම්

උනන්දුවක් නොදක්වන හැඩයි. ටිකක් ඉන්න මං උගේ මඩ සෝද ගෙන එන කල්.''

වියලි තණ මිටක් එකතු කර ගත් හැන්ස් ඌ විලට ගෙන ගොස් උගේ ඇඟ පුරා තැවරී තිබුණු මඩ සෝද හැරියේය. ගෝනා ගේ ගත සුදට සුදේ බබළන්නට විය.

''මොකද බො දැන් මූ ගැන කියන්නෙ?'' යි හැන්ස් රනී ගෙන් ඇසුවේය.

රනී විස්මයෙන් දෙනෙත් විදහා ගෙන ඌ දෙස බලා සිටියාය. ''ඌ හරිම ලස්සනයි'' ඈ තොල් මතුළාය.

පුරුදු පරිදි හැන්ස් ගෝනා ගේ පිට උඩ නැංගේය. දඟ නැට හැව්රිදි හැන්ස් සැහෙන තරම් බර තරුණයකු වුවද සුදු ගෝනා ඔහුත් රැගෙන විල් තෙර තැනිතලාව ඔස්සේ දික් පිම්මෙන් දුවන්නට විය. මේ පුදුම හමුවීම ඔවුනට බෙහෙවින් සතුට ගෙන දුනි.

දිනක් ඇතා උගේ රාත්‍රී සංචාරයෙන් පසු ආපසු නොපැමිණියේ ය. ඌ රැළකට එකතු වී සිටින බවට කිසිදු සැකයක් නැත. දැන් සිය ගල් ලෙණ කරා ආපසු යාමට කාලය පැමිණ තිබෙන බව ද හැන්ස් හට වැටහුණි. දිකුද් උගේ කාලීන සංචාරයෙහිදී, අවුරුද්දේ එක්තරා වකවානුවකට විල් තෙර අවට පෙදෙසට පැමිණෙන බව හැන්ස් දැන සිටියේය. එවිට යළිත් ඔහුට ඌ හමු විය හැක.

හැන්ස් ද රනී ද ගල් ලෙණ වෙත ආපසු යන්නට වූහ. ගෝනාත් දිවියාත් ඔවුන් පසු පස එන්නට වූහ. උන්ට ආපසු යන සේ හැන්ස් අතින් සංඥා කළේය. එහෙත් දීයා නොනැවතී ඔවුන් පසු පස එන්නට විය.

''හා, හා, බො බොගේ යාළුවත් බලා ගෙන හිටපන්'' යි ආපසු හැරී දිවියා ඇතින් තල්ලු කළ හැන්ස් ආදරයෙන් කීවේය. ඔවුන් නොපෙනී යන තෙක්ම දිවියාත් ගෝනාත් ඔවුන් දෙස බලා සිටියහ. ආපසු හැරී බැලූ හැන්ස්හට සහ රනීට මේ පුදුම වන ළ තුන් දෙදෙනා ඔවුන් දෙස ශෝකාකුලව බලා ගත් වනම බවත් සැටි දක්නට ලැබුණි. ඔවුහු අවසන් වරටත් උන් දෙස කරන නොපෙනී ගියහ.

බෙල්ල ්ස් සහ රනී මගදී කතා කළේ කලාතුරෙකිනි. නිසල
විසින් හ වනය තුළින් ඇසුණු ශබ්දයෝ හැන්ස් හට සිය අතීතය



සුදු ගෝනා හැන්ස් පිට තබාගෙන විල් තෙර තැනිතලාව ඔස්සේ දික් පිම්මේ දුවන්නට විය

Scanned with CamScanner

සිහි ගැන්වූහ. අතර මගදී ඔහුට ඇසුණු 'සර සර' ශබ්දයත්, සතකු ගේ හැඬීමත් ඔහුට දක්නට ලැබුණු පා සටහනුත් ගඩා ගෙඩිත් මලුත් ඔහු සිත සිය අතීතයට ඇද ගෙන ගියේය.

වැද්දන් හමු වීමට පෙර හැන්ස් ජීවත් වූයේ ඔහුට හුපුරුදු වන සතුන් අතරේය. මහ වනය, සාගින්නෙන් පෙළෙන්නාවූ ද මස් මාංසවලට ගිජු වූ ද වන මෘගයන් ගෙන් හා බිය ගෙන දෙන භූතයන් ගෙන් පිරුණු එකක් බව හේ සිතුවේය. එහෙත් ඔහුට සතුන් ගෙන් හානියක් නොවීය. විසකුරු සපුහු ඔහුට නිතර පෑගුනේය. එවිට දරණ ලාගෙන පහර දීමට සූදානමින් සිටින උන්ගෙන්, බියෙන් ගල්ගැසී සිටි හැන්ස් බේරුණේ යන්තමිනි.

බිය වූ විට දරුණු ලෙස පහර දෙන විසකුරු සපුන් ද හානියක් නොමැති එවුන් ද හඳුනා ගැනීමට ඔහු පුරුදු වූයේය. ගැරඬින් අහරකුක්කන් වැනි අහිංසක සතුන් උන්ට හැකි ඉක්මනින් සැඟවෙන බව හේ දැන ගත්තේය. නයා, පොළඟා වැනි විසකුරු සපුහු එසේ නොවෙති. උහු පිඹිමින් පහර දෙන්නට සැරසෙති. දරණ ගසා ගන්නා නයා උගේ පෙණය පුප්පා ඒ මේ අත වනයි. නැවතත් හිස පහත් කරයි. යළිත් කෙළින් වී පහර දෙයි. ටිකි නමැති මුගටියා සමග වරක් නයකුත් පොළඟකුත් සටන් කළ සැටි හැන්ස් දුටුවේය. පොළඟා පහර දෙන සමහර අවස්ථාවල දී උගේ මුළු සිරුරම ඉහළට පනී. ඔරලෝසුවක දුන්නක් මෙන් දරණ ගසා ගන්නා පොළඟා පහර දෙන්නේ අති බිහිසුණු අන්දමකිනි.

දිනක්, හැන්ස් ද වැද්දෝ ද එළිමහනක පිහිටි තුරු සෙවණක් යටට වී මුව පොව්වකු තණ කන අයුරු බලා සිටියෝ ය. සැණෙකින් මුව පොව්වා උගේ හිස ඔසවා වේගයෙන් ඒ මේ අත වනන්නට විය. උගේ හොම්බෙහි අඩි තුනක් පමණ දිග සර්පයෙක් එල්ලී සිටියේය. මුව පොව්වා සර්පයා ගළවා ගැනීමට බලවත් උත්සාහයක් දැරුවේය. එහෙත් සර්පයා උගේ හොම්බ කාගෙනම සිටියේය. ක්‍රමයෙන් මුව පොව්වා ගේ ශක්තිය හීන වී යන්නට විය. අනතුරුව ඒ මේ අතට වැනුණු අසරණ මුව පොව්වා මැරි වැටුණේය. වැද්දෝ මෙවැනි මළ මුවන් කෑමට නොගනිති. මුව පොව්වා දෂ්ට කළ සර්පයා පොළඟකු බවත් ඌ නිල් තණ බිම්වල අව්ව තැපීමට කැමති බවත් යම් සතකු ඌ වෙත පැමිණිය හොත් සැණෙකින් ඌ දෂ්ට කරන බවත් වැද්දෝ හැන්ස්හට පහදා දුන්හ. මහ වනයේ දී බෙල්ල තුවාල වී මැරී සිටින මුවකු හමු වුවහොත් ඌ කොටියකු විසින් මරනු ලැබූවෙකි. මෙවැනි මුවන් ගේ මස් කෑම අහිතකර

නොවේ. එහෙත් දිවෙහි හෝ හොම්බෙහි පමණක් කුඩා දළ සිදුරු සහිතව මුවෙක් මැරී සිටිය හොත් උගේ මස් කෑමට ගැනීම අනතුරුදායකය.

පොළඟා පැටවුන් කෙළින්ම වදන අතර නයාත් පිඹුරාත් අනෙක් බඩ ගා යන සතුන් මෙන් බිජු ලා ඒ මත දරණ ලාගෙන සිට බිජු රැකීමෙන් පැටවුන් බිහි කරන බව හැන්ස් දැන ගත්තේය. පිඹුරා සමහර අවස්ථාවල දී නෙමසක් පමණ කිසිදු අහරක් හෝ බීමට දියක් හෝ නැතිව බිජු රකී.

දිනක්, බට්ටිච්චකු කුඩා අතු රිකිල්ලක පැටලී ඉගිලී යා ගත නොහැකිව අසරණව තටු ගසන සැටි හැන්ස්හට දක්නට ලැබුණි. ඒ අසලට ගිය ඔහුට සිහින් වැලක් බඳු කොළ පැහැති ඇහැ-වුල්ලකු කුරුල්ලාට අඩියක් පමණ නුදුරින් සිටිනු දක්නට ලැබුණි. හැන්ස් බලා සිටිය දීම ඇහැවුල්ලා කුරුල්ලා වෙත ඇදී උගේ හිසින් ඩැහැ ගත්තේය. වේගයෙන් තටු ගැසූ කුරුල්ලා ගේ බරින් ඇහැවුල්ලා අත්තෙන් පහළට වැටී එල්ලී ගත්තේය. කුරුල්ලාත් කටේ තබා ගෙන ඌ ඔරලෝසු බට්ටකු මෙන් පැද්දෙන්නට විය. මේ දර්ශනය කුතුහලයෙන් බලා සිටි හැන්ස් හට ඇහැවුල්ලා ගේ හකු පළල් වී යන සැටිත් කුරුල්ලා ටිකින් ටික උගේ කට ඇතුළට යන සැටිත් දක්නට ලැබුණි. ඔහු වහා කෝටුවක් ගෙන ඇහැවුල්ලාට පහර දුන්නේය. උගේ කටින් කුරුල්ලා ගැළවී ගොස් බිම පතිත විය. හැන්ස් කුරුල්ලා අතට ගෙන ඌට සාත්තු සප්පායම් කොට අල්ල මත තබා ඉහළට ඇල්ලීය. කිසිදු අනතුරකට මුහුණ නොපෑවකු මෙන් කුරුල්ලා සිහින් හඬක් නගමින් ඉගිලී ගියේය.

ස්වභාව ධර්මය අනුකම්පා විරහිතය. එක් සතෙක් තවත් සතකු ස්වකීය ආහාරය පිණිස විනාශ කරයි. සමහර විට සිය ජීවිතය බේරා ගැනීමට ද අන් සතකු ගේ පණ නසයි. කිසිදු වන සතෙක් වයස් ගත වී නොමැරෙයි. ස්වෝත්සාහයෙන් ආහාර සොයා ගැනීමට නොහැකි වූ විට හෝ සතුරකු අතින් හෝ උගේ අවසානය සිදු වන්නේය.

සර්පයන් හැරෙන්නට තවත් විසකුරුවන් බොහෝ ගණනක් වනයේ වෙසෙති. කොළ රොඩු අතරේ සැඟවී සිටින ගෝනුස්-සන්, දිවිමකුළුවන්, පත්තෑයන්, කුරුමිණියන් ආදීහු උන් අතර වෙති. විශාල මදුරුවන්, දෙබරුන්, බඹරුන් හා මීමැස්සන්

වැනි කෘමීහු ද වනයේ සිටින තවත් විසකුරු සත්ව කොට්ඨාසයෙකි. හැන්ස් මේ හැම විසකුරුවකුම සිය අත්දැකීමෙන් හඳුනයි.

සත්ව ලෝකයේ පමණක් නොව ගස් වැල් අතර ද බිහිසුණු වස විස ඇත. මේවායින් මිනිසාට අනායාසයෙන්ම විපත් නොවූවත් කෑමෙන් හා ස්පර්ශ වීමෙන් දරුණු විපත් සිදුවේ. ගෙඩි, කොළ සහ අල මේ අතර වෙයි.

හැන්ස් හුදකලාව වනයෙහි ජීවත්වන විට මෙවැනි දෙයින් ඉතා පරිස්සම් වූයේය. ගසක කෙතරම් ප්‍රිය උපදවන ගෙඩියක් තිබුණත් කුරුල්ලකු හෝ වෙනත් සතකු හෝ එය නොකයි නම් ඔහු ඒ වෙත ළං වූයේ වත් නැත. කිසියම් සහජ හැකියාවක් නිසා සතුනට විෂ සහිත හා රහිත දෑ තෝරා ගැනීමට පුළුවන. අපේ ආදි කල්පික මුතුන් මිත්තන් විෂ සහිත හා රහිත දෑ හඳුනා ගැනීමට කොතරම් දුකක් විඳින්නට ඇත්දැයි කිව හැක්කේ කාටද?

වැද්දන් හැන්ස් ගේ ගුරුන් වූ පසු වනය පිළිබඳ ඔහුගේ දැනුම පළල් වූයේය. විෂ සහිත හා රහිත හතු වර්ග සහ අල වර්ග හඳුනා ගැනීමට ඔහු ඉක්මනින් උගත්තේය. රිළවුන් සහ වඳුරන් විසින් කා දමනු ලැබූ ගොඩ කදුරු ගෙඩි, දිනක්, හැන්ස් කෑවේය. ඉන් ඔහු නොමැරී ගැළවුණේ යන්තමිනි. ඔහු මේ ගැන මහත් කුතුහලයෙන් කල්පනා කළේය. විෂ ගතිය ඇත්තේ කදුරු ගෙඩියෙහි ලෙල්ලෙහි නොව ඒ තුළ ඇති ඇටවල බව ඔහු වැද්දන් ගෙන් දැන ගත්තේය. වඳුරෝ කිසි විටෙකත් ගොඩ කදුරු ගෙඩියෙහි ඇට නොකති.

අවට පෙනෙන්නට ඇති අලංකාර වස්තූන් විෂයෙන් වෙළී ඇති බව හේ තේරුම් ගත්තේය. නළාවක හැඩය ඇති සුදු මල් සහිත ගසක (අත්තන) හට ගන්නා ගෙඩි ඉතා විෂ සහිත බව හේ දැන ගත්තේය. වනයේ පිපෙන රතු හා කහ පාටින් යුත් කැටයමක් වැනි එක් පියකරු මලක් හට ගන්නා වැලේ අලය විෂයක් බව හැන්ස් දැන ගත්තේ අහම්බෙනි. වනයේ ඇවිදින ඔහුට, දිනක් මේ මල් පොකුරක් දක්නට ලැබුණි. එහි සුන්දරත්වයෙන් පිනා ගිය හැන්ස් මල් පොකුර වැලත් සමග කඩා ගෙන රනි වෙත'වුත් ''මෙතරම් ලස්සන මල් පොකුරක් මං කවදාවත් දැක්කේ නෑ'' යි කියා එය ඇය වෙත ළං කළේය.

''නියඟලා! නියඟලා! ඕවායේ අල කෑවොත් මැරෙනවා! වීසි කරන්න! වීසි කරන්න!'' යි ඈ කීවාය.

හැන්ස් සතුන් දඩයම් කිරීමේ දී ඉමහත් විනෝදයක් ලැබීය. එහෙත් ජීවත්වීමට අත්‍යවශ්‍ය නිසා ම මිස හුදු විනෝදය සඳහා කිසි දිනක ඔහු සතකු නොමැරුවේය. සතකු දඩයම් කිරීමට

හොඳ පළපුරුද්දක් තිබිය යුතුය. එමෙන්ම සතුන් දඩයම් කිරීම ත්‍රාසජනක වූත් සමහර විට අනතුරුදායක වූත් ක්‍රියාවකි.

දිනක්, තමාත් රන්දුනා සහ පෙමාත් ඝනව වැඩුණු පඳුරු සහිත කැලේ වල් ඌරකුට කිට්ටු කළ හැටි හැන්ස්ට හොඳට මතකය. අඩි ලකුණු අනුව යමින් ඌරාට හොඳටම ළං වුණු ඔවුන්ට ඌරා බිහිසුණු ලෙස ගොරවමින් උගේ දළින් ගස් මුල් බිඳිනා හැටි ඇසුණි. හැන්ස් හෙමින් සිරුවේ ඌ කිට්ටුවට රිංගා ගොස් සැඟවී සිට හියක් විද්දේය. කෝපයෙන් ඝෝර නාද කළ ඌරා ලොම් පුප්පා ගෙන හිය ආ පැත්තට එළවාගෙන ආවේය. හැන්ස් විසින් විදින ලද හිය උගේ ශරීරයේ අංගයකට වැදී ඇතුළට එරී ගොස් තිබුණි. තමා එළවා ආ පාරේ සතුරකු නුදුටු ඌරා උගේ හොම්බෙන් හිය ගළවා දමා ගොරවමින් වනය තුළට වැදුණේය.

''ඌරා ගෙන් ලේ ගලන කල් ටිකක් හිඳිමු'' යි කිය උරේ එල්ලා තිබුණු වඳුරු සම් පසුම්බියෙන්, කොටා කුඩු කළ පොතු විටක් ගෙන කට තුළට දමමින් ගසක් මුලට වී හිඳගෙන සිටි රන්දුනා කීවේය.

''මොරියන් කෙක්ක හොඳට වැදිල යටට කා ගෙන ගොහින් තියෙනවා. ඒත් ඌ ලොකු සතෙක්'' යි ඔහු යළිත් කීවේය.

පැයකට පමණ පසු ඔවුහු ඌරා ගේ හී තුවාලයෙන් හැළුණු ලේ පාර ඔස්සේ ඌ සොයා යන්නට වූහ. හැන්ස් පෙරටුවෙන් ගමන් කළේය. සැතපුමක් පමණ දුර ගිය පසු රන්දුනා පෙරටුව ගත්තේය. හැන්ස් මෙන් නොව මේ වයෝවෘද්ධ වැද්දා ඌරා ගිය පාර දෙස පමණක් නොව අසල තිබුණු පඳුරු දෙස ද බලමින් ඒවා යටට එබෙමින් නැවති නැවති ගමන් කළේය. මඳක් දුර ගමන් කළ රන්දුනා පඳුරක් වෙත එබී බලා, සෙසු පිරිසට සංඥාවක් කොට දුන්න ඇද ගත්තේය. ඔවුන් සිටි තැනට යාර දහයක් පමණ ඔබ්බෙන් පහර කෑ ඌරා ඔවුන් දෙසට හැරී සැඟවී සිටියේය. තිදෙනම හී තුනක් එක විට ඌ වෙත විද්දෝය. මරණීය තුවාල ලැබූ ඌරා මරහඬ දෙමින් ඔවුන් වෙත එළවා ගෙන ආවේය. පණ බේරා ගැනීමට ඔවුනට ගස්වලට නැග ගැනීමට ඉඩ ලැබුණා පමණි. හී පහරවල් කා ලේ දමමින් එළවා ගෙන ආ ඌරා උගේ දළ කැඩී යන තරම් වේගයෙන් පෙමා නැග සිටි ගසට පහර දෙන්නට විය. ඇඟ ඇනී සැලෙන හී ගැන ද නොතකා පහර දුන් ඌරා ගේ රෞද්‍ර වික්‍රමය අවසන් වූයේ ඌ ගස මුල මැරී වැටීමෙනි.

''මූට හී පාරවල් කීයක් විද්දද!'' යි හැන්ස් කීවේය. ඔවුහු ස්වකීය හී තල ඌරා ගේ සිරුරින් ගළවා ගත්හ.

Scanned with CamScanner

''මං හිතුවා මං හිටපු ගහ ඌ ඉදිරුවා තමා කියලා'' යි හොඳට ම බිය වී සිටි පෙමා කීවේය.

''මං ඌ කල් තියා දැක්ක හින්ද හොඳා. නැත්නම් අපෙන් කවුරු හරි ඉවරයි'' රන්දුනා කීවේය. ''දැන්ම එන්ඩ මාත් එක්ක. මං ඇව්වොට හරි වැඩක් පෙන්වන්නම්කො'' යි කී රන්දුනා හැන්ස් කැටිව ආපසු යන්නට විය.

ඌරා දිව ආ පාරේ ගිය රන්දුනා එක් තැනකදී නැවතුණි. ඌරා සොයා එද්දී රන්දුනා පෙරටුව ගත්තේ මෙතැනදීය. ඉක්බිති ඔහු යළිත් ඌරා සැඟවී සිටි තැනට හැන්ස් කැටුව පැමිණියේය. ''දැක්ක ද වැඩේ?'' රන්දුනා ඇසීය.

''මොකක්ද?''

''ඌරා ආ පාර දිගේම, වට පිට තියෙන පඳුරුවලට එබිකම් නොකොට අපි ආවා නම් අපි ඔක්කොම ඉවර කරනවා ඌ. ඌරා මෙන්න මෙහෙම වට රවුමෙන් ගිහින් තියෙන්නෙ'' යි රන්දුනා අත දිගු කරමින් පෙන්නුවේය. ස්වකීය සතුරා මුළාවේ දමා, සැඟවී සිට පහර දීමට සිතූ ඌරා ඌ සැඟවී සිටි තැන පසු කොට ගොස් යළිත් ආපසු පැමිණ සැඟවී බලා සිටියේය. මේ බැව් නොදන ලේ පාර ඔස්සේ ඔවුන් දිගටම ආවා නම් ඔවුන් ලෙහෙසියෙන් ම වල් ඌරා ගේ පහරට ලක්වන්නට තිබුණි.

''තුවාල වුණු පොල්ලෙව්වා[1] කරන්නේත් ඔය දේමයි'' රන්දුනා තව දුරටත් කීවේය.

තමා පෙමාත් සමග දඩයම් කළ දවස් හැන්ස්ට සිහි විය. දිනක් කොටි දෙනකට විද්ද හැන්ස් ඇය ලුහුබඳිමින් ඇගේ ලෙණ වෙත ගියේය. ආපසු හැරී ඔහු වෙතට කඩා පැන්න කොටි දෙනට ඔහු මාරාන්තික හී පහරක් විද්දේය.

කොටි දෙන අලුත පැටවුන් වැදූ එකියක බැව් දැන ගත් හැන්ස් ලෙණ තුළට රිංගා, බෙරිහන් දෙමින් සිටි කොටි පැටවුන් දෙදෙන අත් දෙකින් එල්ලාගෙන එළියට ආවේය. උන්ගෙන් එකෙක් පුල්ලි සහිත විය. අනෙකා කළු පැහැති එකෙකි. පෙමා පුල්ලි සහිත පැටවා අල්ලා ගත්තේය. ඌ පෙමාගේ අත සපා කෑවේය. ඉන් කෝපයට පත් පෙමා කොටි පැටවා ගලක ගසා මරා දැමුවේය. එහෙත් හැන්ස් කළු පැටවා වැදි ලෙණ වෙත ගෙනවුත් ඌට දීයා යන නම තබා ඇති දැඩි කළේය. දීයා වැද්දන් විසින් කොටියාට කියන නමකි.

''රනී මේ දීයා දන්නව නම් මං මේ ඇඳගෙන ඉන්නෙ උගේ අම්මි ගේ හම බව, ඌ මොනවා හිතයි ද?'' යි දිනක් හැන්ස් රනී ගෙන් ඇසීය.

''ඌට ඒ ගාණක් නෑ'' යි රනී කීවාය.

---

1 කොටියා

# 4

# වෙද හාමුදුරුවෝ

හැන්ස් සහ රනී විල් තෙර වෙත ගොස් ආපසු ගුහාවට පැමිණ වසරක් පමණ ඉක්ම ගිය ඉක්බිති, දිනක් රන්දුනා අසනීප විය. වැදි ලෙණෙහි සිට මඳ දුරක් ඈතින් පිහිටි කන්දක වැවී තිබුණු බිම් කොහොඹ ඔහුගේ අසනීපය සඳහා හොඳ බව හැන්ස් කියා සිටියේය. මුව මස් වගයක් පුලුස්සමින් සිටි පෙමාටත් ඔහුගේ බිරියටත් රන්දුනා රැක බලා ගැනීමට භාර කළ හැන්ස් සහ රනී, බිම් කොහොඹ ගෙන ඒමට පිටත් වූහ.

කන්ද වෙත පැමිණි ඔවුහු වන ලැහැබින් ගැවසී ගත් කඳු බෑවුම් දිගේ ඉහළට නගින්නට වූහ. කඳු බෑවුම්වල මෙම කුඩා පැළෑටිය සෙවීම සඳහා ඔවුහු ඝන අකුල්වලින් සහ පර්වත විවරයන්ගෙන් ගහන කඳු බෑවුමෙහි ඇවිද්දෝය. ළං වීමට අසීරු තැනක බිම් කොහොඹ පැළ වගයක් තිබෙනු දුටු හැන්ස් එතැනට යාම සඳහා නුග මුල්වලින් වැසී ගත් ගල් කුලකට නගින්නට විය. ඒ අසලම පැටවුන් සහිත වැලහින්නක් සිටිනු ඔහුට දක්නට ලැබුණි. හැන්ස් දුටු වැලහින්න ගොරවමින් ඔහු දෙසට කඩා පැන්නේය. මෙයින් කැළඹීමට පත් වූ හැන්ස් ගල් විවරයකට ඇද වැටුණේය. විවරය තුළ කොටුවුණු හැන්ස් වෙතට ගොරවමින් කඩා පැන්න වැලහින්නත් පැටවුනුත්, ඔහුට දරුණු අන්දමින් පහර දෙන්නට වූහ. වලසුන් ගේ බිහිසුණු නිය පහරවලින් බේරීමට ඔහුට කළ හැකි වූයේ දෑතින් මුහුණ වසා ගැනීම පමණි.

රනී සිය ජීවිතය පවා නොතකා හැන්ස් සිටි තැනට පැන්නාය. ඈ කෑගසමින්, පහර කමින් සිටි හැන්ස්ටත් වලසුනටත් අතරට පැන්නාය. ''චෝ! චෝ! චෝ! චී හෙච්චා![1] චී කෙරියා! පලයව් අහකට!'' යි ඈ යටි ගිරියෙන් කෑගසමින් සිය අත තිබුණු කුඩා පොරොවෙන් වලසුන්ට පහර දෙන්නට වූවාය. ඝන ලොමින් ගහන වලසුන්ට ඇගේ කුඩා පොරොවෙන් වැදුණු පහරවලින් එතරම් වේදනාවක් නොදැනුණි. එහෙත් වලසුන් ගේ ගෙරවීම අභිභවා ඇසෙන්නට වූ රනී ගේ කට හඬට උහු බිය වූහ. ඈ වෙතට ළං වූ වලස් පැටවකුට ඈ දුන් පොරෝ පහරකින් ඌ මර හඬ දෙමින් පැන දිව්වේය.

---

1 වැලහින්න



“චෝ! චෝ! චෝ! ච් හෙච්චා! ච් කෙරියා! පලයව් අහකට!” යි රනී යටි ගිරියෙන් කෑගසමින් වලසුන්ට පහර දෙන්නට වූවාය

රනි ගේ මැදිහත් වීමෙන් වළෙන් ගොඩ ඒමට මඳ අස්වැසිල්ලක් ලද හැන්ස් වහා විවරයෙන් ගොඩට පැන ගත්තේය. ඔහු ද වලසුනට තියුණු ගල් පතුරක් ගෙන පහර දෙන්නට විය.

''රනී බොට තුවාල ද?'' හැන්ස් නොඉවසිල්ලෙන් ඇසීය.

''නෑ. ඒත් ඇච්චො ලෙයින් නැවිලා'' යි ඇ හති ලමින් කීවාය.

වලසුන් ගේ තියුණු නිය පහරවලින් හා දත් පහරවලින් මස් සහිත සම ගැළ වී ගොස් තිබුණු සිය දෑත් දෙස හැන්ස් බැලීය. ''ඒකට කමක් නෑ. මගේ මූණ වත් බේරා ගන්ට පුළුවන් වුණා නොව. බෝ හරි නිර්භීත කෙල්ලක් රනී. බෝ නොහිටින්ට මාව උන් කිතු කිතු කරදනවා'' යි හැන්ස් සිය දෑත් එකින් එක අත්ලෙන් තද කරමින් කීයේය.

එහෙත් හැන්ස් ගේ තුවාල සුළුපටු ඒවා නොවීය. අත්වල මස් ගොබ ඉරී බොහෝ යටට තුවාල වී තිබුණි. තමා ක්ලාන්ත වී ගෙන එනු දැනුණු හැන්ස් බිම හිඳ ගත්තේය. වම් අතෙහි ඉරී ගැළවී ගිය මස් වැදලිවලින් ලේ වැහීම අඩුකරන අටියෙන් ඒවා දකුණු අත්ලෙන් තද කර ගත් හැන්ස්, අනෙක් තුවාලවලට ද එසේ කරන ලෙස රනිට කීවේය. පැ බාගයක් පමණ ඔවුහු මෙසේ තුවාල තද කරමින් ලේ ගැලීම අඩු කිරීමට තැත් කළහ. අතනින් මෙතනින් කාන්දු වූ ලේ බිඳු හැර තදින් ලේ ගැලීම ඒ වනවිට නතර වී තිබුණි. එහෙත් තුවාලවලින් හැන්ස්ට බලවත් වේදනාවක් දැනුණේය.

දිගටි පළල පට්ටා වගයක් ගළවා ගෙන ඒමට රනී මෙහෙය වූ හැන්ස්, ඇගේ ද උදව් ඇතිව ඒවායින් තුවාල හොඳින් වෙළුවේය. දිග පට්ටයක් යොද ඇටය දක්වා සපා කනු ලැබූ වම් අත ඔහු කරේ එල්ලා ගත්තේය. මෙහිදී හෙදියක මෙන් රනී ඔහුට සහාය වූවාය. හැන්ස් වත්තම් කරගත් රනී සෙමින් සෙමින් කන්දෙන් පහළට බසින්නට වූවාය.

ඔවුන් ගුහාවට ගිය විට ඔත්පළව සිටි රන්දුනා හැන්ස් ගේ තුවාල දෙස බැලුවේ එක්වරකි. ඉක්බිති ඔහු පෙමා වෙත හැරුණේය. ''මේ තුවාල බොහොම බරපතලයි. අපට මේවා සනීප කරන්ට බෑ. තුවාල පැසවන්ට ඉස්සර වෙලා අපි අපේ හුදු හුරාව අර කන්ද මුදුනේ ඉන්න සාමී ළඟට ඉක්මනට අරන් යන්ඩ ඕන. කෙරියා ගේ නිය බොහොම විසයි.'' රන්දුනා සිය රෝගය අමතක වූවකු මෙන් කීවේය.

තමා ගේ අසනීපය පවා අමතක කොට දැමූ රන්දුනා තම දියණියත් පෙමාත් කැටුව, ඔවුන්ගේ ගුහාවේ සිට සැතපුම් තිහක් පමණ ඈතින් මහ වන මැද පිහිටි විශාල හුදකලා පර්වතයක් මුදුනේ ශාන්ත පරිසරයක පිහිටි ලෙණක තනිව වාසය

කළ ආරණ්‍යවාසී භික්ෂූන්වහන්සේ නමක් වෙත හැන්ස් උසුලා ගෙන ගියේය.

එදින මුළුල්ලේමත් රාත්‍රියේත් ගමන් කළ ඔවුහු යම්තම් එළිය වැටී ගෙන එද්දී කඳු පාමුලට පැමිණියහ. ඉක්බිති රනී කඳු පාමුල වෙත නවතාලූ ඔවුහු, පර්වත ප්‍රාන්තය පසෙක, පහත ජේන තෙක් මානයේ විහිදුණු මහ වන පෙතට මුහුණ ලා පිහිටි ගල් ලෙණ වැසි යෝගාවචරයන් වහන්සේ වෙත හැන්ස් ඔසවා ගෙන ගියහ. මේ ලෙණ දෙරකඩ සිටගත් අයකුට සැතපුම් ගණනාවක් ඈතට විහිදී ගිය මහා වන පෙත දිස්වන්නේය.

මේ ආරණ්‍යවාසී භික්ෂූන්වහන්සේ හැන්ස් හට අමුත්තෙක් නොවේ. ගත වූ අවදියේ එක් දිනක, ඔහු වැද්දන් සමග දඩයමේ යද්දී හිරු බැස යමින් තිබුණි. යමකු ගේ ගීතවත් ශාන්ත කට හඬක් ඇසුණු හැන්ස් මවිත වූයේය. ඒ ශාන්ත කට හඬ ඔහුට ඇසුණේ ඉතා දුරිනි. ඒ ගීතවත් කට හඬෙහි අමුතු ශාන්ත ගතියකුත් පුදුම මිහිරියාවකුත් ඇති බව ඔහුට හැඟුණි. ඔහු ඒ ගැන කුතුහලයෙන් වැද්දන් ගෙන් විමසුවේය. ඒ කට හඬ ඈත මහ වන මැද පිහිටි කන්දක හුදකලාව වාසය කරන ආරණ්‍යවාසී භික්ෂූන්වහන්සේ නමක ගේ බැව් වැද්දෝ කීහ.

ඊට මඳ කලකට පසු හෙතෙම යෝගාවචර භික්ෂූන්වහන්සේ දැක ගැනීම සඳහා කඳු මුදුනට නැංගේය. ගුරු පැහැති චීවරයක් පොරවා ගෙන සිටි මේ ශාන්ත නිහතමානී උත්තමයා කෙරෙහි හැන්ස් ගේ සිත තදින් ඇදී ගියේය. උන් වහන්සේ ද ඔහුට බලවත් කැමැත්තක් දැක්වූහ. එතැන් පටන් හැන්ස් වරින් වර එහි ගියේය. සමහර අවස්ථාවලදී ඔහු සති ගණන් ආරණ්‍යයෙහි ගත කළේය. ඒ අතර ඔහු සිංහල භාෂාව ද උන්වහන්සේ ගෙන් සෑහෙන තරම් දුරට ඉගෙන ගැනීමට සමර්ථ විය. මඳ කලෙකින් හැන්ස් උන්වහන්සේ සමග නිවැරදි සිංහලෙන් කතා කිරීමට උගත්තේය. මේ යෝගාවචර භික්ෂූන්වහන්සේ කතා කළ ශිපිල භාෂා විලාසය ඔහුට ඉතා මිහිරි විය. වැද්දන් විසින් කතා කරනු ලබන අවුල් බසත් ඔවුන්ගේ නොදැමුණු සිතිවිලිත් මීට කොතරම් වෙනස් දැයි හේ සිතීය. එහෙත් ඔහු වැද්දන් ගේ සමාගමයම ප්‍රිය කළේ, ඔහු ගේ සහජ ගති, පාණ්ඩිත්‍යයට වඩා වනයෙහි ත්‍රාසජනක වික්‍රම ක්‍රියාවන්හි ඔහු ඇලුම් කර වූ බැවිනි.

මේ භික්ෂූන්වහන්සේ කිසි දිනෙක ස්වකීය පර්වත ගුහාවෙන් පහළට නොබැස්සහ. එමෙන් ම අන් කිසිවෙක් ද උන්වහන්සේ ගේ ආරණ්‍ය සේනාසනයේ නිහැඬියාවට හා ශාන්ත බවට බාධා නොකළහ. තවුස් ලෙණට සැතපුම් පහක් පමණ ඔබ්බෙන් පිහිටි සිංහල ගමකින් උන්වහන්සේට සිවුපසය ලැබුණි. මේ

ගම වැසියෝ සතියකට දෙවරක් නවුස් ලෙණ වෙත අවුත් උන්වහන්සේට අවශ්‍ය ආහාර පාන උන්වහන්සේ ගේ නේවාසික ලෙණට පහළින් පිහිටි නවත් ලෙණක තැන්පත් කොට ගියහ. මෙතැන දී උන්වහන්සේ ස්වකීය ආහාර පාන සියතින්ම පිළියෙල කරගත්හ. උන්වහන්සේ පොරවා සිටි සිවුරත් අහර වැළඳූ පාත්‍රයත් හැරෙන්නට උන්වහන්සේ සතුව තිබුණු සම්පූර්ණ වස්තුව, මැටි බඳුන් කිහිපයකටත් ගිනි ගලකටත් සීමා විය. ලෙණ සමීපයේ පිහිටි ගැඹුරු ළිඳකින් උන්වහන්සේට අවශ්‍ය ජලය ලැබුණි. පර්වත ගර්භයෙහි සිට නිරන්තරයෙන් ම ගලන උල්පතකින් ලැබුණු පිරිසිදු සිසිල් ජලයෙන් මේ මනහර පොකුණක් බඳු ළිඳ පිරී තිබුණේය. නියං කාලයේ දී තැනිතලා වන පෙතින් කොටි වලසුන් වැනි බිහිසුණු වන මෘගයෝ උන්ගේ පිපාසය සංසිඳුවා ගැනීම පිණිස මේ පොකුණ වෙත පැමිණියහ. එහෙත් උන්ගෙන් භික්ෂූන්වහන්සේට කිසිදු අනතුරක් සිදු නොවිය. ශීත කාලයේ දී ස්වකීය මහලු සිරුර උණුසුම්ව තබා ගැනීම සඳහා ලෙණ දෙර අවුලුවා තබන ගිනි මැලය වටා සමහර දිනවල පැටවුන් සහිත වැලහින්නක් සිටින සැටි අලුයම අවදි වන උන්වහන්සේට දක්නට ලැබේ.

බොහෝ ආරණ්‍යවාසී භික්ෂූන්වහන්සේලාට මෙන් මුන්වහන්සේට ද වන ඖෂධ පිළිබඳව නිපුණත්වයක් තිබුණි. ගස් පොතුවලින් තනන ලද භාජනවල තැන්පත් කොට තුබූ බොහෝ වටිනා දුර්ලභ ඖෂධ උන්වහන්සේ වෙත තිබුණි. වන්නි රටේ අස්සක් මුල්ලක් නැර පමණක් නොව වැද්දන් අතර පවා උන්වහන්සේ ගේ දක්ෂකම පතළේය. උන්වහන්සේ වෙත සිවුපසය සැපයූ ගම්මුනට මෙයින් ඉමහත් ප්‍රයෝජන ලැබිණි. ගැමියෙක් රෝගාතුර වූ විට ගම්මු භික්ෂූන්වහන්සේ වෙත දූතයකු එවති. මේ දූතයා උන්වහන්සේ ගේ නේවාසික ලෙණට පහළින් පිහිටි ලෙණ අසලට ගොස් සංඥාවක් කරයි. එවිට උන්වහන්සේ එතැනට වඩිති. දූතයා ගෙන් රෝගියා ගේ රෝග ලක්ෂණ දැන ගන්නා උන්වහන්සේ ස්වකීය ඖෂධවලින් ඒ රෝගයට සුදුසු වූවක් දූතයාට දී එය භාවිත කරන පිළිවෙළ ද පහදා දෙති.

මේ නිහතමාන උපශාන්ත භික්ෂූන්වහන්සේ ගේ සහාය අපේක්ෂා කළ වැද්දෝ හැන්ස් ඔසවා ගෙන උන්වහන්සේ වෙත ගියහ. කඳු මුදුනට නැඟ ගත් ඔවුහු පිටාර ගලමින් තිබුණු ගල් පොකුණ අසලින් ඉතා පරිස්සමින් භික්ෂූන්වහන්සේ ගේ කුටිය වෙත ගියහ.

කලකට පසු හැන්ස් දක්නට ලැබීමෙන් භික්ෂූන්වහන්සේ ගේ වයෝවෘද්ධ උපශාන්ත මුහුණෙහි ඇති වූ සතුට ඔහු ගේ දරුණු

තුවාල දැකීමෙන් කල්පනාකාරී ස්වභාවයකට පෙරළුණි. උන්වහන්සේ තුවාල වෙළා තිබුණු රෙළ පටිටා වහා ගලවා දමා ඉතා උනන්දුවකින් තුවාල පිරික්සන්නට විය. තැවී මිරිකී ඉදිමී රත්පැහැ නැග තුබුණු තුවාල හැන්ස්ට බලවත් වේදනාවක් ගෙන දුන් බව උන්වහන්සේට වැටහුණි.

"කවදා ද ඔබට වලසුන් පහර දුන්නේ?" යි උන්වහන්සේ හැන්ස් ගෙන් ප්‍රශ්න කළේය.

"ඊයේ උදේ."

"කල් ඇතිව ඔබ මෙහි පැමිණීම බොහොම හොඳයි. තුවාල පැසවා ගෙන එන නිසා ඔබට උණත් තිබෙනවා. වාඩි වෙන්න දරුවා! බොහොම දුර ඇවිත් ඔබ විඩාවට පත්වෙලා බව මට පෙනෙනවා" යි හැන්ස් ගේ මුහුණ දෙස සානුකම්ප බැල්මක් හෙළූ භික්ෂූන්වහන්සේ කීහ.

උන්වහන්සේ වහා පැන් කළයක් උණු කොට හැන්ස් ගේ තුවාල සේදූහ. ඉක්බිති බෙහෙත් කුඩු වගයක් තුවාලවලට දමා උන්වහන්සේ ගේම සිවුරෙන් ඉරා ගත් සිවුරු පටිවලින් තුවාල වෙළූහ.

"දැන් ඉතින් ඔබ නිදගෙන විවේක ගන්ට ඕනෑ. මේ යහපත් මනුෂ්‍යයන්ට කියන්න ඔවුන් ඔබ මා වෙත කල් ඇතිව ගෙන ඊමෙන් කළේ ලොකු සේවයක් බව. ඔවුන්ට දැන් යන්න කියන්න. නැවතත් දෙසතියකින් ආපසු එන්නට කියන්න" යි හැන්ස්ට එවේලේ ප්‍රතිකාර කොට අවසන් වූ උන්වහන්සේ කීහ.

තමා වෙත ආපසු පැමිණිය යුතු කාලය සිය දෑතේ ඇඟිලිවලින් වැද්දන්ට ඇඟ වූ හැන්ස් භික්ෂූන්වහන්සේ කී දෑ ඔවුනට පහදා දුන්නේය.

"එහෙනම් අපි යන්නම් සුදු හූරා. ඉක්මනට සනීප වෙන්ට ඕනෑ" යි රන්දූනා කිවේය.

දින කීපයක් ගත විය. හැන්ස් ගේ තුවාලවල තත්ත්වය බරපතල විය. භික්ෂූන්වහන්සේ සිය දරුවකුට මෙන් හැන්ස්ට සාත්තු සප්පායම් කළහ.

භික්ෂූන්වහන්සේ වෙත තෑගි වශයෙන් මී පැණි සහ අල වර්ගත් හැන්ස් සඳහා වියළි මුව මසුත් රැගෙන වැද්දන් නැවත පැමිණෙන විට හැන්ස් ගේ උණ බැසී තිබුණි. එහෙත් ඔහු ගේ තුවාල පැසවා තිබීම නිසා ඔහු ඉතා දුර්වල වී සිටියේය.

හැන්ස් තව කලක් ප්‍රතිකාර ලබමින් තමන් වහන්සේ වෙත සිටිය යුතු බව උන්වහන්සේ වැද්දන්හට පහදා දුන්හ. බරපතල ලෙස තුවාල වී තිබුණු හැන්ස් ගේ වම් අත නැවතත් දුන්න භාවිතය සඳහා සුව කළ හැකි බව ආපසු යන්නට සමුගත් වැද්දන්

අමතා භික්ෂූන්වහන්සේ කීහ. මෙයින් ඔවුහු මහත් සැනසිල්ලක් ලදහ.

වැද්දන් ගිය නොබෝ දිනකින් හැන්ස් ඉතා ඉක්මනින් සුවය ලබන්නට පටන් ගත්තේය.

දිනක් සැන්දෑ සමයේ උන්වහන්සේ හැන්ස් ඇමතූහ. ''දරුවා, ඔබට දැන් කතා කරන්නට තරම් සුවයක් ලැබිල තියෙනවා. අවුරුදු ගණනකට පසුව නොවැ ඔබ මේ දැක්කෙ? මෙච්චර කාලයක් ඔබ කොහේ ගියාද? මොනවද කළේ?''

''ඔබවහන්සේ පුදුම වෙයි ඒ ගැන ඇහුවොත්!'' යි තම සයනයේ හිඳගත් හැන්ස් කීවේය.

''හැබෑට!''

''ඔබවහන්සේට මතකද දවසක් ද ඔබවහන්සේ මේ කන්ද මුදුනේ දී අර ඈතින් පෙනෙන කන්ද උඩරට කඳුකරයට අත දික්කරල මට කිව්වා, කවදවත් එහි යන්ට තැත් කරන්ට එපා කියල?''

''ඔව් දරුවා මට මතකයි'' යි තෙපලූ මහලු භික්ෂූන්වහන්සේ ඉතා ඕනෑකමින් හැන්ස් දෙස බලා සිටියහ.

''මං එහි ගියා.''

''මොනවා! ඔබට එහි ගොස් ආපසු එන්ට ලැබුණා?''

''ඔව්, නැත්නම් මං කොහොමද දැන් මේ ඔබවහන්සේ ඉදිරියේ ඉන්නෙ!'' යි හැන්ස් සිනාසෙමින් කීවේය.

''මට එය විශ්වාස කරන්ට බැහැ. මහලු මට ඔබ මේ විහිළු කරනවද?'' යි උන්වහන්සේ නළල රැළි නැගූහ.

''කවදවත් මං ඔබවහන්සේට විහිළු කරන්නෙ නැහැ. මාව විශ්වාස කරන්ට හාමුදුරුවනේ. මං කියන්නේ ඇත්ත'' යි හේ භික්ෂූන්වහන්සේ වෙත ආචාරශීලීව නැමුරු වෙමින් කීවේය.

''මොන දෙවියන් ගේ නාමෙටද ඔබ එහි ගියේ!''

''රජ්ජුරුවන්ගෙ අඩයක්කාරයො මාව අරන් ගියා. නැතුව මගේ ඕනකමින් නොවෙයි.''

''වෙච්ච දේ ඔක්කොම මට කියන්න බලන්න'' යි කුතුහලයට පත් උන්වහන්සේ කීහ.

Scanned with CamScanner

"ඒක බොහොම දිග කතාවක් හාමුදුරුවනේ."

"කතාව දිග වැඩි වුණත් අපට කාලය තියෙන්නෙ ඕන තරම්, කියන්න."

හැන්ස් පුරා පැ දෙකක් ම ස්වකීය ත්‍රාසජනක කතාව කියද්දී හාමුදුරුවෝ කල්පනා සහගතවත් නිශ්ශබ්දවත් එය අසා සිටියහ. "කර්ම නියාමය එහෙම තමා. කෙනෙකුගේ කර්ම විපාකය කිසිවකුට වළක්වන්ට බැහැ" යි කතාව අවසන් කළ හැන්ස් ඇමතූ හාමුදුරුවන් වහන්සේ වදාළහ.

අනතුරුව උන්වහන්සේ සෙත් පිරිත් සජ්ඣායනා කොට හැන්ස්ට සෙත් පැතූහ.

අහසේ තරු බබළමින් තිබුණි. තවුස් ලෙණ පහළින් ඈතට විහිදී තිබුණු මහ වන පෙත අහසින් වැගිරෙන පඬුවන් රැස් කැලුමින් වැසී තිබුණි. භික්ෂූන්වහන්සේ ද හැන්ස් ද නින්දට වන්හ.

පසු ද උදේ සුව වී ගෙන එන තුවාලවලට බෙහෙත් දැමීමෙන් පසු උන්වහන්සේ හැන්ස්ට කතා කළහ.

"ඔබ ඊයේ කතාවේ දී ගැස්පා පිගේරා කියා නමක් සඳහන් කළා වගේ මට මතකයි. ඔබ කිව්වේ ඔහු රාජ සේවයට බැඳිල ඉන්න වගක්ද?"

"ඔව්, මං ඒ වග කිව්වා."

"ඒ ප්‍රසිද්ධ පෘතුගීසි කපිතාන්?"

"එයා කොච්චර ප්‍රසිද්දද කියල මට කියන්න බැහැ. නමුත් ඔහු පෘතුගීසි කපිතාන් කෙනෙක් තමා."

"එයාගෙ හැඩ තිල ඔබට මතකද?"

"උසයි. හැඩි දැඩියි. තඹවන් පාටයි. ඇඟ හැම තැනම වගේ තුවාල කැලැල්."

"පුදුමයි හිතන්ටත් අමාරුයි. මා ඔහු කිසි දිනක දැක නෑ. ඒ වුණත් ඔය කියන විධියට මිනිහා ඔහු වෙන්නට ඕනෑ."

"ඇයි ඔබවහන්සේ ඒ ගැන පුදුම වෙන්නෙ?"

"ඇයි කියල අහනවා. එක කාලයක් තිබුණා ඔය කපිතාන් වරයා පණ පිටින් හෝ මරා හෝ අල්ලා දුන් කෙනෙකුට රජ

තුමා විශාල වස්තුවක් දෙනවයි කියන අණක්. ඔහු සැහැසි රණ සූරයෙක්. ඔහු අපේ මිනිසුන්ට ලොකු තර්ජනයක් වුණා. නමුත් ඔබ දැන් කියනවා ඔහු රජ්ජුරුවන්ට හිතවත්ව සේවය කරන බව. වරද කළවුන් එකෙක් නැර පළිගන්නා රජ්ජුරුවො දැන් ඔහුගේ සේවයට කැමතිලු. ඉතින් මේක කොහොමද පුදුම නොවී විශ්වාස කරන්නෙ?''

''ඔව්, එහෙම වෙන්ට පුළුවනි. නමුත් ඔහු දැන් රාජ සේවයෙ ඉන්නවා. ඔහුත්, මගේම ජාතිකයෙක් වන වැන් ස්ටියර්-වෙල්ටුත් රජ්ජුරුවන් ගේ යුද්ද හමුදව පුහුණු කරනවා. රජතුමා ගේ ආරක්ෂාවත් මේ දෙන්න බාරේ තියෙන්නෙ.''

''රජ්ජුරුවන්ට විශේෂ ආරක්ෂා වුවමනා බව නම් ඇත්තයි. වටේ ඉන්නෙ, නිතර විහ කරන්ට බලා හිටින, බලය ලබා ගන්ට හදන නිලමෙලා නොවැ.''

''මේ ඔක්කොම හාමුදුරුවො දන්නෙ කොහොමද?'' යි හැන්ස් පුදුමයෙන් ඇසුවේය.

''මා මෙහි එන්නට ඉස්සර, අවුරුදු ගණනාක්ම වාසය කළේ කන්ද උඩරට පන්සලක. මා මෙහි එන්නට කිට්ටුව තමයි රජ්ජුරුවො පෘතුගීසීන් පලවා හරින්නට ඕලන්දක්කාරයන් එක්ක රහස් ගිවිසුමක් ඇති කර ගෙන විශාල යුද්ද සේනාවක් රැස් කරලා පහත රටට ගියේ. කුඩා සේනාවකුත් සමග පැමිණි ඔය ගැස්පා කපිතාන් තැන එක් වෙල් එළියක දී රජු ගේ සේනාවට පහර දුන්නා. රජ්ජුරුවො යන්තම් ගැළවිලා කන්ද උඩ රටට පැන ගත්තා.

''එතෙකින් සෑහීමට පත් වුණේ නෑ, මේ දරදඬු කපිතාන් වරයා, කන්ද උඩ රටට ද ඇවිත් රජ්ජුරුවන්ට අභියෝග කරන්-නට පටන් ගත්තා. කන්ද උඩරටට ඇතුළු වන හැම කපොල්-ලකම රජ්ජුරුවො හේවායන් නතර කළා ඔහු අල්ලා ගන්ට. නමුත් ඔහු අහුවුණේ නැහැ. මේක රජ්ජුරුවන්ට මදිකමක් වුණා. පසුව පිගේරා පහත රට විනාශ කරන්ට පටන් ගත්තා.

''මේ එක්කම වගේ ඕලන්දක්කාරයො විශාල සේනාවකුත් සමග දකුණු වෙරළට ගොඩ බැස්සා. එවිට පෘතුගීසීන් කරපු වැඩේ, රට හැම තැනම විසිරිලා හිටිය හේවා භටයන්, කොළඹ කොටුව ආරක්ෂා කරගන්ට කොළඹට ගෙන්නා ගත්තා. මං හිතන්නෙ ඔය ගැන ඔබේ මිත්‍ර කපිතාන්වරු දෙන්නා ඔබට කියන්ට ඇති. නැද්ද?''

''වැඩි මොකුත් කිව්වෙ නැහැ. ඔවුන් තම තමන් ගැන කතා කළේ බොහොම ටිකයි. මාලිගාවෙන් පිටස්තර දේ ගැන ඔවුන් කතා කළේ නෑ.''

''ඕලන්දක්කාරයො හිතුව වගේ නොවෙයි, ඔවුන්ට පෙනි ගියා කොළඹ අල්ලා ගැනීම බොහොම අසීරු වැඩක් බව. මේ හැරෙන්නට වෙන යමක් මට කියන්ට නැහැ ඒ ගැන.

''මාස හතරක්ම ලන්දේසීන් පෘතුගීසීන්ට පහර දුන්නා. නමුත් කොටුව ඇතුළේ උන්නු පෘතුගීසීන් යටත් වුණේ නැහැ. කොටුව වටේම සතුරන් හිටිය නිසා කොටුව ඇතුළේ උන්නු පෘතුගීසීන්ට කෑම නැතුව ගියා. නොයෙක් වසංගත රෝග කොටුව තුළ පැතිරිලා බොහොම දෙනෙක් මළා. අපට ආරංචි හැටියට අන්තිමට හේවායො සියයකට වැඩිය ඉතිරි වෙලා නැහැ. ඔය ගැස්පා පිගේරා ඒ ඉතිරිවුණු අයගෙන් කෙනෙක් වෙන්නට ඕන. ඉතින් රජතුමා, ඔය ගැස්පාවයි ඔබේ ජාතිකයෙකුයි කොහොම අල්ලා ගත්තද කියා කියන්නට මා දන්නෙ නැහැ. මේ කාලේ සමාජය අවිචාර කම්වලින් පිරී ගියා. මට සමාජ ආශ්‍රයේ විසීම එපා වුණා. උඩරටින් පිට වෙලා, මගේ අවසාන කාලය භාවනා යෝගීව සාමයෙන් ගත කරන්නට මෙහි ආවා.'' කවුරුත් ටික වේලාවක් යන තුරු කිසිවක් කතා නොකොට කල්පනා කරන්නට වූහ.

''හාමුදුරුවනේ, දන් මගේ යාළු කපිතාන්වරු දෙන්නා රජු ගෙන් ගැළවීමට කාගෙවත් පිළිසරණක් නැතුව කන්දේ නුවර ජීවත්වෙනවා. මට හිතෙනවා ඔවුන්ට උදව් කරන්ට මට පුළුවන් කියල'' හැන්ස් කල්පනා සහිතව බලා සිට සෙමින් කීවේය.

''මොන මෝඩ කතාවක් ද ඒ?'' හාමුදුරුවෝ උස් ස්වරයකින් කීහ. ''ඔබ කොපමණ දුක් වින්ද ද? කන්ද උඩ රටින් ඔබ බේරිලා ආ එක මහා ආශ්චර්යයක්. ඔය වගේ සැහැසි සිතුවිලි හිතෙන් ඉවත් කොට මේ ශාන්ත වන පෙතේ සැනසීමෙන් ජීවත්වෙන්ට හිතට ගනින් දරුවා!'' යි උන්වහන්සේ ඔහුට අවවාද කළහ.

හාමුදුරුවෝ හැන්ස් ගේ තුවාල දෙස නැවතත් බැලූහ. ඔහුගේ අත සම්පූර්ණයෙන්ම සුවවන තුරු පිළිපැදිය යුතු විධි, කළ යුතු පිළියම්, උන්වහන්සේ ඔහුට විස්තර කළහ. ඔහුගේ අනෙක්

තුවාල සුවවී ඇති බවත් වියි නොවරදවා පිළියම් කිරීමෙන් අත ද සනීපවී ඉක්මනින් ගෙදර යන්නට හැකි වන බවත් උන්වහන්සේ කීහ.

සුවවී තිබුණු සිය තුවාල කැලැල් දෙස බැලූ හැන්ස්, ඒවා සුව කළ හාමුදුරුවන්ට මුව නොසෑහෙන සේ ප්‍රශංසා කළේය.

''ප්‍රශංසාව හිමිවිය යුත්තේ මට වඩා ඔබටයි'' යි හාමුදුරුවෝ හැන්ස් දෙස බලා මඳ සිනා පහළ කළහ.

මේ විශාරද වෙද හාමුදුරුවෝ වෙදකමෙහි පැතිරි නුවණ ඇත්තාහ. තුවාල සුවවීම සඳහා ස්වභාව ධර්මයා කෙතෙක් දුර බල පාන්නේ දැයි උන්වහන්සේ දන්නාහ. ස්වකීය සුළු පිළියම් හැරෙන්නට අමතර කිසිත් නොකොට හැන්ස් ගේ තුවාල ඉබේ සුව වන්නට උන්වහන්සේ ඉඩ හැරියහ.

වැද්දන් යළි ආපසු පැමිණෙන විට, හැන්ස් ඔවුන් සමග යන්නට සූදානමින් සිටියේය. මේ උපශාන්ත උත්තම පුරුෂයාණන් කෙරෙහි ස්වකීය කෘතඥතාව පළකිරීමට වචන නැතිව ගිය හැන්ස් එතුමා ගේ දෙපා වැළඳ හැඬුවේය. තමා, මේ උත්තමයා මේ මහ වන මැද පිහිටි පාළු කඳු මුදුනේ තනිකර දමා දූන් පිටත්ව යන බව හේ දත්තේය.

''ඔබ නැති මෙහි පාළුව දනෙන්නේ මටයි දරුවා'' හාමුදුරුවෝ ඔහුට යන්නට අවසර දුන්හ.

එපමණ කලක් වෙන්වී සිටීමෙන් පසු යළිත් සිය රනී වෙතට එන්නට ලැබීම ගැන හැන්ස් ප්‍රීති වූයේය. භාවනානුයෝගීන් වසන ආරණ්‍ය වාස භූමියකට ඇතුළු වීම ස්ත්‍රියකට නුසුදුසු බව සිතූ වැද්දෝ රනී තවුස් ලෙණ වෙත කැටුව නොගියෝය. රනී කෙරෙහි හැන්ස් තුළ තිබුණු ආදරය තව තවත් වැඩි විය. දූන් දෙවරක්ම රනී ඔහුගේ ජීවිතය බේරා ගෙන තිබේ. පළමු වතාව ඇගේම පියා ගෙන්ය. දෙවන වතාව රුදුරු වලසුන් ගෙන්ය.

# 5

# කපිතාන්වරු දෙදෙනා

"මට දැන් මේ මාලිගාව හොඳටම තිත්ත වෙලා. අපට මින් යන්නට ඉඩක් ලබා දෙන්නට කියල මා දෙවියන් ගෙන් ඉල්ලා සිටිනවා'' යි එඩ්මන්ට් වැන් ස්ටියර්වෙල්ට් කීවේය.

මොහු රජු ගේ රාජකාරියක් සඳහා බැහැර ගොස් දින දෙකකට පසු ආපසු නිවාසය කරා පැමිණියා පමණි. එඩ්මන්ට් වාසය කළේ ගැස්පා පිගේරා සමග එකම නිවාසයකය. තම හිස පැළඳි තොප්පිය බිත්තියෙහි සවිකොට තිබුණු ගෝන අංතට්ටුවේ තුඩකට විසි කළ එඩ්මන්ට් සිය කඩුව එල්ලා තිබුණු බඳ පටිය ගළවා දැම්මේය. හේ ඇඳ සිටි කබාය ද ගළවා දමා සිය මිතුරා අසල තිබුණු සුව පහසු ඇති කැන්වස් පුටුවෙහි දිගා වූයේය.

එඩ්මන්ට් කී දෙයට පිළිතුරු වශයෙන් ගැස්පා කිසිත් නොකීවේය. දෙදෙනා ගෙන් එක් අයකු විඩා පත්ව ආ විට ඔහුගේම කැමැත්තෙන් කතාව අරඹන තෙක්, අනෙකා නිශ්ශබ්දව සිටීම මොවුන් දෙදෙනා ගේ සිරිත වූයේය. එඩ්මන්ට් විසින් ඉතාමත් අප්‍රිය කරනු ලබන රාජකාරියක් සඳහා ගොස් ආපසු පැමිණ සිටි ඔහු අධික වෙහෙසටත් කෝපයටත් පත් වී සිටියේය. මහ රජු ගේ උදහසට ලක්වූ රදලයකු ගේ ගමකට රාජාඥ ගෙන යාමට ඔහුට නියමව තිබුණි.

''ගැස්පා'' යි සිය පයිප්පයට දුම්කොළ ටිකක් ඔබමින් කී එඩ්මන්ට් ''ඔබට මේ ජීවිතේ එපා වෙලා නැද්ද? මට මේකෙ කෙළවරක් තියෙනවා නම් තව ඉවසතැකි. අවට ලෝකයෙන් වෙන් වෙලා හැමදම අපට මෙහෙම ඉන්ට පුළුවන්ද? මං හිතන්නෙ අපේ මුළු ජීවිත කාලෙටම මෙහෙම තමා.''

''එහෙම නොවන්නට අපි ප්‍රාර්ථනා කරමු'' යි ගැස්පා කීවේය.

යළිත් කතාව නැවතු කපිතාන්වරු දෙදෙනා කල්පනාවේ නිමග්න වූහ. එඩ්මන්ට් නිශ්ශබ්දතාව බින්දේය.

''මට ඊයේ නොක්ස්'[1] කියල ඉංග්‍රීසි ජාතිකයෙක් හමුවුණා. අප වැනි අසරණ යුරෝපීය ජාතිකයන් වගේ ඔහුත් කුඩා ගමක සිරකරුවකු විදියට ජීවත් වෙනවා. ඔහු ඉන්න ගම වටේම රුදුරු වන සතුන් ගෙන් ගහන මහ කැලේ. ඔහුට එයින් පිට වෙන්න කිසිම විදියක් නැහැ.''

---

1 රොබට් නොක්ස්

Scanned with CamScanner

"අපට ටිකක් හරි නිදහස් සේවයක යෙදෙන්ට තියෙනවා. නමුත් ඒ වගේ අය කොහොම ජීවත් වෙනවා ඇත්ද?" යි ගැස්පා කීවේය.

"නිදහස් සේවයක් කරන්ට!" යි එයම ප්‍රතිරාවය කළ එඩ්මන්ට් අරුම හිනාවක් පළ කළේය. "මොකක් ද ඒ නිදහස් සේවය? අපට තියෙන මහ ලොකු නිදහස් සේවය තමා රජු ආරක්ෂා කිරීම, ඔහුගේ දරුණු ආඥා ක්‍රියාවේ යෙදීම. මේක නිදහසක් ද? ගැස්පා! තව අපි යුද සෙබලු. තව අපට සටන් කරන්ට තියෙනවා!!"

ගැස්පා ගේ මුහුණ අඳුරු පැහැයක් ගන්නා දුටු එඩ්මන්ට්ට, තමා වුවමනා පමණට වඩා කතා කළේ යයි සිතුණි. ඔහු වහා එතැනින් ඉවත් වී ගියේය. ඔවුන් ගෙන් පිටස්තර ලෝකයේ, ස්වකීය ජාතීන් දෙක එකිනෙකාට විරුද්ධව අවි අමෝරා ගෙන සිටිති. පෙරදිග පෘතුගීසි ආධිපත්‍යය ලන්දේසීන් අතට පත් වෙමින් තිබුණි. ජීවිතයත් මරණයත් අතර සත් මසක් තිස්සේ කළ සටනින් මීට අවුරුදු කිහිපයකට පෙර පෘතුගීසීන් ගේ පෙරදිග තිබූ බලගතුම කඳවුර වූ කොළඹ ලන්දේසීනට අයත් විය. මේ සටනේ දී මේ කපිතාන්වරු දෙදෙනා ස්වකීය හමුද ඔවුනොවුනට විරුද්ධව මෙහෙයවා සටන් කළහ. තමා සමග සටන් කළ සගයන් ගැන ගැස්පා තවමත් මෙනෙහි කරයි. තමන් හා එකට ලන්දේසීන්ට විරුද්ධව සටන් කොට මිය ගිය සිමන් ද බස්තෝ සහ තවමත් ජීවතුන් අතර සිටිය හැකි ඩේමියන් පියතුමා ද ඔහු ගේ හිතවත්ම මිතුරෝ වූහ.

තමා කිසිවක් සිතා නොබලා කතා කළ බව එඩ්මන්ට්ට වැටහුණි. එහෙත් ඒ ගැන දැන් කුමක් කරන්ටද? ඒ වෙනුවෙන් සමාව අයදින්ට යාම එය තවත් නරක අතට හරවන්නකි.

මාස කිහිපයකට පෙර ඔවුනොවුනට සතුරුව සටන් කළ මේ කපිතාන්වරුන් දෙදෙනා සිරකරුවන් වශයෙන් රජු ඉදිරියට ගෙන ආ අවස්ථාවේ රජතුමා ඔවුන් දෙස සෝපහාසයෙන් බලා දෙ දෙනාම එකම නිවාසයක සිර කොට තැබුවේය. ගැස්පා පෘතුගීසියෙකි. එඩ්මන්ට් ලන්දේසියෙකි. නැගෙනහිර ලෝකයේ ආධිපත්‍යය පිළිබඳ ඔවුහු ඔවුනොවුනට පරම හතුරෝ වූහ. එහෙත් මේ කපිතාන්වරුන් දෙදෙනා තම තමන් වෙත පැමිණ ඇති අභාග්‍යසම්පන්න ඉරණම සමසේ බෙදා ගෙන ඉතා කුලුපගව විසූහ.

එඩ්මන්ට් ගේ සැලුණු හිත සන්සුන් කරනු වස් ගැස්පා කතා කළේය.

Scanned with CamScanner

''ඔබ ඒ ඉංග්‍රීසි ජාතිකයා සමග කතා කළා ද?''

''අපොයි ඔව්. ඊයේ රෑ මා ගත කළේ ඔහුගේ පැලේ. හොඳ රහට මට කන්ට දුන්නා. ඔහුගේ කුකුළු පැටවුන් ගෙන් එකෙක් මරල හොඳ හොද්දකුත් හදලා තිබුණා. ඒත් මගෙ අම්මේ ඔහු හොද්දට දපු මිරිස් අහුරේ තරම! බත් කාලා පැය බාගයක්ම යන කල් මගේ ඇස් දෙකෙන් කඳුළු ගැලුවා. ඒ තරම් මිරිස්. කට දැවිල්ල උහුලන්ට බෑ.''

''වෙන මොනවද ඔහු ගැන තොරතුරු?''

''ඔහු ජීවත් වන්නේ නියම සිංහල ගැමියෙක් වගේ. දැක්ක ගමන්ම කියන්ට බෑ ඒ සුද්දෙක් කියල. අව්වට කළු වෙලා. හිස කෙස් දිගට වැවිලා. උඩුකයේ ඇඳුමක් නෑ. ඉණට ඇඳි වතක් පමණයි ඔහුගේ ඇඳුම. දවස පුරාම ඔහුගේ වැඩේ බුලත් විට හපන එක තමා. බුලත් කාල කෙළ ගහන හැටි! ආයෙ ඇරපු අතක් නෑ නියම සිංහල ගැමියෙක් වගේමයි. ඔහු යුරෝපියයෙක් ද කියල හිතන්ටවත් බැහැ. ඔහු මාව දැකලා සිංහල විදියට ආයුබෝවන් කියල ආචාර කරල, ඔහුගේ පැලට මාව එක්ක ගෙන යන කොට මං හිතුවේ ඔහු සිංහලයෙක් කියලමයි.''

''මං හිතන්නෙ මිනිහා බොහොම කාලෙක ඉඳන් ඉන්න කෙනෙක් වෙන්න ඕනෑ'' ගැස්පා කීවේය.

''ඔහු මා එක්ක කී විදියට අවුරුදු දහයක් විතර වෙනවා. මෙහෙමයි ඔහුගේ කතාව. ලංකාවේ නැගෙනහිර වෙරළේ ඔහුගේ නැව නැංගුරම්ලා නැවට කුඹ ගහක් කපන්න ඔවුන් කැලේට ඇතුල් වුණා. නැවේ කපිතාන් මිනිහ ගේ පියා. තවත් දහතර දෙනෙක් නැවේ උන්නා. කැලේදී මේ ඔක්කොම රජු ගේ හේවායන්ට අහුවෙලා රජු ළඟට ගෙන ගියා. එතකොට ඔහුගේ වයස දහ නවයයි. ඔවුන් කන්ද උඩරටට ගෙනැවිත් දවස් ගණනකට පස්සෙ ඔහුගේ පියා මිය ගියාලු.''

''මොකද ඔහු ඒ විදියට ජීවිතේ ගෙන යාම ගැන කියන්නෙ?''

''ඔහුට ඒ ජීවිතේ පුරුදු වෙලා තියෙන හැඩයි. මිනිහා ටිකක් ආගම ධර්මයට බර මිනිහෙක්. කොළඹ කොටුව වැටුණු වෙලාවේ ගෙවල් කොල්ල කන කොට සිංහල මිනිහෙකුට ලැබුණු පරණ බයිබලයක් ඔහු ළඟ තිබෙනවා. ඉන් ඔහු ලොකු සැනසිල්ලක් ලබනවා. පොත, ඔහු පාවිච්චි කරල තිබෙන විදියෙන් පෙනෙනවා, ඔහුට ඒකෙන් වැඩි හරියක් කට පාඩම් ඇති කියල. ඒ තරම්ම පොත ඇඟිලිවලට ගෙවිල ගිහින්. බයිබලේ කියමනුත් සිංහල කියමනුත් ඔහු කතා කරන ඕනෑම වේලාවක අහන්න පුළුවනි. මං පැය ගණනක් ඔහුගේ කතාවලට කන් දී ගෙන හිටියා. පස්සෙ ඔහු මට එහි රාත්‍රිය ගත කරන්ට

ආරාධනා කළා. මා එය අහක දැම්මේ නැහැ. මට එය කරන්ට බැරි දෙයක් වුණා.''

''ඔහු වෙල හොයා ගන්නෙ මොන මාරුවක් කරලද?'' ගැස්පා ඇසීය.

''ඔහුට තියෙනවා පොඩි කුඹුරක්. ඔහු ඒක ගැමියෙකුට අඳේට දීලා තියෙනවා. තවත් එකක් කරනවා ඔහු. ගැස්පා, ඔබ ඒක ඇසුවොත් හිනා වේවි. ඔහු තොප්පි වියල විකුණනවා. මිනිහා හරිම සූරයා. ඔහු ඉන්න පැල මැටි ගහලා පිදුරු හෙවිල්ලා තියෙන්නේ ඔහුමයි. ඔහුත් එක්ක ඒ පැලේ ජිවත් වෙන අනෙක් අය කවුද දන්නවද? කතා කරන මයිනෙකුයි, හූරතල් වඳුරෙකුයි. එයාම හද ගත්තු පයිප්පයක් තියෙනවා මිනිහට. ඒ පයිප්පය පත්තු කරන්ට ගිනි පෙනෙල්ලක් ගේන්ට වඳුරට කිව්වාම ඌ අගේට අරගෙන එනවා.''

''මේ ඉංග්‍රීසි ජාතිකයාට කවදා හරි ඉන් ගැළවී යන්ට ආශාවක් නැහැයි කියල ඔබ හිතනවද?''

''මං ඔහුගෙන් ඒ ගැන ඇසුවා. අප වගේ ඔහුත් එසේ යන බලාපොරොත්තුවෙන් තමයි ඉන්නෙ'' යි එඩ්මන්ට් කීවේය.

ගැස්පා නැගිට මණ්ඩ දෙකකට අරක්කු වත් කළේය. එකක් එඩ්මන්ට්ට දුන්නේය. ''මෙකෙන් ටිකක් බොන්න. අපට පෙනෙන හැටියට අපේ ඉරණම බලාපොරොත්තු සුන් වූ එකක් වෙන එකක් නැහැ'' හේ කීය.

''මීට අවුරුද්දකට ඉස්සර හැන්ස් මෙහි සිටිද්දී අපට බේරිලා යන්ට ඉඩ තිබුණා. නමුත් ඒ අවස්ථාව නැති වුණා'' යි එඩ්මන්ට් කල්පනා සහිත වෙමින් කීවේය.

''ඔව්, ඔබේ කීම හරි එඩ්මන්ට්. ඒ අරුම සිද්දිය නොවෙන්නට ඔහුගෙන් අපට උපකාර ලැබෙන්න තිබුණා'' යි ගැස්පා කීය.

දෙදෙනාම සිහිනයක් බඳුව ඒ වනයෙන් ආ අමුත්තා ගැන කල්පනාවේ නිමග්න වූහ.

''ඔහු දැන් කොහේ ඇද්ද?'' එඩ්මන්ට් සෙමින් තොල් මතුළේය.

''අප ගළවා ගෙන යන්ට එන්නට ඔහුට හිත් දෙවා වදාරන්න කියා මා දෙවියන් ගෙන් ඉල්ලනවා. ඔහුට එද මෙහිදී මුහුණ පාන්නට වුණු සිද්දිය කෙසේ වෙතත්, එවැනි අවස්ථාවක් එන කල් ඔහු උමතුවෙන් වගේ ඇති කියල මට හිතෙනවා'' යි එඩ්මන්ට් කීවේය.

''කවුද දන්නෙ ඔහු මොනවා කරයිද කියල'' ගැස්පා කීය.

# 6

## අනාථිකය

පසු ද හඟුරන්කෙත මහා උත්සවයක් විය. සිය ආරක්ෂාව වඩාත් තහවුරු කර ගනු වස් රජු දැන් හඟුරන්කෙතට වී සිටී. ගිරි දුර්ගවලින් වට වූ මෙම ස්ථානයට සතුරන්ට ලෙහෙසියෙන් පැමිණිය නොහැක. ස්වකීය ආරක්ෂාව පිළිබඳව යුරෝපීය කපිතාන්වරුන් දෙදෙනා කෙරෙහි විශ්වාසය තැබූ රජතුමා, කාපිරි මුර සෙබළුන් විසින් ද පිරිවරන ලදුව ඉතා සුරක්ෂිත ලෙස මෙහි නිශ්චල ජීවිතයක් ගත කළේය. එතරම් උත්කර්ෂවත් නොවූවත්, කන්දේ නුවර, සෑම බෞද්ධ ආගමික පෝය දිනයන්හි දී ආගමික උත්සව පැවැත්විණි. වෙසඟ පුනු පොහොය බුදුන්වහන්සේ ගේ උත්පත්තියත් බුදුවීමත් පිරිනිවීමත් සිහි පත් කරවන දිනය වේ. මෙය බෞද්ධයන් නොයෙක් පින්කම් කරන ඉතා වැදගත් දිනයකි.

මෙ දින කන්දේ නුවර විශේෂාංගයක් වූයේ මහ පෙරහරකි. පෙරහර පෙරටුවෙන් වූවෝ මග දෙපස මහ සෙනග දෙපසට කරවන කස පුපුරවන්නෝය. ඔවුන් පසු පස දර්ශනීය ඇඳුම් ආයිත්තම්වලින් සැරසී බෙර, දවුල්, තම්මැට්ටම් තාලයට නටන නළුවෝය. අනතුරුව ස්වකීය නිල ඇඳුම්වලින් සැරසී මහා තේජාන්විත ලීලාවකින් ගමන් ගත් නිලමේවරුය. මනහර ඇඳුම් ආයිත්තම්වලින් සරහන ලද දළ ඇත්තු ධාතූන්වහන්සේලා හා තවත් පූජනීය වස්තූන් ද ඔසවා ගෙන ඔවුන් අනුව ගමන් ගත්හ. ඊට පසු පසින් වූයේ සුදෝ සුදු වතින් සැරසී බුද්ධ භක්තියෙන් ඇලලී සාදුකාර දෙමින් ගමන් ගත් ස්ත්‍රී පුරුෂ ළමා ළපටි ඇතුළු මහ ජන සන්නිපාතයකි. එය අනුපමේය මහා කලා සන්දර්ශනයක් විය. මෙම උත්සවය සමස්තයක් වශයෙන් ගෙන කල්පනා කරන අයකුට එය පෙනෙන්නේ සිංහලයන් ගේ රාජත්වයත් අද්ධ්‍යාත්මික පාරිශුද්ධ්‍යයත්, දමුණු විනෝදශීලී භාවයත් එක්තැන් කළ සංකීර්ණ ප්‍රදර්ශනයක් මෙනි. මෙම උත්සවය සඳහා දිවයිනේ දස දිගින් ගලා ආ සැදැහැවතුන්ගේ පහසුව තකා මග දෙපස නානා මාදිලියේ ආපණශාලා සහ කඩ සාප්පු රාශියක් විය. පෙරහර අවසන් වූවායින් පසු මහජනකාය

Scanned with CamScanner

මේ ආපණ ශාලා හා වෙළඳ ශාලා වෙත රොක් වී තම තමන් කැමති දේ මිලයට ගත්හ. සමහරු ඒවා තුළට වී සප්පායම් වූහ.

මේ මහා ජනකාය අතර ස්වකීය මිත්‍ර අලුතලාව නිලමේ සමග ගැස්පා සහ එඩමන්ට් ද සිටියහ. අලුතලාව රාජ සභාවේ තරුණ නිලමේ කෙනෙකි. ඔවුහු මහ සෙනග දෙස බලමින් වෙළඳ සැල් අසල නවතිමින් නිදහසේ හැසුරුණාහ. එක් තැනක මිනිසුන් රාශියක් රොක් වී සිටිනු ඔවුනට දක්නට ලැබුණි. ඔවුන් එතැනට ළඟා වන විට රොක් වී සිටියවුන් ගිස් නමා ඔවුනට ආචාර කොට ඔවුනට ඒ අසලට යාම සඳහා ඇත් මැත් වූහ. සෙනග වට වී සිටියේ රොඩී නැටුමක් බැලීමටය. රොඩී ජනයා අන්ත කුලහීනයන් වශයෙන් ලාංකිකයන් විසින් සලකනු ලැබේ. නැටුමට සහභාගි වී සිටි කෙල්ලන් වෙත හෙළන එක බැල්මකින් ඔවුහු කෙරෙහි ඇති සිත් ඇද ගැනීමේ ගතිය කාහට වුවත් වැටහේ. ඔවුහු එතරම් රූපත්ය. උන්ගෙන් එකියක් පිත්තල තැටියක් සිය දබරැඟිල්ලෙහි රඳවා එය වේගයෙන් කරකවමින් ඉහළට ඇල්ලූ සැටි විස්මය ඉපදවිය. තවත් එකියක් පිත්තල බෝල කිහිපයක් කරකවා උඩ දමා ඒවා බිම පතිත නොවන සේ අහසෙහි රඳවා ගෙන සිටියාය. ඉක්බිති තවත් කෙල්ලන් කණ්ඩායමක් නැටුම ඇරඹීය. නැටුම ඇරඹෙනවාත් සමගම අලුතලාව නිලමේ කපිතාන්වරුන්ට කතා කළේය. ''මේ මහ සෙනග ගොඩේ හිට ගෙන අපට ඔව බලන්ට බැහැ. අපට නැටුම් බැලීමට තරම් තැනක් නොවෙයි මේ. අද රෑට මගේ වලව්වට එන්න. මම විශේෂ නැටුම් කණ්ඩායමක් ගෙන්වන්නම්'' යි කී අලුතලාව සිය පයිණ්ඩකාරයන් අමතා ඒ සඳහා උපදෙස් දුන්නේය.

අලුතලාව නිලමේ තමනට වූ පොරොන්දුවේ කිසියම් අමුත්තක් ඇති බව කපිතාන් වරුනට වැටහුණි. කුල භේදය ඉතා උග්‍ර ලෙස සලකන, උසස් යයි සම්මත කුලයකට අයත් අලුතලාව වැන්නකු, ඉතා පහත් කුල හීනයන් වශයෙන් සලකනු ලබන රොඩීන් ස්වකීය වලව්වට ගෙන්වන්නට අදහස් කළේ මන්දැයි කපිතාන්වරුන් දෙපොළට විසඳිය නොහැකි ප්‍රහේලිකාවක් විය. අලුතලාව වැන්නකු පාරේ ගමන් කරන විට රොඩියකු මග සිටිය හොත් ඔහු ඒ කුලීනයාට නොපෙනී සැඟවී ගත යුතුය. රොඩියකුගේ ඇසට ලක්වීම පවා කිලුටක් කොට ඔවුහු සැලකූහ.

එදින සවස ගැස්පා සහ එඩමන්ට් තුවරින් යැතපුම් කිහිපයක් ඔබ්බෙන් පිහිටි අලුතලාව නිලමේ ගේ වලව්වට ගියහ. කළු, උස මහත සිරුරක් ඇති අලුතලාව අයික ශූබ විගරණයට කැමති විනෝද කාමියෙකි. ඔහු තවත් ස්වකීය යහළුවන් දහ පහළොස් දෙනකු කැඳවා තිබුණි. එහෙත් කාන්තාවන් කිසිවෙක් ඒ අතර නොසිටියහ. පරණ අරක්කු මණ්ඩ කිහිපයක් පානය කළ ඔවුහු බත් මාලු සහිත විශාල කෑම මේසයකට වාඩි වූහ. කෑම ගෙන අවසන් වූ ඔවුහු, වලව්වට ඉදිරිපසින් පිහිටි සඳ එළියෙන් නැහැවුණු විශාල ගෘහාංගණයට මුහුණ ලා ආලින්දයේ අසුන් ගත්හ.

සංඥාවකින් පසු අසල වූ ගස් මුවාවකින් රොඩී කණ්ඩායමක් අංගණයට පැමිණියහ. කණ්ඩායමේ නායකයා, දික් වූ රැවුලක් ඇති පනස් විය ඉක්ම වූ හැඩි දැඩි පුරුෂයෙකි. ඔහු සමග ඔහුගේ බිරිය ද බෙරවායන් දෙදෙනෙක් ද නැට්වුවෝ ද තරුණ නාටිකාවන් සය දෙනෙක් ද වූහ. සොළොස් විය පටන් විසි විය අතර වූ මේ තරුණ නාටිකාවන් සියල්ලෝම ඉතා රූපත් වූහ. පෙළ ගැසී ඉදිරියට පැමිණි ඔවුහු තරමක් දුර තබා දෙකට නැමී දෙ අත් එක් කොට ආචාර කළහ.

ප්‍රථම දර්ශනය ඇරඹිණි. එය මහ බෙරහඬ අනුව පිරිමින් විසින් නටනු ලැබූ වේගවත් ගෝත්‍රික නැටුමකි. අනතුරුව වූයේ, ලයාන්විතව වැයුණු බෙර වාදනයට අනුව සිනිඳු සිහින් කය ලෙලවමින්, ගී හඬ දෙමින්, කළගෙඩි ගත් අත් ඇතිව තරුණියන් විසින් දක්වනු ලැබූ මනහර නැටුම්ය.

ඉක්බිති රොඩී නායකයා පමණක් ඉදිරියට ආවේය. ඔහු ඉතා ලයාන්විත හඬකින් ස්වකීය වර්ගයා පිළිබඳ කතා පුවත ඇතුළත් රත්නවල්ලී කාව්‍යය කියන්නට පටන් ගත්තේය. රත්නවල්ලී වූකලි නින්දිත අපරාධයක් හේතු කොට ගෙන රාජ කුලයෙන් නෙරපන ලද කුමාරිකාවකි. ඇය පිළිබඳ කතාව රත්නවල්ලී කතාව වශයෙන් හඳුන්වනු ලැබේ.

උඩු මහලෙන් බැහැපන් රත්න වල්ලියේ
සළු පළඳින්ට බැහැපන් රත්න වල්ලියේ
මුතු පළඳින්ට බැහැපන් රත්න වල්ලියේ
රොඩියට දෙන්ට බැහැපන් රත්න වල්ලියේ

අනමුල වළලු අනමුල සෙලවි සෙලවි        යේ
පාමුල ගිගිරි පාමුල සෙලවි සෙලවි        යේ
කරේ තිබුණු මුතු දෙපොටක් නොසෙලවි        යේ
සබෙ මැදට බැහැපන් රත්නවල්ලි        යේ'

ඔහුගේ ගායනය යාදින්නක් මෙන් ම හැවිල්ලක් ද විය. මහලු රොඩී ගායකයා ගේ ලයාන්විත කට හඬින් පිට වුණු මේ ශෝචනීය ගී, අසා සිටියවුන් කම්පා කරවන තරම් විය.

ගායනය අවසන් වූ පසු අලුතලාව ඇමතූ එඩමන්ඩ්, රත්න-වල්ලි කුමරිය කවරෙක් දැයි විමසීය.

''ආ ඒ කතාව කියන්ට කදිම මිනිහෙක් මෙහි ඉන්නවා'' යි නිලමේ සිය අසුනෙන් නැගිටිමින් කිවේය. ''ඔහු ලංකාවේ පමණක් නොවෙයි ඉන්දියාවේ ද පුරාවෘත්ත හා ජනකතා ගැන හොඳට දන්නා පඬිවරයෙක්. ඔහු මේ රොඩීන් කෙරෙහි දක්වන උනන්දුව නිසාමයි මා අද ඔහු මෙහාට ගෙන්නුවේ.''

ඉවතට ගිය නිලමේ මද වේලාවකින් මිටි තරබාරු සිරුරක් ඇති, විශාල දෙනෙතකින් යුත්[1] මිනිසකු කැටුව ආපසු පැමිණි-යේය. ගවරාන් නමැති දකුණු ඉන්දියානු දමිළයකු හැටියට ඔහු ඔවුනට හඳුන්වා දෙන ලදී. කපිතාන්වරුන් දෙදෙනා අතර අසුනක් ඔහුට පිළිගැන් වූ අලුතලාව, ප්‍රීතිවන අනෙක් අමුත්තන් හමුවට ගියේය. කලාතුරෙකින් කපිතාන්වරුන් දෙදෙනා විසින් අසන ලද පැනයක් දෙකක් හැරෙන්නට ගවරාන් රය කරමින් කී කතාවට ඔවුහු ඉතා ඕනෑකමින් සවන් දී සිටියහ. ගවරාන් හොඳ විද්වතෙකි. එහෙත් ඒ කතාවල ගැබ්වී තිබුණු මිථ්‍යා මත ඔහු අවිශ්වාස කළේ නැත.

''රොඩීන් ගේ පරම්පරා කතාව ඇතුළත් වෙලා තිබෙන්නේ ඔය රත්නවල්ලි කාව්‍යයෙහි තමා'' යි කියමින් හේ කතාව ඇරඹුවේය. ''මෙම කාව්‍යයෙහි එන හැටියට රොඩීන් ගේ පරම්පරාව ආරම්භ වෙලා තියෙන්නෙ පරාක්‍රමබාහු රජු ගේ දූ රත්නවල්ලි කුමරිය ගෙන්. මේ රත්නවල්ලිට මිනී මස් කෑමට දොළක් උපන්නා. මේ හේතුවෙන් රජු ඇය මාලිගාවේ කසළ ශෝධකයකුට පාවා දීලා මාලිගාවෙන් පිට මං කළා. මේ දෙදෙනා ගෙන් රොඩීන් පැවත ගෙන එන බව ඔවුන් කියනවා.

1 ඇම්. ඩී. රඝවන් ගේ Handsome Beggars, The Story of The Ceylon Rodiya

ඔවුන් සමාජයේ කොතරම් පහත් තත්ත්වයක හිටියත් ඔවුන් කල්පනා කරනවා ඔවුන්ගේ තිබෙන්නේ රාජ ලේ බව. ඔබ දෙදෙනාට දැන් ඇසුණා වගේ ඔවුන් රත්නවල්ලි කාව්‍යය ගායනා කරන්නේ බොහොම භක්තියකින්. ඔවුන්ට රත්නවල්ලී යන නම ඉතා උතුම් නමක්.

"මේ කාව්‍යයෙහි තවත් වැදගත් දේ බොහොම අඩංගු වෙලා තිබෙනවා. ආදි කල්පික දඩයක්කාර ගෝත්‍රිකයන් අතර තිබුණු පැරණි ඇදහිලි ක්‍රමයක් පිළිබඳ සාක්ෂි මීට ඇතුළත් වී තිබෙනවා. මේ කාව්‍යයෙහි රත්නවල්ලී මූර්තිමත් කර තිබෙන්නේ තෙළඹු ගසක් සිය විමානය කොට වාසය කරන දේවතාවියක් හැටියට. මේ කාව්‍යයෙහි විස්තර වන ඒ දේවතාවිය ගේ නිල්වන් කෙස් කලඹ, දීප්තිමත් සිරුර, බිහිසුණු මාලය, නර්තන විලාසය සහ මිනිස් බිලි කෙරෙහි ඇති බලවත් ආශාව, යන මේ ලක්ෂණ කිසිදු සැකයක් නැතිව, බෙන්ගාලයේ සහ කේරළයේ පුදනු ලබන කාලි දෙව්දුව හෝ එවැනිම තේජාන්විත පත්තිනි අම්මා හෝ සම්බන්ධ ඇදහිලි ක්‍රමයකට නෑකම් කියන ඒවා විය යුතුයි. පත්තිනි අම්මා, ඉන්දියාවේ සිටින දමරිකයන් විසින් ඉතා ගෞරවයෙන් පුදනු ලබන දෙව් දුවක්. මේ භයානක මිනිසුන් ඉන්දියාවේ නා නා ගෝත්‍රවලට අයත්. අවුරුද්දේ වැඩි හරියක් ඔවුන් ගත කරන්නේ සාමකාමී රැකියාවල්වල නිරත වෙලා. එහෙත් ඔවුන්ගේ රහස් සංවිධානයක් තිබෙනවා. මෙම රහස් සංවිධානය මගින් කරනු ලබන සංඥාවක් අනුව අවුරුද්දේ එක්තරා කාලයක දී කණ්ඩායම් වශයෙන් එකතුවන මේ මිනිස්සු, මග රැක සිට තවලම්, විදේශික සංචාරකයන් කොල්ල කනවා. ඊට පසු ඔවුන් ඒ වස්තුව බෙදා ගෙන මොකුත් නොදන්නා මිනිසුන් වගේ තම තමන් ගේ ගෙවල්වලට ගිහින් ඔවුන්ගේ පුරුදු රැකියාවල යෙදෙනවා.

"අපි මේ කියන රොඩී මිනිසුන් ගේ කාව්‍යයෙහි විස්තර වෙන හැටියට රත්නවල්ලී පිළිබිඹු කොට ඇත්තේ මිනිස් දුවක් හැටියටයි. එහෙත් ලේ පිපාසයෙන් පීඩිත වූ අනෙක් රත්න-වල්ලී ගේ ඡායාව එහි ගැබ් වී තිබෙනවා. කාට ද කියන්ට පුළුවන් මේ කුමරිය කාලි අම්මාගේ අවතාරයක් ද නැද්ද කියල. එසේත් නැත්නම්, සමහර විට මේ කුමරියට කාලි අම්මා ආවේශ වීමෙන් ලේ පිපාසා ඇති වෙන්ට ඇති."

Scanned with CamScanner

ස්වකීය බහුශ්‍රැතභාවය දක්වමින් කතා කරන්නට වූ ගවරාන් නා නා මිථ්‍යා විශ්වාසයන් පිළිබඳ කතා පුවත් කියන්නට පටන් ගත්තේය. එහෙත් ඔහුට වැඩි දුර කතා කරන්නට ඉඩක් නො ලැබුණි. අලුතලාව ඔවුන් වෙත පැමිණියේය. "ඔබ දෙන්නා මේ විදියට ගවරාන්ට බාර දුන්නොත් ඔබ කැමති වුවත් නො වූවත් ඔහු එළිවන තෙක් කතා කරාවි. එන්න ඔක්කොම— පොඩි අඩියක් ගහන්න" යි අලුතලාව ඔවුන් හැම කැඳවූයේය.

"රොඩීන් බොහොම දක්ෂයි මන්ත්‍ර ගුරුකම්වලට. දැන් ඇද ඇවිත් ඉන්නවා ශාස්ත්‍ර කියන්න බොහෝම දක්ෂ එකෙක්" යි ඔවුන් කැටුව ගෙතුළට යමින් සිටි අලුතලාව කීවේය.

"මං කැමතියි ශාස්ත්‍රයක් අහන්ට" යි එඩ්මන්ට් කීවේය.

"ආ මං ඒක පිළියෙල කරන්නම්. ඔක්කොටම ඉස්සර වෙලා අඩියක් ගහලා ඉඳිමුකො" අලුතලාව කීවේය.

ඔහු රොඩී නායකයා කැඳෙව්වේය. "උඹේ ගෑනි මෙහාට එවා පන්! මේ මහත්තැන්ට ශාස්ත්‍ර අහන්ට ඕනැලු." බැගෑ ගති දක්වා පසෙක සිටි රොඩී නායකයාට අලුතලාව කීවේය.

අළු පාට තියුණු නෙත් ඇති ඈ පන්සාළිස් විය පමණ වූ ගැහැනියකි.

"මහත්තයලා දෙන්නා ඔහොම ඇඳිගන්ඩ" යි කී අලුතලාව නිලමේ ආලින්දය අයිනේ අසුන් දෙකක් කපිතාන්වරුන්හට දැක්විය. බරාඳය අයිනේ පොල්තෙල් පහනක් දැල්වෙමින් තිබුණි. "මහත්තයලට ඕනැම දෙයක් ඒ ගෑනි ගෙන් ඇසිය හැකියි."

ආලින්දය අයිනෙහි තබා තිබූ අසුන් දෙක මත කපිතාන්වරුන් දෙදෙනා වාඩි වූහ. රොඩී ගැහැනිය, උස් වූ ආලින්දය අයිනේ කපිතාන්වරුනට මුහුණ ලා මිදුලෙහි සිට ගෙන සිටියාය. එඩ්මන්ට් ඇය වෙත සිය අත්ල දිගු කළේය. රොඩී ගැහැනිය ඔහු ගේ අත ස්පර්ශ නො කොට ඒ දෙස ඉතා පරීක්ෂාවෙන් බැලුවාය. ඉක්බිති ඈ ඔහුගේ අතීත ජීවිතය පිළිබඳව හැම දෙයක්ම අකුරටම කීවාය. සමහර විට කරදරකාරී අවදියක ඔහු යුද සෙබළකුව සිටීම නිසා ඇය ඒ තොරතුරු සිතින් මවා ගන්නට ඇතැයි සිතිය හැකි වුවත් ඈ විසින් අකුරටම කියන ලද සමහර අතීත සිද්ධීන් ගැන ඔහු විස්මයට පත් වූයේය. එකම අරමුණකින් යුක්තව ඈ අත බැලූ අයුරු ද ඇගේ දක්ෂකම් ගැන ඈ දැක් වූ දැඩි විශ්වාසයද ඒ කියමන් සත්‍ය සේ ඒත්තු ගැන්වීමට සමත් විය.



මිදුලෙහි සිටගෙන හුන් රොඩී ගැහැනිය වෙත එඩ්මන්ට්
සිය අත දිගු කෙළේය

Scanned with CamScanner

"උඹ මගේ අතීතය ගැන හැම දෙයක්ම අකුරටම කීවා. දැන් උඹට පුළුවන් ද මගේ අනාගතය ගැන යමක් කියන්ට ?" යි එඩ්මන්ට් බලාපොරොත්තු සහගතව ඇගෙන් ඇසීය.

"එහෙමයි අප්පෝ. මට පුළුවනි" යි ඈ බැගෑපත්ව කීවාය.

"එහෙනම් කියපන් බලන්ට මට හැමදාම මේ කඳුකරේම ඉන්ට වෙයි ද, එහෙම නැත්නම් මට මෙහෙන් යන්ට ලැබෙයි ද කියල."

ඈ ඇගේ තියුණු දෙනෙත් එඩ්මන්ට් ගේ අත්ල කොනෙහි වූ රේඛාවක් වෙත රැඳෙව්වාය. "ළඟදීම ඔබතුමාට මෙහෙන් යන්ට සිදුවන බව පේනවා. ඔබතුමා දන්නා කෙනෙක්ම ඇවිත් ඔබතුමාව එක්ක යනවා ඇති."

"ඒ ගැන උඹට හොඳටම විශ්වාස ද?" යි එඩ්මන්ට් පුදුමයෙන් ඇසීය.

"දැන් අර ඇඩුවේ බස්සෙක් බව ඇත්ත නම්, අන්න ඒ වගේම මා කී දේත් ඇත්ත."

"උඹ අර ඉස්සර වෙලා කියාපු නෝනා තවමත් මේ මහත්තයා බලාපොරොත්තුවෙන් ඉන්නව ද?" යි ගැස්පා යටින් සිනාසෙමින් ඇසුවේය.

"එහෙමයි අප්පෝ, බලාපොරොත්තුව ඉන්නවා."

ඉක්බිති ගැස්පා ද සිය අත ඇය වෙත දිගු කළේය. "මගේ ඉදිරි වාසනාව ගැනත් කියපන් බලන්ට. මගේ අතීතය මා දන්නවා. ඒ ගැන නම් ඕනැ නැහැ" යි හේ අත දිගු කරමින් කීවේය.

ගැස්පා ගේ ගොරෝසු අත්ල දෙස ප්‍රශ්නාංකයෙන් මඳ වේලාවක් බලා සිටි ඈ අනෙක් අත්ල පෙන්වන ලෙස අයැදියාය. ගැස්පා අනෙක් අත පෑවේය. මඳ වේලාවක් ඒ දෙස බලා සිටි ඈ යළිත් පළමු අත දෙසට නෙත් යොමු කළාය.

"දෙය්යෝ ඔබතුමා ගේ අත මට හොඳට බලාගන්ට මේ පාන කිට්ටුවට එන්ට අවසර."

ගැස්පා පහන වෙත කිට්ටු වුණේය. යළිත් ඈ ඔහුගේ අත දෙස විනාඩි කිහිපයක් නිශ්ශබ්දව බලා සිටියාය. අනතුරුව ඈ ගැස්පා ගේ මුහුණ දෙස කුතුහලයෙන් බැලුවාය. "අප්පෝ, ඔබතුමා ගේ අනාගතේ මට පෙනෙන්නේ නැහැ" යි ඈ කීවාය.

"උඹට මොකක් හරි දෙයක් මගේ අතින් හිතට වැදී ගිය බව මට පේනවා. උඹ ඒ දේ එළිකරන්ට කැමති නෑ වගේ නේ ද? කමක් නැහැ කියාපන්. මොනව වුණත් කියාපන්, එය කුමක් ද කියා. මේ මහත්තයත් එක්ක මට යන්ට ලැබෙයි ද?" යි ගැස්පා නොඉවසිලිමත්ව ඇසිය.

"අප්පෝ මට එය කියන්ට බැහැ" යි ඈ පිළිතුරු දුන්නාය.

"උඹ මට කියන්ටම ඕනෑ, උඹට මගේ අතින් පෙනෙන දේ" යි ගැස්පා ඇට බලකර සිටියේය.

"ඔබතුමා ගේ කැමැත්තක්. අප්පෝ, ලොකු මාරකයක් ළඟම තියෙනවා. එපමණයි මට කියන්ට පුළුවන්."

තවත් කිසිවක් ඇගෙන් දැන ගත නොහැකි බව ඔවුනට වැටහුණි.

එඩ්මන්ට් විසින් දෙන ලද කාසිය ඈ සතුටින් පිළිගත්තාය. එහෙත් ගැස්පා දුන් කාසිය ඈ භාර නොගත්තාය. ඔහුට ඇගෙන් ශාස්ත්‍රයක් නොකියවුණු නිසා ඇට එය භාරගත නොහැකි බව ඈ කීවාය.

අලුතලාව ගේ වලව්වේ සිට කපිතාන්වරුන් ගේ නවාතැනට සැතපුම් තුනක් පමණ ඇත. ඔවුන් සිය නවාතැනට පැමිණෙන විට මැදියම් රැය ද පසුවී තිබුණි. සඳ රැසින් අවට නැහැවී තිබුණි. කඳුකර ශීතල සුළඟ ඔවුන්ගේ නවාතැන තුළට ද පිවිසියේය. කපිතාන්වරු දෙදෙනා ශාස්ත්‍රකාරිය විසින් කියන ලද තීරණාත්මක වචන පිළිබඳව කතා කරන්නට වූහ. ඔවුන් දෙදෙනා ගෙන් කිසිවකු තුළ ශාස්ත්‍ර ඇසීම ගැන විශ්වාසයක් නොතිබුණි. එහෙත් රොඩී ගැහැනිය විසින් ගැස්පා පිළිබඳව කියන ලද කතාව ඔවුන් ගේ සිත් තුළ තදින්ම කාවැදී තිබුණි.

"ඔබට ඔය තියෙනවා යයි කිව්ව මාරකේ කුමක් වෙන්ට පුළුවන් ද?" එඩ්මන්ට් ඇසිය.

"කවුද දන්නෙ. මම ඕව ගණන් ගන්නෙ නැහැ" යි ගැස්පා සිය දෙවුර නටවමින් කීවේය. "ඇත්තටම ඒ ගෑනි කියපු දේවල් ඔක්කොම ඔබට විශ්වාස ද?" ගැස්පා ඇසිය.

එහෙත් ගැස්පා ළමා කාලයේ පටන් ලංකාවේ හැදුණු වැඩුණු කෙනෙකි. ඔහුට ලංකාවේ ගෝත්‍රික ජනයා ගේත් ගැමියන් ගේත් ඇදහිලි ක්‍රම හා විශ්වාසයන් පිළිබඳව වැටහීමක් තිබුණි. ගැස්පා යළිත් කතා කළේය. "එඩ්මන්ට්, ඈ ඔබට කීවා නේද ඔබ දන්නා හඳුනන කෙනෙක් ඇවිත් ඔබව එක්ක යාවී කියල? ඉතින් ඒ කවුරුයි කියල ද ඔබ හිතන්නේ?"

Scanned with CamScanner

''හැන්ස්'' යි එඩ්මන්ට් කීවේය.

''මාත් එහෙමමයි හිතුවේ'' යි ගැස්පා ඔහු හා එකඟ විය.

''නමුත් අපි දන්නෙ කොහොමද? ඔහු වන සතකු ගෙන් මැරුම් කාලා ඇති මෙලාකට'' යි එඩ්මන්ට් කීය.

''අනේ, මොකද මන්ද මට නම් එහෙම හිතෙන්නෙම නැහැ, එඩ්මන්ට්. මට ඔහු ගැන හරි පුදුමයි. අවුරුදු දහතරක කොලු-වෙක් මුහුදු බත් වුණු නැවකින් බේරිලා පාළු වෙරළකට ඇවිත් කිසිම ආයුධයක් නැතුව මහ වනයට ඇතුල් වෙලා රුදුරු වන මෘගයන් ගෙන් කිසිම අනතුරක් නැතිව ජීවත්වුණු එක ගැනමයි මං හැම වෙලාවෙම කල්පනා කරන්නෙ. මහ පුදුම දෙයක් ඒක.''

''ඒක නම් මහා ප්‍රාතිහාර්යයක්.''

''නමුත් ඒක දෛවයෙන්ම සිදුවුණ දෙයක් නොවෙයි. සිංහල කියමනක් තියෙනවා 'වාසනාව ළං වෙන්නෙ ඒකෙන් පල ගන්න සූදානම් මිනිහට කියල'. ඇත්තෙන්ම, හැන්ස් හොඳ සූර නුවණ ඇති එකෙක්. වන මෘගයන් අරක්ගත් මහ වනය ගැනයි එහි තනිවුණු කොල්ලකු ගැනයි හිතන කොට කොහොමද? එහෙත් හැන්ස්ට තිබුණා නොවැ ඔහුට හමුවන හැම අනතුරක්ම ජය ගන්නට පුළුවන් ශක්තියක්. නුවණක්.''

''ඔහුගේ වාසනාවක් තමා වැද්දන් ගේ පවුලකට එක් වෙන්න සිදු වුණ එක'' යි එඩ්මන්ට් කීවේය.

''මට හැකයි හැන්ස් අප සමග විස්තර කළ වැදි කෙල්ල ඔහුගේ බිරිය කර ගත්තා වත්ද කියල. ඔහු ඒ තරමටම ඇට කැමති බව පෙනුණා.

''මට තේරුම් ගන්ට බැරි එකම දේ තමයි එදා අර ඇතා ඔහු කෙරෙහි හැසුරුණු විදිය. ඌ කවමදාවත් කිසිම කෙනකුට අනුකම්පා කළේ නෑ. ඒ තරම් අරුමයකින් ඌ හැන්ස්ව අර ගෙන ගියේ නැත් නම් අපට ඒ ගැන ඔහුගෙන් දැන ගන්ට තිබුණා'' යි ගැස්පා විමතියෙන් කීවේය.

''ඒක නොවෙන්නම්. එදා ඒ සිද්දිය වෙච්ච හැටියට කිසිම දෙයක් දැනගන්ට වේලාවක් තිබුණායැ.''

''ඔහු දැන් හරියට දේව කතාවකට සම්බන්ධ කෙනෙක් වගේ. එඩ්මන්ට්, ඔබ ආඩම්බර විය යුතුයි ඔහු ගැන. ඔහු ඔබේ රට වැසියෙක්. ඔබේම ජාතිකයෙක්.''

''ඇත්තෙන්ම ගැස්පා මට ඔහු ගැන හරිම ආඩම්බරයි. මගේ සහෝදර ප්‍රේමය ඔහු වෙත ඇදී යනවා.'' කපිතාන්වරුන් දෙදෙනා මෙසේ කතා කරමින් අවුත් ස්වකීය නවාතැනට පිවිසෙන පඩි පෙළ දිගේ නගින්නට වූහ.

Scanned with CamScanner

# 7

# රත් සූරය

රජ අණින් බිහිසුණු මරණයකට කැපවීමට සිටි හැන්ස් ඉන් බේරී යාම ගැන ඉතා ප්‍රීතියට පත් තවත් තැනැත්තෙක් රජ මාලිගයෙහි සිටියේය. හැන්ස්, මාලිගයෙහි ගත කළ ටික කාලය තුළ දී, ඔහු විසින් නොයෙක් රාජකීය ක්‍රීඩාවන්හි දී දක්වන ලද දක්ෂතාවන් නිසා රජු ගේ ලේලිය වූ නාලිනි කුමරිය ගේ සිත් සතන් ඔහු වෙත ඇදී ගියේය. මේ සුදු තරුණයා ගේ සුරුබුහුටි ගතියෙනුත් ක්‍රීඩා කෞශල්‍යයෙනුත් වසඟයට පත් ඈ ඔහු සමග කතා කිරීමට අවස්ථාවක් ලැබෙන තෙක් පුල පුලා සිටියාය. හැන්ස් වැනි තරුණයකු ඇය කිසි දිනක දැක නැත. ඔහු ගේ ශක්තිමත් දේහය, ධෛර්යය සහ කාර්යක්ෂමතාව නිසා ඔහු අන් හැම තරුණයකුට ම වඩා හොඳින් කැපී පෙනුණේය. ඇගේ මාමණ්ඩිය වූ සිංහලේ රජු විසින් ඔහු අත් අඩංගුවට ගැනීමට පෙර ඈ ඔහු ගැන නොයෙක් විධියේ ත්‍රාසජනක කතා අසා තිබුණි. මෙ හේතුවෙන් ඈ තුළ ඔහු කෙරෙහි බලවත් ඇල්මක් හා කුතුහලයක් ඇති විය. එහෙත් මෙවැන්නකු හා හාද වීම කළ හැක්කක්ද? වල් වැදුණු ඕලන්දක්කාර තරුණයකු වූ මොහු දැන් ස්වකීය මාමණ්ඩිය ගේ සිරකරුවෙකි. එහෙත් හැන්ස් රජු අතින් මැරුම් කන්නට යනු දුටු ඇය තුළ ඔහු කෙරෙහි වූ අනුකම්පාව, ඇය තුළ රජු කෙරෙහි තිබූ බිය අභිභවා නැගී ආවේය.

දිනක් රාත්‍රියෙහි හැන්ස්, සිය සිර කුඩුවෙහි කුස ගින්නෙන් පෙළෙමින් පිපාසයෙන් පීඩා විඳිමින්, රජු ගේ අවසාන තීරණය අපේක්ෂාවෙන් සිටිය දී, හිස සිට දෙපා දක්වා වසා ගත් කවුදෝ කෙනකු එහි දෙරටුව අසලට අවුත් ඔහුට කතා කළෙන්, හැන්ස් යකඩ කූරු සවි කරන ලද සිරකූඩුවෙහි දෙර වෙත අවුත් සිට ගත්තේය. ''ඔබ රජතුමා ඉදිරියට යන විට මෙන්න මේක ඉණේ සඟවා ගෙන යන්න. එය ඔබව ආරක්ෂාකරාවි.'' ඔහු වෙත යමක් අතැතිව අත දික්කළ ඒ නාඳුනන තැනැත්තා කීවේය. එය පිරිමි කට හඬක් විය.

ඔහු කවරෙක් දැයි ඇසීමට හැන්ස් සැරසෙත්ම දෙර අසල නිදි කිරමින් සිටි කාපිරි මුර සෙබළා හදිසියෙන් අවදිව බියෙන්

Scanned with CamScanner

ගොරවා හඬ නැළිය. එකෙණෙහිම ඔහු ඉදිරියේ වෙස්වළා සිටි රුව අතුරුදහන් වූයේය.

කෝපයෙන් හා බියෙන් නැගී සිටි මුර සෙබළා වහා සිර කූඩුවෙහි දොර හැර එහි ඇතුළු විය. අඳුරේ සිර කූඩුව තුළ අතපය විහිදුවා, ඔහු, හැන්ස් එහි සිටින බව දැනී සැනසුම් සුසුමක් හෙළිය. වඩාත් සැක හැර ගැනීමට හැන්ස් අල්වා ගෙන ඔහු සිරුර අත් පා මුළුල්ල ද අත පත ගෑවේය. මෙහි දී හැන්ස් අත තිබූ යමක් සෙබළා අතට හසු විය. කෝපයට පත් මුර සෙබළා එය ඔහු අතින් උදුරා ගෙන හැන්ස්ට වේගයෙන් පහරක් ගසා සිර කූඩුවෙන් පිට වී එහි දොර'ගුල් ලෑවේය. තමා නිදි කිරමින් සිටිය දී කිසිවකු සිරගෙට ඇතුළු වී තිබෙන බවත් ඉන් ඇති විය හැකි අනිටු පලවිපාක ගැනත් සෙබළාට බිය ඇති විය. සෙබළා මේ සිද්ධිය සිය ඉහළ නිලධාරීන් වෙත දන්වා සිටියේය. සිද්ධිය සැබවක් වුව ද ඒ පිළිබඳ කළ විස්තරය ඔහු විසින්ම ගොතන ලද්දක් විය. තමා ඉතා සෙවිල්ලෙන් හැන්ස් ගේ සිර කාමරය මුර කරද්දී අවතාරයක් බඳු රුවක් ඒ දෙසට ආ බවත් එය දුටු ඔහුට සෙලවී ගත නොහැකි වූ බවත් ඔහු නිලධාරීන්ට කියා සිටියේය. ක්ෂණයකින් තමා බිය පහකර ගෙන ඉදිරියට පැන රුව බඳ අල්ලා ගත් නමුත් හිස් අහස විනා අතට හසු වන අන් කිසිවක් නොවිය. අනතුරුව තමා සිර කූඩුව තුළට වැදී හැන්ස් පරීක්ෂා කළ විට ඔහු අත තිබී උදුරා ගන්නට යෙදුණා යයි හේ රන් සුරයක් ඉදිරිපත් කළේය. තමා දුටුවේ ඉඳුරා මිනිස් රුවක් නොව අවතාරයක්ම බව ඔහුගේ කීම විය.

එය නාලිනී කුමරියට අයත් පරම්පරාගත සුරයක් බව ඔවුහු හැඳින ගත්හ. සුරය රජු වෙත ඉදිරිපත් කෙරිණි. පසු ද උදැසන මේ සිද්ධිය පිළිබඳ සියලු පවත් මාලිගය පුරා ආරංචි වීමෙන්, ඒ ගැන රජතුමා කුමන තීරණයක් ගනීදැයි සියල්ලෝම බියෙන් පසු වූහ. රාජ මාලිගයෙහි උසස් හෝ පහත් හෝ ඕනෑම කෙනකු ගේ රාජපාක්ෂික භාවය කෙරෙහි රජතුමා තුළ සැක පහළ වුවහොත් එය අවසන් වන්නේ බිහිසුණු දඬුවම් පැමිණ වීමෙන්ය.

රජතුමා ස්වකීය අදිකාරම්වරුන් දෙදෙනා කැඳවා මේ සිද්ධිය ගැන වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස අණ කළේය.

සිර කුඩුවෙහි දී හැන්ස් ගෙන් මේ ගැන ප්‍රශ්න කරන ලදුව, ඔහු කතා කිරීමට පවා නොහැකි දුර්වල තත්ත්වයක සිටින බව ඔවුනට ඇහෙව්වේය. ඔහුගෙන් මේ ගැන තොරතුරක් ලබා ගනු රිසියෙන් ඔහුට නොයෙක් තාඩන පීඩන ද කරන ලදි. එහෙත් සුරය ගැනවත් එය ඔහු අතට පත් වූ පිළිවෙළ ගැනවත් කිසිවක් නොදන්නා බව ඔහු කියා සිටියේය.

මේ අතර නාලිනීට සුරය පෙන්වා ඒ ගැන ඇගෙන් ප්‍රශ්න කරන ලදී. ඈ, සුරය ඇගේ බැව් පිළිගත්තාය. එහෙත් එය ඕලන්ද ජාතික කොලුවා ගේ සිර කුඩුවෙහි තිබී හමු වූ බව ඇසීමෙන් ඈ පුදුම වන බවක් පළ කළාය. ඔහුගේ සිර කුඩුව කොහේ තිබේදැයි කියාවත් ඈ නොදන්නීය. සුරයෙහි දම්වැල් පොට කැඩී තිබුණු නිසා රාත්‍රී නින්දට යද්දී ඈ එය ගළවා තැබූ බවත් උදේ අවදි වී බැලූ කල එය අතුරුදහන් වී තිබුණු බවත් ඈ කීවාය.

රජ නාලිනී ගේ කතාව විශ්වාස නොකළේය. රජු, දෛවඥයන් හෝ ශාස්ත්‍රකාරයන් හෝ විජ්ජාකාරයන් හෝ කෙරෙහි විශ්වාසය තැබුවත් ජප කරන ලද සුරයක් මිනිසකු ගේ සහායක් නැතිව යම්කිසි තැනකට අතුරුදහන් වීය යි කීම රජුට විශ්වාස කළ නොහැක.

මේ කියුම් කෙරුම් රජු ගේ කෝපය දෙගුණ තෙගුණ කළේය. නාලිනී ඇගේ කාමරය තුළ සිර කොට, ස්ත්‍රීන් රැකවලෙහි සිටවිය. හැන්ස් පිළිබඳ ආරක්ෂා සංවිධාන වඩාත් තර කෙරිණි.

පසු දින අලුයම එඩ්මන්ට් වැන් ස්ටියර්වෙල්ට් කපිතාන්වරයාට රජවාසල පෙනී සිටීමට අණක් ලැබුණි. අවේලාවක මෙවැනි අණක් ලැබීම ගැන හේ පුදුම විය.

ඔහු වහා රජු ඉදිරියේ පෙනී සිටියේය. කිසියම් අසුබ දෙයක් සිදු වී ඇති බව රජු ගේ මුහුණ දුටු කපිතාන්වරයාට වැටහුණි.

යටපත් කර ගත් කෝප ඇත්තේ රජ කපිතාන්වරයා ඇමතුවේය. ''එඩ්මන්ට් වැන් ස්ටියර්වෙල්ට් කපිතාන්, ඔබේ රට වැසියෙක් වූ අර වන වැදි කොල්ලා මා ඉදිරියේ එද නොහොබිනා වචන කතා කරන තෙක් මාස ගණනක් ඔබ ළඟ හිටියා. ඔහු මෙහි අවුත් ගත වූ ඒ මාස කිහිපය තුළ දී ඔහු මගේ අණට කීකරු

වීමට මැලි වූ නිසා මා ඔහු දැඩි සිර අඩස්සියට ගත් බව ඔබ දන්නෙහිය. එසේ තිබියදීත් ඊයේ රෑ ඔහු හමු වෙන්නට ඔහුගේ සිර කුඩුවට ස්ත්‍රියක් ගිය බව ඔබ දන්නෙහිද?''

කපිතාන්වරයා පුදුමයෙන් සිය දෙනෙත් අයාගෙන බලා සිටියේය.

''ඔබ කට ඇර ගෙන බලා සිටින ආකාරයෙන් මට පෙනෙනවා මේ ආරංචිය ඔබට පුදුම එකක් බව'' යි රජ කීවේය.

''එහෙමයි දේවයන් වහන්ස, මට මේක මහ පුදුමයක්. ඔහුට එතරම් ආරක්ෂා සංවිධාන යොදා තිබියදීත් මෙවැනි දෙයක් වන්නේ කොහොමද?''

''ඊට සාක්ෂි තිබෙනවා කපිතාන්!''

''එහෙනම් දේවයන් වහන්ස ඒ කොල්ලා කෙරෙහි වරද තබන්න බැහැ. එහි ගිය ස්ත්‍රිය තමා. . . .''

''නවතිනු!'' යි රජ කෝපයෙන් ගිගුරුවේය. ''තොප කතා කරන දේ ගැන පරිස්සම් වෙව! ඒ ස්ත්‍රිය අන් කිසිවකු නොව මගේ ලේලියි.''

කපිතාන්වරයා සුදුමැලි විය. ඔහු රජු ගේ දෙපා ළඟ දණ ගැසුවේය.

''වැන් ස්ටියර්වෙල්ට් කපිතාන්!'' යි රජ කපිතාන්වරයා ඇමතුවේය. ''මීට පෙර කිසි දිනක මා තොප අත වරදක් දැක නැහැ. මේ අවස්ථාවේ දීත් මා තොපගේ වරදක් කියන්නේ නැහැ. එහෙත් මේ වන වැදි කොල්ලා මෙහි ගෙනා දවසට මා ශාප කරනවා'' යි වේගයෙන් කී රජ සිය දැත් අහසට විහිදෙව්වේය. ''දැන් තොපට මෙතැනින් යන්ට පුළුවනි. මා නැවත තොප කැඳවන තෙක් මෙහි එන්ට ඕනෑ නැත.''

රජඅණට අකීකරුව රජු ඉදිරියේ වහසි බිණීම ගැනත් රාජකීයයන්ට කැලලක් කිරීම ගැනත්, විශේෂයෙන් රජු ගේ ලේලියට කැලලක් වන අන්දමින් හැසිරීම ගැනත් හැන්ස් කෙරෙහි රජු තුළ තිබූ කෝපය බුර බුරා නැංගේය. තම ලේලිය හැරෙන්නට අන් කිසිවකු මේ සිද්ධියට සම්බන්ධ වී නම් මේ පිළිබඳව රජු ගේ අනනුකම්පා තීරණය එවලේම ලැබී අවසානය. අධිකරණ සභාව කැඳවන තෙක් ඉවසා සිටියේ ස්වකීය ලේලිය මීට සම්බන්ධ නිසාය.

එදින සවස රජ රාජාධිකරණ සභාව කැඳවා ගත වූ රැයෙහි වූ ඒ රාජ ද්‍රෝහී ක්‍රියාව පිළිබඳ මහ නිලමවරුන් ගේ ද අදහස් බලා තම විනිශ්චය දුන්නේය. ඒ විනිශ්චය අනුව පසු දා උදෑසන ඕලන්ද ජාතික කොල්ලා ඇතකු ලවා පාගවා මරණයට පත් කිරීමට නියම විය.

රාජාධිකරණය ඉදිරියට ගෙන ආ හැන්ස් ඉන් ඉවතට ගෙන යන විට ඔහුට විරුද්ධව සාක්ෂි වශයෙන් ඉදිරිපත් කොට තිබුණු රන් සුරය, කුඩා විල්ලුද මෙට්ටයක් මත තිබෙනු රජු දුටුවේය. එය අඟල් දෙකක් පමණ දිගය. එහි නූලක් හෝ දම්වැලක් ඇමිණීමට මුදු දෙකක් විය. රන් සුරය එසේ අමුණා ඉණේ හෝ කරේ බැඳ ගත හැකිය. එහි තුළ තඹ කොළයේ ඇඳ ලියා ජප කළ යන්ත්‍රයක් විය. එය මහානුභාව සම්පන්න යන්ත්‍රයක් බව කාගේත් ඇදහීම විය.

"ඔහෙ හිටු!"යි රජ මුර සෙබළුනට අණ කළේය.

"අර සුරය ඔය කොල්ලා ගේ අතෙහි බඳිව්! කිසි කෙනෙකුට එය උගෙන් ගැනීම තහනම්. උගේ අවසානය දක්වා ඌ එය පැළඳිය යුතුයි. එය බොහොම මහානුභාව සම්පන්න යන්ත්‍ර-යක්ලු. අපට බලා ගන්ට පුළුවනි එහි ආනුභාවයෙන් වත් වැදි කොල්ලා රැකේවිද කියා." රජු පහළ කළේ නපුරු සිතහවකි.

යන්ත්‍රයෙහිම ආනුභාවය ඒ අරුම සිද්ධියට හේතු වී යයි සිතනු නොයෙදෙන්නේ නොවේ.

# 8

## බකුදූ නුව

අළුතලාව නිලමේ විසින් අමුත්තන් වෙනුවෙන් පවත්වන ලද රොඩී නැටුමෙන් පසු මාස කිහිපයක් ඉකුත් වී ගියේය. කපිතාන්වරුන් දෙදෙනා ගේ සාමාන්‍ය ජීවිතයෙහි කිසිදු වෙනසක් සිදු නොවීය. තවමත් ඔවුහු වෙනදා මෙන් රජු ගේ සේනා සංවිධානයෙහි හා රජ වාසල මුරකාවල් පාලනයෙහි නියුක්තව සිටිති.

එඩ්මන්ට් ස්වකීය කාමරයෙහි නිදා හුන්නේය. ඔහුගේ කාමරයට යාබදව ගැස්පා ගේ කාමරය පිහිටියේය. එඩ්මන්ට් නිදා සිටි කාමරයේ බරාඳය පැත්තේ තිබුණු දොරවල් විවෘතව තිබුණි. කපිතාන්වරුන් ගේ වාසය පිහිටා තිබුණේ මාලිගාව ඉදිරිපස පිහිටි අක්කර පහක පමණ වත්තකය. මේ වත්ත වටා විශාල ගස් වවා තිබුණි. අතුගාන්නකු විසින් අතුගා පිරිසිදුව තබන ලද ගේ වටා වූ කුඩා මිදුල හැරෙන්නට වත්තේ ඉතිරි කොටස ගස්වල කොළ වැටීමෙන් හා උසට වැඩුණු වල් පැළෑටිවලින් ගහන වීමෙන්, පාළුවට හැර තබා තිබුණු බවක් පෙනුණි. රාත්‍රි වැඩ අවසන් වීමෙන් පසු කපිතාන් වාසයේ අරක්කැමියාත් අතවැසි කොලුවාත් ඔවුනොවුන්ගේ නිවෙස් කරා පිටත්ව ගියහ. එහි ඉතිරිව සිටියේ මැලේ ජාතික සාමත් නමැති ආවතේවකාර කොලුවකු පමණි. ඔහු සඳහා ගෙයි පිටුපස කුඩා කාමරයක් වෙන් කොට තිබුණි.

මැදියම් රැයේ බල්ලකු ගේ බිරීමෙන් එඩ්මන්ට් අවදි වූයේය. ඔහුට බස්සකු හඬනු ඇසෙන්නට විය. බස්සා හඬන්නේ ගෙට මඳක් ඈතින් පිහිටි විශාල නුග රුකෙහි සිට බව එඩ්මන්ට්ට වැටහුණි. හාත්පස විහිදී අතුවලින් රුරා වැටුණු මහා මුල් වටවලින් ගහන, සෙවණින් අඳුර දුන් මේ දැවැන්ත නුගේට විශාල නාගයෙක් අරක්ගෙන සිටියේය. ඌ නිතර කපිතාන්වරුන් වසන ගෙය පිහිටි වත්තෙහි සැරිසරනු දක්නට පුළුවන. එහෙත් උගෙන් කිසිවකුට හානියක් නොවීය. මේ නුග ගසෙහි දේවතාවකු වාසය කරන බව ද බොහෝ දෙන කියති. සාමත්

Scanned with CamScanner

නමැති මැලේ කොලුවා ද නුගේට මහත් හරසර දැක්වූයේය. දිනපතා සවස නුග ගස මුල පොල් තෙල් පහනක් දැල්වීමට උයන්පල්ලා කිසි දිනක අමතක නොකළේය. ඒ පහන එහි වාසය කරන දේවතාවුන් වහන්සේ වෙනුවෙනි.

නොකඩවා හඬන්නට වූ බස්සා ගේ අමිහිරි නාදය නිසා එඩ්මන්ට්ට නිදගත නොහැකි විය. බස්සා හඬන හඬේ යම් කිසි අමුත්තක් ඇති බව ඔහුට හැඟෙන්නට විය. ඔහු ඇඳෙන් නැගිට බරාදයට පැමිණියේය. විටින් විට හද වලාකුළුවලින් වැසී ගිය නිසා ගස්වලින් ආවරණය වූ ගේ අවට වරින් වර දැඩි අඳුරකින් වැසී යමින් පැවතුණි. අහසේ තැනින් තැන තිබුණු තරු ඔහුට ගස් අතු පතර අතරින් පෙනුණේ කණාමැදිරියන් මෙනි.

වරෙක හදිසියේම බස්සා නැගූ හඬෙහි අමුතු ස්වරයක් වූයෙන් හේ තිගැස්සී නුග ගස දෙස එක්වන් නෙත් යොමා සිටියේය. ගසේ අත්තක් සෙලවෙනු ඔහුට දක්නට ලැබුණි. අතු අතරින් රූරා කිසියම් රුවක් පහතට බසින සැටි දුටු හේ තිගැස්සුණේය.

ඔහුගේ සර්වාංගයම කිළිපොලා ගියේය. නුගේට අරක්ගත් දේවතාවා පිළිබඳ කතාව ඇත්තක් වෙන්ට පුළුවන්ද? අවතාරයක් බඳු ඒ රුව ගසින් බිමට බසින තෙක් හේ බලා සිටියේය. වහා ගෙතුළට ගොස් කඩුව ගෙන එන්නට සිත් වුවද ඒ සඳහා යාමට ඔහු තුළ ධෛර්යයක් නොවීය. ඔහු සිටි තැනම ගල් ගැසී සිටියේය. රුව ගසින් බැස්සේය. එය ඔහු වෙත පා නගයි. එයින් ලැබුණේ සැක පහ කෙරෙන සංඥුවකි. දැන් රුව ඔහු සිටි තැනට යාර කිහිපයක නුදුරින් ඔහු වෙතට එමින් සිටී. එය ඔහු ළඟටම පැමිණියේය.

''එඩ්මන්ට්. . .''

''කවුද ඔබ?'' එඩ්මන්ට් බියෙන් තැති ගෙන ඇසීය.

''හැන්ස්.''

මේ මොන පුදුමයක්ද අප්පෝ! මොහොතක් ගතවිය. කතා කර ගත නොහැකි වූ ඔවුන් දෙදෙනා ඔවුනොවුන් වැළඳ ගත්හ.

''ඔබ වන සතෙක් වගේ ගඳයි'' එඩ්මන්ට්, දික් කළ අත්වලින් ඔහු උරහිස ගෙන සොලවා සිනාසෙමින් කීවේය.

''මට එයින්ම ඔබව හඳුනා ගන්ට තිබුණා. එන්න ඇතුළට. මේ රෑ දෙගොඩ හරියේ ගැස්පා ඔබ දුටුවාම හරි පුදුමවේවි. ඔහුට කවදවත් මේ වගේ පුදුමයක් නම් හමු වන එකක් නැහැ.''

ඔවුහු ගැස්පා ගේ කාමරය තුළට පිවිසියහ.

''හ්ලූ, මේ බලපන්! මේ කවුද?'' එඩ්මන්ට්, නිද සිටි ගැස්පා ගේ ඇඟ සොලවා කුද්දමින් කීවේය.

ගැස්පා බිය පත් වූවකු මෙන් නැගිට ඇඳ මත වාඩි වූයේය.

''කවුද මේ?'' යි ඔහු නිදිකිරමින් ඇසුවේය.

''අල්ලා බලපන් ගැස්පා'' යි කී එඩ්මන්ට් හැන්ස් ඔහු වෙත තල්ලු කළේය.

''මේ මොන පුදුමයක්ද! හැන්ස්! දෙයියනේ ඔබ කොහොමද මෙහි ආවේ!''

''මගේ දෙපාවලින්.''

තිදෙනම සිනාසෙන්නට වූහ.

''හා හා, ඔය තරම් හයියෙන් හිනාවෙන්ට එපා! සාමත්ට ඇහෙයි'' ගැස්පා අනතුරු ඇඟවීමක් කළේය. ඔහු බිත්තියේ ගසා තිබුණු පහන දල්වා එහි එළිය අඩු කළේය. ඉක්බිති කපිතාන්වරුන් දෙදෙනා හැන්ස් මැදි කර ගෙන ඇඳ මත වාඩි වී ඉතා සෙමින් කතා කරන්නට වූහ.

''ඇයි ඔබ මේ විදියට මෙහේ ආවේ?'' යි එඩ්මන්ට් ඇසීය.

''ඔබ දෙන්නා මාත් එක්ක යන්ට එනවා නම් ඔබ දෙන්නා මෙයින් මුදා ගෙන යන්නයි මං ආවේ.''

''මේ මොන පුදුමයක්ද!'' ගැස්පා විස්මයාකූලව කීය.

''මොනවා! දැන්මම!'' එඩ්මන්ට් කලබල විය.

''නෑ නෑ හෙට රෑ. පුළුවන් තරම් ඉක්මන් කරන එක හොඳයි. මට ඉන්න සුදුසු තැනක් නොවෙයි මේක.''

''මං එය නෑ කියන්නෙ නෑ. ඔබ මෙහි ආ එක තමයි පුදුමෙනුත් පුදුමෙ කියන්නෙ'' යි එඩ්මන්ට් කීවේය.

''ඔබට බොහොම බඩගිනි ඇති. මොනවා වත් කාලා හිටිමු ද?'' යි ගැස්පා ඇසීය.

''බඩගිනි නම් නැහැ. ඒත් හරිම තිබහයි. මං එන කොට වියළූ මුව මස් අරගෙන ආවා. ඉතුරු හරිය අර ගහ උඩ. නමුත් මගේ පුංචි කැටේ දිය ඊයේ ඉවර වුණා.''

''කොපමණ කල් ද ඔබ මෙහි ඇවිත්?'' යි එඩ්මන්ට් ඇසීය.

ඔහු ඇඳ අසල තිබුණු ගුරුලේත්තුවකින් කෝප්පයකට වතුර වත් කොට හැන්ස්ට දුන්නේය.

"ඊයේ දෙගොඩ හරියේ ඉඳන් මං මෙහේ. මං මගෙ බකුසු හඬින් ඔබව අවදිකරන්ට කල්පනා කළා. එහෙත් ඔබ දෙන්නා ගෙදර ඉන්නව ද කොහොම ද දන්නෙ නැති නිසා මං නිකම් හිටියා. ඔබ කවුරුත් නැතුව වැඩකාරයෙකු එහෙම අවදිවෙයි කියල මං සද්ද නැතුව හිටියා."

"එහෙනම් ඔබ ඊයේ අපි යන එන දිහා බලාගෙන හිටියා?"

"ඔව්, මුළු දවස පුරාම."

"ඔබ කොහොම ද මේ කඳු රටට එන්ට පාර හොයා ගත්තේ?" යි එඩ්මන්ට් ඇසීය.

"ඒක ඒ තරම් කාරියක් නොවෙයි. මං දන් වැද්දෙක් නොවැ. වැද්දෙකුට පුළුවනි ඔහු යම් තැනකට එක වතාවක් ගියොත් නැවතත් ඒ තැනටම නොවැරදීම යන්ට. ඒත් මං ආවේ එද රජ්ජුරුවන් ගෙ සෙබළුන් මාව අල්ලාගෙන ආ පාරේ නොවෙයි. වෙන පාරකින්" යි හැන්ස් කට කොනකට නඟා ගත් සිනාවකින් යුතුව කීවේය. "ඒ මීට කොච්චර කාලෙකට ඉස්සරද? කාලය මට නොදැනීම ගෙවී ගියා."

"අවුරුදු එක හමාරක් වෙනවා" යි කපිතාන්වරු ඔහුට පිළිතුරු දුන්හ.

කන්ද උඩරටට ඇතුළු වන දුර්ග කපොලු හා ගම්මාන මග හරිමින් කුඩා හා මහත් කඳු තරණය කරමින් රාත්‍රියෙහි පමණක් ගමන් කොට මෙහි පැමිණි සැටි ඔහු විස්තර කරන්නට විය. මේ විදියට කන්දේ නුවරට ළඟා වීමට ඔහුට බොහෝ දිනක් ගත විය. නුවරට ළඟා වූ ඔහුට මුර සෙබළුන් මග හැර එහි ඇතුළු වීම තද ගැටලුවක් විය. ඔහු නගරය වෙත ළඟා වූයේ රාත්‍රියෙහිය. වියලි කඳක් ඉරන විට නැගෙන කොටි හඬ වැනි හඬකින් හේ සෙබළුන් බිය ගන්වා කෙසේ හෝ මාලිගා භූමියට රිංගා ගෙන නුග ගසට නැග ගත්තේය.

"මං හිතන්නෙ ඒ නුග ගස මට ම හැදුණු ගහක්. ගහ මුල පාන දල්වන මිනිහා හැරෙන්නට කිසිම කෙනෙක් එතැනට එන්නෙ නැහැ. මං හිතන්නෙ ඒ ගහේ ඉන්න මහා නාගරාජයාට බයේ වෙන්න ඇති කවුරුත් එතැනට යන්නෙ නැත්තෙ."

"එහෙනම් ඔබ ඒ නාගයා දැකලා තියෙනවා."

"නැත්තම්. උඹත් මාත් ගජ යාළුවෝ. උගේ බෙනය තිබුණේ මං හිටිය විටපයට පාතින්. මං මගේ අල්ලට වතුර අරන් උඹට පෙව්වා."



නුගේ සිටි නාගයාට හැන්ස් සිය අත්ලෙන් වතුර පෙව්වේය

"ඒ නාගයට ඔබ වතුර පෙව්වා!" යි ගැස්පා මහත් පුදුමයෙන් ඇසීය.

"හැන්ස්ව දැන් මෙහි තියාගන්න එක හොඳ නැහැ. දැන් කතා කළා ඇති" යි එඩ්මන්ට් කෙඳුරුවේය.

කවුරුත් ඊට එකඟ වූහ. පසු ද රාත්‍රියෙහි පලා යන මානය ඔවුහු කතා කර ගත්හ.

"අපි මීට සැතපුම් තුනකට පමණ ඔබ්බෙහි තියෙන හන්දියේ දී ඔබව හමු වෙන්ට එන්නම්. ඒ හන්දිය. . ."

"අපොයි එඩ්මන්ට් එහෙම කරන්ට බැහැ. මං ඒ ගැන ඔක්කොම සිතලා ඉවරයි. අප තුන් දෙනා එක්වම මෙහෙන් පිටත් වෙන්නට ඕනැ. මා ඔබලා අරන් යන ඉසව්ව කිසිම කෙනෙක් දන්නේ නැහැ. කාටවත් හිතන්නවත් බැහැ ඒක. ඔබ දෙන්නටත් බොහොම අමාරු වෙයි ඒ මඟ නැග යාම."

"කොහෙන් ද ඒ මඟ වැටී තියෙන්නෙ?" යි එඩ්මන්ට් ඇසුවේය.

"මාලිගය පිටි පස්සේ තියෙන ගල් කුළ නැගල එහා පැත්තට බහින්නට ඕනැ."

"වල් බළලෙකුට හැරෙන්නට ඒක නගින්නට පුළුවන් කාටද?"

"මොන තරම් නිර්භීත හිතක්ද! ඔබ හැරෙන්නට වෙන කිසිම කෙනෙක් ඔය ගැන හිතන්නේවත් නැහැ" යි ගැස්පා කීවේය.

"මාත් ඕනැ තැන දී උදව් දෙන්නම්. ඔබට ඔය ගල් කුළ නගින්නට බැරි වෙන එකක් නැහැ" යි හැන්ස් කීවේය. "වුවමනා නැති කෑම, මඟ ආම්පන්න එහෙම, මොකුත් ගන්ට එපා! තුවක්කු පිස්තෝල මොකුත් ඕනැ නැහැ. ඒව ගමනට බාධයි. මට අන්න අර මලයානු කිරිච්චිය කොහොම හරි ගේන්නට ඕනැ."

"ආ ඒක සාමත් ඔබට දේවි; ඔහු නොදැනුවත්වම සිහිවටනයක් වශයෙන්" යි ගැස්පා ඔලොක්කුවට සිනාසුණේය.

"කොහොමද මුර සෙබළුන් ගෙන් බේරිලා යන්නෙ? ඔවුන් හැම තැනම මුරකාවල් ගෙන ඉන්නව නොවැ."

"ඒ ගැන මං බලා ගන්නම්. මං මෙහාට එද්දී කළ වැඩේ කළාම හරි. හොර කොටි යුවළක් වගේ ගොරවන එක විතරයි."

පලා යන අයුරු මෙසේ නිරණය කරගෙන හැන්ස් මහ නුගයට නැග ගත්තේය. එහෙත් වැඩි වේලාවක් ඔහුට එහි නිශ්කලංකව ඉන්නට හැකි වූයේ නැත.

මාලිගයෙහි කාන්තාවන් ගේ සයනාගාරයෙහි කාමරයක නිදි සිටි නාලිනී කුමරියට ද නුගේ දෙසින් එන බකුසු හඬ සිහිනෙන් මෙන් ඇසුණි. ඈ ඊට කන්දී ගෙන ඇඳෙහි වැතිර සිටියාය.

බස්සා ගේ හැඬීම නැවතත් ඇසෙන්නට විය. ඈට ද එහි අමුත්තක් තිබෙන බව හැඟුණි. කුමක් දෝ හෝයි කිව නොහැකි කිසියම් බන්ධනයකින් ඈ සිත් බකුසු හඬට ඇදෙන්නේය. ඇගේ පපුව ගැහෙන්නට විය. එළියට අවුත් නුග ගස දෙස බැලීමට ඈට සිත් විය. ඈ නිසලව ඇඳෙන් නැගිට කාමරයෙන් පිටවී සඳලු තලයට පැමිණියාය. සඳ එළියෙන් තැනින් තැන හොඳින් ආලෝක වී තිබුණි. රජවාසල වටා තිබුණු උයනත් එහි තාප්පයෙන් එහා පාරෙන් අනෙක් පැත්තේ පිහිටි කපිතාන් නිවාසය අසල වූ මහ නුග රුකේ අතු පතරත් ඈට හොඳට පෙනුණි. ජේන තෙක් මානයේ පිහිටි එකම විශාල වෘක්ෂය මේ නුග රුක විය. බස්සා ගේ හැඬීම නිකුත් වන්නේ නුග රුක වෙතින්ම බව ඈට වැටහුණි.

ඈ ඒ දෙස පරික්ෂාවෙන් බලා සිටියාය. යම් කිසිවකු නුග අතු දිගේ බඩගානා බව ඈට පෙනුණි. ඒ දිවියකු බඳු විශාල සතකු විය හැකි ද මේ නුග අත්තේ ඇදෙන්නේ?

වලාකුළකට මුවා වී තිබුණු හඳ ඉන් මිදී ආලෝක ධාරාවක් එව්වේය. සත්ව රූපය ඈට හොඳින් පෙනුණේය. ඒ එළලුවන් සිරුර ඇති මිනිස් රුවකි. ගස් නැගීමෙහි රුසි හැඩි දැඩි පුරුෂයෙකි. ඔහු ගස් නැග කෑ ගසා නොයෙක් සතුන් මුළා කරන හැටි දැන් ඈට සිහි විය. දැන් ඇගේ හද සුළඟේ වැනෙන දළුවක් මෙන් සැලෙන්නේය. ඈට ඔහු ගේ තඹවන් සෝබන හිස කෙස් ද පෙනෙන්නාක් මෙනි. ආං! ඒ රුව නුග කොළ අතරේ නොපෙනී ගියේය.

ඈ සිය අතින් නෙත් පිස ද මුව වසා ගත්තාය. ඈ දන්නා එවැනි සිරුරක් ඇති වූයේ එක් කෙනකුට පමණි. කාලයකට පෙර ඔහු මාලිගයේ සිරකරුවකු වශයෙන් සිටිනු ඈට මතකය.

ඈ වහා සිය යෙහෙළි සුජාතා ගේ නිදි යහන වෙත ගොස් ඈ අවදි කළාය.

"සුජා! සුජා! සුජාතා! නැගිටින්න! නැගිටින්න!" ඈ තොල් මතුළාය.

සුජාතා නිදිමතින් ඒ මේ අත පෙරළුණාය. ''මොකද නාලිනී? මට නිදාගන්න ඉඩ හරින්නකෝ.''

''සුජාතා මෙහෙ එන්නකෝ. ඔබට යමක් පෙන්වන්න'' යි ඈ කලබල ගතියකින් කීවාය. ඈ සුජාතා කැටුව සඳලු තලය වෙතට ආවාය.

''ඔබට පේනවා ද අර කපිතාන් ගෙය ළඟ තියෙන මහ නුගේ?''

''කියන්න ඕනෑ ද? ඔබ මා අවදි කළේ ඕක පෙන්වන්නට ද?'' යි සුජාතා නිදිකිරමින් ඇනුවාය.

''අර අර දකුණු පැත්තෙ තියෙන අත්ත දිහා බලා ඉන්න. හොඳට බලා ඉන්න. ඔයාට එහි යමක් පෙනෙනවාද?''

''කෝ, මොකුත් පෙනෙන්නේ නැහැ. ආ ආ ඉන්න! ඉන්න! මොකක්ද සෙලවුණා මොකක්ද ඒ නාලිනී?'' යි කී සුජාතා බියෙන් තැති ගැත්තියක මෙන් බලා සිටියාය.

''ඔබට මතකද අර ඕලන්ද ජාතික තරුණයා, හැන්ස්?''

සුජාතා නාලිනී ගේ අත වැරෙන් අල්ලා ගත්තාය. ''අනේ කුමරි, ඔහුගේ නමවත් සඳහන් කරන්ට එපා මේ මාලිගාව ඇතුළේ. දෙවියෝ බලා ගනිවි ඔහු නැවතත් මෙහි නොඑන්ට.''

''මම හඳ එළියට දක්ක හැටියට ඒ නම් ඔහු තමා. ඔහුගේ එළලුවන් යොවුන් සිරුර තඹවන් හිස කෙස් මට පෙනුණාමයි වගේ. ඔහු අත්තක් උඩ ඉඳලා තවත් අත්තකට මාරු වුණා ඒ වෙලාවේ'' යි නාලිනී දිග සුසුමක් හෙළුවාය.

සුජාතා නාලිනී දෙස රවා ගෙන සිටියාය. ''කුමරිය, ඔබ කියන දේ ඇත්ත නම් අපට නැවතත් කරදර වේවි. ඒත් මං හිතන්නෙ නැහැ ඒ ඔහුයි කියල.''

ටික වේලාවකට ඔවුන් ගෙන් එකියක්වත් කතා නොකළාය.

''මම යනවා එතැනට ඒ ඔහුද කියල බලන්ට.''

සුජාතා ගැහෙන්නට පටන් ගත්තාය. ''කුමරිය මොනවද ඔබ මේ දොඩවන්නේ? ඔබේ මාමණ්ඩි මේ ගැන දැන ගත්තොත් ඔබ මරාවි. රජතුමා අල්ලා ගෙන එන්ට අණ කළ සුදු ගෝනා ඔය හැන්ස් තමා මුඳු හැරියේ. අන්තිමට රජතුමා ගේ ඇතාත් අරගෙන ඔහු වල් වැදුණා. රජතුමා එවේලේ ඒ වළක්වාලීමට උත්සාහ නොගත්ත බව ඇත්ත. නමුත් අපි දන්නවා නොව ඔබේ මාමණ්ඩි ගේ හැටි. කුමරිය මේ පිස්සු වැඩ කරන්න එපා. අනේ වදින්නම්. . .''

''මට කියන්න එපා සුජාතා. මා එහි යන්නට ඕනෑ. මා තීරණය කරලා ඉවරයි. මා ඔහු හමුවීමට යා යුතුමයි'' යි කී නාලිනි වහ වහා ඇඳුමක් ඇඟ ලාගන්නට වූවාය.

''අනේ අම්මෝ, මොකද ඔබ මේ කරන්ට හදන්නේ? ඔබ පණ නහගන්න නේද ඔය හදන්නෙ! ටිකක් කල්පනා කරන්න කො!''

නාලිනි හා සුජාතා මේ ගැන නොයෙක් අයුරින් කතා කළහ.

හැන්ස් ගසින් බැස කපිතාන් මැදුර වෙත ගොස් ආපසු නුග ගසට ආ විට ඔහු හමුවීමට යන්නට නාලිනි තීරණය කළාය. සුජාතා අකමැත්තෙන් ඊට එකඟ වූවාය. ඔවුහු, හැන්ස් කපිතාන් මැදුරේ සිට ආපසු එන තෙක් බලා සිටියහ.

නාලිනි ඇගේ යෙහෙළිය ගේ මුව ගෙන සිඹිබාය. ''මා එහි ගියාම කවුරුත් ආවොත් මොනව හරි කියල වසන්ගන්න එකයි ඔබට තියෙන කාරිය'' යි නාලිනි කීවාය. ''මම හොඳට පරිස්සම් වෙන්නම්. මාව කවුරුත් දැක්කොත් ඒ මගේ කරුමෙට තමා. ඒක වළක්වන්ට කාටවත් බැහැ. මා කිසි දෙයකට බය නැහැ. මා ඔහු හමු වී කතා කළ යුතුමයි. මොහොතක් වත් ඔහු සමග කතා කළ යුතුයි. මාස ගණනක් ඔහු මෙහි සිටියා. නමුත් මට ඔහු සමග කතා කරන්නට බැරි වුණා. මට ඕනෑ ඔහු මෙහි ආවේ ඇයි ද කියා දැන ගන්නට'' යි ඇ කිසියම් ත්‍රාසජනක ක්‍රියාවකට සැරසෙන්නියක මෙන් කීවාය.

ඔසරි පොටින් සිය හිස ආවරණය කරගත් නාලිනි පඩි පෙළ දිගේ උඩු මහලින් පහළට බසින්නට වූවාය. මුව දෙනක මෙන් ඇ පරික්ෂාකාරී වූවාය.

මාලිගා පරිසරය මුළුල්ලේම නිසලතාව පැතිර තිබුණි. නාලිනි මාලිගය වටා තිබුණු තාප්පය අසල පිහිටි විශාල වෘක්ෂයක් වෙත ගියාය. එහි අතු ඉති ඉතා පහතට නැමී තිබුණි. ඇට මේ ගස හොඳට පුරුදුය. මාලිගා භූමියෙන් ඉවත යාමට වුවමනා වූ විට ඇ සුජාතාත් සමග මේ ගසට නැඟ තාප්පයෙන් අනෙක් පැත්තට පනියි. මෙහි දී ද ඇ ඉතා පහසුවෙන් පවුරෙන් පැන ගත්තාය.

කවුරුන් විසින් හෝ දකිනු ලැබේදෝයි යන මර බියෙන් ඇ තාප්පය අයින දිගේම ගමන් කොට පාර වෙතට ඇදුණාය. තාප්පය අයිනේ මුවා වී සිට ගත් ඇ යමකු ඇත්දැයි පාර දෙපස සෝදිසියෙන් බැලුවාය. කිසිවකු නොදුටු ඇ වහා පාර හරහා පැන කපිතාන් වාසය පිහිටි වත්තට රිංගා ගත්තාය.

Scanned with CamScanner

වන්නට පැන ගත් පසු කිසිවකුට ඇය නොපෙනෙනු ඇතැයි ඈ සිතුවාය. එහෙත් ඈ තුළින් අමුතු බියක් හටගන්නට විය. දවැන්ත නුග රුක මුල තවමත් පොල් තෙල් පහන දල්වෙමින් ඇත. එහි මන්දාලෝකයත්, ගස වසා සිටි අඳුරු ගතියත්, නුග ගස ගැන ඈ තුළ වූ සංකීර්ණ හැඟුමත් ඈ තුළ අමුතු බියක් ජනිත කළේය. මේ දවැන්ත නුග රුක දේවතා විමානයක් බව ඈ දැන සිටියාය. ඇගේ හද ගැහෙන්නට විය. ඈ නැවති කල්පනා කරන්නට වූවාය. තමා නින්දෙන් පිබිදීමෙන් පසු තමා තුළ වූ කිසියම් මානසික විපර්යාසයකින් ගස උඩ යමකු සිටින්නා සේ තමාට පෙනුණාවත්ද යි ඇට සිතුණි. කෙසේ වුවද තමා දැන් නුගේ අසලටම අවුත් ඇති හෙයින් නිකම්ම ආපසු යා යුතු නොවේ. ඈ කපිතාන් වාසයට මුවා වී නුග ගස වෙත බියෙන් සැලෙමින් ළංවූවාය. ගස මුලට ගොස් නැවතුණු ඇගේ මුළු සිරුරම ගැහෙන්නට විය. ඈ ගැහෙන හදින් යුතුව ගස උඩට දෙනෙත් යොමු කළාය.

''හැන්ස්!'' යි ඈ කොඳුළාය.

අතුපතර අතර පැවැති නිසලතාව විනා කිසිදු හැලහොල්මනක් නොවීය.

''හැන්ස්!''

අතු සෙලවෙන ශබ්දයක් තම දෙසවන වැටුණේද? නැවතත් ඈ කතා කළාය. ''හැන්ස් මා දන්නවා ඔබ මෙහෙ ඉන්න බව. එන්න පහළට බය වෙන්ට කිසිත් නැහැ.''

මේ වර යමෙක් ගස උඩ සිට ඉක්මනින් පහළට බසිනු ඇසුණි. හැන්ස් ගේ උත්තුංග ශක්තිමත් රූපකාය නාලිනී ඉදිරියේ සිට ගත්තේය. ඈ මීට බොහෝ කාලයකට පෙර හැන්ස් දුටු අන්දමටම ඔහු කොට් සමක් ඇඳ ගෙන සිටියේය. තමා දෙස බලා සිටින හැන්ස් ගේ දෙනෙතෙහි ප්‍රහේලිකාත්මක හැඟීම් පිළිබිඹුවී ඇති බැව් ඇට පෙනුණි.

''ඔබට මා මතක නැද්ද?'' යි ඈ ඇසුවාය.

හැන්ස් ගේ අතෙහි බැඳ තිබුණු සුරය ඈ ඇල්ලුවාය. ''ඔබට මේ සුරය එව්වේ මමයි. මට හරිම සතුටක් ඔබ එය තවමත් පැළඳගෙන ඉන්න එක.''

''මේක ඔබේ එකක්ද?'' යි ඔහු පුදුමයෙන් ඇසීය. ''ඉන් මගේ වාසනාව උදවුණා.''

''ඔබ මාලිගාවේ බොහොම කාලයක් සිර කොට සිටියත් මට ඔබ සමග කතා කරන්ට බැරි වුණා. මා රජතුමා ගේ ලේලි. මගේ නම නාලිනී. මා දන්නවා ඔබේ නම හැන්ස් බව.''

''ඔබ කොහොමද දැන ගත්තේ මා මෙහේ ඉන්න විත්තිය ?'' හැන්ස් කැළඹිලි ස්වභාවයකින් ඇසුවේය.

''මට ඊයේ රෑ නින්ද ගියේ නැහැ. නිතරම වගේ බස්සෙක් හඬන්ට පටන් ගත්තා. මේ ගහ පැත්තෙනුයි ඒ හඬ ඇසුණේ. මා සඳලු තලයට ඇවිත් මේ ගහ දිහා බලා සිටියා. එවිට මා හඳ එළියෙන් දැක්ක ඔබේ අවතාරය. ඔබේ ඔය ලස්සණ සිරුර, රන්වන් හිස කෙස් මට හිතේ මැවී පෙනුණා.''

හැන්ස් මඳක් කම්පා වී සිනාසුණේය. ''මගේ හිස කෙස්වලට මොනවා හරි කරන්ට ඕනෑ. මං මේ වන තෙක් හිතා හිටියේ බැද්දෙ දූවිල්ල වැදී ඒවා කළු වෙලා ඇති කියල.''

''හැන්ස් ඔබ මට තව කිව්වේ නැහැ නොවැ ඔබ මොකද මෙහේ කරන්නෙ කියල!'' යි ඈ සැකයෙන් නොඉවසිලිමත්ව ඇසුවාය. ''ඇයි ඔබ දන්නෙ නැද්ද ඔබ මෙහි සිටීමෙන් ඔබේ ජීවිතේ අනතුරේ බව ?''

''මා මෙහි ඉන්නෙ කුමට ද කියා ඔබ දැන නොගන්නවා නම් වඩා හොඳයි කියල මා හිතනවා'' යි හැන්ස් කීය.

''හා හොඳයි. මා මෙහි ආවේ ඔබට ඉක්මනට මෙහෙන් යන්ට කියන්ටයි. මගේ මාමණ්ඩි ගේ ජීවිතේටම ඔබ වැනි කෙනෙක් මුණ ගැහිලා නැහැ. ඔබ පමණයි ඔහුගේ අණට අකීකරු වුණු එකම තැනැත්තා.''

''එහෙනම් ඔබත් මා සමග කතා කරන හැම මොහොතකම අනතුරේ ඉන්නෙ'' යි හැන්ස් කීවේය.

''මාමණ්ඩි ඒ රාජද්‍රෝහි ක්‍රියාවක් හැටියට සලකාවි. ඒකට කමක් නැහැ. මා එනවා කවුරුත් දුටුවේ නැහැ.''

''ඉක්මනට ආපසු යන්න! ඔබ මා දුටු බව අමතක කර දමන්න. මා වැඩි වේලාවක් මෙහි ඉන්නේ නැහැ'' යි හැන්ස් කීය.

''ඔබ වෙනුවෙන් මට කරන්ට පුළුවන් උදව්වක් එහෙම තියෙනවද ? ඔබට කන්නට කෑම තියෙනවද ?''

''මං වනයෙන් එන කොට වියලි මස් ගෙනාවා. යන්න නාලිනි! යන්න! ඉක්මනට යන්න! හඳ වැහිල තියෙන වෙලාවෙ යන්න. අපි හුඟක් වේලා කතා කළා. හෙට අනිද්ද මොන මොනවා වුණත් ඔබ ඒ ගැන කිසිම දෙයක් නොදන්නා වගේ ඉන්න. කිසිම කෙනකුට මා ගැන වචනයක් වත් කියන්න එපා! ඔබේ ආරක්ෂාවටයි මං මේ කියන්නේ.''

''ඔබට ඕනෑද මේ සුරය ආපසු?'' හැන්ස් ස්වකීය අතෙහි බැඳි සුරය අල්ලමින් ඇසීය.

''එපා, ඔබ එය තියා ගන්න.'' ඈ හිස වැනුවාය. ''එය ඔබ ආරක්ෂා කරාවි.''

නාලිනි ආපසු එන්නට වූවාය. ඇය නොපෙනී යන තෙක් හැන්ස් නොසැලී බලා සිටියේය. මාලිගයේ සඳලු තලයට පැමිණි නාලිනී, හැන්ස්ට තමා තව වරක් දක්වන රිසි වූවා උර සළුව වැනුවාය. ඈ එහි පැමිණි බව දුටු හැන්ස් සැනසුම් සුසුමක් හෙළුවේය.

රජවාසල රැකවල් ගත් මුර සෙබළා නිදි කිරමින් සිට දෙනෙත් හැරියේය. කිසියම් අවතාරයක් බඳු රුවක් එවිට පාර හරහා පාවෙනු ඔහුට දක්නට ලැබුණි. ඔහු සියොළඟ වෙව්ලා ගියේය. මාලිගය අවට අවතාර, හොල්මන්, බකුසු, බක මුහුණු ඈ අසුබ හඬ පවතින බව හේ දනී. රාජ සේවය සඳහා මාලිගයට පැමිණි තෙක් ඔහුට මෙතරම් නරක දිනයක් නොතිබුණි. එය මහා අසුබ දිනයක් හැටියට හේ සිතීය.

# 9

# රාජ උදහස

ගැන්ස් කන්දේ නුවරට පැමිණ ගතවූයේ පෑ හතළිස් අටකි. මුළු රාජ මාලිගයම එකම ගාල ගෝට්ටියක් බවට පත් විය. මෙදින උදෑසන ගැස්පා පිගේරා හා වැන් ස්ටියර්වෙල්ට් කපිතාන්වරුන් දෙදෙන අතුරුදන් වී සිටියහ. ඔවුන් කෙසේ අතුරුදන් වී ද යන්න මහත් අබිරහසක් විය. කපිතාන්වරුන් සෙවීමට ලහි ලහියේ දැරූ තැතින් කිසිදු පලක් නොවීය.

මහ අදිකාරම වෙවුලමින් රජු ඉදිරියට පැමිණ වැඳ නමස්කාර කොට සිදු වී ඇති පවත් සැලකර සිටියේය. ''මොනවා! වැන් ස්ටියර්වෙල්ට් හා පිගේරා පැන ගිහින්!'' රජ කෝපයෙන් ගුගුළේය. රජු ඉහළ ගත් හුස්ම පහළ හෙළුවේ අමාරුවෙනි. ඔහුගේ ඇස් ගිනි පුළිඟු මෙන් රත් පැහැ ගැනීය. ඉක්බිති ඔහු කෝපය යටපත් කොට තේජාන්විත රාජ උදහසින් බැලුවේය. මේ බැල්මෙන්ම බොහෝ දෙනා බියට පත් වූහ. රජ වේග ස්වරයෙන් කතා කළේය.

''වහා උනු සොයා අල්වා ගැනීමට හැම පැත්තකින්ම මිනිසුන් පිටත් කරව්'' යි හේ අණ කළේය. ''පලා ගියවුන් අල්වා ගෙන මා ඉදිරියට ගෙන ඒම තොපට බාරයි. එය කළ නොහැකි වුවහොත්, තොප හැම ඊට වගකිව යුතු බව සිකුරුයි'' යි ආඥ ස්වරයෙන් කී රජු ගේ ගත කෝපයෙන් සැලෙන්නට විය.

දින ගණන් ගෙවී ගියේය. කපිතාන්වරුන් පිළිබඳව කිසිදු හෝඩුවාවක් නොලැබුණි. රජු ගේ කෝපය එන්ට එන්ට ම උත්සන්න වන බව නිලමවරුන්ට පෙනී ගියේය. ස්වකීය කෝපාග්නිය ඉවසාගත නොහැකි වූ රජ නිලමවරුන්ටත් මාලිගයේ සිටි අවශේෂ අයටත් බැණ වදින්නට විය. තවත් විටෙක හේ අසුනක වාඩිගෙන කිසිත් කතාවක් නැතිව බලාගත් වනම බලා සිටියේය. කපිතාන්වරුන් ගෙන් පළි ගන්නා සැටි හේ කල්පනා කළේය.

දෙසතියක් ඉක්ම ගියේය. දූඩි මුරකාවල් යොදා කපිතාන්-වරුන් සෙවීමට ගත් තැතින් පලක් නොවන බව පෙනී යන්නට විය. මේ ගැන තවත් බලා සිටිය යුතු නැති බව රජ තීරණය කළේය. පලා ගිය කපිතාන්වරුන් සෙවීමේ කාර්ය භාර වී සිටි අදිකාරම්වරු හා නායක මුර සෙබළු රජු ඉදිරියට කැඳවන ලදහ.

කපිතාන්වරුන් ගේ අබිරහස් අතුරුදන් වීම පිළිබඳව යම්තම් හෝ හෝඩුවාවක් රජු ඉදිරියේ නොතැබුවහොත් ඒ වෙනුවෙන් තම තමන් ගේ ජීවිත පවා බිලිදීමට සිදු වෙතැයි බියට පත් නිලමවරු, මේ ගැන රජුට කුමන කරුණක් ඉදිරිපත් කළ යුතු දැයි සාකච්ඡා කිරීම සඳහා රැස්වූහ.

ඔවුහු බොහෝ වේලා සාකච්ඡා කළහ. එහෙත් ඉන් කිසිදු පලක් නොවිය. කපිතාන්වරුන් ගේ පලා යාම සම්බන්ධයෙන් රජුට ඇදහිය හැකි හෝ පිළිගත හැකි කිසියම් සාක්ෂියක් සොයා ගැනීමට ඔවුහු සමත් නොවූහ. සියල්ලෝම බියෙන් සැලෙමින් කල්පනා කරන්නට වූහ. රජවාසලට මස් සපයන සෙල්ලා නමැති වැද්දා මේ ගැන යමක් දැන සිටින්නට පුළුවන් බවත් සමහර විට ඔහුගේ ආධාරයෙන්ම කපිතාන්වරුන් පලා යන්නට ඇති බවත් එකෙක් කීවේය. කඳු රටින් පිට වීමට ඇති අප්‍රසිද්ධ මාර්ග ගැන දන්නා එකම තැනැත්තා සෙල්ලා බැවින් ඔහුගේ ආධාර නියත වශයෙන්ම කපිතාන්වරුනට ලැබෙන්නට ඇතැයි ද හේ තවදුරටත් කියා සිටියේය.

''පුදුමයි අපට මුලදී මේ ගැන කල්පනා නොවූ එක.''

''වැද්දා ගෙන් මේ ගැන ප්‍රශ්න කළ යුතු බව, වද දීමෙන් වත් මේ ගැන තොරතුරු වැද්දා ගෙන් ලබා ගැනීම කළ යුතු බව අපි රජතුමාට යෝජනා කරමු'' යි තවෙකෙක් කීවේය.

''හරි, හොඳයි යෝජනාව; අඩු ගණනේ අප කෙරෙහි ඇති රාජ උදහසවත් මෙයින් තුනී වී යාවි'' යි තෙවැන්නෙක් කීවේය.

බරටම මස් කදක් කර තබා ගත් වැද්දා කඳු හෙල් හරහා මාලිගය වෙත වැටී ඇති අඩි පාරක් දිගේ හතිලමින්, විඩාව නිසා තැනින් තැන නවතිමින් ගමන් ගත්තේ එදා උදේමය. හේ මාලිගයට අවශ්‍ය මස් සපයා ගෙන මේ එන්නේ දින කිහිපයකට පසුවය. හැඩි දැඩි මස් ගොබ ඇති, මිටි සිරුරකින් ද රැලි ගැසුණු අවුල් හිස කෙසින් ද යුත්, මොහුගේ එකම ඇඳුම වූයේ ඉණ වටා ඇඳි දණ පමණට වත් නැති දළ රෙදි කඩකි. සතියකට වරක් හෝ දෙවරක් මාලිගයට සෑහෙන මස් කදක් ගෙන ඒම මොහුට අයත් මෙහෙවරක් විය. ඔහුගේ මුහුණේ ගණන් කළ හැකි තරම් තුනීව රැවුල් ගස් ඇත. එහි වලසකු ගේ නිය පහර-වලින් වූයයි සිතිය හැකි කැලැල් බිය උපදවන සුලුය. පිටතට නෙරා ගිය රත් වූ තියුණු දෙනෙත් ඝනව වැඩුණු ඇසි බැමින් වැසී ගියේය. මොහු දක්මෙන් කුඩා ළමෝ බියෙන් සැඟවෙති. ඔහු වැනියකු දැකීම ඔවුන්ගේ නිජ බිම වූ මහ වනයෙහි දී මිස නගරයක දී නම් සිදු නොවන්නකි. ඔහු වෙත පැවරී ඇති රාජ මෙහෙවර නොවන්නට හේ කිසි දිනක මෙහි නොඑන්නේය.

මහ වනය ස්වකීය එකම නිවහන කොට සලකන මොහු දක්ෂ දුනුවායකු ද අධ්‍යක්කාරයකු ද වූ නිසා මේ රාජ මෙහෙවර ඔහුට පැවරුණේය. මස් සැපයීම පමණක් නොව රජු කැමති දුර්ලභ වන සතුන් ඇල්ලීම සඳහා රජු ගේ අධ්‍යක්කාරයන් සමග යාම ද මොහුට අයත් කාරියක් විය. රජු ගේ අධ්‍යක්කාරයන් විසින් උගුලකට හසු කරන ලද සුදු ගෝනා මුදා හැරීමේ වරදට මහ වනය තුළ දී හැන්ස් අත් අඩංගුවට ගැනීම සඳහා සෙල්ලා බොහෝ වෙහෙසුණේය. එදා සෙල්ලා නොසිටියේනම් හැන්ස් සැහැවී පලා යන්නට තිබුණි. මහ වනයේ සිට කඳු රට දක්වා ඇති දුර සුළුපටු නොවේ. එදා මේ දුර්ග මාර්ගය හරහා හැන්ස් මාලිගය වෙත ගෙන ආවේ සෙල්ලා නිසාය. සෙල්ලා ගේ ආධාරය නොලැබෙන්නට ඔහු මග දී ගැළවී යනු නිසැකය.

වැද්දා කිසි විටෙක වචන තුන හතරකට වඩා කතා නොකරයි. ඔහුගේ තියුණු බැල්ම සිතෙහි ඇති රුදුරු බව පළ කළේය. කන්දේ නුවර දුනු සිප් තරඟයක දී වරක් හැන්ස් විසින් වැද්දා පරදවන්නට යෙදුණි. මෙයින් සෙල්ලා ඔහු කෙරෙහි නොමනාප විය. එහෙත් වැඩි කාලයක් එය නොපැවතිණි.

හැන්ස් සිර කුඩුවේ ලන්නට යෙදුණේ රජ්ජුරුවන් හා එකටෙක කතා කළ දවසින් පසුවය. ඊට පෙර හැන්ස් සිර භාරයේ සිටියේ නමට පමණකි. ඔහු මාලිග පරිසරයේ කැමති පරිද්දෙන් නිදහසේ හැසුරුණි. සතියකට වරක් දෙවරක් මාලිගයට මස් ගෙනෙන වැද්දාට ඔහු මුණ ගැසුණේය. මේ හේතුවෙන් ඔවුන් දෙදෙනා අතර තරමක මිත්‍රත්වයක් හට ගත්තේය. මස් කද මාලිගයේ මුළුතැන් ගෙට භාර දෙන සෙල්ලා අසල උයනේ සෙවණැති ගසක් යට බුලත් විටක් හෝ කමින් දවල් වන තුරු ගත කරයි. මේ අතර හැන්ස් ඔහු ළඟට වී සිටී. ඔවුන් කතා කළේ ටිකක් වුව ද ඔවුන් සිතූ කියූ දේවල් ඔවුනොවුනට බෙහෙවින් ගැළපුණේය. වැදි කුලයේ ජනයාට බෙහෙවින් සමාන ගති ගුණ හැන්ස්ට ඇත්තේය. විදීමෙහි ඔහු වැද්දන්ටත් වඩා සූරය. වැද්දා ගේ ගතිය රළු වූවද හැන්ස් කෙරෙහි ගරු සරු සුහද බව ඔහු හද තුළ වැඩුණි.

එදා බරටම මස් කදක් ඔසවා ගත් සෙල්ලා මාලිගාවේ පිටුපස මිදුලට පිවිසියේය. හේ මස් කද මුළුතැන් ගෙට භාර දුන්නේය. සිරිත් පරිදි හේ මුළුතැන් ගෙය අසල ගස යටට වී වාඩි ගත්තේය. ඉක්බිති වඳුරු සමින් කළ සිය බුලත් මඩිස්සලයෙන් කිසියම් පොතු වගයක් ගෙන සපන්නට විය. මාලිගයට අඩු වැඩිය සපයන කාහටත් දෙනු ලබන දහවල් ආහාරය ඔහුට ද ලැබෙන තෙක් සෙල්ලා එතැන වාඩි ගෙන සිටියේය.

රජ ගෙදර මුළුතැන් ගෙය භාරව සිටියේ මඩප්ප නිලමෙය. මුළුතැන් ගෙය පිළිබඳ සියලු කටයුතුවලට හේ වග කිව යුතුය. කුලවත් පවුල්වල රූමත් නිරෝගී ගැහැනු පිරිමි දෙපක්ෂයම රජ ගෙදර මුළුතැන් ගෙයි සේවය කළහ. අඩු කුලවල අයට රාජ භෝජන දෙස බැලීමට පවා තහනම් වූයේ ඒවාට ඉන් කිලුටක් වේයයි සැලකූ බැවිනි.

මුළුතැන් ගෙයි පිරිසිදුකම පිළිබඳව විශේෂ නීති පනවා තිබුණි. එහි භාවිත වුණු පිත්තල හා තඹ බඳුන් දිනකට කිහිප වාරයක්ම සෝදා සුදු ඇතිරිලි එලන ලද විශාල මේසයක් මත තබා තිබුණි. කෑම පිසින්නෝ සුදු වතින් සැරසී සුදු තලප්පා සහ මුකවාඩම් බැඳ සිටියහ. වී කෙටීමේදීත් සහල් පොලා පිරිසිදු කිරීමේදීත් සහල් ගැරීමේදීත් සේවකයෝ ඉතා පරීක්ෂාකාරී වූහ. රජු ආහාර ගන්නා විට වී පොත්තක් හෝ දුර්වර්ණ සහල් ඇටයක් හෝ හමු වුවහොත් ඊට වගකිව යුත්තන්ට ඒ වෙනුවෙන් තදබල දඬුවම් ලැබේ. සහල්, පිසීම සඳහා මුට්ටියට දැමීමට පෙර ඒවා සත් වරක් පොලා සත් වරක් ගරා විශේෂ ලෙස පිළියෙල කිරීමට මිනිසුන් කිහිප දෙනෙක් පත්කොට සිටිති.

රජුට ආහාර විෂවීම වළක්වනු සඳහා ඒවා පිස අවසන් වූවායින් පසු අගු බලන නිලමේ විසින් ආහාර පළමුවෙන් අනුභව කොට රස බලනු ලැබේ. හේ රස බලා පැයක් පමණ ගතකොට ආහාරවල අමුත්තක් නොමැති නම්, රජු වෙත ආහාර අනුභවය සඳහා මහත් ගෞරව පූර්වකව සැලකර සිටී.

රජු ආහාර ගන්නේ තනිවමය. කෑම මේසයට වාඩි වූ පසු කිසිවකුටවත් ඔහුට කතා කළ නොහැක. රජු ආහාර අනුභවය සඳහා පැමිණෙන්නේ මහත් ගෞරවාකාරයෙනි. ඔහු ගමන් කරන බිම පුරා සුවඳ මල් අතුරනු ලැබේ. සිහින් සංගීත නාදය ඇසෙන්නට වෙයි. අනුභවය සඳහා ඔහු සුදු ඇතිරිල්ලකින් සරසන ලද කුඩා මේසයට වාඩි ගනියි. මුතු මැණික් ඔබ්බවන ලද විශාල රන් පළභානක් මේසයට වාඩි ගත් රජු ඉදිරියේ තබනු ලැබේ. ඉක්බිති රන් කෙණ්ඩියක් හා කුඩා තැටියක් අතැතිව, දියවඩන නිලමේ රජු වෙත එළඹෙයි. සත් වරක් පෙරන ලද පැන් කෙණ්ඩියෙහි වෙයි. දියවඩන නිලමේ කෙණ්ඩියෙන් රජුගේ අතට පැන් වත් කරමින් අත සේදී වැගෙන පැන් වැටීමට කුඩා තැටිය අල්ලයි. අනතුරුව බත් වඩන නිලමේ වටකුරුව කපා තවන ලද කෙසෙල් කොළයක් රැගෙන රජු වෙත එළඹෙයි. හේ ඉතා පිරිසිදු සුදු වතින් සැරසී මුකවාඩමක් බැඳ සිටී. බත් වඩන නිලමේ වටකුරු කෙසෙල් කොළය රන් පළභාන මත එළා ඒ මතට බත් හැන්දක් සහ එක් ව්‍යඤ්ජනයක් බෙදයි. රජු

සිය ඇඟිලි තුඩුවලින් එය අනුභව කොට නිම වෙයි. ඉක්බිති බත්වඩන නිලමේ එම කෙසෙල් කොළය ඉවත් කොට තවත් එවැනිම කෙසෙල් කොළයක් රන් පළඟාන මතට එළයි. දිය වඩන නිලමේ පෙර පරිදි රජු ගේ අත සේදීම කරයි. අනතුරුව බත්වඩන නිලමේ අලුතින් එලන ලද කෙසෙල් කොළය මතට තවත් බත් හැන්දක් සහ වෙනත් ව්‍යඤ්ජනයක් බෙදයි. මේ ආකාරයට රජු අවශ්‍ය තරම් ආහාර ගන්නා තෙක් බත්වඩන නිලමේත් දියවඩන නිලමේත් දිගටම ක්‍රියාකාරීව සිටිති.

ප්‍රධාන වශයෙන් පලතුරු, එළවලු හා පලා වර්ග රජු ගේ දෛනික ආහාරවලට අයත් විය. මේ ආහාරයන් ගෙන් බොහො-මයක් රජ ගෙදර වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන ඒවා වෙයි. රජු ගේ ආහාර වේලක් සඳහා කෑම වර්ග තිහක් පිළියෙල කරනු ලැබේ. මේවායින් රජු වඩාත් කැමති වර්ග අනුභව කරයි. ආහාරයෙහි වෛවර්ණ රස සෙවූ රජු තෘප්තිමත් කිරීම එතරම් පහසු නැත. රටේ ඒ ඒ පලාත්වල වගා කෙරුණු ඒවායින් තෝරා ගෙන විශේෂයෙන් පිළියෙල වුණු කිසියම් වී වර්ගයක බත් බෙදනු ලැබෙයි. මේ බත් වර්ගවලින් රජු වඩාත් ප්‍රිය කළේ සරිලන ව්‍යඤ්ජන හා සුවඳ ඇල් හාලේ බතටය. ඉස්ම සිඳෙන්නට පිසන ලද එළවලු සහ මාළු, ඇඹුල් තියා පිසන ලද ව්‍යඤ්ජන, බැදුම්, ඉතා රසවත් තැම්බුම් හොද්දක් (සුප්) හා අච්චාරුවක් ද රජු වඩාත් ප්‍රිය කළ ව්‍යඤ්ජන අතර වෙයි.

බත් කෑමෙන් පසු, මී කිරි සහ වනයෙන් ගෙනා අලුත් මී පැණි, පොල් සකුරු හෝ කිතුල් සකුරු හෝ රජුට පිළිගන්වනු ලැබේ. කැවිලි හා පලතුරු වළඳා අවසන් වන රජතුමා අනතුරුව අහර දිරවීමට උපකාරී වන ඖෂධ ලේහයක් හා පැණියක් ද ගනී.

අවසානයට පණිවිඩකරන නිලමේ විසින් රන් තැටියක බහා ලූ බුලත් රජු වෙත පිළිගන්වනු ලබයි. පසුව පහසු අන්දමට ස්වකීය අසුනෙහි හරිබරි ගැසී වාඩිවන රජ තෙමේ නිවිහිල්ලේ බුලත් සපන්නට වෙයි. ඉක්බිති සේවකාදීන් විසින් රජ තෙමේ ආසනයක හිඳුවා යහන් ගබඩාව වෙත ඔසවා ගෙන යනු ලැබේ. ආහාර අනුභවයෙන් පසු හේ සුව පහසුව මඳ වේලාවක් නිදා ගනී.

මේ වූකලී රජු ගේ දෛනික ආහාර ගැනීමේ සාමාන්‍ය පිළි-වෙළයි. එහෙත්, පලා ගිය කපිතාන්වරුන් සෙවීමේ කටයුතු භාර වූ අදිකාරම්වරුන් ගේ සහ නායක සෙබළුන් ගේ සාකච්ඡා සහා දිනයෙහි රජතුමා ආහාර අනුභවය සඳහා වාඩි ගත්තේ ඉතා ගැඹුරු කල්පනා සහගත ස්වභාවයකිනි. එදින රජු අහර ගත්තේ ඉතා ස්වල්පයකි. රාජ සභාවට යාම සඳහා රජතුමාට

ඇඳුම් ඇන්දවීමට සේවකයන් පැමිණෙද්දී, අහර ගැනීමෙන් පසු වෙනදා සිටින විවේක සුවයෙන් රජ නොසිටියේය.

රජතුමා රාජ සභා ශාලාවට ඇතුළු විය. ඔහු බලාපොරොත්තු වූවෝ එහි රැස් වී සිටියහ. පිරිස දෙළොස් දෙනකු ගෙන් සමන්විත විය. රජු සභා ශාලාවට පිවිසෙද්දී සියල්ලෝම නැමී සිට ඔහුට ආචාර කළහ. රජු අසුන් ගන්නා තෙක් ඔවුහු එසේම නැමී සිටියහ. රජු අසුන් ගත් ඉක්බිති ඔවුහු නැවතත් රජුට ආචාර පවත්වා අසුන් ගත්හ.

රජතුමා මහා තේජස්වී පුරුෂයෙක් විය. සැත්තෑ විය ඉක්ම වූවකු වුවත් එතුමාගේ පූර්ණ දේහය තරුණ යෝධයකු ගේ මෙන් විය. දෙපසට පුළුල්ව විහිදී ගිය උඩු රැවුලත් පහතට වැටුණු යටි රැවුලත් දීප්තිමත් දෙනෙතත් නිසා එතුමා ගේ මුහුණෙහි මහා ගාම්භීර බවකුත් තේජස්වී ගතියකුත් රැඳී තිබුණි. පළල පටියකින් පිටු පසට එල්ලා වැටෙන සේ පැළඳ සිටි රන් ආලේප කරන ලද කඩුව රන් කොපුවක බහා තිබුණි. බල පරාක්‍රමයත් තේජානුභාවත් කැටි කොට නිමවන ලද මහා යෝධ පිළිරුවක් මෙන් රජ තෙමේ රාජ සභාව ඉදිරියේ සිංහාසනාරූඪව සිටියේය.

රජ තෙමේ රැස්ව සිටියවුන් දෙස සිය දෙනෙත් යොමු කළේය. රජු ගේ මුවින් කුමන නියෝගයක් නිකුත් වේදැයි ඔවුහු බියෙන් තැති ගෙන සිටියහ. රජ මහ අදිකාරම් වෙත හැරුණේය.

''තොප කපිතාන්ලා ගේ පලායාම ගැන සොයා ගත් තොරතුරු දැන් සැළකරව!'' යි හේ කීය.

මහ අදිකාරම් තෙමේ ඉදිරියට ගොස් ආචාර විධි පවත්වා එකත්පස්ව සිට ගත්තේය. ''දේවයන් වහන්ස! මට මෙපමණයි කියන්නට තිබෙන්නේ. අප මෙතරම් කාලයක් තුළ ගන්නා ලද සෑම ප්‍රයත්නයක්ම ව්‍යර්ථ වී ඇත. හැම දෙසකටම රාජ පුරුෂයන් යවා ගම් නියම්ගම්වල අණ බෙර ලවා කළ සෑම උත්සාහයක්ම නිෂ්ඵල වී තිබේ. කපිතාන්වරුන් ගේ පලා යාම ගැන කිසිම හෝඩුවාවක් දන්නා කිසිම කෙනෙක් නැත.''

''තොප ඔය ටික කියන්ටද මෙතැනට රැස්වුණේ?'' යි රජ කෝපයෙන් දැවෙමින් ගුගුළේය.

''අවසර දේවයන් වහන්ස, තව එක දෙයක් කියන්ට තිබෙනවා. මේ පලා යාම මහා අබිරහසක් නිසා අප කල්පනා කරනවා එය සිදුවන්නට තිබෙන්නේ එකම මගයි කියා. එනම් මහ වනය ගැන හොඳට දන්නා කියන අයෙකුගේ උපකාරය නැතුව මේ විදියට අසු නොවී පලා යාමට කිසිම ඉඩක් නැහැ දේවයිනි.''

''ඕනෑම මොඩයෙකුට ඒ බව වැටහෙනවා. තොප ඔය මහා ලොකු නිගමනයට බැස්සේ කෙසේද?'' යි කෝපයෙන් රත් වී සිටි රජ උපහාසාත්මකව විචාළේය.

''දේවයන් වහන්ස මේ පලා යාම ගැන සෙල්ලා නමැති වැද්දා ගේ සම්බන්ධයක් තිබෙන්නට පුළුවන්.''

''තොප උගෙන් ප්‍රශ්න කළාද?''

''එසේය දේවයන් වහන්ස. එහෙත් ඌ කිසිවක් නොදන්නා බව කියනවා. ඔබ වහන්සේ ගෙන් අවසර ලැබෙනවා නම් ඌ මෙතැනට ගෙනැවිත් ප්‍රශ්න කළොත් සමහර විට යමක් කියන්ට පුළුවන්.''

''ඌ දැන් කොහිද?''

''මුරකාවල් පිට රාජාංගණයේ සිටී. දේවයන් වහන්ස, ඌ මස් ගෙනා අවස්ථාවේ අපි ඌ අත් අඩංගුවට ගත්තා.''

''ඌ මෙහි ගෙන එව.''

හැඩිදැඩි සෙබළුන් දෙදෙනකු විසින් රැකවල් කරනු ලැබූ සෙල්ලා රජු ඉදිරියට ගෙනෙනු ලැබුවේය. සෙබළුන් දෙදෙනා අතර සිටි සෙල්ලා කාහටත් කැපී පෙනුණේය. සෙල්ලා ගේ මුහුණෙහි වෙන ද තිබුණු ගතියම විනා එහි කිසිදු වෙනසක් දක්නට නො තිබුණි. ඒ හැඩි දැඩි පෙනුම ඔහුගේ මුහුණෙහි එසේම තිබුණි.

රජු ගෙන් ලැබුණු සංඥාවක් අනුව සෙල්ලා ගෙන් ප්‍රශ්න ඇසීම ඇරඹිණි. කුමන අයුරකින්වත් ඔහුගෙන් ඒ ගැන කිසිවක් දැන ගැනීමට නොහැකි විය. රජු ඉදිරියේවත් රාජ සභාව ඉදිරියේවත් හැසිරිය යුතු අන්දම ගැන අබ මල් රේණුවකවත් දැනුමක් නැති සෙල්ලා තමාගෙන් අසන ලද ප්‍රශ්නවලට වචනයෙන් හෝ දෙකින් පිළිතුරු දුන්නේය. නැවත නැවතත් එකම ප්‍රශ්න ඔහු ගෙන් ඇසීම නිසා ගේ ඉන් විඩාවට පත් විය. ප්‍රශ්න ඇසීමේ කෙළවරක් නුදුටු සෙල්ලා කතා කළේය. ''දෙයියො ඉර බහින කල් ඒ ප්‍රශ්න මගෙන් ඇසුවත් මගේ පිළිතුරු ඒකමයි. සුදු හූරලා ගේ අතුරුදන්වීම ගැන මං මොකුත් දන්නෙ නැහැ.'' සෙල්ලා මේ වදන් තෙපලා අවසන් වනවාත් සමගම මුහුණ හරහා වැරෙන් පහරක් වැදුණි.

"දේවයන් වහන්ස" යි අදිකාරම රජු ඇමතුවේය. "මූට වද දී හෝ මුගෙන් මේ ගැන ප්‍රශ්න කිරීම යහපති. මූ මේ ගැන යමක් දන්නා බව පෙනෙනවා."

"මූ ඉවතට ගෙන ගොස් තොපට මනාප දෙයක් කරව්. ඌ මේ ගැන යමක් කීමට සූදානම් වූ විට නැවත මෙහි රැගෙන එව" යි රජ අණ කළේය.

රජ තෙමේ සිහසුනෙන් නැගිට ගියේය. පැයකට පමණ පසු කපිතාන්වරුන්ගේ පලා යාම ගැන පාපෝච්චාරණයක් කිරීමට වැද්ද සූදානම් බව රජුට දන්වන ලදී. නැවතත් රජ සභා ශාලාවට පිවිස වාඩි ගත්තේය.

මීට පෙර වතාවේ දී රජු ඉදිරියේ පෙනී සිටි සෙල්ලා නොවේ දැන් රජු ඉදිරියේ සිටින්නේ. ඔහුගේ බැල්ම කා තුළත් අනුකම්පාව උපදවන්නක් විය. අඩ පණවී ගිය සෙල්ලා වෙව්ලමින් රජු ඉදිරියේ සිට ගෙන සිටියේය. රජු ගේ වධකයන් විසින් ඔහුට නොයෙක් වධ හිංසා කොට ඇති බව පෙනෙන්නට තිබුණි. ඔහුගේ සිරුරෙහි බොහෝ තැන්වලින් ලේ වැහෙමින් තිබුණි. ඔහුට සිට ගෙන සිටීමට පවා වාරුවක් නොවීය. සෙබළුන් දෙදෙනකු විසින් ඔහු වත්තම් කරනු ලැබ සිටියේය.

රජු ඉදිරියේ අඩ පණව සිටි සෙල්ලා ගෙන් අදිකාරම ප්‍රශ්න කිරීමට පටන් ගත්තේය. වනයෙන් පැමිණි සුදු වැදි කොල්ලා කපිතාන්වරුන් රැගෙන ගොස් ඇති බව හේ වෙව්ල වෙව්ලා ගොත ලැවේය. ඔහුට කතා කිරීමට පවා ශක්තියක් නොවීය. ක්‍රමයෙන් ඔහුගේ මුහුණත් කයත් ලෙයින් තෙත් වන්නට විය. "කුමක්ද බල තා මේ කියන්නේ?" යි රජ සිහසුනෙහි කෙළින් වෙමින් වේගයෙන් ගුගුළේය. වාචාගත නොහැකි කෝපයකින් දැවෙන රජු ගේ ස්වභාවය දුටු රාජ සභාවට පෙනුණේ රජු විසංඥ වන්නට යන්නාක් මෙනි. ඔහුගේ මුහුණෙහි ලේ නහර සහ මස් ගොබ ඉල්පී ගැහෙන්නට විය. ඔහුගේ ඇත් සිංහාසනයේ ඇඳි දෙකෙහි වැරයේ ගැටී තිබුණි.

"කුමක් ද ඌ කීවේ?" යි රජ ගොරෝසු හඬින් යළිත් ප්‍රශ්න කළේය.

"දේවයන් වහන්ස" යි අදිකාරම රජු ඇමතීය. "ඌ කියනවා අර සුදු වැදි කොල්ලා, හැන්ස්, වනයෙන් ආපසු අවුත් කපිතාන්වරුන් රැගෙන ගිය බව."

Scanned with CamScanner

තමා තුළින් බුර බුරා නැගී ආ අසීමිත කෝපය රජ ඉතා අමාරුවෙන් මැඩ පවත්වා ගත්තේය. රජු ගේ කෝපයෙහි තරම ඔහුගේ ගිනි පුළිඟු මෙන් දිලිසෙන දෙනෙත්වලින් රැස්ව සිටියහු මැනවින් වටහා ගත්හ.

කෝපයෙන් රත් වී සිය රාජ ගරුත්වය පවා අමතක වූ රජ තෙමේ තමාම වැද්දා ගෙන් ප්‍රශ්න ඇසීමට පටන් ගත්තේය. කිසි දිනක, මෙවැනි තේජාන්විත සැඩ පරුෂ පුද්ගලයකුට මුහුණ නුදුන් වැද්දා මෙයින් තවත් බිය පත් වූයේය.

''තා ඒ කොල්ලා දුටුවාද?''

''නෑ.''

''කෙසේද එහෙනම් තා ඒ ගැන දන්නේ?''

''මට ඒ බව කිව්වා.''

''කවරෙක්ද ඒ?''

වැද්දා නිශ්ශබ්ද විය.

''කිමෙක්ද බල! තා තගේ රජතුමා අසන ප්‍රශ්නවලට පිළිතුරු නොදී නිහඬව සිටිනවාද? නිවයා! මූ මෙතැනින් වහා ඉවතට ගෙන යව්! කතා කරන්නට උගේ දිව බුරුල් වන තෙක් නිසි ඇ කරව්!'' රජ උත්සන්න වූ කෝපයෙන් ගුගුළේය.

මුර සෙබළෝ වැද්දා ඇදගෙන යන්නට සූදනම් වූහ.

''අනේ නෑ නෑ අප්පෝ'' යි වැද්දා මරහඬ දෙන්නට විය. ''අනේ මට ඒ වද නම් දෙන්න එපා! මා මෙතන විද මරා දමන්න හොඳා. මට එච්චර වදයක් නම් දෙන්න එපා දෙයියනේ! මා මෙතන එක විටම මරා දමන්න හොඳා. අනේ දෙයියනේ මට වද දෙන්න එපා!'' යි වැද්දා වේදනාවෙන් හා බියෙන් විලාප කියන්නට විය.

''කෑ නොගසව!'' යි මුර සෙබළෝ ඔහු ඉවතට අදින්නට වූහ.

''අනේ—දෙයියනේ—එපා එපා—මං දන්න ඔක්කොම කියන්නම්. අනේ දෙයියනේ'' යි සෙල්ලා මහ හඬින් විලාප කියමින් හඬන්නට විය. වේදනාව ඉවසා ගත නොහැකිව මිරිකෙමින් බියෙන් තැති ගෙන සිටි සෙල්ලා යළි මඳක් ප්‍රකෘති තත්ත්වයට පැමිණෙන තෙක් සියල්ලෝම බලා සිටියහ.

ඉක්බිති වැද්දා ඉතා අමාරුවෙන් කතා කිරීමට පටන් ගත්තේය. ඔහුගේ මුවින් වචන පිට වූයේ ඉතා සෙමින්ය. එමෙන්ම

අකමැත්තෙනි. ඔහු කතා කළේ මහත් ආයාසයකිනි. දිනක් තමා මාලිගයට මස් ගෙනා අවස්ථාවේ එක්තරා තරුණියක් තමා පසෙකට කැඳවා තමා ඒ ඕලන්ද ජාතික තරුණයා දුටුවේ දැයි තමාගෙන් ඇසූ බව හේ කියා සිටියේය.

"ඒ මීට කොපමණ කලකට පෙරද?" යි අදිකාරම ඇසීය.

"සුදු හූරලා පලා ගියාට දවසකට පස්සෙ."

"ඒ තරුණිය තොපගෙන් ඒ ගැන විමසුවේ ඇයි?"

"මා දන්නේ නැහැ. ඒ ඇත්තො මට කැලේදී හමුවෙන්නට ඇති කියා ඒ ඇත්තොට කල්පනා වුණු බව ඒ ඇත්තො කිව්වා."

"තොට ඒ වැදි කොල්ලා හමු වුණාද?"

"නෑ."

"කවුද ඒ තරුණිය?"

"ඒක මට කියන්ට බැහැ. මාලිගාවේ ඉන්න හැම ඇත්තෙක්ම මට පෙනෙන්නේ එකවගේ."

"ඌ කියන්නේ බොරු. කැත බල්ලා!" යි රජ බෙරිසන් දුන්නේය.

"මේ ගැන මට තවත් කතා කරන්නට වුවමනා නැහැ. මූ ඉවතට ගෙන යව්." එක් මුර සෙබළෙක් සෙල්ලා ගේ අතක් අල්ලා ඇඹරුවේය. සෙල්ලා වේදනාවෙන් විලාප තියන්නට විය.

"මට මේ මාලිගාවේ ඉන්න ඒ ඇත්තො සියල්ලන්ම බලන්ට සැලැස්සුවොත් මට ඒ ගැන කතා කළ තරුණිය කියන්ට පුළුවන් වෙයි" යි සෙල්ලා තතනමින් කීවේය.

කෝපයෙන් දැවෙමින් වැද්දා දෙස බලා සිටි රජ නැවතත් කතා කළේය. "හොඳයි, ඌ කියන දේ අපි අදහමු."

මාලිගයේ සිටින කාන්තාවන් රාජාංගණයට රැස් කරවන ලෙසත් එහි දී සෙල්ලාට ඔවුන් පෙන්වන ලෙසත් රජ අදිකාරමට අණ කළේය.

මේ ගැන කිසිවක් නොදත් මාලිගයේ සිටි ස්ත්‍රීහු කුමක් වන්නට යන්නේ දැයි බියෙන්, එකා බැගින් වැද්දා පසු කරමින් පෙළට ගමන් ගත්හ. ප්‍රථමයෙන් මුළුතැන්ගෙයි සුරූපී තරුණියෝ ද අනතුරුව අනෙක් සේවිකාවෝ ද සෙල්ලා පසු කොට ගියහ.

Scanned with CamScanner

එහෙත් සෙල්ලා සොයන තරුණිය ඒ අතර නොවූවාය. ඔහු යළිත් රාජ සභා ශාලාව වෙත ගෙන යනලදී. වැද්ද කිසිවකු හඳුනා ගැනීමට අසමත් වූ බව අදිකාරම රජුට සැලකර සිටියේය.

‘‘දැන් තොට කියන්න තිබෙන්නේ කුමක්ද බල?’’ රජ බලවත් කෝපයෙන් කෑගැසුවේය.

‘‘මට එද කතා කරපු ඇත්තො ඒ අතර හිටියේ නෑ. මා නුදුටු තවත් ඇත්තො මාලිගාවේ ඉන්න පුළුවන්.’’

‘‘මාලිගාවේ සිටින සියලුම ස්ත්‍රීන් මූට පෙන්නුවාද?’’ රජ අදිකාරම ගෙන් ඇසීය.

‘‘එසේය දේවයන් වහන්ස, කුමාරිකාවනුත් දේවීන්වහන්සේ-ලාත් හැර සියල්ලන්ම පෙන්නුවා.’’

‘‘මට කතා කළ ඇත්තො උසස් කෙනෙක් වගෙයි පෙනුණේ’’ වැද්ද කිසි සැකක් බියක් නැතිව කීවේය. මෙය ඇසූ රජු ගේ කෝපය උත්සන්න වූවත් ඉන් රජු ගේ සිත අන් අතකට යොමු වන්නට විය. රාජකීයයනට හෝ සාමාන්‍ය කෙනකුට හෝ විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් වූ විට රජ තෙමේ කිසි විටෙකත් පක්ෂයක් නොගත්තේය. මේ කාරණය පිළිබඳ ඇති තතු සියල්ල සොයාගත යුතු බව රජ අදිටන් කරගත්තේය.

රජ ස්වකීය රැවුල පිරිමැද්දේය. ඔහුගේ දෙනෙත් කෝපයෙන් දැවෙමින් තිබුණි.

‘‘තට ඒ උසස් ඇත්තොත් බලන්නට ඉඩ දෙනවා. එහෙත් තා ඒ වර යමක් කියන්නට අසමත් වූවහොත් තා කැලිවලට පෙති ගසනවා. අදිකාරම, කුමාරිකාවන්ටත් දේවීන්වහන්සේලාටත් මෙහි එන්නට කියව! එවිට මූට බලන්නට පුළුවනි.’’

‘‘අවසර දේවයන් වහන්ස, මේ කාලකණ්ණියා ඉදිරියට කුමාරිකාවනුත් දේවීන්වහන්සේලාත් කැඳවාගෙන ඒම උන්-වහන්සේලාට අවනම්බුවක් නොවන්නේද? ඔබ වහන්සේ තවත් මූගේ කපටි වදන් ඉවසන සේක්ද?’’ රජු ඉදිරියේ නැමී අදිකාරම කියා සිටියේය.

‘‘මා කියන්නක් කරව!’’ යි රජ ගුගුළේය.

එය ඉතා අමිහිරි දර්ශනයක් විය. මහාර්ඝ වස්ත්‍රාභරණයන් ගෙන් සැරසී ගත් රාජකීය කාන්තාවන් විසි දෙනෙක්, ලෙයින් තෙත් වී ගිය ගතින් යුත් අඩ නිරුවත් වැද්ද ඉදිරියේ සිට ගෙන සිටියහ. වැද්ද තැති ගෙන සිටියේය.

වැද්දා සියල්ලන් දෙසම පරීක්ෂාවෙන් බැලිය. ඔහුට කිසිවකු හඳුනා ගත නොහැකිව හිස වැනුවේය.

"දැන් තා මොකද කියන්නේ?" රජ ඇසුවේය.

"මං තවම ඒ ඇත්තො දුටුවේ නැහැ" යි වැද්දා සෙමින් කීවේය.

අතපය තැළී පොඩි වී බරපතල ලෙස තුවාල ලැබ සිටි වැද්දා වේදනාවෙන් මිරිකෙමින් බලවත් සේ තෙහෙට්ටු වී සිටියේය.

"අදිකාරම තොපට හොඳටම විස්වාසද මේ කාලකණ්ණියාට රජ වාසල සිටින සියලුම කාන්තාවන් පෙන් වූ බව"යි රජ අදිකාරම වෙත හැරී ඇසුවේය.

වැද්දා නුදුටු තව එක් අයකු පමණයි මාලිගාවේ සිටින්නේ."

"කවුද ඒ? ඇයි තොප ඇය අත් හැරියේ?"

"දේවයිනි, ඒ ඔබවහන්සේගේ ලේලී නාලිනී කුමරියයි. ඈට අද ටිකක් අසනීප වගේ."

රජ මඳක් කල්පනා කළේය.

"දේවයන් වහන්ස, මූ කාලය කා දමන්නට බොරු ගොතා කියනවා. අපි මූට ඕනෑවට වැඩිය නිදහස දුන්නා" යි අදිකාරම කීවේය.

අදිකාරම් කියූ දේ සැබෑ බව හැඟුණු රජ වැද්දා වෙත හැරුණේය.

"කාලකණ්ණි හිවලා, තා අප සමග සෙල්ලම් කරන්ට හදනව ද? තට සුදුසු එක ම දෙය ගහලයා ගේ දිවස් උලට යැවීමයි." කෝපාවිෂ්ටව මුර ගෑ රජ මුර සෙබළුන් වෙතට අත දික් කොට "මූ රැගෙන යව්! මැරෙන තුරු මූට වද දෙව්! හෙට උදෑසන දිවස් උල තියව්!" ගුගුළේය.

පමණ ඉක්මවා කරන ලද වද හිංසා නිසා දැන් වැද්දා ගේ ශරීරයට වේදනා නොදැනේ. "දෙයියෝ දැන් මගේ වද දෙන්ට දෙයක් නැහැ. ඔබවහන්සේට ඕනෑ දෙයක් කරන්ට මේ සරීරයට. දෙයියෝ බලා ගනින්, දිවුරලායි මේ කියන්නේ. මා කී හැම වචනයක්ම ඇත්ත" යි වැද්දා කෑගැවේය.

"මගේ ලේලිය මෙහි ගෙන එව" යි රජ එකෙණෙහිම අණ කළේය.

Scanned with CamScanner

# 10

## දඬුවම

මේ සිදුවන කිසිවක් නාලිනි නොදන්නාය. ඇගේ අඩ නින්දෙන් මෙන් පසුවුණු ඇ වහා අවදි කරවනු ලැබුවාය. රාජ සභාව ඉදිරියට යන හෙයින් ඇ ඊට සුදුසු ඇඟලුමකින් සැරසුණාය. අදිකාරම ඇය සභාව ඉදිරියට එක් කරගෙන ගියේය. එතෙක් අනෙක් රාජකීය කාන්තාවෝ ද රාජ සභාවෙහි නැවතී සිටියහ. තැතිගත් මුවැත්තියක මෙන් නාලිනී කුමරිය රජු ඉදිරියට පැමිණියාය. එහෙත් වෙනද සිය මාමණ්ඩිය ගේ ඇ දකින, ප්‍රේමාවනද්ධ බැල්ම අද නැත. වැද්ද බිමට නමා ගෙන සිටි හිස ඔසවා නාලිනී දෙස නෙත් යොමා බැලුවේය. ඇය හඳුනාගත් ලකුණු ඔහුගේ මුහුණෙහි දිස්විය.

''මේ ඇත්තො තමා මට කතා කළේ'' යි ඔහු ගොතලමින් ඉතා අමාරුවෙන් කීවේය. නාලිනී, වැද්ද එහි සිටිනු දුටුවේ එවිටය. ඔහුට ලැබී තිබුණු භයානක හිංසා පීඩා දැක ඇගේ මුළු සිරුරම අනුවේදනයෙන් ඇඹරී ගොස් ඇට ඉබේටම කැඟැසුණි. ඇ තමා අවට සෙස්සන් දෙස බැලුවාය. කවුරුත් මහත් අනිෂ්ට දෙයක් සිදුවන්නට යන කලක මෙන් බියෙන් ඇලලී සිටියහ. දැඩි නිසලතාව රාජ සභාව තුළ පැතිර ගියේය. බියෙන් තැතිගත් නාලිනීට තමා එහි හුදකලා වූවා සේ දැනිණි.

''මේ වැද්ද කියන දේ ඇයට කියනු!'' යි රජ අදිකාරමට අණ කළේය.

මහ අදිකාරම නාලිනීට ඉතා කරුණාවෙන් කතා කළේය. ''දියණියනි, මේ කැත වැද්ද කියනවා, කපිතාන්ලා පැන ගිය දට පසු ද ඔබ ඌට කතා කළාලු. එද මහ වාසලට මස් ගෙනා වෙලාවේ ඔබ ඌ රහසින් ඉවත කැඳවා කීවාලු ඉකුත් වූ රෑ ගත වූ මැදියම් වෙලේ ඔබ සුදු වැදි කොල්ලා දුටු බව. ඌගේ ඒ කීම ඇත්තද? එහෙම දෙයක් ඇත්තෙන්ම සිදු වුණාද?''

මේ පැනය අසත්ම ඇගේ මුහුණෙහි ඇතිවූ හදිසි විපර්යාසය නිසා ඇගේ සාවද්‍යතාව කාහටත් වැටහුණි. ඇ රාජ සභාව වෙත නෙත් යොමු කළාය. ඇය දිරිගන්වන කිසිදු නිමිත්තක් ඒ අවට නොවීය. රජ ස්වකීය රැවුල පිරිමදිමින් ඇය දෙස රවා ගෙන සිටියේය.

''කතා කරන්න කුමරිය'' යි අදිකාරම ඇගෙන් කරුණාවෙන් ඉල්ලිය. ''වැද්ද ගේ කිම බොරුවක් නම් ඒ බව කියන්න. මා කිවෙ ඔබට විරුද්ධව මේ වැද්ද කියන දේවලුයි.''

ඈ යළිත් වැද්ද දෙස බැලුවාය. දින බල්ලන් එලවා දඩයම කොට අල්ලා ගන්නා ලද වන සතකු මෙන් හේ ලෙයින් තෙත්වී අඩ පණව සිටියේය. ඔහුගේ බැගෑපත් බැල්ම හද කකියවන්-නක් විය. ඔහු කෙරෙහි ඈ තුළ බලවත් අනුකම්පාවක් හට ගත්තේය. තමා නිසා මේ අසරණ වැද්ද මෙවැනි දරුණු ඉරණමකට වැටී සිටින බැව් ඈට කල්පනා වුණි.

''ඔව්. මා ඔහුට කතා කළා'' යි ඈ කිවාය.

''ඔබ උංට කිව්වා ඔබ ඒ ඕලන්ද ජාතික කොලුවා දුටු බව?''

''ඔව්.'' ඇදහිය නොහැකි තරම් වූ ඇගේ මේ පිළිතුරෙන් සන්ත්‍රාසයත් බියත් සභා ගර්භය තුළ පැතිර ගියේය.

''කවදද? කොහේදිද?'' යි අදිකාරම වඩාත් උනන්දු විය.

නාලිනී සෙමින් කතා කරන්නට වූවාය. ''මීට සති දෙකකට පමණ ඉහත දිනක් රෑ මට නින්ද ගියේ නැහැ. එම නිසා මම ඇඳෙන් නැඟිට ගොස් කවුළුවෙන් පිටත බලාගෙන හිටියා. එසේ බලා සිටින විට හඳ එළියේ මට පෙනුණා අර කපිතාන් මැඳුර අසල තිබෙන ලොකු නුග ගහේ අතු පතර අස්සේ ඒ ඕලන්ද ජාතික තරුණයා කියා සැක කරන්ට පුළුවන් කෙනකු ඉන්න බව. පළමුවෙන් මා හිතුවේ එය මායාවක් නැත්නම් සිනයක් වත්ද කියල. නමුත් පසුව ද උදේ කපිතාන්වරු පලා ගොස් සිටින බව ආරංචි වුණාම මා හිතුවා ඔහු වෙන්ට ඇති කපිතාන්ලාට පලායන්ට උදව් කළේ කියලා.''

''මොනවා! තී ඒ ගැන මට කිසිවක් දැන්නුවාද?'' යි රජ උදහස් විය.

නාලිනී බිම බලා ගත්තාය.

''ඔබ ඒ බව වැද්දට පමණක් කියන්නට සිදුවුණු හේතුව කුමක් ද? ඒ ගැන කිසිවක් අපට දැනුම් නොදුන්නේ ඇයි?'' යි අදිකාරම පුදුමයෙන් ප්‍රශ්න කළේය.

"අද මා වැද්දා දුටුවා. ඔහුගෙන් මා ඇසුවා කපිතාන්වරුන් ගේ පලා යාම ගැන මොකුත් දන්නවාද කියල."

"ඉතින් වැද්දා මොකද කිව්වේ?"

"ඔහු ඒ ගැන මොකුත්ම නොදන්නා බව කිවා."

"තී මොනවද මේ දෙඩවන්නේ" යි රජ උත්සන්න වූ කෝපයෙන් ගුගුළේය. "තී දන් කිව්වාට වඩා දේවල් තී මේ ගැන දන්නවා. අදිකාරම වැද්දා ගෙන් අසව මගේ මේ ලේලිය ඌට තව මොකුත් කිවාද කියා."

සෙල්ලා ගෙන් අදිකාරම ඒ ගැන අසනවාත් සමගම සෙල්ලා නාලිනී දෙස බැලුවේය. ඇගේ බියපත් බැගෑ දෙනෙත් දුටු ඔහු තමාට ඈ වෙන කිසිම දෙයක් නොකී බැව් කීවේය.

"මූ කියන්නේ බොරු" යි රජ මහ හඬින් ගුගුළේය.

රජු ගේ සැකය හේතු සහිතය. ඔහුට නාලිනී මේ ගැන කතා කළ බව කිසිවකු හට නොකියන ලෙසත් හැන්ස් පිළිබඳ තොරතුරු සොයා ගෙනැවිත් ඇයට දන්වන ලෙසත් ඒ වෙනුවෙන් ඔහුට තෑගි දෙන බවත් නාලිනී විසින් තමාට කියන ලද බව සෙල්ලා දනී.

ළඟ සිටි රැකවල්හු දෙදෙන වැද්දා ගේ දෑත් අඹරවන්ටත් ඉල ඇටවලට අනින්ටත් පටන් ගත්හ. එහෙත් සෙල්ලා ගෙන් පිට වූයේ සිරුර මස් ඇඹරෙන ගෙළෙහි හුස්ම හිරවෙන වේදනා හුංකාරය පමණි. අන්තිමේදී ඔහු සිහිසන් නැතිව බිම ඇද වැටුණේය.

එකෙණෙහි සභා ශාලාවේ දොරටුව දෙසින් ගාලගෝට්ටියක් ඇසෙන්නට විය. ඒ සමගම සෙබළුන් දෙදෙනෙක් රැකවලෙහි සිටි වෙනත් සෙබළකු බලෙන් අල්වාගෙන රජු ඉදිරියට ගෙනාවෝය.

"කිමෙක්ද මේ?" යි රජ උදහස් පළ කළේය.

"මේ විදියටත් පුළුවන්ද තොපට මා ඉදිරියේ හැසිරෙන්ට?"

සෙබළෝ රජු ඉදිරියේ දණ්ඩ නමස්කාරයෙන් වැටුණෝය. එකෙක් මෙසේ සැල කළේය.

"දේවයන් වහන්ස, අවසරයක් නැතිව මෙහි ඇතුල්වීම ගැන අපට සමාවන සේක්වා! දේවයිනි, අප මෙහි ආ කාරණය පමා කළ යුත්තක් නොවේ. කපිතාන්වරුන් පලාගිය දින ඉකුත්

රාත්‍රියෙහි මාලිගාවේ මහ වාසල රැකවලේ සිටියේ මොහුයි. මොහු දනුයි කියන්නේ එද රැ අවසන් මැදියම සුදු වතක් හිසේ සිට පොරවාගත් ස්ත්‍රී රූපයක් කපිතාන් වාසය පැත්තේ සිට පාර හරහා බිසෝ මන්දිරය දෙසට එනු දුටු බව. අවතාරයක් යයි සිතා ඔහු හුන් තැනම දෙඇස් පියා ගෙන ඇකිළී සිටියාලු. පසුව ද උදේ මොහු ඒ ස්ථානය පසු කොට යද්දී පද්මරාග මැණික් එබවූ මේ වළල්ල ඔහුට හමුවුණාලු. දැන් ටිකකට පෙර මේක මොහු ළඟ තිබී අපට දකින්නට ලැබෙන තෙක් මොහු ඒ ගැන කාටවත් කිසිවක් කියා නැහැ. මේ තරම් වටිනා වස්තුවක් ඔහුට ලැබුණේ කෙසේ ද කියා අපි ඔහුගෙන් ප්‍රශ්න කළා. ඔහු කියා සිටියා එය අවතාරයක් දමා ගිය තෑග්ගක් කියා. අපි ඔහුට බල කර සිටියා මේ ගැන ඇත්ත සිද්ධිය කියන්නට. ඊට පසු තමයි ඔහු මේ කතන්දරේ කිව්වේ. දෙවියන් ඉදිරියෙහි ගැත්තන් අනවසරයෙහි පැමිණීම ගැන ගැත්තන්ට සමාවී වදාරනවා හොඳයි.''

''ඔය වළල්ල මෙහි දෙව!'' යි රජ වළල්ල ගන්නට අත පෑය.

අදිකාරම එය සෙබළා අතින් ගෙන රන් තැටියේ තබා රජ හට දුන්නේය.

රජු වළල්ල දෙස නෙත් හෙළේ එක් වරකි. කෝපාග්නියෙන් දිලිසෙන්නට වූ ඔහුගේ දෙනෙත් නාලිනී වෙත යොමුවිය. නාලිනී, රැකවල සෙබළා දුටු අවතාරය මෙන්ම සුදුමැලි වූවාය. මේ වළල්ල රජු විසින් ඇට තෑගි දෙන ලද්දකි.

දැඩි නිහඬතාවක් සභා ගර්භය තුළ පැතිර ගියේය. රජ තෙමේ ද කිසිවක් තීරණය කර ගත නොහැකිවාක් මෙන් බලා සිටියේය.

නැවත ප්‍රකෘති සිහිය ලද රජ තෙමේ සිය අදිකාරම් නිලමෙවරුන් සය දෙන හැර අන් සියල්ලන්ම සභා ගර්භයෙන් පිට කරවීය.

ඉක්බිති රජ කතා කළේය. ඔහුගේ කට හඬෙහි වෙන ද පුරුදු සෙනෙහෙබර ස්වරය යළිත් හටගෙන තිබුණි. හේ කරුණාවෙන් කතා කරන්නට විය.

''දරුව, කපිතාන්වරුන් පලායන ද ඉකුත් රාත්‍රියෙහි ඔබ ඔවුන්ගේ වාසය අසල උන් බව ඇත්තක්ද?''

නාලිනී සිය හිස වඩාත් බිමට හරවා ගත්තා විනා කතා නොකළාය.

''ඔබට ඒ ගැන කියන්නට දෙයක් නැද්ද?'' යි රජ තව දුරටත් සෙනෙහෙබරව ඇසුවේය.



රජු වළල්ල දෙස නෙත් හෙළේ එක් වරකි

Scanned with CamScanner

"දුව මේ ඇත්තක් වන්නට බැහැ. ඔබ, මගේ දයාබර ලේලිය—සිවුමැලි කුමරිය—ඒ ගතවූ මැදියම් රයේ වැදි කොල්ලා සමග එසේ කතා කරන්නට ගියා කියා හිතන්නට බැහැ. ඔබ අපේ මුළු රජ පවුලට නිගා දෙන මෙවැන්නක් කෙසේ නම් කරාවිද? වැදි කොල්ලා එහි සිටි බව ඔබ දැන ගත්තා නම් මට ඒ නොව දන්වා නොසිටින බව මා දන්නවා. මගේ දුව මේ ඇත්තක් වන්නට බැහැ. එසේ නම් ඒ බව කියන්න." සිය ආදරණීය ලේලියට අභය දිය හැකි චින්තා මාත්‍රයකින් රජ බලා සිටියේය.

එහෙත් කුමරිය නොසැලී නිහඬව සිටියාය.

"තිට මේ ගැන කියන්නට මොකුත්ම නැද්ද?" යි හද තුළ කරුණාව නොසිඳිය ද රජ පැහැදිලි තෙපලෙන් ඇසුවේය.

නාලිනී රජු ඉදිරියේ දණින් වැටුණාය. "මා හිතුවා ඉන් විපතක් වන එකක් නැහැ කියා. මා ඇසුවා ඒ ඕලන්ද ජාතික තරුණයා ගෙන් ඔහු ආවේ ඇයි ද කියා. නමුත් ඔහු ඒ ගැන කිසිත් කීවේ නැහැ. මා ඔහුට කතා කළේ වචන දෙක තුනයි" යි ඈ ඉතා බැගෑපත් හඬින් කීවාය.

"තොප සියල්ලන්ම මෙතැනින් ඉවත්ව යව්! මට නිදහසේ සිටින්නට ඉඩ හරිව්!" යි කියමින් සියල්ලන්ටම ඉවත්වන ලෙස රජ අතින් ද සංඥා කළේය. "මේ ගැන මගේ තීරණය හෙට මේ වෙලාවටම ප්‍රකාශ කරන්නෙමි" යි හේ නැවතත් වේගයෙන් කීවේය.

ඉන්පසු රජ මහත් සේ ශෝකාකුලව මුහුණ වසා අත හිස තබා ගත්තේය.

සිය නළල අත තබාගත් රජ තෙමේ සිංහාසනයේ වාඩිගෙන බොහෝ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටියේය. ඔහුට දැන් ඔහුගේ කපිතාන්වරුන් ගෙන් වැඩක් නැත. ඒ වෙනුවෙන් දැන් ඔහුට සිය ලේලිය ගෙන් ද වෙන්වීමට සිදුවී ඇත. මුළු මහත් මාලිගය තුළම රජු ගේ ආදරය දිනා ගෙන සිටි එකම තැනැත්තිය නාලිනී කුමරියයි.

මීට ප්‍රථම ඈ, රජු ගේ සිරකරුවකුව සිටි ඕලන්ද ජාතිකයාට ඇගේ සුරය දීමෙන් ඔහු හා සබඳකම් පවත්වා රජුට ද්‍රෝහිකම් කොට ඇත. දැන් ඔහු යළිත් අවතාරයක් මෙන් මෙහි අවුත් රජුට විරුද්ධව කුමන්ත්‍රණයකට ඈ ද හවුල් කරවා ගෙන තිබේ. මේ ගැන තව දුරටත් කල්පනා කිරීමේ තේරුමක් නැති බව රජුට පෙනී ගියේය. තමා විසින් කළ යුතු දේ දැන් රජුට පැහැදිලිය. රජ කෙනකු වශයෙන් ඔහු මෙහි දී අපක්ෂපාතීව ක්‍රියා කළ යුතුය.

මෙවැනි අවස්ථාවක දී රාජ නීතිය අකුරටම පිළිපදින් මෙ රජ තෙමේ යළිත් කල්පනා කරන්නට වූයේය. එදින මුළු දවසත් එද රාත්‍රියත් රජ මේ ගැන ස්ථිර නිගමනයකට බැස ගත නො හැකිව වද වින්දේය.

කෝපය මැඩපවත්වා ගැනිමෙන් රජුට නිවී සැනසිල්ලේ කල්පනා කළ හැක. බලවත් සේ කෝපයට පත් බොහෝ අවස්ථාවල දී බොහෝ දෙනෙක් රජු අතින් දරුණු වද හිංසාවලට ගොදුරු වූහ. මේ බරපතල වරදට අසුවී සිටින්නේ තමාගේම ලේලිය බැවින් ඒ ගැන හදිසියේ තීරණයක් ගැනීම රජ අත් හළේය. අනුකම්පා සහගතව මේ ගැන යුක්තිය පසිඳා ගත හැකි මඟක් ගැන හේ කල්පනා කළේය. සාමාන්‍යයෙන් ගැහැනියක මෙවැනි වරදකට අසු වුවහොත් ඒ වෙනුවෙන් රජු ගෙන් ලැබෙන දඬුවම බිහිසුණු එකකි. එය බෝගම්බර වැවේ ගිල්වා මැරීම හෝ ඇතැම් විට ඊටත් වඩා දරුණු එකක් විය හැක.

නාලිනී, රජු ගේ ලේලියයි. එහෙත් හේ රජ කෙනෙකි. එහිදී කාට වුවද විශේෂයක් කිරීමට ඔහුට ඉඩ නැත. මෙතරම් කාලයක් තමන් විසින් අකුරටම පිළිපදින ලද පාරම්පරික රාජ නීතියෙන් ඔහුට ගැළවී ගත නොහැක. නාලිනී වරදකාරිය හැටියට ඔප්පු වේ නම් තමා ඒ රාජ නීතිය අනුව නිසි දඬුවම ඇයට දිය යුතුමය.

පසු ද නියමිත වේලාවට රාජ සභා ශාලාව විශාල ප්‍රභූ පිරිසක ගෙන් පිරී තිබුණි. මහ අදිකාරම්වරුන්, මහ නිලමේවරුන් හා රාජකීය කාන්තාවන් ආදී රාජකීයයෝ තම තමහට නිසි නිසි නිල ඇඳුම්වලින් සැරසී වාඩිගෙන සිටියහ.

සභා ශාලාවට යාබද කාමරයක නාලිනීත් ඇගේ යෙහෙළිය වන සුජාතාත් සිටියහ. දැන් මුළු මහත් මාලිගයේම සිත් සතන් යොමුවී ඇත්තේ එකම දෙයක් කෙරෙහිය.

රජ තෙමේ රාජ ගෞරව සහිතව සභා ශාලාවට පිවිස රාජා-සනයෙහි වාඩි ගත්තේය. රාජාධිකරණයේ මූර්තිමත් ලක්ෂණය වන කඩුව හා හෙල්ල බැගින් ගත් අත් ඇති කාපිරි හේවක්කාර-යන් දෙදෙන රජු දෙපස සිට ගත්හ. රාජාභරණයෙන් අලංකාර වූ සිය දකුණත ඔසවා රජ සංඥාවක් කළේය.

මහ අදිකාරම රජු ඉදිරියේ නමස්කාර පූර්වකව සිට ගත්තේය.

ඉක්බිති රැකවල් ගැහැනුන් දෙදෙනකුන් විසින් රත්මිණි මුතු පැළඳ සුදු වතින් සැරසුණු නාලිනි කුමරිය රජු ඉදිරියට ගෙන එනු ලැබුවාය. ඒ සමගම මුර සෙබලුන් දෙදෙනකුන් විසින් වත්තම් කරනු ලැබූ වැද්ද ද එහි ගෙන එනු ලැබීය. වැද්ද ගේ තත්වය ඉතා බරපතල විය. නාලිනීත් වැද්දත් මුරකාවල් සහිතව රජු ඉදිරියේ සිටගෙන සිටියහ. අදිකාරම්වරු ද මහ නිලමේවරු ද රාජකීය කාන්තාවෝ ද සභා ගර්භයෙහි රැස්වී ඔවුන් දෙස බලා සිටියහ.

නාලිනීත් වැද්දත් අතර ඇති පරතරය කෙසේ නම් විස්තර කරන්ට ද? ළපටි රූපත් තරුණියක වූ නාලිනි ඉතා වටිනා ඇඳුම් ආයිත්තම්වලින් සැරසී භීතියෙන් සුදුමැලිව හිස බිමට හරවාගෙන සිටගෙන හුන් අතර සෙල්ලා ලෙයින් තෙත්වූ ගතින් අඩ නිරුවත්ව අඩ පණව සෙබළුන්ගේ වාරුවෙන් සිට ගෙන සිටියේය.

මුළු සභා ගර්භයම බිහිසුණු නිසලතාවකින් වෙළී ගියාය. ඉක්බිති රජ තෙමේ රාජ සභාව අමතන්නට විය. ''මීට කලකට පෙර මෙහි සිරකරුවකුව සිට ගැළවී ගිය ඕලන්ද ජාතික තරුණයා මේ ළඟ දී මෙහි ආ බව අපට දැන ගන්නට ලැබී තිබේ. දිවා රෑ ඉතා පරීක්ෂාකාරීව මුරකාවලෙහි යෙදී සිටින්නේ යයි කියනු ලබන දහස් සංඛ්‍යාත ඊනියා මුර සෙබළුන් අස්සක් මුල්ලක් නැර මෙහි සිටිය දී ඒ ඕලන්ද ජාතිකයා මෙම රාජ-ධානියේ කේන්ද්‍රස්ථානයටම ඇතුළු වී කපිතාන්වරුන් දෙදෙනා රැගෙන පලායාම මහත් අබිරහසක්ව පවතී. මෙවැනි දෙයක් සිදුවීමට ඉඩ තැබීම ගැන වගකිවයුතු වංචනික නිලධාරීන් ගැනවත් පලා ගියවුන් සොයා ගැනීමට අසමත් වූ නිලධාරීන් ගැනවත් නොවේ මා දැන් කතා කරන්නේ. දැනට ඔවුන් ගැන යමක් මම නොකියමි. යථා කාලයෙහිදී මම ඔවුනට නිසි දඬුවම් දෙන්නෙමි.''

රජු ගේ බිහිසුණු කට හඬින් රාජ සභාව වෙව්ලා ගියාය. බලවත් සේ උණුසුම්ව නැගී එන්නාවූ ස්වකීය හැඟීම් නැවතත් පාලනය කරගත් රජ තෙමේ ගැඹුරු දුක්මුසු හඬකින් කතා කරන්නට විය. ''අද අප මෙහි රැස්ව සිටින්නේ මේ රාජකීය තරුණියටත් මේ වැද්දටත් විරුද්ධව තීන්දුවක් දීමටයි. හැන්ස් නමින් හඳුන්වනු ලබන ඒ වනචාරී ඕලන්ද කොල්ලා මගේ සිරකරුවකුව සිටිය දී මේ අප ඉදිරියේ සිටගෙන සිටින නාලනී කුමරිය ඔහු කෙරෙහි ළැදියාවක් දක්වූ බව ඔප්පු වී තිබේ. ඇගේ

Scanned with CamScanner

කරේ තිබුණු සුරය ඒ කොල්ලා ගේ සිරකූඩුවෙහි තිබී එද හමු විය. එය එතැනට කෙසේ ගියාද කියා අපට සොයාගත නොහැකි විය. එහෙත් එය ඒ සිරකූඩුවෙහි තිබුණි. එහෙත් ඊට මා ඇයට සමාව දුන්නා. මේ මුළු මාලිගයෙහි සිටින අන් කිසිම කෙනකුට නොදෙන සමාවක් මා ඇට ඒ අවස්ථාවේ දී දුන්නා.''

රජ මේ වදන් තෙපලේ ඔහුට ඊළඟට කියන්නට ඇති දේවල ආයාසය මැඩගන්නට මෙනි. ඔහු කතාව නවතා අතින් දෙබැම පිරිමැද්දේය. කිසියම් සැනසිලිදයක පසිඳලීමකට තුඩු දෙන්නක් කාගෙන් හෝ වේදැයි බලාපොරොත්තුවෙන් හේ රාජ සභාව දෙස නෙත් හෙළුවේය. එවැන්නක් එහි නැත. හේ බලාපොරොත්තු අත් හළේය. ගතවූයේ මොහොතක් හෝ දෙකකි. රජු ගේ හද යළිත් දැඩිව කතා කරන්නට වූයේය.

''ඒ ඕලන්ද ජාතිකයා යළිත් මෙහි පැමිණි අවස්ථාවේ මගේ මේ ලේලිය ඔහුට කතා කළ බව ඈ විසින්ම පිළිගෙන ඇත. ඔහු කන්දේ නුවරට ආ බව ඈ අපට නොදැන්වීමෙන් ඒ ඕලන්ද කොල්ලා ගේ කුමන්ත්‍රණ ප්‍රයෝග අනාවරණය කොට ඌට සුදුසු දඬුවම් දීමට අවස්ථාවක් අපට නොලැබී ගියේය. කපිතාන්වරුන් පැන යාමත් මට අවමානයත් එහි ඵලවිපාක වී තිබේ. තද බල රාජද්‍රෝහී ක්‍රියාවකි.''

රජු ගේ අවසාන වචනවලින් රාජ සභාව භීතියෙන් ඇලලී ගියාය.

බියෙන් මුසපත්ව සිටි නාලිනී පිටුපසින් සිටි ඇගේ යෙහෙළිය සුජාතා, සිය වැලමිටින් නාලිනීට සෙමින් ඇන්නාය. නාලිනී රජු ගේ දෙපතුල් ළඟ ඇද වැටී හඬන්නට වූවාය. ''මාමණ්ඩිය, මා නොදැනුවත්ව කළ වරදට සමාවන්න මාමණ්ඩි. මාමණ්ඩි මා දැන සිටියේ නැහැ ඔහු පැමිණ සිටියේ කපිතාන්වරුන් ගෙන යන්නට බව. මගේ අම්මාත් තාත්තාත් ගැන දිවුරන්නම්, මා ඒ බව දැන සිටියේ නැහැ මාමණ්ඩි.''

නාලිනී ගේ මේ වදන්වලින් රජු ගේ ගලක් බඳු හද උණුවී යන්නට විය. එහෙත් හේ එය අමාරුවෙන් යටපත් කර ගත්තේය. නාලිනී ඔසවන ලෙස රැකවල ගැහැනුන්ට හේ අණ කළේය. රජ විනාඩියක් පමණ නිශ්ශබ්දව බලා සිටියේය. නැතිගෙන සිටි රාජ සභාවට එය පැයක් බඳු විය. රජු ගේ නළල් තලය අඳුරු පැහැගැනී තොල් එකට තදවී තිබුණි. ඔහුගේ මොලය එකම අවුල් ජාලයක් බවට පත්විය.

යළිත් ඔහුගේ ස්වභාවය වෙනස් විය. හේ කෝපයෙන් කතා කරන්නට විය.

''තවත් එකක්!'' යි රජ වැද්ද දෙසට අත දික්කරමින් කතා කරන්නට විය. ''අප කිසිවෙක් ගැන නොතකා මැ මේ ගල් වැද්දට ඒ බව කිවා. සිද්දිය පිළිබඳ කිසිවක් ඇය අපට දන්නුවේ නැහැ. මේ නම් බරපතල වරදක්. යුක්තිය නම් ඉටුකළ පරිද්දෙන්ම ඉටුකළ යුතුයි.''

යළිත් ස්වකීය හද තුළින් නැගී එන හැඟීම් යටපත් කිරීමට රජ කතාව අත්හිටවූයේය. නැවතත් වේගයෙන් කතා කරන්නට විය. ''මේ තරුණියත් වැද්දත් පෙළට සිටුවව්!'' යි හේ අණ කළේය.

මුර සෙබළකු ගේ ඇණවුමෙන් වැද්ද අමාරුවෙන් නැගිට සිටියේය. වැද්ද ගේ තැළුණු බිඳුණු අත් පා ඔහුට තද වේදනාවක් ගෙන දෙන්නට විය. නාලිනීත් වැද්දත් පසෙක සිටුවනු ලැබූ-වෝය. වද වේදනාවට පත් වුවද වැද්ද ගේ දර්ශනය බිය එළවන්නේය. ඔහු පසෙක ළද වයසේ සිවුමැලි රූපත් රජ කුමරිය බිම බලාගත් වනම නොසැලී සිටිනු දුටුවන් තුළ ඇති කළේ මහත් අනුවේදනයකි.

''ඔය බුලත් මෙහි ගෙන එව්!'' යි රජ නියෝග කළේය.

සිදුවන්නට යන්නේ කුමක්දැයි වැටහුණු රාජ සභාවේ සිටි ස්ත්‍රීහු දුක් සුසුම් ලන්නටත් මුමුනන්නටත් පටන් ගත්හ. රාජකීය කාන්තාවක විසින් පහත් මිනිසකු හා සබඳකම් පැවැත්-වීමෙන් රජ කුලයට නිගා කිරීමේ වරදට පනවනු ලබන දරුණු දඬුවමකි මේ දැන් පැනවීමට යන්නේ. මෙය මරණීය දණ්ඩන-යටත් වඩා දරුණු එකක් ලෙස ඔවුහු සැලකුවෝය.

තැටියක තබන ලද බුලත් කොළ කීපයක් රජු වෙත ගෙන එන ලදී. රජු ගෙන් ලැබුණු අණ අනුව අදිකාරම් නිලමේ කෙනෙක් එක් බුලත් කොළයක් ගෙන දෙකට ඉරුවේය. ඉක්බිති ඔහු ඒ බුලත් ඉරු දෙකෙහි පුවක් කැබැල්ලක් හා හුනු ස්වල්පයක් බැගින් තබා හැකිළුවේය. මෙසේ හැකිළූ එක් බුලත් විටක්, මේ කුමක් සිදුවන්නට යන්නේ දැයි විමතියෙනුත් භීතියෙනුත් බලා සිටින වැද්දට කන්නට කියා දුන්නේය. අනෙක් බුලත් විට නාලිනී වෙත දී ඇට කන්නට කීවේය.

''එපා! එපා! මට එපා!'' යි එය ඉවතට තල්ලු කරමින් කෑ ගැසූ නාලිනී රජතුමා දෙස මහත් බැගෑපත් බැල්මකින් බැලුවාය. එහෙත් කිසිදු සානුකම්ප පෙනුමක් රජු කෙරෙහි නොමැති බව ඇයට පෙනී ගියේය.

නාලිනී හාරව සිටි රැකවල ගැහැනිය ඒ බුලත් ඉරුව නාලිනීට බලයෙන් කවන්නට වූවාය. නාලිනී වරින් වර කාරා එය ඉවතට දැම්මාය.

මහ අදිකාරම ගේ කුමාරිහාමි ගේත් සුජාතා ගේත් සහාය ඇතිව නාලිනී ඇඳ පැළඳ ගෙන සිටි සියලුම රන් මිණි මුතු අබරණ කඩා ඇගේ ඇඟෙන් ඉවත් කරන ලදී. මුතු මැණික් ඔබ්බවන ලද ඇගේ රන් වළලු ද රන් මාලය ද අනෙක් කනකර ආයිත්තම් ද ආදී සියලුම අබරණවලට එකෙණෙහිම ඈ අහිමි වූවාය.

''සුජාතා ඔබ ඕවා තියාගන්න'' යි නාලිනී කොඳුළාය.

මේ, නාලිනී සිය යෙහෙළි සුජාතාට කතා කළ අවසන් වචනයි.

''දැන් ඉතින් මැය රැගෙන යව!'' යි රජ වැද්දට අණ කළේය.

''මින් පසු ඈය තොප ගේ වරිගයේ එකියක්. තොපට රිසි දිහාවක දැන් යන්නට පුළුවනි. වහා දැන් මෙතැනින් පිටවී යව්! නැවත මගේ කන්දේ නුවර පස් පාගන්නට නොඑව්!'' යි රජ ගුගුළේය.

නොසිතූ තරමේ කරුණාවකින් හා දයානුකම්පාවකින් වෙලී ගිය සෙල්ලා නාලිනී පෙරටු කොට ගෙන රජ වාසල පසුකොට මහ මඟට අවතීර්ණ වූයේය. විශාල ජනකායක් ඔවුන් බැලීමට මඟ දෙපස රැස්වී සිටියහ. මුළු ගතම ලෙයින් තෙත්වී දුර්වර්ණවී සිටි සෙල්ලා ඉතා අමාරුවෙන් ගමන් කළේය. ඔහුගේ අත් පා ඔහුට වළංගු නොවීය. නාලිනී සෙමින් සෙමින් වැද්ද අනුව පිය නැගුවාය. ඇගේ රුවත් සිහින් දේහය මැලවී ගොස් තිබුණි. ඈ දෙ අතින් මුහුණ වසා දෙ වැලමිට පපුවට තද කරගෙන හැඬුවාය. මග දෙපස සිටියෝ ශෝකයෙන් හා සන්තාපයෙන් ඔවුන් දෙස බලා සිටියහ.

Scanned with CamScanner

# 11

# දුර්ග තරණය

මේ අතර හැන්ස්, ගැස්පා පිගේරා සහ එඩ්මන්ට් වැන් ස්ටියර්වේල්ට් රජු ගේ රාජධානියෙන් බොහෝ ඈත ගොස් සිටියහ. ඔවුන් කලින් යොද ගෙන තිබුණු උපක්‍රමය අනුව රාත්‍රියෙහි රහසින් නගරයෙන් පිටවූහ. හැන්ස් පෙරටුව ගමන් ගත්තේය. කපිතාන්වරුන් දෙදෙනා ඔහු අනුගමනය කළහ. රාත්‍රියත් දවාලත් හැන්ස්ට එක හා සමානය. ඔහු එතරම් රාත්‍රියට හුරු පුරුදුව සිටියේය. මාලිගය පිටු පසින් වූ මහා කන්ද පාමුලට පැමිණීමට ඔවුන්ට වැඩි වේලා ගියේ නැත. මෙහි දී ඔවුහු විශේෂයෙන් පරික්ෂාකාරි වූහ. මෙහි මුර සෙබළෝ නිතර සැරි සැරූහ. එක් තැනක මුර සෙබළකු සිටිනු දුටු හැන්ස් ඔහු වෙත සුදුසු මානයේ ළංව කොටියකු මෙන් ගෙරෙව්වේය. සෙබළා ඔහු හුන් තැනින් මහ හැර ගියේය.

හැන්ස් ගේ මහ පෙන්විම අනුව කපිතාන්වරුන් දෙදෙනා මහ වනයෙන් වැසිගත් කන්ද ඉහළට නගින්නට වූහ. ප්‍රපාතය ඉහළින් පහළට පෙරළි ආ ලොකු ගල් තැනින් තැන රැඳී තිබුණි. කන්ද ඉහළට නගින්ම ඔවුනට වඩා ඍජුව නැගි ගල් කුළු පසු කර යන්නට සිදුවිය. මේ බෑවුම් දිගේ ඉහළට නැගීම හැන්ස්ට නම් එතරම් කාරියක් නොවීය. එහෙත් කපිතාන්වරුන්ට එය මහත් විඩා ගෙන දෙන්නක් විය. සමහර තැනක දී කපිතාන්-වරුන් දෙදෙනා කිසිවක් කර කියා ගත නොහැකිව බලා සිටියෝය. එවිට හැන්ස් ඔවුනට අත දුන්නේය. දහවල් කාලයක දී නම් බෑවුම තරණය කිරීම කපිතාන්වරුන්ට අමාරු-වෙන් කළ හැකි වූ නමුදු තරු එළිය පවා නොවැටෙන සේ රුස්ස ගස්වලින් හා සන අතු පතරවලින් ගහන වූ බෑවුම් ඒ රාත්‍රියෙහි නැගීම සිතීමට පවා බිය ගෙන දෙන කාර්යයක් විය. එහෙත් හැන්ස් ගේ උදව් ඇතිව ඔවුහු මහත් අමාරුවෙන් කන්ද නගින්-නට වූහ.

දණගාමින් ද බඩගාමින් ද ඔවුහු රාත්‍රිය මුළුල්ලේම හති ලමින් කන්ද නගින්නට වූහ. පෙරදිග අහසේ අරුණලු නැගෙන හැටි මීදුම අතරින් ඔවුනට දිස්විය. මේ වන විට ඔවුහු කඳු මුදුන කිට්ටු කොට සිටියහ. දැන් ඔවුන් ඉහළින් ඇත්තේ තනි කළු ගල් පව්ව පමණි. හැන්ස් කලින් සිතා පිළියෙල කරන ලද වැල්වලින් තැනූ වැල් ඉණිමඟ එහි විය. ඔවුහු එය ආධාර කොට ගෙන කොත් පව්ව නැග මුදුනෙහි වූ කුඩා ගුහාවක් තුළට පිවිසියහ. හැන්ස් ඉණිමඟ ඉහළට ඇදගත්තේය.

Scanned with CamScanner

කඳු මුදුනේ වූ දැඩි ශීතලය ඔවුනට හිරිහැරයක් විය. එහෙත් ඔවුහු ඉන් මිදීමට ගිනි ගොඩක් ගැසීමට බිය වූයේ ඉන් නගින දුම් නුවරුනට පෙනිය හැකි බැවිනි. නගරයේ සිට බොහෝ දුර ගෙවා ගමන් කළ නමුත් ඔවුන් ආ මහ කඳු බැවුමේ වට රවුමකි. එහෙයින් පහළින් ඇති නගරය තවම ඔවුනට දර්ශනය වේ.

වෙනද නියමිත වේලාවට මුරකාවල් පිරික්සීමට පැමිණෙන කපිතාන්වරුන් ඒ වේලාවට නොපැමිණීමෙන් ඒ ගැන රැකවලහු කලබලයට පත්වන බවත් ඒ බැව් රජුට සැලවූ කල පලාගිය කපිතාන්වරුන් ඇල්ලීම සඳහා රජු අස්සක් මුල්ලක් නැර සෙබළ කණ්ඩායම් යවන බවත් රට හැම තැනම මේ ගැන අණ බෙර ලවන බවත් ඔවුහු දැන සිටියහ. එහෙත් මාලිගය පිටු පසින්ම විහිද ගිය මේ බිහිසුණු බැවුම් සහිත කන්ද මුදුනෙහි ඔවුන් සිටිතැයි කාට සිතිය හැකිද?

කඳු මුදුන හොඳින් එළිය වුණි. ඔවුන්ගේ සිරුරු කුඩැල්ලන් කෑමෙන්, ලෙයින් තෙත්වී තිබෙනු දක්නට ලැබුණේ එවිටය. කුඩැල්ලෝ තවත් ඔවුන්ගේ සිරුරුවල එල්ලී සිටියහ. ඔවුහු දුම්කොළ සපා ඉන් කෙල රැගෙන එල්ලී සිටින කුඩැල්ලන් මුව ගෑමෙන් උන් ගළවා දැමූහ. එහෙත් ලේ ගැලීම දිගටම පැවතුණි. ඔවුන් ඒ ගැන එතරම් සැලකිල්ලක් දැක්වූයේ නැත.

හිරු නැගී එත්ම ඔවුහු නිදල්ලේ වාඩි ගෙන මහට ගෙනා ආහාර අනුභව කරන්නට වූහ. අනතුරුව ඔවුහු ළඟ තිබුණු අරක්කු බෝතල්වලින් ස්වල්පය බැගින් ගෙන පානය කළහ. මත් පැනිනුත් අහරවලිනුත් විඩාව පහ කරගත් ඔවුහු, ඔවුනට දැන් ලැබී ඇති අලුත් නිදහසේ සුවය විඳින්නට වූහ.

පසුගිය රාත්‍රියේ එකිනෙකා අත්දුටු දේ ගැනත් ඔවුනොවුන්ගේ අනාගත වැඩ පිළිවෙළ ගැනත් ඔවුහු සාකච්ඡා කළහ. අනුක්‍රමයෙන් ගැස්පා ගේ කතාව අඩු වී ගියේය. ඔහු මහත් බර කල්පනාවක නිමග්න වී සිටිනු පෙනුණි.

''මොකද ගැස්පා ඔබට වෙලා තියෙන්නේ? ඔබට අසනීපයක් වත්ද?'' යි එඩ්මන්ට් ඇසීය.

''නෑ, මං ඔහේ කල්පනා කළා.''

''මොනවද?''

''නිධාන් ගැන.''

"මගේ දෙවියනේ මෙහෙමත් පුදුමයක්!" යි එඩ්මන්ට් හඬ නගා කීවේය. "හැන්ස්, මේ වගේ දෙයක් මීට පෙර ඔබ අහල වත් තියෙනවද? අපි මේ පණ බයේ පලායනවා. මේ මිනිහා නිධාන් ගැන හීන දකිනවා. අනේ අනේ, මෙහෙමත් විගඩමක්."

"ඉතින් ටිකක් ඉවසපල්ලකෝ. මා කියන දේ හොඳින් අහ ගනිල්ලා" යි කී ගැස්පා සිය සගයන් දෙදෙනා අසලට ඇදුණේය.

"අපි මේ ඉන්න කඳු පාමුල රජු ගේ මුරකාවල් තිබෙනවා. කිසිම කෙනෙකු මේ කන්දට නැගීම රජු විසින්ම තහනම් කොට තිබෙනවා. එඩ්මන්ට්, ඔබට මෙයින් යමක් වැටහෙන්නේ නැද්ද?"

"ඔව්, අපි මෙහෙන් ඉක්මනට ගිය තරමට හොඳයි."

"ඔව්, ඒක මං දන්නවා. නමුත් අපි ටිකක් මෙහේ සොයලා බලලා ගියොත් හොඳයි නේද? නිකම් දේව බලයකින් වගේ අපව මෙහාට එවුණේ."

"මොනවා හොයන්ටද අපි මෙකෙ ලගින්නෙ?" යි එඩ්මන්ට් ගැස්පා දෙස බලාගෙන සිටියේය. ඔහුට ගැස්පා ගේ අදහස යන්තමින් වැටහුණි.

"රජතුමා ඔහුගේ ධනය පෘතුගීසීන් ගෙන් ආරක්ෂා කිරීමට මේ පර්වත අස්සේ නිධාන් කරල තියෙන බව බොහොම දෙනෙක් කියනවා. ඉතින් ඒ ධනය මෙහි කොහේ හෝ තියෙන්නට ඕනෑ."

"ඉතින් අපට මොකද?"

"අපි හොයමු බලන්ට!"

"ඔව්, හොඳ වැඩේ. නිධාන් හොයන්ට ගිහින් රාජ පුරුෂයන්ට අහුවෙන්ට. මෝඩයෙක් වෙන්ට එපා ගැස්පා. රජු ගේ මුර භටයන් දැනුත් මේ කන්ද නැග ගෙන එනවද නැද්ද කියල කාටද කියන්ට පුළුවන්."

"නෑ නෑ, එහෙම වෙන්නෙ නැහැ. ඔවුන් දන් රට හැම තැනම ගිහින් අපව හොයනවා ඇති. නමුත් මේ කන්ද මුදුන ගැන ඔවුන්ට කාටවත් කල්පනා වෙයි කියල මා නම් හිතන්නේ නැහැ. ඒ ගැන හැන්ස් දන්න නිසා තමයි ඔහු අප මේ ලිහිණි හෙල මුදුනට එක්කර ගෙන ආවේ."

එඩ්මන්ට් හුන් තැනින් නැගිට්ටේය. "හැන්ස්, නැගිටපන්! ගැස්පාට පිස්සු වැහෙන්ට ඉස්සර වරෙන් අපි මෙතැනින් යන්ට."

ගැස්පා සිය මිතුරා ගේ අතින් අල්ලා නැවත වාඩි ගන්නා ලෙස

බල කළේය. "මා කියන්නේ නැහැ අපි මෙහේ වැඩි වේලාවක් ගත කරන්නට ඕනෑ කියල. අපි නිකම් පැයක් දෙකක් විතර හොයලා බලමු. නිධාන් වදුල් හොයන්ට හැන්ස්ට බැරිවන එකක් නැහැ. පැය දෙකක් විතර හොයලා මොකුත් හමු වුණේ නැත්නම් අපි පුළුවන් තරම් ඉක්මනට මෙහෙන් යන්ට පටන් ගනිමු. එඩමන්ට්, ටිකක් හිතල බලාපන් ඒ රන් මුතු මැණික් ගැන. සමහරවිට මේ ළඟම ඇති" යි ගැස්පා කෑදර සිතින් කීවේය.

"අපි නිධාන් සෙව්වත් නොසෙව්වත් ඉර බහින කල් කන්දෙන් අනික් පැත්තට බහින්ට හොඳ නැහැ. කළුවර වැටෙන තෙක් අපි මෙහි ඉන්ට ඕනෑ" යි හැන්ස් කීවේය.

"හරිද මං කිව්වා!" යි ගැස්පා කෑගැසුවේය. "උඹ හිතන්න පුළුවන් මගේ අදහස නිකම් මායාවක් කියල. මෙහි නිධාන් කරල තියෙන වස්තුව ගැන නොයෙක් කතා සාමත් මට කියල තියෙනවා. ඔහු ඒවා කොහෙන් දැන ගත්තාද කියා දෙයියො තමයි දන්නෙ. වස්තුව නිධාන් කරන්නට ඉස්සර වෙලා රජ්ජුරුවො ඊට හොඳ තිථි, හෝරා, නැකැත්කරුවන් ලවා බලව ගන්නවා. ඊට පස්සෙ රජ්ජුරුවො වෙස් වළාගෙන දුරු කතරින් ගෙන්වා ගත් මිනිසුන් කිහිප දෙනෙකුන් සමග නිධාන් කරන තැනට යනවා. හැබැයි මේ යන මිනිසුන් ලවා රජ්ජුරුවො දිවුරුම් ගන්නවා, නිධාන් පොළ රහසේ තබා ගන්නා හැටියට. ගැඹුරු වළක් කපලා එහි අඩියත් වළ වටේත් ගල් පතුරු අතුරනවා. ඊට පස්සෙ රන් රිදී කාසි, මාල, මුතු, මැණික් ආදී වටිනා වස්තු තඹ භාජනවලට පුරවලා වළ තුළ තැන්පත් කරනවා. ඔබේ ඇහේ මවිල් කෙළින් හිටින්නේ මෙන්න මේ කතාව ඇසුවාම තමා. ඒ කියන්නෙ, නිධානය වසා දමන්නට පෙර රජ්ජුරුවො දූතයෙක් යවනවා ගම්මානයට. ගම්මානයට යන දූතයාට පළමුවෙන්ම හමු වෙන මිනිහා නිධානය තිබෙන තැනට කැඳවාගෙන ආ යුතුයි. ඉතින් ඒ දූතයා ඔහුට හමුවන පළමුවෙනි මිනිහා නිධානය ළඟට කැඳවාගෙන ආවාම රජ්ජුරුවො ඒ මිනිහා ගෙන් අහනවා නිධානය පෙන්වලා, ඒ නිධානය ඔහුට අවුරුදු පනහක් යන තුරු රැක බලාගන්ට පුළුවන්ද කියලා. ඉතින් මේ මිනිහා ඊට එකඟ වෙනවා. එවිට රජ්ජුරුවො ඒ මිනිහට කියනව තඹ භාජනවල තියෙන වටිනා වස්තුවෙන් ඔහුට හැකි තරම් දෝතට ගන්නටයි කියල. ඉතින් ඒ මිනිහා වස්තුවට ඇති බලවත් තණ්හාවෙන් වළ තුළට නැමිලා ඒ වස්තුවෙන් කොටසක් දෝතට ගන්නට සූදනම් වෙන කොටම ඒ ළඟ සිටින සෙබළෙක් ඒ මිනිහා ගේ හිස තියුණු මුවහත් කඩුවකින් ගසා දමනවා. මිනිහා ගේ මළ කඳ කැනහිලුන්ට

නැමට කැලේට ඇද දමන්ට පෙර එයින් ගලන උණු ලේ වස්තු නිධානය මත තවරනවා. මේ ක්‍රියාව නිසා අර මළ මිනිහා පොරොන්දු වුණු කාල සීමාව තුළ යක්ෂයෙකු වෙලා නිධානය ආරක්ෂා කරන බවයි ඔවුන්ගේ විශ්වාසය. මෙය පුරාණයේ පටන් එන සිරිතක් ලු. මිනිහා ගේ කාල සීමාවෙන් පසු බහිරව යක්ෂයා නිධානයට අරක් ගන්නවා. නිධානය ගන්නට යමෙකුට උවමනා නම් ඊට මිනිස් බිල්ලක් හෝ ගොනෙකු හෝ එළුවෙකු හෝ බිලි දෙන්ට ඕනෑ.''

''ගැස්පා උඹේ කතාවෙන් මගේ ඇගේ ලේ කැටි ගැහෙනවා''යි එඩ්මන්ට් විහිළුවට මෙන් තෙපලේය. ''උඹට බිල්ල දෙන්ට ගොනෙක්වත් එළුවෙක්වත් මෙහේ නැති නිසා උඹ මාව ද බිල්ලට දෙන්ට හිතාගෙන ඉන්නෙ? උඹට බෑරිලා යන්ට හැන්ස් ගේ උපකාරය නොලැබුණොත් උඹ ඔය තියෙනවායයි කියන වස්තුවෙන් ප්‍රයෝජනයක් නැහැ නොවැ.'' ගැස්පා ගේ සිනා මුහුණ ලජ්ජාවෙන් රතු විය. 'බිල්ල ගැන අදහස අපි අතහැර දමුකො. මා කියන්නෙ වාසනාව තියෙන කෙනෙකුට ලබාගන්ට වස්තුව මේ හරියේ තිබෙන බවයි'' යි හේ කීවේය.

''හොඳයි එහෙම හිතමු. අපි ඒවා කොහේ කියල හොයන්ටද?''

''නිධානයක් තියෙන තැනක තියෙනවා ගව මුහුණක් හෝ ඇත් මුහුණක් කොටා තියෙන ගලක්. එහෙම නැත්නම් ගල් ලිපියක් තියෙනවා'' යි ගැස්පා කීය.

''පරණ ආච්චිලා ගේ කතන්දර ගොඩක් සාමත් උඹේ ඔලුවට දලා තියෙන හැඩයි මට පෙනෙන්නේ'' යි නවත් මෙවැනි දේ නොරිස්සූ එඩ්මන්ට් කීවේය.

''නිකම් ශීතලේ මෙතන වෙව්ල වෙව්ලා ඉන්න කලියෙන් අපි ඔහේ ටිකක් නිකමට හොයලා බලමු. ශීතලවත් ඇරිලා යන්නෙ නැතෑ.''

''එන්න හැන්ස්'' යි එඩ්මන්ට් එතැනින් නැගිටිමින් හැන්ස්ට කතා කළේය. ''මිනිහා කියන දෙයක් කරමු. නැත්නම් අපට කනක් ඇහිලා මේකේ ඉන්ට හම්බවෙන්නෙ නැහැ.''

ඉක්බිති ඔවුහු වැල් ඉණිමගේ ආධාරයෙන් කඳු මුදුනෙහි, මහ වනයෙන් වැසී ගත් අනෙක් පැත්තේ ප්‍රපාතයට බටහ. මෙහි කුඩා තැනි තලාවක් බඳු තැනකට සේන්දු වූ ඔවුහු තවත් ඉදිරියට යන්නේ කෙසේදැයි ලතවන්නට වූහ. විශාල පර්වත, ගල්ලෙණ හා පාතාලයන් ගෙන් ගහන වූ මේ පෙදෙස හරහා ගමන් කිරීම ඉතා අනතුරුදායක විය.

''අලි ඔලුවක් හරි වෙන මොනවා හරි කලාත්මක දෙයක් කොටලා තිබෙන ගලක් මේකේ හොයන එක හරියට පිදුරු ගොඩක ඉඳිකටුවක් හොයනවා වගේ වැඩක්'' යි එඩ්මන්ට් කීවේය.

''ගල් කැටයම් ගැන අමතක කරලා අපි බලමු ටිකක් සැඟ හිතෙන තැන් තියෙනවාද කියල'' යි ගැස්පා තම සගයන් දිරි ගැන්වූයේය.

''අපෝ, ඒ වගේ තැන් දහස් ගණනක් ඇති මේකේ.''

තනි තනිව ගොස් පරීක්ෂා කරන එක හොඳ යයි හැන්ස් යෝජනා කළේය. එහෙත් කිසිවකු එකිනෙකාගේ කට හඬ ඇසෙන මානයෙන් ඈතට නොයන සේ වග බලාගත යුතු බව හැන්ස් ඔවුනට අවවාද කළේය. තමන් අනතුරක් නැතිව සිටින බව එකිනෙකාට ඇහවීමට වරින් වර එසේ ශබ්දයක් කරන ලෙසද හැන්ස් ඔවුනට නියම කළේය. මීට එකඟ වූ තිදෙනා තුන් පැත්තකට පිටත්ව ගියහ.

දෙපැයක් පමණ ගත විය. හදිසියේම යමකුගේ මරළතෝනි-යක් හැන්ස්ට ඇසුණි. ශබ්දය ඇසුණේ ගැස්පා බැස ගිය ප්‍රපාතය දෙසිනි. හැන්ස් වහා ගලෙන් ගලට පනිමින් වැටෙන්ට යන විට අතුල්වල එල්ලෙමින් බසිමින් ඒ දෙසට පිය මාරු කළේය. එඩ්මන්ට් පසු කොට බොහෝ දුරක් ගිය හැන්ස්ට එක් ගල් ලෙණක් තුළින් වවුලන් පිටවී ඉගිලෙනු දක්නට ලැබුණි. එය තුළින් යමකුගේ කෙඳිරිල්ලක් ඇසෙන්නට විය. හැන්ස් ලෙණ තුළට එබී බැලුවේය. එහෙත් ඔහුට කිසිවක් හරිහැටි පෙනුණේ නැත. ලෙණ තුළ තරමක අඳුරින් වැසී තිබුණි. එහෙත් ඒ තුළින් නිකුත් වන කෙඳිරිල්ලත් හතිලෑමත් එහි යමකු මරණීය සටනක යෙදී සිටින බව සිතා ගැනීමට ප්‍රමාණවත් විය. ලෙණට ඇතුළුවීමට තිබුණේ කුඩා කවුළුවකි. මිනිසකුට බඩගා යන්තමින් එහි රිංගා ගත හැක. දැන් මෙහි රිංගීම මාර මුඛයට යාමක් බව හැන්ස්ට වැටහී ගියේය. එහෙත් හේ පසුබට නොවූයේය. සිය කුඩා කිරිච්චිය කටින් ඩැහැගත් හැන්ස් පළමුවෙන් සිය දෙකකුල් ලෙණ තුළට දමා ඇත්වල වාරුවෙන් එය තුළට ඇදුණේය.

කවුළුව තුළින් ලෙණ තුළට පිවිසි ඔහුගේ දෙපා අඩි තුනක් පමණ පහළින් පිහිටි ලෙණෙහි බිම ගැටුණි. ක්‍රමයෙන් පහත් වෙමින් ඈතට විහිද තිබුණු බෑවුම් සහිත ලෙණ බිම, ලෙණ දෙර පසෙක බිත්ති මුලින් කාන්දුවන දිය පාරකින් තෙමී ලිස්සන ගතියකින් යුතු බව එහි තුළ බට හැන්ස්ට වැටහුණි. ඔහු අත පත ගාමින් පහළට රූටන්නට විය. දැවැන්ත පිඹුරකු ගැස්පා වෙළා ගනු ලැබ සිටින හැටි ඔහුට පෙනුණි.

ලෙණ බිත්තියෙන් පිටට නෙරා සිටි ගල් තුඩුවක වලිගය වෙළා ගත් දූවැන්ත පිඹුරෙක් ගැස්පා ගේ එක් කලවයක් සහ ගෙලද වෙළා සිටින අයුරු ලෙණ පියස්සේ තිබුණු කුඩා විවරයකින් ලෙණ තුළට වැටුණු මඳ එළියෙන් හැන්ස්ට දක්නට ලැබුණි. සිය ගෙල පෙදෙස වෙළා තිබුණු පිඹුරු වෙළුම ගැලවීමට ගැස්පා දැතින් අසාර්ථක තැතක් දරනු ඔහුට පෙනුණි. හැන්ස් ගේ ඇස් හමුවේදීම පිඹුරා ගැස්පා ගේ පපුව ද වෙළා ගත්තේය. ගැස්පා, පිඹුරා වෙළා සිටි සිය කලවය නිදහස් කර ගැනීමට අනෙක් කකුලෙන් මහත් තැතක් දැරුවේය. එහෙත් ඔහු අනුක්‍රමයෙන් දුර්වල වී යන හැටි හැන්ස් දැක්කේය.

පිඹුරා ගේ හිස ගැස්පා ගේ සිරුරෙහි කොතැනක හෝ සඟවා ගෙන ඇති බව හැන්ස් දනී. ඔහුට පිඹුරා ගේ හිස තිබෙන තැන සොයා ගන්නට එක විටම නොහැකි විය. පිඹුරා උගේ හිස ගැස්පා ගේ බත්කෙන්දට තද කරගෙන එය සපාගෙන සිටින සැටි අන්තිමට ඔහු සොයා ගත්තේය. හැන්ස් ගැස්පාට තුවාල නොවන පරිද්දෙන් සිය කුඩා කිරිච්චිය ගෙන පිඹුරා ගේ බෙල්ල පලා ඉරන්නට විය. පිඹුරා ගේ බෙල්ල කැපී යත්ම උගේ කිටි කිටියේ තිබුණු වෙළුම බුරුල් වී ගියේය. මඳ වේලාවකින් පිඹුරු වෙළුම ගැලවී ගියේය. හැන්ස් මළ මිනියක් බඳු ගැස්පා ගේ සිරුර ඉතා සීරුවෙන් ඔසවා ගෙන ලෙණ කවුළුව අසලට ගොස් පළමුවෙන් ගැස්පා ගේ හිසත් දෙවුරත් කවුළුවෙන් පිටතට කළේය. ඒ අසල හුන් එඩ්මන්ට් ගැස්පා ගේ අප්‍රාණික සිරුර ඔසවා එළියට ගත්තේය.

ගැස්පා මළ මිනියක් මෙන් විය. ඔහුගේ මුහුණ නිල් පැහැ ගැහී තිබුණි. ගෙල වටා තිබුණු තදබල සීරීමක් නිසා ගෙල කොර වී තිබුණි. ඔහුගේ ගෙළ කැඩී ඇත්දෝයි යන බියෙන් එඩ්මන්ට් එය සීරුවෙන් ඒ මේ අතට හැරෙව්වේය. වසනාවකට මෙන් ගැස්පා ගේ ගෙලෙහි ඇති බලවත් මස් පිඬුවලට බරපතල හානියක් නොවී තිබීම ගැන ඔවුහු සතුටු වූහ. එහෙත් මඳ වේලාවක් ගැස්පා පිඹුරා ගේ ග්‍රහණයට අසුවී සිටියා නම් සියල්ල අවසන් වන්නට තිබුණි.

කුමක් කරම්දෝයි, ගැස්පා ගේ අප්‍රාණික සිරුර දෙස බියෙන් තැතිගෙන බලා සිටි එඩ්මන්ට් සහ හැන්ස්, ගැස්පා ගේ මුහුණ ටිකින් ටික පැහැපත් වන සැටිත් ආශ්වාස ප්‍රශ්වාස කිරීම හා නාඩි වැටීම අනුක්‍රමයෙන් දියුණු වන සැටිත් දැකීමෙන් මඳ සහනයක් ලැබූහ. ටික වේලාවකින් ඔහුගේ ඇසි පිහාටු සෙලවෙන සැටි ඔවුනට දක්නට ලැබුණි. ගැස්පා සිය දෙනෙත් හැර

බැලිය. ඔහු එක් අතකින් සිය ගෙල අතගා බැලිය. තමා දෙස සිනා මුහුණින් යුතුව බලා සිටින සිය සගයන් දෙදෙනා දෙස සිහිනයකින් අවදි වූවකු මෙන් ඔහු බලන්නට විය.

''ගැස්පා, දැන් අමාරුව ටිකක් අඩුද?'' යි එඩ්මන්ට් ඇසිය.

එහෙත් ගැස්පා පිළිතුරු දිය හැකි තත්ත්වයක නොසිටියේය. ඔහු ඉතා අමාරුවෙන් කෙලින් වී ඉඳ ගත්තේය. ඉක්බිති හෙතෙම ඉනා සීරුවෙන් සිය ගෙල ඒ මේ අත හැරවූයේය. පිඹුරා වෙළා ගෙන සිටි සිය කලවය හේ අත ගෑවේය. පිඹුරා ගේ කටට හසුවී තිබුණු සිය බත්කෙන්ද ද හේ පිරික්සා බැලුවේය.

''වතුර'' යි ගැස්පා කෙඳිරි ගෑවේය. දිය බඳුනට ළං කළ ඔහු ගේ තොල් වෙව්ලන්නට විය. වේදනාවෙන් මිරිකෙමින් දිය පානය කළ ගැස්පා වරින් වර නැති ගත්තකු මෙන් සැලුණේය.

''ඔබ මරුවා ගේ කට ළඟටම ගියා. හැන්ස් තමා ඔබ ගළවා ගත්තේ'' යි එඩ්මන්ට් කිය.

පැයක් පමණ ඉක්ම ගියේය. ගැස්පා තමාට සිදුවූ දේ ගොතලමින් කියන්නට වූයේය. ගල් ලෙණෙහි කවුළුව දුටු ඔහුට ඊට වඩා වස්තුව සඟවා ඇතැයි සිතිය හැකි තැනක් තවත් තිබෙන්නට නුපුළුවනැයි සිතුණි. කවුළුව තුළින් එහි එබී බැලූ ඔහුට එය ගන අඳුරින් වැසී ගත් විශාල ගල් ලෙණක් බව වැටහුණි. ඔහු ඉතා අමාරුවෙන් එතුළට බඩගෑවේය. ඔහු ලෙණ තුළට බැස නැගිටින්නට සූදනම් වනවාත් සමගම ඔහුගේ බත්කෙන්දට වැදුණු දරුණු පහරකින් හේ බිම ඇද වැටුණේය. එකෙණෙහිම ඔහුගේ ගෙල යකඩ පටියක් බඳු යමකින් කිටි කිටියේ වෙළී ගියේය. ඔහු එය ගැළවීමට බලවත් වෑයමක් දරන්නට විය. ඔහුට කෑගැසීමට ලැබුණේ එක් වරක් පමණි. ඔහුගේ හුස්ම හිරවී ගියේය. වෙළුම තද විය. ඔහු ජීවිතයත් මරණයත් අතර බිහිසුණු සටනකට වැදුණි. ඔහුට මතක එපමණය. තමා ගළවා ගැනීමට තම සගයන් ආ හැටි ඔහු විමසුවේය.

''ගැස්පාට ඒ විස්තරේ ඔක්කොම කියන්න හැන්ස්'' යි එඩ්මන්ට් කීවේය.

''මට ඔබේ කෑගැසීම ඇහුණ හැටියෙම මට වැටහුණා වෙලා තියෙන දේ'' හැන්ස් කීවේය. ''ඔය වගේ මර ළතෝනි මා ඕන තරම් කැලේ දී අහලා තියෙනවා. පිඹුරෙක් මුවෙකු අල්ලා ගත්තාම මුවා කෑ ගහන්නේ ඔය විදියටමයි. ඉතින් ඔබේ මර ළතෝනිය ඇසුණාම මං තත්පරයක්වත් පමාවුණේ නැහැ. එඩ්මන්ට් හිටියේ මට වඩා ඈතින්. ලෙණ දෙර ළඟට ආ මට

ඔබේ කෙඳිරීම ඇහුණා. කොහොම නමුත් මං ඇතුළට රිංගුවා.'' ලෙණ ඇතුළට පිවිසි හැන්ස් කළ යුත්තේ කුමක් දැයි දැන සිටියේය. එහෙත් එය පහසු කාරියක් නොවීය. ගැස්පා වෙළා ගෙන සිටි පිඹුරා ගේ හිස අඳුරු ලෙණ තුළ සොයා ගැනීමට ඔහුට සිදු විය. ගැස්පා සිය පණ ගළවා ගැනීමට දඟලද්දීම එසේ සොයා ගැනීම වඩාත් අසීරු විය.

''පිඹුරා ගේ ඔලුව සොයා ගත්තාට පස්සේ අනිත් ටික කරන එක අමාරු වැඩක් නොවෙයි. මා ඔබට පෙන්වන්නම් මා කළ දේ මොකක්ද කියල'' යි හැන්ස් කතාව අවසන් කළේය.

''අනේ හැන්ස් පෙන්වන්න'' යි එඩ්මන්ට් කීවේය. ''මා හිතන්නෙ ගැස්පා කැමති ඇති එයාව ඒ තරම් ආලයෙන් බඳ වැළඳ ගෙන සිටිය ලස්සණ සතා බලන්ට.''

හැන්ස් ලෙණ තුළට බැස නොපෙනී ගියේය. කපා වෙන් වූ හිස යන්තම් සම් කැල්ලකින් පමණක් සම්බන්ධව අඩ පණව ඇඹරෙමින් නලියමින් තිබුණු මහ දරුණු පිඹුරු කඳ පොදියක් කොට හැන්ස් එළියට ගත්තේය.

එඩ්මන්ට් ගැස්පාට කළ විහිළුව ගැන කනගාටු වූයේය. අඩි දෙළහක් පමණ දිග දැවැන්ත පිඹුරා දුටු ඔහු බියෙන් තැති ගත්තේය. අඩ පණව, වැකුණු ලෙයින් තෙත් වූ පිඹුරු කයෙහි දර්ශනය ඔහුට බිහිසුණු එකක් විය.

පිඹුරු තඩියා ගේ හිස හැර සෙසු සිරුර ඒ මේ අත නලියමින් තිබුණි. පසුව සැක බිය පහව ගිය එඩ්මන්ට් කෝටු කැබැල්ලක් ගෙන උගේ කට ඇතුළට ඔබා උගේ හකු දෙපසට කළේය. උගේ නැමීගිය තියුණු දත් දෙපෙළ හොඳින් පෙනෙන්නට විය. මේ භයානක දත්වලින් සපාකනු ලැබ ලෙයින් තෙත් වී තිබුණු සිය බත්කෙන්ද දෙස ගැස්පා බලාගෙන සිටියේය.

''ගැස්පා හොඳ නේද ඔබගේ නිධාන් සෙවීම අවසන් වූ හැටි'' යි එඩ්මන්ට් නැගිටිමින් කීවේය. ''හෝ! කෝ හැන්ස්!'' යි හැන්ස් අතුරු දහන් වී සිටිනු දුටු හේ පුදුමයෙන් කෑ ගැසුවේය.

''මං මෙහේ!'' ලෙණ තුළින් සිය හිස එළියට දැමූ හැන්ස් කීවේය. හැන්ස් එළියට ආවේය. ඔහු අත විශාල පුහුලක් තරම් වූ සම් මල්ලක් විය. හේ එය ඔවුන් අසල බිම දැම්මේය. ''මේක තිබුණෙ ලෙණ කෙළවර ගල් පොත්තක් උඩයි. මට පේන හැටියට මේකෙ තියෙන්නෙ තිරිවානා ගල් වගේ'' යි හේ කීවේය.

''ඕක ඇරලා බලාපල්ලා!'' යි කලබලයටත් පුදුමයටත් පත් ගැස්පා කතා කළේය. ගැස්පා නැතිගත්තකු මෙන් වෙව්ලුවේය.

සිය කිනිස්ස එළියට ඇද ගත් එඩ්මන්ට් සම් මල්ලෙහි කට බැඳ තිබුණු ලනුව කපා එය ගල් තලාව මත මුණින් හැළුවේය. ඔවුනට සිය දෙනෙත් අදහාගත නොහැකි විය. පද්මරාග, දියමන්ති, රතුකැට, වෛරෝඩි ආදී මහාර්ඝ මැණික් ගල් රාශියක් ද රන්, රිදී, කාසි සහ ස්වර්ණාභරණ තොගයක් ද එහි විය.

''රජු ගේ ධනය තමා මේ'' යි ගැස්පා උමතුවෙන් මෙන් සිය උගුරු දණ්ඩ පිරිමදිමින් කීවේය. ''මං කිව්ව කතාව බොරුද?''

''ඇත්තෙන්ම ඔබ කී දේ හරි'' යි එඩ්මන්ට් ගැස්පා ගේ පිටට තට්ටු කරමින් කීවේය. හැන්ස් මේවා එතරම් අගය කළ බවක් පෙනුණේ නැත. හැන්ස්ට නම් මේවා තිරිවාන ගල්වලට වඩා වටින්නේ නැත.

එහි තිබුණු නොයෙක් වටිනා වස්තූන් සිත් සේ පරීක්ෂා කළ ඔවුහු ඒවා නැවතත් මල්ල ඇතුළට දැමූහ. හැන්ස් ශක්තිමත් වැලක් ගෙන මල්ල කරේ එල්ලාගෙන යා හැකි අන්දමට ගැට ගසා ගත්තේය.

ඔවුහු යළිත් ඔවුන් පළමුවෙන් සිටි තැනට පැමිණියහ. බලවත් සේ වෙහෙසට පත්ව සිටි ඔවුහු කටගැස්මකුත් සමග අරක්කු ස්වල්පයක් බැගින් ගත්හ. දවසේ සෙසු කොටස හොඳ නින්දකින් ඔවුහු ගත කළෝය.

ඉරු බැස යද්දී එඩ්මන්ට් අවදිවූයේය. ඔහු අවුල් වූ හිස කෙස් අතින් සකසමින් හිඳ ගත්තේය. ඔහු ඇහි බැම හකුළුවා ගැස්පා දෙස බැලුවේය.

''ගැස්පා'' යි ඔහු කතා කළේය. ''ඔබට වෙන්ට තිබුණු මාරකය ගැන අර රොඩී ගැහැනිය කියූ දේ කොයි තරම් ඇත්තද?''

''ඒක නේන්නම් තව බින්දුවෙන් ඒ අනාවැකිය හරියටම හරියන්ට තිබුණා.''

# 12

# වන රජදහන

එදින මුළු රාත්‍රියෙහිම ඔවුහු ගමන් කළහ. වන ලැහැබින් වැසී ගත් ගන අඳුරින් වෙළී ගිය හෙල් පල්ලම් හරහා වැටී තිබුණු ඔවුන්ගේ ගමන් මග ඉතා බිහිසුණු විය. උදෑසන ඔවුහු කඳු පාමුලට බැස ගත්හ. අධික වෙහෙසට පත් වී සිටි ඔවුහු ලිය මඬුල්ලක් යටට වී නිදාගත්හ.

සවස ගැස්පා සහ එඩ්මන්ට් අවදි වූහ. හැන්ස් අතුරුදහන්වී සිටින බව ඔවුන්ට දක්නට ලැබුණි. කවු අල වගයක් ගත් හැන්ස් නොබෝ වේලාවකින් ආපසු පැමිණියේය. "මේ ළඟින් සොයා ගන්නට ලැබුණේ මෙපමණයි. දැනට මේවායින් පිරි මහගන්න වෙයි. හෙට සිට අපට මීට වඩා හොඳ කෑම ලැබෙයි" යි හැන්ස් කීවේය. අල පුලුස්සා අනුභව කළ ඔවුහු අඳුරු වැටෙන තෙක් ගමන් කළහ.

පසු ද ඔවුහු, හැන්ස් විසින් සිය දුනු හී සහ වියලි මුව මස් පොදියක් සඟවා තබනු ලැබූ මහ ගස් බෙනයක් වෙත පැමිණියෝය. දින දෙකකට පසු ඔවුනට ලැබුණු හොඳම ආහාරය එය විය.

ඔවුහු දැන් පහත රට මහ වනයට අවුත් සිටිති. තැනින් තැනදී ඔවුනට දක්නට ලැබුණු වන සතුන් ගේ ගමන් මාර්ග හැරෙන්නට අන් කිසිදු මගක් එහි නොවීය. මේ ගමන එඩ්මන්ට්ට නුපුරුදු එකක් වුව ද ගැස්පාට එසේ නොවීය. ඔහුට කැලෑවලදී සටන්හී යෙදී පුරුදුය. හේ මහ වන මැද දඩයම් කළ හොඳ දඩයක්කාරයෙක් ද විය. එහෙත් මෙවැනි පාළු ඝන වනාන්තරයක ඔහු මීට පෙර කවදාවත් සැරිසරා නොමැත. ස්වභාව ධර්මයා විසින් රක්ෂිත, මහා වන රාජධානියේ නිමග්නව ගිය ඔවුන්ට තමන් එහි කොතරම් කුඩා සතුන් දැයි වැටහී ගියේය.

ලංකාවේ වනාන්තර කිව නොහැකි තරම් විශාලත්වයෙන් පැතිරී ඇත. ඒවායේ විස්මිත අලංකාරය, සැරිසරන්නන් ගේ සිතෙහි ප්‍රේමය ද භය ද සංත්‍රාසය ද එක්වන්ව දනවයි. උස්ව නැඟී විටපයෙන් විටපය ඈ පැතුරුණු වනස් පති ගස්, පරම්පරා ගණන් පැරණිය. ඒවායේ නිලවර්ණ ශාඛා මණ්ඩල යට සෙවණ

ගන සිසිල ගෙන දෙයි. රුව් වඩයි. දහවල් සැඩ හිරු කිරණ අතු පතර අතරින් වැටෙත්ම මහා වනය රන් පැහැයෙන් ඔප නැගේ.

එඩමන්ට් සහ ගැස්පා හැන්ස් ගේ අණට ඉතාමත් කීකරුව අවනත වෙමින් ගමන් ගත්හ. රමණීය වන එළි, විල් එළි හරහා හැන්ස් පසු පස ගමන් ගත් කපිතාන්වරුන් දෙදෙනා ඒවායේ චමත්කාරයෙන් ඉමහත් රසාස්වාදය ලැබූහ. දූන් සතුරන් තමන් ලුහු බැඳ එනැයි සිතිය නොහැක. හැන්ස් අනුව යාමෙන් තම ආරක්ෂාව ස්ථිර බැව් දත් ඔවුහු නිදහසේ ගමන් ගත්හ. ගමන අවසන් කිරීමට එතරම් ආයාසයක් ගැනීම දූන් ඔවුනට උවමනා නැත.

හැන්ස්ට නම් මහ වනය ඔහුගේ ගෙදරයි. එහි හැම පෙදෙසක්ම ඔහුට හොඳට හුරු පුරුදුය. වනය පිළිබඳ හැන්ස් තුළ වූ පුදුමාකාර දැනුම ගැනත් ඔහුගේ නිර්භීතකම ගැනත් කපිතාන්වරුන් දෙදෙනා පුදුම වූහ. දුන්න හා හී තලත්, උරෙහි එල්ලා ගත් කුඩා පොරොවත් ඉණෙහි ගසා තිබූ ඔහුට ළඟදී ලැබුණු කිරිච්චියත් හැරෙන්නට ඔහු වෙත අන් කිසිදු ආයුධයක් නොතිබුණේය. කපිතාන්වරුන් ස්වකීය ආරක්ෂාව ගැන යන්තමින් වත් සැක පහළ කර නොගත්තේ මේ ශූර තරුණයා කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබමිනි. ඔවුනට ලැබුණු හැම ආහාරයක්ම හැන්ස් විසින් සපයා ගන්නා ලද ඒවා විය. මුව මස් හැරෙන්නට තවත් මස් වර්ග, අල, පලතුරු හා මී පැණි ඔවුන්ට කන්නට ලැබුණි. වල් ඌරු, තලගොයි හා වලිකුකුළු ආදී මස් ද හැන්ස් ඔවුනට සපයා දුන්නේය.

කලින් වට වැසි නිසා බක් මහේ දී මහ වනය අලුත් දළු දමයි. නිල් පැහැයෙන් ඔප නැගී ජීවයෙන් පිරී යයි. ප්‍රීතියෙන් කුල්මත් වූ කුරුල්ලන් ගේ නාදයත් රැහැයියන් ගේ කන් බිහිරි කරවන හඬත් වනය තුළ දෝංකාරය නංවමින් පැතිර යන්නේය.

එදින දවස ගෙවී යද්දී ඔවුනට ඉතා දර්ශනීය කුරුල්ලෙක් පියාඹනු දක්නට ලැබුණි. ඔවුනට මුණ ගැසුණු වල් ඌරු රංචුවල සිටි පැටවු ඔවුන් දැක බියපත්ව වේගයෙන් දුව ගොස් පඳුරු අතර සැඟවී ගත්හ. එහෙත් මහ ඌරෝ ඔවුන් දෙස කෝපයෙන් මද වේලාවක් බලා සිට ගොරවමින්, සෙමින් සෙමින් පැටවුන් අනුගමනය කළහ. ඔවුන් දැකීමෙන් බිය පත් වූ විශාල මුව රංචුවක් වේගයෙන් දුවන්නට විය. සාවුන් සහ

වලිකුකුළන් විශාල ගණනක් ඔවුන්ට දක්නට ලැබුණි. පලින් බර වූ ගස්වල ඒ මේ අත ඉගිලෙමින් පල බුදින කැදැත්තන්, බටගොයින් හා ගිරවුන් ද තවත් නොයෙක් වර්ගයේ කුරුල්ලන් රැසක් ද ඔවුහු දුටහ. තැනින් තැන හිරු එළිය වැටී පුල්ලි ගැසී තිබුණු ගස්වල කොළ මත වසමින් යළිත් එකිනෙකා අභිභවා පියාඹා ගිය නන් වන් සමනලුන් ගේ දර්ශනයෙන් ඇතැම් පෙදෙස් අලංකාර විය.

වඳුරෝ සිය පැටවුන් සමග ගසින් ගසට පනිමින් පල රස විඳිමින් ඔවුනට නොයෙක් විහිළු තහළු කරන්නට වූහ. මෙය ඔවුන් ගේ මහත් විනෝදය පිණිස විය. බටගොයින් ගේ ''කූවූ'' නාදයෙනුත් හමු කුරුල්ලන් ගේ මිහිරි ගී හඬිනුත් නිරතුරුවම වනය රැව් පිළිරැව් දුන්නේය.

එඩ්මන්ට් ගේ අදහසේ හැටියට අන් හැම පක්ෂියකුම අභිභවා සිටි කුරුල්ලන් දෙවර්ගයක් විය. එක් වර්ගයක් වර්ණවත් පිහාටු නිසා අන් හැම පක්ෂියකුම අභිභවයි. අනෙක් වර්ගය උන් ගේ මිහිරි ගී නාදයෙන් සෙස්සන් පරදවති. චමත්කාරය අතින් සෙසු පක්ෂීන් පරදවන්නේ මොනරාය. වල්පොල්කිච්චා අන් හැම කුරුල්ලකුම පරදවා වනය ගී නාදයෙන් කුල්මත් කරවයි. මේ කුරුල්ලා ගේ ඉමිහිරි ගීතවත් නාදයෙහි පුදුම සංගීතයක් ගැබ් වී ඇත. මේ කුඩා පක්ෂියා ගේ ගීතවත් නාදයට ඔවුහු අතෘප්තකර ආශාවකින් කන් දුන්හ. පාළු නිසල වනකරයේ තනිව ගී ගයන මේ නාඳුනන ගායකයා, මධුරස්වරයෙන් ගී ගැයීමට ප්‍රකට රෑ කෝකිලයා පවා අභිභවතැයි ඔවුහු සිතූහ.

දහවල් කාලයේ මහ වනය කොතරම් චමත්කාර ජනක ද, එහෙත් රාත්‍රි කාලයේ දී එය එපමණම බිහිසුණුය. දහවල් කාලයේ කුරුලු ගී නදින් රැව් පිළිරැව් දෙන මහ වනය නොවේ රාත්‍රියට ඇත්තේ. අහස උසට විහිද ගිය මහ තුරු පෙළ අතරින්- දහවල් කාලයේ දී වනය තුළට පෙරී එන රන්වන් හිරු එළිය වෙනුවට රාත්‍රියෙහි දී මහ වනය බිහිසුණු ඝනාන්ධකාරයෙන් වෙළී යයි. ඉද හිට හඬන බස්සකු ගේ අමිහිරි නාදය හැරෙන්නට රාත්‍රියෙහි දී මහ වනය සොහොන් පිටියක් මෙන් පාළුය. නිසලය. බිය ජනකය. වරෙක ඒ බිය ජනක පාළුවත් නිසංසලයත් බිඳ ලමින් නරි රැළක ගේ හූ හඬ ඇසෙයි. වරෙක කොටියකු ගේ බිහිසුණු ගෙරවීමකි. ඒ සමගම මරණය ළඟ ළඟම ඇති බව ඇඟවීමට මෙන් ගෝනෙක් හෝ මුවෙක් හෝ හඬයි.

යළිත් ඒ බිය ජනක පාළුවම රජයන්නේය. ඒ නිහඬ නිසංසලයම පැතිරෙන්නේය. අමු සොහොනක් මෙන් පාළු වන්නේය. නිසල වන්නේය.

හැන්ස් සහ කපිතාන්වරුන් දෙදෙනා රාත්‍රිය ළං වූ විට ඔය බඩක හෝ ඇල බඩක හෝ නවාතැන් ගත්හ. ඉක්බිති ඔවුහු වියලි මුව මස් අනුභව කොට ගසකට හෝ ඉවුරකට හේත්තුවී නිසල සැන්දෑවේ පාළු මිහිර විඳිමින් පඳුරු වටා නොනැවතී බමන කණ මැදිරියන් දෙස බලමින් දුම්කොළ සප සපා කල් ගෙව්වෝය.

නිද ගැනීමට පෙර ඔවුහු විශාල ගිනි මැලයක් ගසති. එහෙත් හැන්ස් පමණක් මහ වන මැද රාත්‍රිය ගත කරන විට නම් ගිනි මැල නොගසයි. ගිනි මැලයක් තිබියදීත් කපිතාන්වරුන් තුළ මහ වන මැද රාත්‍රිය පුදුම හැඟීම් ජනිත කළේය. ඔවුහු නොයෙක් විට හදිසියේ තිගැස්සුණහ.

දිනක් රාත්‍රියේ විශාල ගසක් යට ඔවුහු ගිනි මැලයක් ගැසූහ. හදිසියේම අවට විහිද ගිය ගිනි මැලයේ ආලෝකයෙන් මහත්සේ නැති ගත් ඒ ගස උඩ හුන් වඳුරු රැළක් මහා ගාලගෝට්ටියක් කරන්නට වූහ. වඳුරු රැළ හදිසියේ බිරුසන් දෙන්නට වූයෙන් ඉන් මහත් සේ තැතිගත් එඩ්මන්ට් කෑගසමින් නැඟී සිටියේය. බියෙන් වෙව්ලමින් ඔහු හැන්ස් දෙස බලා සිටියේය. සිදු වූයේ කුමක්දැයි නොදත් අයකු මෙන් බිම දිගාවී සිය හිස වැලමිටට බර කරගෙන සිටි හැන්ස් කට කොනකින් සිනා සෙමින් ගිනි මැලය දෙස බලා සිටින සැටි දුටු එඩ්මන්ට් පුදුම වූයේය. බියට පත් එඩ්මන්ට් ඒ බිය සඟවා ගැනීමට තැත් කරමින් සිය සගයන් සමග කොක් හඬලමින් සිනාසුණේය.

මහ වනයෙහි වල් අලි රංචු පිටින් සැරි සැරූහ. දහවල් කාලයේ දී ඔවුනට වල් අලි දක්නට ලැබුණේ ඉතා කලාතුරකිනි. එහෙත් හැම රැයකදීම පාහේ අතු කඩමින් කොළ බුදින වල් අලින් ගේ හොල්මන් කිරීම ඔවුනට ඇසුණි. දිනක් මැදියම් රැයේ ඔවුන්ගේ ගිනිමැලය අඟුරු බැස දිලිසෙමින් තිබුණි. ඉතා ළඟින් ඇසුණු බිහිසුණු ඝෝර නාදයකින් ඔවුහු තිගැස්සී අවදි වූහ. දවැන්ත වල් අලියෙක් උගේ හොඬ වේගයෙන් ඒ මේ අත වනමින් ඔවුන් දෙස බලා සිටින සැටි ඔවුනට දක්නට ලැබුණි. හැන්ස් වහා නැගිට්ටේය. ඔහු වල් අලියා වෙත ගොස් මොනවාදෝ කීවේය. අලියා සෙමින් සෙමින් කැලයට වැදුණි. දිනක් ඇදිරි වැටුණාට පසු වල් අලි රංචුවක් ඔවුන් ලැග සිටි තැනට නුදුරින් ගස් වැල් පොඩි කරමින් හදිසියේම ගමන් කරන්නට වීමෙන් ඔවුහු මහත්සේ තැති ගත්හ.

මෙවැනි බිහිසුණු අත්දැකීම් මධ්‍යයේ වුවද ඔවුහු වනයේ චමත්කාරයෙන් කුල්මත් වූහ. තව අවුරුදු කිහිපයකින් ඔවුන්

Scanned with CamScanner

දුන් ජීවත් වන මේ මහ වනය ඔවුනට පරාදීසයක් සේ සිහිවනු ඇතැයි ද මෙහි දී ඔවුන් මුහුණ පෑ ත්‍රාසපූර්ණ සිද්ධීන් අමතක කොට යළි ලක්දිව වනාන්තරවල සැරි සැරීමට බලවත් ආශාවක් ඔවුන් තුළ ඇතිවනු ඇතැයි ද ඔවුහු සිතූහ.

වන මැද ගමනේ දී ඔවුනට එකිනෙකාගේ යටගියාව ගැන කතා කිරීමට ද අවස්ථා ලැබුණි.

යෝගාවචර භික්ෂූන්වහන්සේ ගෙන් ගැස්පා පිළිබඳව ඇසූ ද සිට, හැන්ස් තුළ නිර්භීත යුද සෙබළකු වූ ගැස්පා ගැනත් කොළඹ පැහැර ගනිද්දී එහි කොටු වී සිටි පෘතුගීසීන් විසින් ඕලන්දක්කාරයන්ට විරුද්ධව කරන ලද බිහිසුණු සටන් ගැනත් තොරතුරු දැන ගැනීමට බලවත් ආශාවක් තිබුණි.

සිංහල රජු ගේ හමුදුවනට විරුද්ධව ඔහු ගෙන ගිය කැරළි ගැනත් ඔහුගේ කුඩා හමුදුවනට වඩා විශාල හමුදුවන් පරාජය කිරීමට තමා ගත් වෙහෙස ගැනත් ගැස්පාට හොඳට මතකය. කොළඹ පැහැර ගැනීම ගැන ඔහුට බොහෝ දේ කියන්නට තිබුණි. මීට පස් අවුරුද්දකට පමණ පෙර ලංකාවේ තිබුණු ප්‍රධානතම පෘතුගීසි බලකොටුව වූ කොළඹ, සතුරන් අතට පත් වීමේ සිද්ධිය ඔහුගේ සිත තදින් පෑරුවේය. මේ වන තුරුත් ස්වකීය ජාතීන් දෙක මහ මුහුදේ යුද වැදී සිටින බව කපිතාන් දෙපොළ දැන සිටියහ. එම නිසා ඔවුහු ඒ ගැන කිසිවක් කතා කිරීමට මැලිවූහ.

දිනක් ඔවුනට අමතක නොවන දර්ශන දෙකක් දක්නට ලැබුණි. වනයේ ජීවත්වන දුබල සතුන් ගේ අන්‍යෝන්‍ය සහයෝගය මැනැවින් විදහා දක්වෙන දර්ශනයකි ඉන් පළමු වැන්න. අනෙක මහ වනයේ දී ඉතාමත් කලාතුරකින් දක්නට ලැබෙන බඩගා යන සතුන් දෙදෙනකු අතරේ වූ බිහිසුණ පොරයකි. උනුන්ගේ කාය ශක්තිය උනුන් අභිභවා නොයන තරම් විය.

එදින සවස ඔවුහු වැව් කණ්ඩියක් වෙත පැමිණියහ. ලංකාවේ වියලි කලාපයේ වනාන්තරවල තැනින් තැන පෙර රජ දරුවන් විසින් තනවන ලද වැව්වල නටබුන් දක්නට ලැබේ. වැව් කණ්ඩිය මත විශාල පලු ගසක් විය. මේ ගස යට වාඩි ගත් ඔවුහු, ඔවුන් විසින් දඩයම් කරගන්නා ලද තලගොයින් දෙදෙනකු පුලුස්සා කෑහ. කෑමෙන් පසු වැව් කණ්ඩිය මත ඇලවී සිටි ඔවුනට අසල ගසක කඳ මැදට වී එහාට මෙහාට දුවමින් නො කඩවා කෑ ගසන ලේනෙක් දක්නට ලැබුණි. මේ කුඩා සතා මහත් බියට පත්ව උදව් ඉල්ලා කෑගසන බැව් ඔවුනට වැටහුණි.

Scanned with CamScanner



ලේනාත් තලගොයාත් මේ ගස් බෙනය

අසලට අවුත්—

ගතවූයේ මොහොතකි. ලේනා කෑ ගසමින් සිටි ගස මුල තිබූ බෙනයකින් තලගොයෙක් එළියට ඇදුණේය. ඉක්බිති තලගොයා ලේනා සිටි ගස දිගේ ඉහළට නගින්නට විය. තලගොයා එනු දුටු ලේනා ගේ කෑගැසීම මඳකට නතර විය. තලගොයා ලේනා අසලට යත්ම, ලේනා ගසේ කඳ දිගේ ඉහළට නගින්නට විය. තලගොයා ඌ පසු පස එන්නේදැයි බලමින් ලේනා ඉහළටම නගින්නට විය. තලගොයා ලේනා අනුගමනය කළේය. එම ගසේ ඉහළ කඳ මැද ලේනා ගේ කූඩුව පිහිටි බෙනයක් තිබුණි. ලේනාත් තලගොයාත් මේ ගස් බෙනය අසලට පැමිණ ගස් බෙනය තුළට වැදී නොපෙනී ගියෝය.

මඳ වේලාවකින් විශාල දිවිමකුළුවකු කටින් ඩැහැගත් තලගොයා බෙනය තුළින් එළියට ආවේය. දිවිමකුළුවා උගේ බිහිසුණු අඬුවලින් තලගොයා ගේ මුහුණ පහුරු ගානා සැටි ඔවුහු දුටුවෝය. මකුළුවා තලගොයා ගේ මුහුණ, උගේ අඬුවලින් වැරෙන් අල්ලාගෙන සිටියේය. තලගොයා මකුළුවා ගේ අඬුවලින් මිදීමට උගේ හිස ඒ මේ අත ගසන්නට විය. සිය කූඩුව පිහිටි බෙනයෙන් හිස මඳක් එළියට දමාගත් ලේනා මේ දර්ශනය බලා සිටියේය. මඳ වේලාවකින් තලගොයා මකුළුවා ගේ අඬුවලින් ගැළවුණි. එහෙත් මකුළුවා යළිත් තලගොයා ගේ යටි බඩ අල්ලා ගත්තේය. ගතවූයේ මඳ වේලාවකි. දිවිමකුළුවා හපයක් බවට පත් වී තලගොයා ගේ කට තුළට යනු දක්නට ලැබුණි.

''චිකේ! ඉතින් මම නම් තලගොයි මාළු කන්නේ නැහැ'' යි එඩ්මන්ට් කීවේය.

''මොන බොරුද? ඌ ඔය වගේ දේවල් කන නිසා තමයි උගේ මස් එච්චර රස'' යි ගැස්පා කීවේය.

''නිකම් හිතලා බලන්ට ඒ ලේනා ගේ කූඩුවේ හිටපු සතුරා දකලා තලගොයාට අඩ ගහපු පිළිවෙළ ගැන'' යි හැන්ස් කීවේය.

ඔවුන් විඩා හරිමින් සිටි තැන අවට සුන්දර විය. වරින් වර හැමූ මඳ සුළඟ ඔවුනට අමුතු ප්‍රීතියක් ගෙන දුන්නේය. මෙතැන එදින රාත්‍රිය ගත කිරීමට ඔවුහු තීරණය කළහ. වැව මත්තෙහිත් ඒ අවටත් පැතිර තිබූ අසිරිමත් සෝබා නරඹමින් ඔවුහු කාලය ගත කළහ. පන් කුකුළෝ සිහින් හඬින් කෑගසමින් නෙළුම් කොළ මත ඒ මේ අත පනිමින් ඇවිද්දෝය. මැටි කොරවක්කෝ කුක්! කුක්! ගාමින් දුව ගියෝය. වැවේ දිය මතු පිට පාවෙන පෙඳ පාසි වැනි දේ මත පියාපත් විදහා අව්ව තපිමින් උන් දියකාවුන් ගේ දර්ශනය දුටුවන් මන පිනවයි. නිල් අහස් ගැබ රාජාලියෙක් දෙන්නෙක් හෝ පියාසර කළහ. පිළිහුඩුවෝ කුරුමානම් අල්ලමින් අවට ගස් උඩ ලැග සිටියහ. වරෙක

හියක් මෙන් දියට පහත් වූ පිළිහුඩුවෙක් 'ජබුඃ' යනුවෙන් දිය යට ගොස් සැණෙකින් මසකු ඩැහැගෙන ඉගිලී ගියේය. ආදි-කල්පික නියන්දල්[1] තල්මසුන් වැනි කිඹුල්ලු වැව් ඉවුර අයිනේ දිග ඇදී සිටියහ.

සැන්දෑවේ ඔවුහු වැව් කණ්ඩිය දිගේ යමින් සිටියහ. විශාල පන් ගාල්වලින් ගහන වැව් කොනේ එක් තැනක පන් පඳුරු නැළෙමින් සෙලවෙනු ඔවුනට දක්නට ලැබුණි. ඔවුහු වැව් ඉවුර දිගේ ඉදිරියට ගියහ. ඔවුන් කිසි දිනක නුදුටු කොටයක් බඳු දෙයක් වේගයෙන් ඒ මේ අත වැනී අහසට පහරක් ගැසීය. විශාල කිඹුලකු ගේ බඳ වෙළාගත් දැවැන්ත පිඹුරකුට විරුද්ධව ඒ කිඹුලා කරන බිහිසුණු සටනකි එය. සටන දිගටම කෙරුණේය. කිඹුලා ඉදිරියට පනිමින් පිඹුරා ගේ නොවෙළී තිබුණු කොටස සපා සුනු කරන්නට තැත් කළේය. පිඹුරා උගේ සිරුරෙහි ඉතිරි කොටස කිඹුලා ගේ වියරු දත්වලින් බේරා ගැනීමට ඒ මේ අත වැනුවේය. පිඹුරා කිඹුලා ගෙන් බේරුණේ යන්තමිනි. ගතවූයේ මොහොතකි. කිඹුලා තියුණු සටනකට එළඹුණේය. ඌ උගේ කියතක් බඳු බාවෙන් පිඹුරාට පහර දෙන්නට විය. එහෙත් පිඹුරාට ඉන් බේරී සිටින්නට හැකි විය. ඌ උගේ සිරුරේ නොවෙළුණු කොටස කිඹුලා ගේ බාව නොවදින සේ ඈතින් තබාගෙන සිටියේය. සිය ජීවිතය ගළවා ගැනීමට මාරාන්තික ලෙස වැර වඩන්නට වූ කිඹුලා උගේ පිටේ තිබෙන ගැටවලින් පිඹුරා පොඩි කොට දමන අටියෙන් උඩු බැල්ලෙන් පෙරළුණේය. එහෙත් එවිට පිඹුරා වහා උගේ වෙළුම ගළවා ගෙන කිඹුලාට පෙරළීමට ඉඩ හළේය. යළිත් කිඹුලා පෙර සිටි ඉරියව්වට එන්නට සූදානම් වත්ම පිඹුරා වහා ඌ වෙළා ගත්තේය.

මඳ වේලාවකින් පිඹුරා විසින් සම්පූර්ණ කිඹුලා වෙළා ගනු ලැබීය. කිඹුලා ගේ හිස පටන් බාව කෙළවර දක්වා වෙළාගත් පසු පිඹුරා ඌ සෙලවීමට පවා ඉඩ නොතැබුවේය. පිඹුරා ටිකින් ටික උගේ වෙළුම කිටි කිටියේ තද කරන්නට විය. පිඹුරා ගේ දරුණු වෙළීමෙන් සිරුරෙහි සියලු ඇටයක්ම කැඩී පොඩිවී ගිය කිඹුලා අන්තිමේ දී මස් වැදැල්ලක් බවට පත්විය.

ඉක්බිති පිඹුරා කිඹුලා මුදා හැර ඉවතට ඇදුණේය. යහළුවන් තිදෙන උනුන්ගේ මුහුණු බලා ගත්හ. එඩ්මන්ට් තම කටට ආ වචන නොකියා යටපත් කර ගත්තේය. තමා යන්තම් පිඹුරකු ගේ ග්‍රහණයෙන් ගැළවුණු සැටි ගැස්පාට සිහි විය. ගැස්පා ගේ මුහුණින් ඒ බව හොඳින් පෙනී ගියේය. තමා වෙතට හැන්ස් ඇදගත් ගැස්පා මෙවැනි ඉරණමකින් තමා ගළවා ගැනීම ගැන කෘතඥපූර්වකව ඔහු වැළඳ ගත්තේය.

1. Neanderthal -මිනිසා ගේ පරිනාමය පිළිබඳ එක්තරා යුගයක්

“ඒ පිඹුරා, කිඹුලාව ගිලින්ට අදහස් කළේ නැත්නම් ඌ මරා දැම්මේ ඇයි? මට නම් ඒක මහ පුදුමයක්” යි එඩ්මන්ට් කීවේය.

“පිඹුරා දියේ පීනා ගෙන එන කොට කිඹුලා තමයි ඉස්සර වෙලා පිඹුරාට හෙට්ටු කර තියෙන්නෙ” යි හැන්ස් කීවේය. “නමුත් කිඹුලාට වඩා පිඹුරා ඉස්සර වුණා. කිඹුලා පිඹුරා අල්ලා ගන්ට ඉස්සර ඌ ඉවුරට පීනා ගෙන ආවා. ගොඩට ආවාම දන්නවා ඌට තියෙන වාසිය. ඉතින් ඌ කිඹුලා වෙළාගත්තා. දියේ දී එහෙම ඔය පොරය ඇති වුණා නම් පිඹුරාට බේරිලා එන්ට ලැබෙන්නේ නැහැ.”

“ඒක අපූරු සටනක්” යි විවේක හුස්මක් ගත් ගැස්පා කීවේය.

තෙසතියක් වනයෙහි ගත කිරීමෙන් පසු එක් දිනක හැන්ස් සහ කපිතාන්වරුන් දෙදෙනා වැද්දන් ගේ ලෙණ වෙත පැමිණි-යහ.

කන්ද උඩරට සිරගතව සිටි එඩ්මන්ට් සහ ගැස්පා ගළවා ගෙන ආපසු පැමිණීමේ ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව හැන්ස් දුනු හී රැගෙන වැදි ලෙණෙන් පිටත් වූයේ, තමා දඩයමේ යන බව වැද්දන්ට කියමිනි. තමා එවැනි ත්‍රාසජනක ක්‍රියාවක් සඳහා යන බව වැද්දන්ට කිසිම අයුරකින් දැන ගැනීමට හේ ඉඩ නො තැබුවේය. ඒ බව වැද්දන් දැන ගත්තා නම් ඔහුට මේ ගමන කිසි සේත් යන්නට ඔවුන් ඉඩ නොදෙනු ඇත. එසේ දන්වා ඔවුන් වළක්වද්දී ගියත්, ගිය ද පටන් ඔවුන් තමා වෙනුවෙන් දුක්වන බව හැන්ස් දැන සිටියේය.

හැන්ස් වැදි ලෙණෙන් පිට වී දින කිහිපයක්ම ගත වී ගියේය. ඔහු ගිය අතක් වැද්දෝ නොදත්හ. ඔහු ආපසු නොඑනු දුටු වැද්දෝ බියට පත් වූහ. ඔහුට යම් කිසි අනතුරක් වී දෝයි සිතූ ඔවුහු දින ගණනක් ඔහු සොයමින් වනය පුරා ඇවිද්දෝය. පසුව ඔවුහු මහත් දුකින් ලෙණ වෙත පෙරළා අවුත් ශෝකයෙන් කල් යවන්නට වූහ. හැන්ස්ට සිය රට ගැන සිහි වී තමා අතහැර දමා එහි යන්නට ඇතැයි රනී දුක් වූවාය.

සති හයකට පමණ පසු හැන්ස් පෙරළා වැද්දන් වෙතට පැමිණීම ඔවුනට මහත් සොම්නසට කරුණක් විය. හැන්ස්, දිගට වැඩුණු රැවුල් ඇති ප්‍රාංශු දේහයන්ගෙන් යුත් සිය මිතුරන් දෙදෙනා වැද්දන්ට හඳුන්වා දුන්නේය. කපිතාන්වරුන්

දෙදෙනා අසල සිටි වැද්දෝ කුරු මිනිසුන් මෙන් පෙනුණහ. වැද්දෝ මහත් කුතුහලයෙන් කපිතාන්වරුන් දෙස බලා සිටියහ. මෙවැනි මිනිසුන් දෙදෙනකු හැන්ස් ගේ අනුදැනුමක් නැතිව පැමිණියා නම් වැද්දන් මහත් බියට පත් වනු ඇත.

වැදි ලෙණ විශාල එකක් වූ නිසා ඔවුන් සියලු දෙනාටම එහි ඉඩ කඩ ඇතිව සිටින්නට හැකි විය. හැන්ස් ගේ ලගින තැන අසලින් ලෙණ කෙළවරෙහි ගෝන සමක් අතුරා කපිතාන්වරුන් දෙදෙනා ගේ ලැගුම් ස්ථානය පිළියෙල කරන ලදී. ඔවුහු අනුක්‍රමයෙන් මේ කටුක වැදි ජීවිතයට හුරු පුරුදු වන්නට වූහ. ඉන් ඔවුහු විනෝදය ද ලැබූහ. ඔවුන් වෙනත් අනතුරුවලට හුරු පුරුදු වුවත් මෙහි ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් අනතුරුදායක පරිසරයකි. ස්වකීය ජාති දෙක එකිනෙකා ගෙන් බලය පැහැර ගැනීම සඳහා බිහිසුණු ආයුධ ගෙන යුද වැදී සිටිය දී මේ කපිතාන්වරුන් දෙදෙනා ආදිකල්පික ආයුධවල උපකාරයෙන් එදිනෙදා වේල සපයා ගෙන එකට ජීවත් වූහ. මෙම ජීවිතය ඔවුනට ඊට වඩා දහස් ගුණයෙන් සැනසීමකි.

Scanned with CamScanner

# 13

# වැද්ද සහ කුමරිය

රජු විසින් රජ වාසලින් පිටමං කරනු ලැබූ නාලිනී කුමරිය හිස බිමට හරවා ගෙන වාසල දෙරටුවෙන් නික්මී මහ මහට බැස ගමන් ගත්තාය. විශාල ජනකායක් තමා දෙස පිළිකුලින් බලා සිටින බව දත් ඈ දෙනෙත් බිමට හරවා ගෙන නීච කුලයක එකියක මෙන් යන්නට වූවාය. දැන් ඈ වැදි කුලයට අයත් එකියක හැටියට මහජනයා විසින් සලකනු ලැබුවාය. කොහේ නමුත් ගොස් සැඟ වෙනු රිසියෙන් යුහුසුලු වූ ඈ හැකි ඉක්මනින් ගමන් කළාය. එහෙත් අබ්බගාතයකු බවට පත් වී සිටි අසරණ වැද්ද නිසා ඈට ඉක්මනින් ගමන් කළ නොහැකි විය. ඇඟ, අතපය තැලී පොඩිවී ගිය වැද්ද කොර ගසමින් ඉතා සෙමින් ගමන් කළේය. නොසිතූ අන්දමට තමාට ද්‍රෝහී වී සිටින ලෝකයෙහි දැන් ඈයට සිටින එකම හිතවතා මේ අබ්බගාත වැද්ද පමණකි. මෙය සිහිනයක් වත් දැයි නාලිනීට සමහර විට සිතුණි. තමා මේ වැද්ද සමග කතා කරන්නට යෑම නිසා ඈයට මේ සියල්ලක්ම සිදු වූ බව ඈ කල්පනා කළාය.

ඔවුන් ගිය සෑම තැනම ඔවුනට දී තිබුණු දඬුවම ගැන ආරංචි වී තිබුණි. ඒ හැම තැනකදීම බොහෝ ජනයා ඔවුන් බැලීමට මහ දෙපස රොක් වී සිටියහ. රජ වාසලින් පිටමං කරනු ලැබූ කුලහීනයන් දැක ගැනීමට ගැහැනු, මිනිස්සු සහ ළමෝ සිය ගෙවල් තුළින් එළියට දිව ආවෝය. ඔවුන් කිසිවකු තුළ මේ දීනයන් කෙරෙහි කිසියම් අනුකම්පාවක් ඇති වුවත් ඒ බව ඔවුහු වචනයෙන් හෝ ක්‍රියාවෙන් ප්‍රකාශ නොකළහ. යමක් ඉල්ලා ගැනීමට ළඟට ගිය හොත් මහජනයා මොවුන් කෙරේ පිළිකුලෙන් එළවා ගත්තෝය. සෙල්ලා සිය සිරුර ඔසවා ගෙන යා නොහැකි තරම් බලවත් කායික වේදනාවකින් ගමන් කරන්නට විය. එහෙත් නාලිනී ගමන් කළේ ඉවසා ගත නොහැකි සිත් වේදනාවකිනි.

ඔවුන් ගමන් ගත් මග අසල පිහිටි බෝගසක් යට අබ්බගාතයෙක් සිහමින් සිටියේය. තඹ කාසි කිහිපයකින් යුත් පොල් කටුවක් ඔහු අසල තිබුණි. මේ අබ්බගාතයා පසුකර යනවාත් සමගම දෙපා පණ නැතිව ගිය සෙල්ලා බිම ඇද වැටුණේය. නාලිනී ඔහු එසවීමට තැත් කළාය. එහෙත් ඒ සඳහා ඈට ශක්තියක් නොවීය. බෝගස යට සිටි අබ්බගාතයා ඔහුගේ සැරයටිය සෙල්ලා අතට දුන්නේය. සෙල්ලා එම සැරයටියේ

වාරුවෙන් ඉතා අමාරුවෙන් නැගිට්ටේය. සෙල්ලා තමාට පිහිට වූ සැරයටිය සිහන්නාට ආපසු දුන්නේය. එහෙත් ඔහු එය නොපිළිගත්තේය. ''මට වඩා එය උඹට උවමනා කරනවා'' යි සිහන්නා කීවේය. නාලිනී සිහන්නා වෙත කෘතඥ පූර්වක බැල්මක් හෙළුවාය.

දවස ගතවෙද්දී සෙල්ලා අතරමඟ බොහෝ තැන්වල නවතිමින් ගමන් කරන්නට විය. ඔහු මේ ගමන් කරන්නේ පාළු මහ වනයට හැකි තරම් ඉක්මනින් පිවිසීමටය. ඒ සඳහා ඔහු දැන සිටි කෙටිම මහ ඔහු අනුගමනය කළේය. එහෙත් එය ද ඔහුට මහත් දුෂ්කර කාර්යයක් විය.

ගිනි ගෙන දැවෙන්නා සේ ඔවුන් ගමන් කළ මහ තද අව්වෙන් රත්වී තිබුණි. ඔවුහු අධික පිපාසයෙන් පෙළෙන්නට වූහ. තමනට ගරහා එළවා ගනිතියි යන බියෙන් කිසිවකුගෙන් වතුර ටිකක් ඉල්ලා ගැනීමට ඔවුහු මැලිවූහ. මහ දෙපස තිබුණු ජලයෙන් පිරී ගිය පින්තාලියක් අසලට යාමට පවා ඔවුහු බිය වූහ.

ජනාවාස පෙදෙස් මහ හරිමින් ගමන් ගත් ඔවුහු වෙල් එළියකට පැමිණියහ. ඒ අසල අඩු කුලයේ යයි සම්මත කින්නරයන් ගේ ගෙවල් කිහිපයක් තිබුණි. මේ ගෙවල් අසලින් කුඩා දිය ඌලක් ගලා යමින් තිබුණි. පිපාසයෙන් බල-වත් සේ පීඩා විඳිමින් සිටි නාලිනී මේ ඌලෙන් පැන් ටිකක් පොල් කටුවකට ගැනීමට සැරසුණාය. කින්නරයෝ ඇය එළවා ගත්හ. ඔවුන්ගේ දිය ඌල කිලිටි කිරීමට තැත් කළේ යයි ඔවුහු නාලිනීටත් වැද්දටත් බැණ වදින්නට වූහ.

මඳක් ඈතින් තිබුණු විශාල ගස් සෙවණකට ඇදී ගත් සෙල්ලා සහ නාලිනී තවත් අඩියක් වත් ඉදිරියට යාගත නොහැකිව ගස යට වැතිර ගත්තෝය. මඳ වේලාවකින් මුහුණ පුරා වැඩුණු රැවුල් ඇති, පාවහන් රහිත යුරෝපීය ජාතිකයෙක් ඔවුන් අසලින් යන්නට පැමිණියේය. මොහු රජු විසින් අල්ලා ගනු ලැබ, කුඩා ගමක සිර කොට සිටින්නෙකි. නාලිනී කුමරියට පනවන ලද දරුණු දඬුවම ගැන මොහුට ද ආරංචි වී තිබුණි. ඔවුන් ළඟට පැමිණි මේ යුරෝපීයයා ඔවුන් දෙස මහත් අනුකම්පාවෙන් බලා සිටියේය.

ඉක්බිති හේ එතැනින් පිටත් වී ගියේය. සවස් වීගෙන එද්දී යුරෝපීයයා කුරුම්බා ගෙඩි දෙකක් සහ ඉදුණු කෙසෙල්ගෙඩි ඇවරියක්ද අතැතිව ඔවුන් වෙත පැමිණියේය. ඔහු සිය හිණෙන් පූනු පිහියක් එළියට ගෙන දිග හැරියේය. අනතුරුව බිම දණ ගසා ගත් ඔහු කුරුම්බා ගෙඩිවල ඇස්ස කපන්නට විය. ඇස්ස

කහා හිල් කරන ලද කුරුම්බා ගෙඩි දෙකින් එකක් නාලිනී අතටත් අනෙක වැද්ද අතටත් ඔහු දුන්නේය. අධික පිපාසයෙන් හා බඩසයින් වේදනා විඳිමින් සිටි ඔවුන් දෙදෙනාට කුරුම්බා වතුර අමාවක් බඳු විය. නාලිනීත් වැද්දත් සුද්දට පින් දෙමින් කුරුම්බා පානය කළහ. හිස් කුරුම්බා ගෙඩිවල මැද ඔහු ඔවුනට ගළවා දුන්නේය. ඉක්බිති ඔවුන් දිරිමත් කරවන සේ හිස වැනූ සුද්ද කරුණාබර සිනාවකින් ඔවුනට සංග්‍රහ කොට යන්නට ගියේය.

ගමන් වෙහෙසත් අධික පිපාසයත් කුසගින්නත් නිසා මහත් පීඩාවට පත් වී සිටි නාලිනී යුරෝපීයයා ගේ සංග්‍රහයෙන් සැනහී කුඩා දරුවකු මෙන් නිදන්නට වූවාය.

සෙල්ලා ඇය අවදි කරන විට අහසේ සඳ බැබළෙමින් තිබුණි. ඇගේ ගත ගමන් වෙහෙස නිසා වේදනාවෙන් පෙළුණත් රාත්‍රියෙහි ගමන් කිරීමට ඇ කැමති වූවාය. මිනිසුන් ගෙන් ලැබෙන ගැරහුම් හා පිළිකුල් සහගත බැලීම්වලට රාත්‍රියෙහි මුහුණ දෙන්නට නොවන නිසා ඇ සැනසුණාය. ගම්ගොඩවල් පසු කොට අතරින් පතර හමු වූ ගෙවල් අසලින් අවතාර මෙන් ගමන් කළ ඔවුනට සමච්චල් කළෝ බල්ලෝ පමණි.

සැතැපුම් දෙකක් පමණ ඉදිරියට ගමන් කළ සෙල්ලා වනය දෙසට හැරුණේය. වනයෙන් වැසී ගත් කඳු හෙලක් මුදුනට නැගී ගත් ඔවුහු ඉතා සෙමින් අනෙක් පසින් පහළට බසින්නට වූහ.

අරුණලු වැටී ඈත අහස ආලෝක වන සැටි කන්ද පහළට බසින ඔවුනට පෙනුණි. වන පියෙස හිරු එළියෙන් බැබළෙන්නට විය. දෙළක් අසලට පැමිණි සෙල්ලා එතැන විඩා හැරිය යුතු බව නාලිනීට දැන්වීය. යුරෝපීයයා විසින් දෙන ලද කෙසෙල් ගෙඩි අනුභව කරන ලෙස සෙල්ලා නාලිනීට කීවේය. තමාට බඩගිනි නැතැයි කී සෙල්ලා ඔහුට දුන් කෙසෙල් ගෙඩි කෑවේ නැත.

වැද්ද ගසක් යටට වී නිදන්නට විය. නාලිනී නුදුරින් හිඳගෙන කල්පනා කරන්නට වූවාය. මේ වැද්ද තමාත් කැටුව යන්නේ කොයිබට ද? තමාගේ ඉදිරි ජීවිත කාලයම මේ වැද්ද සමග වනයේ ගත කරන්නට වෙයි ද? මෙවැනි දේ ගැන සිතමින් සිටි ඇ ද නිදිකිරා වැටෙන්නට වූවාය.

බොහෝ සවස් වී ඇ අවදි වූවාය. තමා අවදි වන තුරු ඉවසිල්ලේ බලා සිටින වැද්ද ඇට දක්නට ලැබුණි. කෙවිටක් කඩා නාලිනී අතට දුන් වැද්ද එහි ආධාරයෙන් තමා පසු පස සීරුවෙන් කන්ද බසින ලෙස කීවේය. පෙරටුවෙන් ගමන් ගත් සෙල්ලා

තමා පසු පසින් එන නාලිනී ගේ ගමන පහසු කිරීම සඳහා ඉදිරියෙන් මගට නැමී තිබුණු අතුරිකිලි කඩා දමමින් බැසීමට පහසු තැන් හරහා පහළට බසින්නට විය. බැසීමට අනතුරුදයක තැන්වලින් ඈට පරිස්සම් වන ලෙස කියා ඈ එවැනි තැන් පසු කරන තෙක් ඔහු නැවතී බලා සිටියේය. වරෙක එවැනි තැන්වලින් බැසීමට ඔහු ඈට අත දුන්නේය. මෙතරම් දුර්වල තත්ත්වයක සිටියදීත් සෙල්ලා තුළ තිබුණු ධෛර්ය්‍යය ගැන ඈ පුදුම වූවාය.

මෙවැනි කටුක ගමන් කිසිසේත් නුහුරු නාලිනීට මේ ගමන ඉතා අසීරු එකක් විය. අබ්බගාතයකු මෙන් සිටි සෙල්ලාට එය වඩාත් අමාරු කාරියකි. පසු ද සවස ඔවුහු කඳු බෑවුමෙහි මැද භාගයේ ඇද හැලෙමින් තිබුණු රමණීය දිය ඇල්ලක් අසල පිහිටි සෙල්ලා ගේ ගල් ලෙණ වෙත පැමිණියහ. ඔවුන් වෙත බුරා ගෙන ආ දුඹුරු පාට බල්ලෙක් ඔවුන් පිළිගත්තේය. සෙල්ලා ගේ වචනයට බල්ලා නිහඬ විය.

ඈල වූ ගල් පොත්තක් යට මේ ලෙණ පිහිටියේය. එය ගස් වලින් මනාව ආවරණය වී තිබුණි. ඈල වී තිබුණු ගල් පියස්ස යට හේත්තු කොට තිබුණු සෙල්ලා ගේ දුනු හී ද පහළින් මස් පිලිස්සීම පිණිස තැනුණු මැස්සක් ද මුව සම් දෙකක් ද හැරෙන්නට ලෙණ තුළ අන් කිසිවක් නොවිය. නාලිනීට හිඳ ගැනීම පිණිස ඔහු මුව සමක් එළුවේය. ලෙණ බිත්තියේ ගල් පතුරක් ඉවත් කළ සෙල්ලා මීපැණියෙහි බහා ලූ මුවමස් පිරුණු ගල් විවරය ඈට පෙන්විය. ඉක්බිති වැද්ද අඩි කිපයක් අමාරුවෙන් ඉවතට ගොස් සිහි නැතිව බිම ඇද වැටුණේය. බලවත් සේ විඩාවට පත් වී සිටි නාලිනීට සෙල්ලා ගේ තත්ත්වය ගණනකට ගත හැකි නොවිය.

ලෙණ තුළ වූ හැඩි දැඩි ගල මත රාත්‍රිය නොනිදම පහන් කළ නාලිනී, ඇනුම් හරිමින් හිඳගත්තාය. වැද්ද තද නින්දේ පසුවන බව දුටු නාලිනී ලෙණ අසලින් ගලා ගිය දෙළෙහි ආවරණය වූ තැනකට ගොස් ඇඳුම් උනා ස්නානය කළාය. දූවිල්ලෙන් හා දහඩියෙන් අපවිත්‍ර වූ ඇගේ ඇඳුම් ඈ දෙළෙන් සෝද ගල් තලාවක වැනුවාය.

හදිසියේ අසලින් ඇසුණු සරසරයකින් ඈ තිගැස්සුණාය. වන සතකුවත් එත් දෝ හෝයි ඈ බියෙන් වට පිට බැලුවාය. වැද්ද ගේ බල්ලා ඈ දෙසට එනු ඈට දක්නට ලැබුණි. දෙකන් උස්සා මඳ වේලාවක් ඈය දෙස නැවතී බලා හුන් බල්ලා නැවතත් වනය තුළට රිංගා ගත්තේය.

ගල් ලෙණට පෙරළා පැමිණි නාලිනීට සෙල්ලා තවමත් එම ඉරියව්වෙන්ම වැතිර සිටිනු දක්නට ලැබුණි. ඈ ඔහුට කතා

කළාය. එහෙත් වැද්දා ගෙන් කිසිම පිළිතුරක් නොලැබුණි. ඔහු මැරී සිටී දෝයි ඈ බිය වූවාය. ඈ බියෙන් වෙව්ලන්නට වූවාය. ඈ යළිත් වැද්දාට නැඹුරු වී ඔහු පිරික්සුවාය. වැද්දා ඉතා සෙමින් හුස්ම ගන්නා දුටු ඈ සැනසුණාය.

බඩගින්න ඉවසා ගත නොහැකි වූ ඈ මීපැණියෙහි බහාලූ මුව මස් කැබැල්ලක් අප්‍රියාවෙන් කෑවාය. වැද්දා දූන් දූන් අවදි වෙතැයි සිතූ ඈ වරින් වර ඔහු දෙස බැලූවාය. ඇය තුළ වැද්දා කෙරෙහි බලවත් අනුකම්පාවක් හටගත්තේය. එහෙත් ඔහුගේ බිහිසුණු මුහුණත් කෙටි රෙදි කඩකින් පමණක් සෙළුව වසාගත් ගතත් දුටු ඈ තැතිගත්තාය. ඈ හැන්ස් ගැන සිතුවාය. ඔහුට දැන් කුමක් වී ඇත්ද? බිම හිඳ ගෙන කල්පනා කරමින් සිටි ඇගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙන්නට විය.

සවස් විය. වැද්දා තවමත් නිදි ගත් වනම සිටී. බියෙන් හා සැකයෙන් තැතිගත් ඈ වැද්දා ගේ උරෙන් අල්ලා සෙලෙව්වාය. සිහින් කෙඳිරිල්ලක් ඔහුගෙන් නිකුත් විය. මුණින් තලා වැටී නිද හුන් වැද්දා නාලිනී විසින් අනෙක් පසට හරවනු ලැබීය. ඇයට දක්නට ලැබුණේ බිහිසුණු දර්ශනයකි. සෙල්ලා ගේ ගතෙහි වූ තුවාල පැසවා ඉදිමී සාරය ගලමින් තිබුණි. මැස්සෝ "සූ" හඬින් ඔහු වටා හැසුරුණහ. තමන් මෙහි කැඳවා ගෙන ඒමට ඔහු කොතරම් දුකක් වේදනාවක් වින්ද දැයි ඇට සිතුණි. ඔහු කෙරෙහි ඈ තුළ වූ පිළිකුල අභිභවමින් මහත් අනුකම්පාවක් ඇගේ හද පත්ලෙන් නැගී ආවේය.

මේ මහ වන මැද වැද්දා වෙනුවෙන් ඇට කළ හැකි දේ කුමක් ද? ඈ අත්ල මැද්දය. වැද්දා ගේ බල්ලා පවා ඇය තනි කොට දමා ගොස් සිටියේය. නාලිනී බියට පත් ළදරුවකු මෙන් වැලපෙන්නට වූවාය.

මෙතැන නිකම් වැලපීමෙන් කිසිවක් කරගත නොහැකි බව හැඟුණු නාලිනී ලෙණ තුළ පිරික්සන්නට වූවාය. ගලේ විවර-යක් අස්සේ තිබුණු ලබු කැටයක් ඇට දක්නට ලැබුණි. ඈ දෙළ වෙත ගොස් ඊට වතුර ගෙන ආවාය. ගොටුවෙන් අතට දිය ටිකක් ගත් නාලිනී එය සීරුවෙන් සෙල්ලා ගේ තොල් අතරට වත් කළාය. සෙල්ලා තලුමරමින් දිය පානය කරනු දුටු ඈ මහත් සැනසීමක් ලැබුවාය. ඉක්බිති ඈ ඔහුට මී පැණි පෙව්වාය. හැදි වතින් කැබැල්ලක් ඉරා ගත් ඈ එය දියෙන් පොඟවා සෙල්ලා ගේ අපිරිසිදු සිරුර පිරිසිදු කළාය. අනතුරුව ඈ තවත් රෙදි පටි කිහිපයක් සිය වතින් ඉරා බරපතලව තිබුණු තුවාල ඉතා පරිස්සමින් වෙළුවාය.

වැද්දාට සාත්තු සප්පායම් කිරීමෙන් පසු විඩාවට පත් නාලිනී පසෙක හිඳ ගෙන නිදි කිරන්නට වූවාය. මේ අතර තලගොයෙකු කටින් ඩැහැගත් සෙල්ලා ගේ බල්ලා ලෙණ තුළට අවුත් එය මස් පුලුස්සන තැන දැමුවේය. ඉක්බිති ඌ සෙල්ලා අසලට ගොස් ඉව කරමින් ඔහු වටා කැරකුණේය. තම ස්වාමියා ගෙන් කිසිදු බසක් නොලත් බල්ලා ඔහු අසලින් දිග ඇදී හතිලමින් ඔහු දෙස බලා සිටියේය.

බල්ලා විසින් ගෙන එනු ලැබූ සතා දෙස නාලිනී හිරිකිතයෙන් බැලුවාය. තලගොයි මස් කුකුළු මස් මෙන් රසවත් බව සමහරුන් කියනු ඇය අසා තිබේ. එවැනි මසක රස බැලීමට ඇට සිත් වුවද එය පිසීම සඳහා අවශ්‍ය බඳුනක් වත් ගින්දර වත් එහි නොමැත. තමන් විසින් ගෙන එනු ලැබූ තලගොයා මෙතෙක් වේලා නොසලකා හැර තිබෙනු දුටු බල්ලා එය ඉවතට ගෙන ගොස් තනිවම බුදින්නට විය.

දින හතරක් ම නාලිනී, සිහිසන් නැතිව මෙන් වැටී සිටි වැද්දා ගේ තුවාලවලට සාත්තු සප්පායම් කළාය. දිනපතාම වැද්දා දුර්වල වී යන සැටි ඈට වැටහුණි. යම් විදියකින් වැද්දා මළ හොත් තමාට කුමක් වේ දැයි ඈ කල්පනා කළාය. මේ බියකරු මහ වනයෙන් මං සොයා ගෙන පිටව යන්නට තමාට හැකි වේද? එසේ පිටව ගියත් කුලහිනියක ලෙස පිටමං කරනු ලැබූ ඈකියකට යන්නට තැනක් ඇත්තේ නැත.

ගිනි මැලයක් නොතිබුණෙන් රාත්‍රියෙහි ලෙණ තුළ අධික ශීතලයක් පැවතුණි. රාත්‍රියෙහි පැතිරි මර පාළුව බිඳිමින් මහ වනය තුළින් වරින් වර ඇසුණු නොයෙක් බියකරු ශබ්දයන් ගෙන් ද සෙමින් ඇසෙන අඩි ශබ්දයන් ගෙන් ද අතු සෙලවීමෙන් ද ඈ තැති ගත්තාය. සිහිසන් නැතිව වැදහෝනා වැද්දාත් කිසියම් වන සතකු අසල හැසිරෙනු දැනීමෙන් වරින් වර බුරන බල්ලාත් ඇගේ සිතට මඳ සැනසීමක් ගෙන දුන්හ.

නාලිනී ගේ මනා සාත්තු සප්පායම් නිසා පස් වෙනි දින උදෑසන වැද්දා හොඳ සිහිය ලැබුවේය. වැද්දා වෙත නැඹුරුවී බලා සිටි නාලිනී දෙස ඔහු ඇසි පිය නොහෙළා බලා සිටියේය. ඇය විසින් පොවන ලද මී පැණි සහ දිය වැද්දා ආශාවෙන් ගිල දැම්මේය. නාලිනී තම තුවාලවලට සාත්තු කරන හැටි, දූකට පත් කීකරු සතකු මෙන් වැද්දා බලා සිටියේය.

දින දෙක තුනකට පමණ පසු සෙල්ලාට නැගිටින්නට පුළුවන් විය. ඔහුට අඩි කිහිපයක් එහා මෙහා ඇවිදින්නට පුළුවන්

වූයෙන් ඔහු සිය කටයුතු සියතින්ම කරගත්තේය. නාලිනි ගේ කරුණාවත් අනුකම්පාවත් විසින් සෙල්ලා ගේ සැඩ ගතිය මොළොක් කරනු ලැබිය.

එදා බල්ලා විසින් ගෙන එනු ලැබූ තලගොයා කිසිවකු ප්‍රයෝ-ජනයට නොගත් හෙයින් ඌ ඉන්පසු දඩයම් කළ සතුන් ලෙණ වෙත නො ගෙනැවිත් තනිවම කාදැමුවේය. ඉක්මනින් අවසන් වී යමින් තිබුණු මී පැණියෙහි බහාලූ මුවමස් කැබැලිවලින් ද නාලිනී බල්ලාට සංග්‍රහ කළාය. කරුණු තේරුම් බේරුම් කර ගත හැකි පුදුම ගතියකින් යුත් මේ තිරිසන් සතා තම ස්වාමියා සුවපත් වී සිටිනු දැක, දිනක් සවස වඳුරු නාම්බකු ඩැහැගෙන ආවේය.

ගිනි ගල සහ පුළුන් ටිකක් සිය මඩිස්සලයෙන් එළියට ගත් සෙල්ලා දර කෝටු ටිකක්සොයා ගෙන එන ලෙස නාලිනීට කීවේය. ඉක්මනින් ඔවුහු ගිනිමැලයක් ගැසූහ. මිනිස් රුවක් බඳු වඳුරා සෙල්ලා විසින් හීතලයකින් හම ගසනු ලබන සැටි නාලිනී බලා සිටියාය. වැද්ද වඳුරු නාම්බා ගේ බොකු බඩවැල් ඉවතට අදින සැටිත් සමහර කොටස්, ඒ දෙස ඉතා ඕනෑකමින් බලා සිටින බල්ලා වෙත වීසිකරන සැටිත් අනතුරුව මස් ටිකක් ගෙන ගිනි මැලයෙන් පුලුස්සා කන සැටිත් දුටු නාලිනී පිළි-කුලෙන් ඉවත බලා ගත්තාය.

මෙවැනි ආහාරයකට නාලිනී තුළ ඇති පිළිකුල දුටු සෙල්ලා ඊට හවුල් වන ලෙස ඇට ඇවිටිලි නොකළේය. දිගටම මී පැණියේ බහාලූ මුව මස් අනුභව කළ ඇට පිලිස්සෙන වඳුරු මසින් නිකුත් වුණු රුචිකර සුවඳ ඉවසන්නට නොහැකි තරම් විය. ඈ සෙල්ලා අසලට ගියාය. සෙල්ලා පිලිස්සෙන දුඹුරුවන් මස් ගාතයක කොටසක් කඩා කැන්ද කොළයක තබා ඈට පිළිගැන්නුවේය. ඈ අප්‍රියාවෙන් මෙන් ඉන් ටික ටික ඇඟිලි තුඩුවලින් කඩමින් කන්නට වූවාය. මඳ වේලාවකින් වඳුරු මසේ ඇති රසය ඈට වැටහුණි. ඈ කෑදරකමින් වඳුරු මස් බුදින්නට වූවාය. සෙල්ලා ඈ දෙස ප්‍රීතියෙන් බලා සිට වඩ වඩා රසැති කොටස් තෝරා ඈය වෙත පිළිගැන්නුවේය. බල්ලා ඌ වෙත දමන ඇටකටු බුදින්නට විය.

එතැන් පටන් දිනපතාම බල්ලා මොනයම් හෝ සතකු දඩයම් කරගෙන ආවේය. ඌ බොහෝ විට ගෙන ආවේ නාලිනීට

දන් හොඳට හුරු පුරුදු තලගොයෙකි. සමහර විට ඌ සාවුන් හා මීමින්නන් ද ඩැහැගෙන ආවේය. සෙල්ලාත් නාලිනීත් තෙසතියක් ම ලෙණෙහි ගත කළහ. මේ තෙසතිය තුළ ඔවුන් යැපුණේ බල්ලා විසින් අඩයම් කර ගෙන එනු ලැබූ වන සතුන් ගේ මස් වලිනි.

තෙසතියකට පසු දිනක් උදෑසන සිය දුනු හී සහ පොරොවත් රැගෙන සෙල්ලා නාලිනීත් කැටුව මහ වනයෙන් වැසී ගත් කඳු බෑවුම දිගේ පහළට බසින්නට විය. ඔවුහු ඉතා සෙමින් ගමන් කළහ. එහෙත් තැනිතලා මහ වනයට පිවිසි සෙල්ලා අමුතු ප්‍රබෝධයක් ලැබූවකු මෙන් ගමන ඉක්මන් කළේය. සෙල්ලා මේ ගමන් කරන්නේ යළිත් සිය වැදි කණ්ඩායමට එකතුවන අටියෙනි. කඳුකර ජීවිතයෙන් දැන් ඔහුට ඇති වැඩක් නැත.

දිනක් වනගත ගම්මානයකට පත් සෙල්ලා නාලිනීට වැල් ගොමුවක සැඟවී සිටින ලෙස කියා තමා තනිවම ඉදිරියට ගියේය.

තම්බාපු ඉරිඟු කරල් කිහිපයක් ද රැගත් සෙල්ලා පැයකින් පමණ ආපසු පැමිණියේය. ඔවුහු ඉරිඟු කමින් යළිත් ගමන් කරන්නට වූහ. සෙල්ලා නාලිනී සමග කතා කළේ නැත. ගම්මානය දෙසට තනිවම ගොස් ආපසු පැමිණි සෙල්ලා ගේ මුහුණ වෙනදට වඩා අමුතු එළියකින් ඔප වැටී ඇති බව ඈට පෙනුණි. ඔහුට ගම්මානයෙන් ලැබුණු ආරංචිය සුබ එකක් වන්නට පුළුවන. සෙල්ලා දැන් පෙරට වඩා පරීක්ෂාවෙන් කිසියම් අරමුණක් කරා ගමන් ගෙන සිටින බව ඈට අවබෝධ වුණි.

ඔවුහු මහ වනය හරහා ඉදිරියටම ගමන් කළෝය. මේ වැද්ද තමාත් කැටුව කොහි යන්නේ දැයි ඈ සිතුවාය. එහෙත් ඔහුගෙන් ඒ ගැන විමසීමෙන් වැඩක් නොවන බව දත් ඈ නිහඬ වූවාය.

තමා ස්වකීය දියණියක ලෙස සලකන මේ නුපුරුදු වනවාසී මනුෂ්‍යයා කෙරෙහි ඈ විශ්වාසය තැබුවාය. අතර මඟ දී ඔවුන් එකිනෙකා සමඟ කතා නොකළත්, ඔවුන් තුළ එකිනෙකා කෙරෙහි තිබූ අනුකම්පාව ක්‍රමයෙන් වැඩි වන්නට විය. ආයුධ පාවිච්චි කිරීමට තරම් ශක්තියක් මෙතෙක් සෙල්ලා තුළ නුවූවත්

ඔහු තුළ කිසිදු බියක් නොවීය. සෙල්ලා නිසා තමා වන සතුන් ගෙන් සම්පූර්ණයෙන්ම ආරක්ෂා වන්නේ යයි නාලිනී සිතුවාය. වනයේ සුලභව තිබුණු අල වර්ගවලින් හා බල්ලා විසින් අල්ලා ගෙන එනු ලැබූ කුඩා වන සතුන් ගෙන් ඔවුහු කුසගින්න නිවා ගත්හ.

සුව පහසුවට මාලිගයේ ඇති දැඩි වුණු නාලිනී කුමරියට මේ වන මැද ගමන එන්ට එන්ටම කටුක විය. ඇට මහ වනය වද දෙන්නට විය. ගස් වලින් වැටුණු වියලි කොළ අතර හුන් සිය ගණන් මැසි මදුරුවන් දෂ්ට කළ ඇගේ සිනිඳු සම ගොරෝසු වී තිබුණි. ඇගේ සිරුර කුඩා තුවාලවලින් හා විෂ සහිත බිබිලි වලින් වැසී තිබුණි. මේ හේතුවෙන් ඇට නිතර නිතර තදින් උණ ගත්තේය. සමහර අවස්ථාවල දී ඇගේ අධික උණ ගතිය නිසා දින දෙක තුනක් මහ පමා වන්නට සිදුවිය. සෙල්ලා වන බෙහෙත් වර්ග පොඩි කොට තුවාලවලට දැමීමට දුන්නේය. වැරැහැලි බවට පත්වී තිබුණු සිය ඇඳුමින් රෙදි පටි ඉරාගත් නාලිනී ඒ බෙහෙත් තුවාලවලට තබා බැඳ ගත්තාය.

සෙල්ලා ද යළිත් දුර්වල වන්නට විය. මීයක් කැඩීමට ගොස් ගසකින් ඇද වැටීම නිසා ඔහුගේ දුර්වලත්වය සීඝ්‍රයෙන් දියුණු වන්නට විය. ඔහුට රජ වාසල දී දෙන ලද අමානුෂික දඬුවම් වලින් ඔහුගේ සිරුර තුළ තද බල ආබාධයක් හටගැනී තිබෙන බව පැහැදිලිවම පෙනෙන්නට විය. ඔහුගේ ආහාර රුචිය පවා ක්‍රමයෙන් හීන වන්නට විය.

ඔහු දුබල වන්නට වන්නට ඔහු සිය අරමුණ කරා යන ගමන ඉක්මන් කළේය. සෙල්ලා කිසියම් ලකුණු වැටුණු මඟක් ඔස්සේ යන බව නාලිනී දින ගණනකම සිට අනුමාන කළාය. ඔවුන් ගමන කරන මහ දිගට ඇති ගස්වල කිසියම් සලකුණු වගයක් බලමින් ගමන් කරන සෙල්ලා දුටු ඇ කුතුහලයට පත් වූවාය. ඇයට එය ප්‍රහේලිකාවක් විය. ඇ ඔහුගෙන් ඒ ගැන විමසුවාය. එහෙත් ඊට ඔහුගේ පිළිතුර වූයේ කෙඳිරීමක් පමණි.

අලයක් සාරා. ගැනීමට පවා නොහැකි අන්දමින් සෙල්ලා දුර්වල වූයේය. ඔහුට කළ හැකි වූයේ අල වැලක් ඇති තැනක් නාලිනීට පෙන්වා දීම පමණකි. දැඩි වියලි දණ්ඩක් වැනි යමක්

ආධාර කොට ගෙන ඈ සිය ඇඟිලිවලින් අල සැරැව්වාය. ඇගේ ඇඟිලිවල සම ගැලවී ලේ ගලන්නට විය. වඳුරෝ ගස් උඩ හිඳගෙන ඔවුනට දත් විලිස්සූහ. එහෙත් සිය දුන්න ඇදීමට සෙල්ලා සමත් වූයේ නැත.

ඔවුන් සිටින දුර්වල තත්ත්වය වැටහී මෙන් දෝ බල්ලා දින පතාම පාහේ වන සතකු අල්ලා ගෙන ආවේය. අල පුලුස්-සන්නාක් මෙන් නාලිනී ගිනිමැලයක් ගසා ඒ සතුන් පුලුස්සා පිළියෙල කළාය.

සෙල්ලා මහත් වෑයමින් ඉදිරියට ගමන් කළේය. ඉතාමත් දුර්වල තත්ත්වයක සිටි සෙල්ලා ගේ පණ නළ රැකුණේ ඔහු තුළ තිබූ තදබල බලාපොරොත්තුවක් නිසාය. සෙල්ලාට දුන් යාගත හැක්කේ දිනකට සැතපුම් තුන හතරක් පමණි. බොහෝ විට දිය කඩක් අසලට වත් පැමිණීමට ඔවුනට නොහැකි විය. එහෙත් ගල් ලෙණෙහි සිට නාලිනී ගෙන ආ ලබු කැටය ඔවුනට උපකාරී වූයේය. දිය කඩක් හමු වූ විට ඈ ලබු කැටයට ජලය පුරවා ගත්තාය.

තමා සේන්දු වීමට අදිටන් කරගෙන සිටින ස්ථානය නුදුරින්ම පිහිටා ඇත්තාක් මෙන් සෙල්ලා සිය දුර්වල වූ කයට සිතින් ධෛර්යය දෙන්නට තැත් කළේය. මඳක් දුර ගමන් කළ සෙල්ලා හතිලමින් වාඩි ගත්තේය. වේදනාවෙන් කෙඳිරි ගෑවේය. බඩ පපුව අත ගෑවේය. කඳුළු සැලුවේය. විටින් විට මඟ ඇද වැටෙන සෙල්ලා මඳ වේලාවක් නැවතී සිට නාලිනී ගේ උපකාරයෙන් නැගිට ගමන් කළේය. මඳ දුරක් ගොස් යළිත් පා පණ නැතිව ඇද වැටුණේය. නාලිනී යළිත් ඔහු වත්තම් කොට නැගිටු වන්නීය. නාලිනී ද බොහෝ දුර්වල වී සිටියාය. ඇය දූන් රූකඩයක් බඳුය.

ඔවුන් ගමන් ගන්නා ස්ථානයට ළඟා වනවාට වඩා මෙසේ වැටි වැටී ගොස් මඟ දී මළ හොත් වඩා හොඳ යයි නාලිනී කල්පනා කළාය. මේ රුදුරු මහ වන මැද මේ මිනිහා වැනි වැද්දන් සමඟ සිය ජීවිතයේ ඉදිරි කාලය දුක සේ ගත කිරීමෙහි තේරුමක් නැති බව ඈ කල්පනා කළාය.

දිනක් සෙල්ලා කිසියම් සලකුණක් පිරික්සීමට බිමට නැඹුරු වූයේය. එවැනි සලකුණක් වැද්දට හමු වූ පළමු වතාවයි මේ. ඔහු එය නාලිනීට පෙන්වූයේය.

"මොකක් ද ඒ?" යි අමුතු කිසිවක් නුදුටු නාලිනී ඇසුවාය. එය මිනිසකු ගේ පා සටහනක් බව පෙන්වීමට ඔහු ඒ මත සිය පය තබා "මේක අපේ මිනිසුන් ගේ" යි කීවේය.

එය එසේම විය. නාලිනී ද එය ඇදහුවාය. නාලිනී කුමරිය ගේ ආරක්ෂාව වැදි රැළකට භාර දීමේ ස්ථිර අධිෂ්ඨානයෙන් යුත් සෙල්ලා ඉතා වේගයෙන් දුර්වල වී යමින් තිබුණු සිය කයෙහි ඉතිරිව තිබූ හැම පණ බිඳක්ම වෙහෙසෙව්වේය.

පුරා දින දෙකක්ම ඔවුහු බීමට දිය බිඳක් නැතිව අධික පිපාස-යෙන් දුක් වින්දෝය. නාලිනී ළඟ තිබුණු කැටයෙන් දිය ගෙන ගිය හැක්කේ ස්වල්පයකි. එය ඔවුන්ගේ බල්ලාත් සමග පිරිමසා ගත යුතුව තිබුණි. තෙවෙනි දින සවස් වන විට ඔවුහු වියළී ගිය ඇලක් වෙත පැමිණියහ. මෙහි දී සෙල්ලා බලවත් සේ දුර්වල වී සිහි නැතිව ඇද වැටුණේය.

පැයකින් පමණ සිහිය ලැබූ සෙල්ලා ඇළ ඉවුර දිගේ බඩ ගාමින්, මුල් උඩට නෙරා තිබුණු විශාල ගසක් අසලට පැමිණි-යේය. එතැන තිබුණු ගලක් පෙන් වූ සෙල්ලා එතැන යටට සාරන ලෙස නාලිනීට කීවේය. ඈ උල් කරගත් ලී කෝටුවකින් එතැන සාරන්නට වූවාය. ඈ හතිලමින් පැය ගණනක් තිස්සේ අඩි හතරක් පමණ යටට සෑරීමෙන් පසු වතුර උනන්නට විය.

පසු ද උදෑසන සෙල්ලා නැගිටින්නට කිසිදු වෑයමක් නො කළාය. ඔහු සෑම බලාපොරොත්තුවක්ම හැර දමා සිටියේය. සෙල්ලා හදිසියේ මෙවැනි දුබල තත්ත්වයකට පත්වීම ගැන නාලිනී තැති ගත්තාය. සෙල්ලා ගේ සිරුර, ඇටකටුවලට ඇලුණු දිරා ගිය රුකඩයකි. දෙනෙත් වියළී ගොස් අඳුරු වී තිබුණේය.

ඔහු වතුර ස්වල්පයක් පමණක් බීවේය. කිසිවක් ආහාර වශයෙන් නොගත්තේය.

තමාට තමාම සැතිරියක් වූ නාලිනී, වැද්දා මළ හොත් තමාට වන්නේ කුමක්දැයි කල්පනා කරන්නට වූවාය. ඇගේ දෙනෙත් යටට ගිලී ගොස් තිබුණි. රාත්‍රියට වනය තුළින් නිතර පාහේ ඇසෙන බිහිසුණු ගෙරවුම් හඬ ඇට සිහිවිය. වැද්දා මළ හොත් එවැනි බියකරු වන මෘගයකුට ගොදුරු වීම විනා ඇයට සිදු වන්නේ වෙන කුමක්ද? රාත්‍රියට බිය ගෙන දෙමින් ගොරවන ඒ සතා අනෙකකු නොව කොටියා බව ඈ දන්නීය.

තමාට සමීපවන ලෙස සෙල්ලා නාලිනීට සංඥවක් කළේය.

ඔහු කෙඳිරිගාමින් ගොතළමින් මහත් අමාරුවෙන් කතා කරන්නට විය. සෙල්ලා ගේ කටින් පිට වූ වචන නාලිනීට



දිනක් සෙල්ලා කිසියම් සලකුණක් පිරික්සීමට
බිමට නැඹුරු වූයේය

Scanned with CamScanner

ඇසුණේ යන්තමිනි. ''දැන් දවස් ගාණක ඉඳන් මා මේ එමින් හිටියේ එක්තරා ලකුණු වගයක් අනුවයි. තවත් අඩියක් වත් මට දැන් යන්ට බැහැ. ඒ ලකුණු බොහෝම පරණ ඒවා. මේ ඇත්තොට ඒවා හොයා ගන්නට බැහැ. නමුත් දැන් අපි ගමන් ගත් සතුන් ගේ වන පැදුම ඔස්සේ ගියොත් ඇත්තෝ යන මහ හරි. හරස් පැදුම් ඇත්තෝට හමුවෙන්ට පුළුවනි. නමුත් ඒවා ගණන් නොගෙන ඉර නගින පැත්තම බලාගෙන ඉදිරියට යන්න. ඉර නගින්නේ, අර පැත්තෙන්. බහින්නේ මේ පැත්තෙන්'' යි සෙල්ලා සිය දුබල අත දිගු කොට ඈට දිසාව පෙන්වා දුන්නේය.

සෙල්ලා ගේ අන්තිම මොහොත දැන් එළඹ තිබේ. ඔහුගේ මුළු ජීවිත කාලය තුළ දී ම නොකළ දිග කතාවක් ඔහු ඔහුගේ අන්තිම මොහොතෙහි කරන්නට වූයේය. ''දැන් අපි ඉන්නෙ මගේ රටේ. ඊයේ මං ඇත්තෝට පා සලකුණක් පෙන්නුවා. මෙහි සිට වැඩි දුරක් යන්නට ඉස්සර වෙලා වැදි ගුහාවක් තියෙන්ට ඕනැ. නමුත් ඇත්තෝ එහි ගෙන යාමට මට දැන් බින්දුවක වාරුවක් නෑ.''

මෙසේ කී සෙල්ලා බොහෝ වේලාවක් නිහඬව සිටියේය. නාලිනී කඳුළු පිරි දෙනෙතින් යුතුව අසරණ වැද්ද දෙස බලා සිටියාය.

ඔහු යළිත් කතා කිරීමට පටන් ගත්තේය. ''ඇත්තෝට තනිවම ඒ වැදි ගුහාව හොයා ගන්නට අමාරුයි. එය තිබෙන්නේ මහා ගල් පර්වත අස්සෙයි. නමුත් ඒ කිට්ටුවට ගිහින් හූ කිව්වාම ඔවුන් දැන ගනීවි ඇත්තෝ ඉන්න බව. හෙමින් හෙමින් ගියත් හෙට හැන්දෑ වෙන කොට ඒ කිට්ටුවට යන්ට පුළුවනි. හෙට හැන්දෑ වෙනකල්ම ගමන් කරලා මිසක්, ඊට ඉස්සර වෙලා හූ කියන්ට එපා. හැන්දෑ වුණාම හූ කිය කියා ඉදිරියට යන්න. දැන් ඉතින් ඔය කැටයට දිය පුරවාගෙන මේ මගේ පොරොවත් අල ටිකත් අරගෙන පිටත් වෙන්න.''

''මොනවා!'' යි නාලිනී කැගැසුවාය. ''මා විතරක් තනියම? ඒ තරම් දුරක්? ඇරත් ඔබ මෙතන අනාථ කොට දමලා මා කොහොමද මෙතැනින් යන්නේ?''

''ඒකට කමක් නැහැ, දරුවෝ'' යි සෙල්ලා තොල් මතුළේය.

''මගේ ජීවිතේ දැන් ඉතින් අවසානයි. . .''

''මට බැහැ යන්න'' යි නාලිනී කීවාය. ''මම මෙහෙම ඉඳ ගෙන ඔබ රැක බලා ගන්නවා. ඔබට ටිකක් සනීප වුණාම අපි දෙන්නටම යන්ට පුළුවනි.''

''ඒත් දරුවෝ, ඒක කවදාවත් සිදුවෙන දෙයක් නොවෙයි'' යි වැද්දා කෙඳිරි ගෑවේය. ''තව දුරටත් දරුවෝ මෙහෙම හිටියොත් දරුවෝටත් මගේ ඉරණමම අත්වෙනවා. මා කියන දේට ඇහුම්කන් දෙන්න. ඇත්තෝට මං කියන වැද්දන් හමු වුණොත් මා මෙහි ඉන්න බව කියන්න. එතකොට ඔවුන් මෙහි ඇවිත් මාව අරගෙන යාවි.''

වැද්දා කියන දෙයෙහි සත්‍යයක් තිබෙන බව නාලිනීට වැටහුණි.

''මට තනියම යන්ට බයයි'' යි ඈ කීවාය.

''එහෙම කියන්ට එපා දරුවෝ. අපේ නෑ යක්කු[1] දරුවෝ රැක බලා ගනීවි'' යි ඉතා දුබල හඬකින් තෙපලූ සෙල්ලා දෙනෙත් පියා ගත්තේය.

නාලිනී කැටය දියෙන් පුරවා වැද්දා අසලින් තැබුවාය.

''මොකක්ද ඒ?'' යි සෙල්ලා සිය දෙනෙත් අමාරුවෙන් හරිමින් ඇසීය.

''ඔබට වතුර'' යි නාලිනී පිළිතුරු දුන්නාය.

''එපා! එපා! දරුවෝ කැටය අරගෙන යන්ට'' යි හේ කෙඳිරි ගෑවේය. ''දරුවෝට එය බොහොම උවමනා කරනවා. මාව අර දිය වළ ළඟට ඇද දමන්ට. මට ඒ වළෙන් වතුර බොන්ට පුළුවනි.''

ඔහු කී පරිදි ඈ කළාය. ඉක්බිති ඔහු අසලින් ගිනි මැලයක් ගැසූ ඈ පුලුස්සන ලද අල ගෙඩි කිහිපයක් ද සෙල්ලාට සප සපා සිටීමට කැමති ඔහුගේ පොතු මඩිස්සලය ද දුන්න හා හීතල ද ඔහු ළඟින් තැබුවාය. සිය ඇඳුමින් ලොකු රෙදි ඉරුවක් ඉරා ගත් නාලිනී ඉන් වැද්දා ගේ සිරුර වැසුවාය. අනතුරුව ඈ ඔහුගේ අවුල් වී ගිය හිස කෙස් අතින් පිරිමැද සකසා ඔහුගේ ගොරහැඩි දුබල අත ගෙන කඳුලින් තෙමී ගිය සිය කම්මුලට තද කර ගත්තාය. ''ඔබ මට බොහොම අනුකම්පා කළා'' යි ඈ ඉකිබිඳිමින් කීවාය.

ඉක්බිති නැගී සිටි ඈ ''මා යන්නම්'' යි හඬමින් කීවාය.

''අපේ දෙයියෝ දරුවෝ ආරක්සා කරාවි'' යි සෙල්ලා කොඳුළේය.

දිය කැටයත් සෙල්ලා ගේ කුඩා පොරොවත් ඉතිරි අල ගෙඩි ටිකත් රැගත් නාලිනී සෙල්ලා වෙත අවසන් වරටත් සානුකම්පව

1. වැද්දෝ ස්වකීය මළවුන් අදහති. මළවුන් ගෙන් ආරක්ෂාව සැලසේ යයි අදහන ඔවුහු මළවුන් හඳුන් වන්නේ 'නෑ යක්කු' නමිනි.

බලා සිටියාය. ඉවසා ගත නොහැකි ශෝකයෙන් ද හිස් කල්පනාවෙන් ද යුතුව ඈ සෙමින් සෙමින් ගමන් ගත්තාය.

පැය කිහිපයකට පසු සෙල්ලා යළිත් අවදි විය. ඔහුගේ හිතවත් බල්ලා වලිකුකුළකු මරා ගෙනැවිත් ඔහු ළඟ ඉව කරමින් සිටින සැටි සෙල්ලා දුටුවේය. ඔහු ඌට ආදරයෙන් නළවා කළේය. නාලිනි ගේ රෙදි කැබැල්ල බල්ලාට ඉව කිරීමට දුන් සෙල්ලා, ඌ අල්ලාගෙන ආ වලිකුකුළා ද උගේ කටට දී ඇය ගිය දෙසට අත දික් කොට ''පලයන්!'' යි කියමින් ඌ ඒ දෙසට තල්ලු කළේය.

ඔත්පලව බිම ඇද වැටී සිටි සිය ආදරනීය ස්වාමියා තනිකර දමා යා නොහැකි බල්ලා කෙඳිරි ගාමින් සෙල්ලා අසලම කර-කැවෙන්නට විය. සෙල්ලා කෝටුවක් ගෙන පෙර සේම බල්ලාට අණ කොට තර්ජනය කළේය. එහෙත් බල්ලා කෙඳිරි ගාමින් හැකිළෙමින් ඔහු අසල වැතිර ගත්තේය. ඉක්බිති සෙල්ලා ඉතා අමාරුවෙන් අත දිගු කොට ගිනි මැලයෙන් ගිනි පෙනෙල්ලක් ගෙන, ඔහු සතුව තිබුණු මුළු වැර යොදා ඉන් බල්ලාට ගැසුවේය.

ගිනි පෙනෙලි පහර කෑ බල්ලා මොර දෙමින් ඉවතට දිව්වේය. යළිත් නැවති අසරණව වැතිර සිටින තම ස්වාමියා දෙස බලා සිටියේය. තම ස්වාමියා ගේ අන්තිම අණට කීකරු වූ බල්ලා නාලිනි ගිය දෙස බලා දුවන්නට විය.

වැඩි වේලාවක් යන්නට පෙර බල්ලාට නාලිනි හමු විය. ඈ බල්ලා ආපසු එළවීමට තැත් කළාය. එහෙත් ඌ ඈට මඟ හරිමින් ඈ පසු පස්සේම යන්නට විය. අසලින් නිකුත් වුණු සුළු ශබ්දයකට පවා නාලිනි තැති ගත්තාය. එහෙත් ඈ පසු පසින් එන බල්ලා ගේ සමාගමය නිසා ඈ මහත් සැනසිල්ලක් ලැබුවාය.

එදින රාත්‍රියෙහි බල්ලා ගෙන ආ වලිකුකුළා බෙදා ගෙන අනුභව කළ නාලිනීත් බල්ලාත් නිදන්නට වූහ.

අලුයම අවදි වූ ඈ බල්ලා සමඟ අල ගෙඩියක් අනුභව කොට දිය ටිකක් බී යළිත් ඒ කටුක ගමන ඇරඹුවාය. දුර්වලව, ගැහෙමින් සිටි නාලිනි නිතර නිතර නවතිමින් විඩා හරින්නට වූවාය. ඇගේ දෙපා ඇයට මහත් බරක් මෙන් දැනුණි. එදා මුළු දවසම ඈ හූ කියමින් ඉදිරියට යන්නට වූවාය. සැන්දෑවේ ඈ පණ නැතිව ඇද වැටුණාය. දිය කෑටය ද ඉහිරී ගියේය. ඈ ක්ලාන්තව වැතිර ගත්තාය.

එදින රාත්‍රියෙහි ඈ අවදි වූ හැම වාරයක දීම ඈ යටිගිරියෙන් හූ කීවාය. ඇගේ භයංකර කට හඬ පාළු මහ වනය තුළ දෝංකාර නංවමින් පැතිර ගියේය.

# 14

# උලමා හැඬීම

රාත්‍රියෙහි නිසලව තිබුණු වැදි ලෙණ අලුයම් වේලේ යළි පණ ගැන්වෙන්නට විය.

වැදි පවුලේ පියා වූ මහලු රන්දූනා අවදිවී ලෙණ ඉදිරිපිට නිවී යමින් තිබුණු ගිනි මැලය පණ ගන්වා ගිනි තපින්නට වූයේය.

''ඊයේ රෑ උලමා අඬනවා බොටත් ඇහුණාද?'' යි හැන්ස් රන්දූනා ගෙන් ඇසීය. ''පැය ගාණක්ම ඌ ඇඬුවා.''

''ඔව්, කවුරු හරි මැරෙන්ට ළං වෙලා ඇති'' යි රන්දූනා ගොරෝසු හඬින් කීවේය.

''මොකක් ද ඔහු ඉන් අදහස් කළේ'' යි එඩ්මන්ට් ඇනුම් හරිමින් ඇසුවේය.

''ඒ කුරුල්ලාට අමනුස්සයෙක් ආවේස වෙලා ඉන්නවාය කියල ඔවුන් විස්වාස කරනවා. ඉතින් ඌ ඇඬුවාම කවුරු හරි මැරෙනවාලු.''

''එවැනි අවාසනාවන්ත දෙයක් මට සිදු නොවන්නට අපි දෙවියන්ට යාච්ඤා කරමු'' යි එද රොඩි ගැහැනිය කී ශාස්ත්‍රය සිහි වූ ගැස්පා කීවේය.

''ආ, එද නිධාන් හොයන්ට ගිහින් අර ලෙණ ඇතුළට රිංගාපු වේලාවේ ඔබ ඒ මාරකෙන් බේරුණා නොවැ'' යි එඩ්මන්ට් කීවේය.

''ඔව්, නමුත් මට පින් සිද්ද වෙන්ට අපි මේ කැලෙන් පිට වෙලා අපේ ගම රටවලට ගියාම අපි ධනවතුන් වෙනවා'' යි ලෙණ තුළ විවරයක තබා තිබුණු නිධන් මල්ල පෙන් වූ ගැස්පා කීවේය.

''ඒ ඇඬීම මිනිස් කට හඬකට බොහොම සමානයි'' යි මඳ වේලාවක් කල්පනාවේ යෙදී සිටි හැන්ස් කීවේය.

''උලමා අඬන්නේ එහෙම තමා'' යි රන්දූනා කීය.

''මට හිතෙන්නේ බල්ලෙකුත් උඩු බුරලනවා වගේත් ඇහුණා'' යි හැන්ස් යළිත් කීවේය.

''නරියෙක් වෙන්ට ඇති'' යි රන්දූනා කීවේය.

එහෙත් හැන්ස් ඉන් සෑහීමකට පත් නොවූයේය.

''මෙතැන ඉඳන් ඒ තරම් ඈතින් නොවෙයි ඒ හඬ ඇහුණේ. මොකක් වුණත් මා ගිහින් බලන්නම්!!'' යි හැන්ස් කීවේය.

''ඉන් ඇති පලේ මොකක් ද?'' යි රන්දූනා ඊට හරස් වූයේය. ''මොනවද, හූරට දකින්ට ලැබෙයි ඒ උලමා ඇව්වොට ඔරවා ගෙන ඉන්න හැටි.''

''සුදු හූරා ඌව විදගෙන ආවොත් මං නම් උගේ මස් කන්නේ නැහැ'' යි පෙමා දත් විලිස්සමින් කීවේය.

හැන්ස් තනිවම පිටත්විය.

නොබෝ දුරක් ගමන් කළ ඔහුට වැරහැලි ඇඳගත් කෙට්ටු දුර්වල තරුණියක් මළාක් මෙන් වැතිරී සිටිනු දක්නට ලැබුණි. බල්ලෙක් ඇය මුර කරමින් සිටියේය. හැන්ස් ගේ පැමිණීමෙන් ප්‍රීතියට පත් බල්ලා මහත් බැගෑ ගතියකින් වලිගය වනන්නට විය.

හැන්ස් දණ ගසා තරුණිය වෙත නැඹුරු වූවාය. ඇගේ දුබල පෙනුම නිසා ඈ ඔහුට හඳුනා ගත නොහැකි විය. ඈ ඉතා සෙමින් හුස්ම ඉහළ පහළ හෙළුවාය. රාත්‍රියෙහි පැවති අධික ශීතයත් පින්නත් නිසා ඇගේ ගත ශීතලයෙන් ගැහෙමින් තිබුණි.

හැන්ස් ඇය ඔසවා ගත්තේය. ඇගේ සැහැල්ලු බව ගැන ඔහු පුදුම විය. ඇගේ නින්දට බාධා නොවන සේ හැන්ස් ඇය ඉතා ප්‍රවේසමින් ඔසවා ගෙන යද්දී ඈ දෙනෙත් හැර ඔහු දෙස මිනිත්තුවක් පමණ බලා සිටියාය. ඉක්බිති ඈ දුර්වල හඬකින් කෑ ගසා හැන්ස් ගේ ගෙල බදගෙන ඉකිබිඳින්නට වූවාය. ඉකිබිඳීමෙන් තවත් දුර්වල වූ ඈ යළිත් ක්ලාන්ත වූවාය.

හැන්ස් මඳක් නැවතී ඇය දෙස බලා සිටියේය. ඇය මිය ගොස් ඇතැයි ඔහු කල්පනා කළේය. ඇය මිය ගොස් නැත. ඇය තවත් ජීවතුන් අතර සිටින බව හේ දැන ගත්තේය. ඔහු ඇය ඔසවා ගෙන යන්නට විය. බල්ලා ඔහු අනුගමනය කළේය. හැන්ස් ඇය ඔසවා ගෙන වැදි ලෙණ කරා තිබුණු කඳු බෑවුම නගින්නට විය. වැද්දන් ගේ බල්ලෝ පුදුම සතකු දුටුවන් මෙන් බුරන්නට වූහ. රන්දූනා ගේ තර්ජනයෙන් උහු නිහඬ වූහ.

''මොකද මං කිව්වේ. මං හිතුවා හරියටම හරි'' යි සියල්ලන්ම හැන්ස් වටා විස්මයෙන් යුතුව රොක්වන විට ඔහු කීවේය. ඔහු මළ සිරුරක් බඳු ඒ දුබල තරුණිය ගිනි මැලය අසල එළා තිබුණු

මුව සම මත ඉතා සිරුවෙන් තැබුවේය. ඒ අතර සෙස්සෝ ගිනි මැලය පණ ගැන්වූහ.

පිරිමින් කිහිප දෙනා මීළඟට කුමක් කරමුදෝයි ළතවෙද්දී රනි ඇට සාත්තු කරන්නට වූවාය. වියලි, පුපුරා ගොස් තිබුණු තරුණිය ගේ තොල් අතරට දිය බින්දු කිපයක් දමූ රනි මී පැණි ස්වල්පයක් ද තොල්වල තැවරුවාය. තරුණිය එය වහා ලෙව කෑවාය.

ඔවුහු පැයක් පමණ ඇය දෙස බලා සිටියෝය. මේ අතර ගිනි මැලයේ උණුසුමින් ටිකින් ටික සිහිය ලැබූ ඇ අධික පිපාසයකින් පෙළෙන්නට වූවාය. ඇ දෙනෙත් හැර ඇය වටා රොක් වී සිටියවුන් දෙස විස්මයෙන් බලන්නට වූවාය. තමා වෙත නැඹුරු වී සිටින තඹවන් හිස කෙසින් යුත් මිනිසුන් තිදෙනා දෙස ඇ ඉතා ඕනෑකමින් බලන්නට වූවාය. සිය දෙනෙත් අදහාගත නොහැකි එකියක මෙන් ඇ හැන්ස් දෙස මහත් ඕනෑකමින් බලා සිටියාය. ඉක්බිති ඉතා අමාරුවෙන් සිනාසී දිග සුසුමක් හෙළූ ඇ යළිත් නිදන්නට වූවාය.

''මාව නිකම් ගල් ගැහිලා වගේ'' යි ගැස්පා විස්මයෙන් කීය. එඩ්මන්ට් සහ හැන්ස් ඔහු කී දේ තේරුම් ගත නොහැකිව ඔහු දෙස බලා සිටියෝය.

''එඩ්මන්ට් ඔබට බැරිද ඇ හඳුනන්ට?''

''කවුද?''

''හැන්ස් ඔබට වත් ඇය මතකද?''

හැන්ස් හිස වැනුවේය. ''මං කොහොමද හඳුනන්නේ?''

''ඇය නාලිනි, රජතුමා ගේ ලේලි.''

මහත් කැළඹීමකට පත්වූවකු මෙන් හැන්ස් නින්දේ පසු වන තරුණිය දෙස නැඹුරුවී බලා සිටියේය.

ඇගේ ලොකු අඳුරු දෙනෙත්වලත් කෙට්ටු මුහුණෙහිත් තමාට හුරු පුරුදු පෙනුමක් ඇති බව ඔහුට හැඟී ගියේය.

''ඇට ටිකක් සමාන බව මාත් පිළිගන්නවා'' යි හැන්ස් පිටුපසින් සිටි එඩ්මන්ට් කීවේය.

''අප අතරින් ඇට හඳුනා ගන්ට හැකිවී තිබෙන්නේ හැන්ස් පමණයි වගේ පෙනෙන්නේ. කොහොමද ඒ?'' යි ගැස්පා කීය.

''කන්දේ නුවර දුනු සිප් තරඟයේ දී ඇ හැන්ස්ට දක් වූ සැලකිල්ල ඔබට මතක නැද්ද?'' යි එඩ්මන්ට ගැස්පාට මතක් කළේය.

හැන්ස් නිශ්ශබ්දව කල්පනා කරන්නට විය. කපිතාන්වරුන් ගේ වාස භවනය අසල පිහිටි නුග ගස වෙතට ඇ තමා හමුවීමට

එදා රාත්‍රියෙහි පැමිණි සැටි ඔහු කල්පනා කළේය. අදට, ඒ දවස ගෙවී ගොස් එතරම් කලක් නැහැ. එදා රාත්‍රිය—හැන්ස් ගේ මනසෙහි මැවී පෙනෙන්නට විය.

''කොහොමද මගෙ අම්මේ, ඇ මෙතැනට ආවේ?'' යි එඩ්මන්ට් විස්මයෙන් තෙපලේය.

''ඇය සනීප වුණාම අපට ඒ ගැන දැනගන්නට ලැබේවි'' යි ගැස්පා කීවේය. ''අනේ අසරණ කෙල්ල! මේ දුරුකතරක කටුක ගමනින් ඇ බොහොම දුර්වල වෙලා තියෙනවා.''

හැන්ස් රනී වෙත හැරුණේය. ''ඇය හොඳට බලා ගන්ට ඕනැ. ඇ අසාද්දිය අමාරු තත්ත්වයකයි ඉන්නෙ'' යි ඔහු ඇට කීවේය. ''යමු අපි ගිහින් ඇට කෑම ටිකක් හොයාගෙන එමු. ගැස්පා! එඩ්මන්ට්! යමු! යමු!''

වැද්දන් ගේ බල්ලන් දෙදෙනා ඔවුන් අනුගමනය කළහ. එහෙත් සෙල්ලා ගේ බල්ලා නාලිනී වෙතම රැඳී සිටියේය.

එදින උදැසන ඔවුහු වනයේ තිබෙන ඉතාමත් පහසුවෙන් දිරවනසුලු අහර සොයා ගත්හ. තලගොයි පැටියකු ද තලගොයි බිත්තර කිහිපයක් ද ගොන්නල ටිකක් ද ඔවුහු නාලිනී සඳහා සොයා ගෙන ආවෝය. මේවා පුලුස්සා කුඩා කැබලි කොට ආහාරය සකසා ඉන් ටික ටික නාලිනීට කැව්වෝය.

එදින සවස් වන තෙක් නාලිනීට පැහැදිලි ලෙස කල්පනා කිරීමට ශක්තියක් නොතිබුණි. ඇට පළමුවෙන් සිහිවූයේ සෙල්ලාය. ඇ නැති ගත්තියක මෙන් මඳ වේලාවක් බලා සිටියාය. ඇ ඉතා සෙමින් කතා කළාය. සෙල්ලා ගේ තත්ත්වය ගැනත් ඔහු වැද හෙව සිටින ස්ථානය ගැනත් ඇ ඔවුනට කීවාය.

වැද්දන් සමග හැන්ස්, ගැස්පා සහ එඩ්මන්ට් ද සෙල්ලා සොයා යන්නට වූහ. සෙල්ලා ගේ බල්ලා ඔවුන් පෙරටුවෙන් දුවන්නට විය. තමා කළ යුත්තේ කුමක්දැයි ඉවෙන් මෙන් දැනගත් බල්ලා ඔවුනට මඟ පෙන්වමින් ඉදිරියෙන් යන්නට විය.

පැ තුනකට පමණ පසු ඔවුහු එහි ළඟා වූහ. සෙල්ලා මැරී සිටියේය. ඔහු ගේ මළ සිරුර මැස්සන් ගෙන් සහ කුහුඹුවන් ගෙන් වැසී තිබුණි. මිනිසුන් එනු දුටු, මළ සිරුර අසල සිටි මුගටියෙක් නුදුරින් වූ අකුලකට රිංගා ගත්තේය. සෙල්ලා ගේ බල්ලා මළ සිරුර ඉව කොට විලාප කියන්නා සේ ශෝකාකුල හඬකින් උඩු බුරලන්නට විය. ඉක්බිති ඌ ඒ අසල වැතිරගෙන මහත් දුක්බර ගතියකින් බලා සිටියේය.

ඇට සැකිල්ලක් බඳු වූ වැද්දා ගේ සිරුරෙහි තිබුණු දරුණු තුවාල දුටු ඔවුහු බියෙන් තැතිගත්හ. මෙවැනි දරුණු තුවාල

තිබිය දී මොහු මෙ සා දුරක් කෙසේ පැමිණියේ දැයි ඔවුහු මවිත වූහ. දිග වළක් සැරූ ඔවුහු චාරිත්‍ර අනුව සෙල්ලා ගේ මළ සිරුර එහි තැන්පත් කොට එහි පසෙක ඔහුගේ දුනු හී ද තබා පස් දැමූහ. මිනීවළ වල් ඌරන්ගෙන් ආරක්ෂාවීම සඳහා කටු අකුල් ඒ වෙත ඇද දැමූහ.

භක්තිමත් කතෝලිකයෙක් වූ ගැස්පා කෝටු කැබැලි දෙකක් කුරුසාකාරයට ගැට ගසා සෙල්ලා ගේ හිස පිහිටි පැත්තෙන් වළ මත සිටවූයේය. ඉක්බිති ඔහු කෙටි යාච්ඤාවක් ද පවත්වා අතින් උර හරහා කුරුසිය ඇන්දේය. මේ අතර හැන්ස් සහ එඩ්මන්ට් පහත් කරගත් හිසින් යුතුව නොසැලී වළ අසල සිට ගෙන සිටියෝය. වැද්දෝ මේ සුදු මිනිසුන් තිදෙනා දෙස පුදුමයෙන් බලා හුන්හ.

මේ සුළු ආගමික වතාවත්වලින් පසු පෙමා හැන්ස් ඇමතුවේය.

''සුදු හුරා, මොකක්ද ඒ අනික් සුදු හුරා කළේ'' යි පෙමා ඇසීය.

''එහෙම තමා අපි මළවුන් වළලන්නේ. දෙවියන් වහන්සේට සෙල්ලා ගේ ආත්මය ගැන යාච්ඤා කිරීමක් තමා ඒ කළේ'' යි හැන්ස් කීවේය.

''මොකක්ද අර වළ උඩ හිටවාපු එක?'' යි පෙමා ඇසීය.

''ඒ, හූනියමක්'' යි රන්දුනා මහදැනමුත්තකු මෙන් කීවේය.

එදා රාත්‍රියෙහි වැදි ලෙණ පහළින් පිහිටි වැද්දන් ගේ යාග බිමෙහි වූ ගසක අත්තක කොළ මිටියක් එල්ලූ රන්දුනා, සෙල්ලා ගේ ආත්මය නෑ යකුන් භාරයට ගන්නා ලෙස අයැදිමින් මහා යාදින්නක් කරන්නට විය.

පසු දින කෙළින් හිඳ ගැනීමට තරම් ප්‍රාණවත් ගතියක් නාලිනීට ලැබුණි. ඊට දින කිහිපයකට පසු ඇට නැගිට මඳ දුරක් ඇවිදීමට තරම් ශක්තියක් ලැබුණි. රනීත් සමග ලෙණ අසල පිහිටි දෙළ වෙත යන්නට සිතූ නාලිනී පිරිමින් දඩයම් කිරීම සඳහා වනයට යන තෙක් බලා සිටියාය. තමාගේ අදහස් රනීට වටහා දීමට නාලිනීට මඳක් අපහසු විය. වැදි බසත් නාලිනී ගේ බසත් දෙකෙහිම බොහෝ වචනවල සමාන මූල වුව ද වැද්දන් කතා කළේ වඩා පුරාතන බසකි. එම නිසා වැදි යුවතියත් නාලිනීත් අතර සිදු වූ කතාබහ වචනවලට වඩා සංඥාවලට සීමා විය.

දෙළ වෙත ගිය නාලිනී ඇඳුම් උනා ස්නානය කළාය. අනතුරුව ඇ සිය හැට්ටයත් සෙල්ලා ගේ තුවාල වෙළා ඉතිරිව වැරැහැල්ලක් බවට පත්ව තිබුණු කිලිටි රෙද්දත් සෝදන්නට වූවාය. මෙය දුටු රනී කැලය තුළට වැදී ලොකු ලියන් වැලක්

කඩා ගෙනැවිත් ගලක් මත තබා තැළුවා ය. ඉක්බිති ඈ තැළූ ලියන් වැල කුඩා දිය වළකට දමා එහි දිය කැලතුවාය. දියෙන් පෙණ නගින්නට විය. රනී ගේ උපදෙස් අනුව නාලිනී සිය රෙදි ඉන් සෝදා ගත්තාය. ඒ වළෙහි සබන් පෙණ බඳු දියෙන් රෙදිවල තිබුණු කුණු පහව් යන සැටි ඈ දුටුවාය.

සෝදා අවසන් වූ රෙදි මිරිකා නිම කළ නාලිනී, වැලක් ඇද ගෙන අවුත් අව්ව ඇති තැනක ගස් දෙකක් අතර බඳින්නට රනීට කීවාය. නාලිනී සිය කෙස් කලඹ උනා කෝටු කූරුවලින් එහි අවුල් හැර පිරිසිදු කොට වියලෙන්නට හැරියාය. වියලුණු කෙස් වැටිය ඈ එක්කොට බැඳ ගත්තාය. කොණ්ඩා ගැටය තදවීම සඳහා ගැසීමට රන්කූරු දූන් ඈට නැත. ඒ වෙනුවට ඈ ලී පතුරක් ගසා ගත්තාය.

ඇගේ ඇඳුම් වියලී තිබුණි. ඈ සැට්ටය උරලා ගත්තාය. ඇගේ රූප ශෝභාව පෙනෙන අයුරු, පටි ඉරා ඉතිරිව තිබුණු සිහින් වස්ත්‍රය පුළුවන් තරම් හොඳින් සකස් කොට හැන්දය.

දඩයමේ ගොස් ආපසු පැමිණ ස්වකීය සැහැල්ලු පසෙකින් නැවූ දඩයක්කාරයන්ට දක්නට ලැබුණේ එදින උදෑසන ඔවුන් දුටු සුදුමැලි නාලිනී නොවේ. කෙට්ටු දුබල සිරුරකින් යුක්ත වුවත් ඇගේ පිරිසිදු සමෙහි වර්ණය, අව්වට දැවී මැසි මදුරුවන්ට ගොදුරුවී දුර්වර්ණවී තිබුණු රනී ගේ ගතට වඩා ප්‍රසන්න විය. තරුණියන් දෙදෙනාම ඔවුනොවුනටම සීමා වූ පියකරු ගතියකින් යුක්ත වූහ. එකියක් මේ බිහිසුණු වනකරයට නුහුරු වූවාය. අනෙකී එහිම හැදී වැඩී ජීවත් වන්නියකි.

නාලිනී යළිත් කුලීන උඩරට කතක් මෙන් දිස්වූවාය. මේ වනචාරී පිරිස අතරින් ඈ හොඳින් කැපී පෙනුණාය. ඈ හොඳින් හඳුනන, තඹවන් හිස කෙස් ඇති උඩු කය නොවැසූ යුරෝ-පියයන් දෙදෙනා ද වැදි ජීවිතයක්ම ගත කරමින් සිටි හෙයින්, ඔවුන් ගෙන් ද ඇය කැපී පෙනුණාය.

සෙල්ලා ගේ දුඃඛිත මරණය ගැන ඇසූ නාලිනී ඔහුගේ මිනීවළ වෙත යාමට නොඉවසිලිමත් වූවාය. සෙල්ලා ගේ මිනීවළ පිහිටියේ වැදි ගුහාවෙන් සැතපුම් පසළොසක් පමණ ඔබ්බෙනි. දුබල තත්ත්වයක සිටින නාලිනීට එතරම් දුරක් පයින් ගමන් කළ නොහැක. ඔවුහු විශාල ගෝන සමක් ගෙන එය ශක්තිමත් පොලු දෙකක් උඩ මඩියක් කොට එල්ලා එහි නාලිනී තබාගෙන ගමන් කළෝය. හැන්ස්, ගැස්පා සහ එඩ්මන්ට් මාරුවෙන් මාරුවට ඇය ඔසවා ගෙන ගියහ. මේ ශක්තිමත් මිනිසුන් තිදෙනාට ඇය බරක් නොවීය. සවස් වන විට ඔවුහු එහි ළඟා වූහ.

Scanned with CamScanner

නාලිනී බිම තැබූ ඔවුහු පසෙකට වූහ. ඇ නැගිට තනිවම සෙල්ලා ගේ මිනීවළ වෙත ළං වූවාය. මග දී සිය උදව්කාරයන් ලවා කඩවාගත් ඉද්ද මල් කිනිති කිපයක් ඇ සෙල්ලා ගේ මිනීවළ මත තැබුවාය. තමා වෙනුවෙන් සෙල්ලා කරන ලද මහා පරිත්‍යාගය ගැන මෙනෙහි කළ නාලිනී බොහෝ වේලාවක් ඒ අසල ගත කළාය. ඉන්පසු ඇ සිය සගයන්ට එකතු වූවාය.

එදා නාලිනී විසින් සාරන ලද දිය වළ පිහිටි දෙළෙහි වියලි බිම සෙවණකට වී වාඩි ගත් ඔවුහු මහට ගෙනා පුලුස්සන ලද මුවමස් හා අල අනුභව කළහ.

මේ වන තෙක් තමාට මෙවැනි කටුක ගමනක් එන්නට වූයේ ඇයිද යන්න ගැන වචනයකුදු ඇය ඔවුනට කියා නැත. ඇය විසින් මුහුණපාන ලද බිහිසුණු අත්දැකීම් නිසා ඇය තුළ හටගෙන ඇති තැති ගැනීම හා දුබල බව මහ හැරී ගොස් ඇගේම ඕනෑකමින් ඒ ගැන ඔවුනට විස්තර කරන තෙක් ඔවුහු බලා සිටියහ.

මේ අවස්ථාවේ දී ඇ ඒ බිහිසුණු කතාව සවිස්තරව කියන්නට පටන් ගත්තාය. කපිතාන්වරුන් ගේ අතුරුදහන් වීමෙන් මාලිගයෙහි උද්ගත වූ තත්ත්වය ගැනත් වැද්දා ඊට සම්බන්ධ වූ සැටිත් විස්තර කළ ඇ, දැන් ඇය සිටින තැනට එන තෙක් වූ ඇගේ කටුක පීඩනයෙන් පිරි ගමන ගැනත් සියලු තොරතුරු ඇ ඔවුනට කීවාය. සෙල්ලා තමා කෙරෙහි දක්වන ලද අනුකම්පාවත් ඔහු තමා වෙනුවෙන් කළ ආත්ම පරිත්‍යාගයත් ගැන නාලිනී සඳහන් කළේ කඳුළුබර දෙනෙතිනි. දරුණු ලෙස තුවාල වීමෙන් අඩ පණ වූ වන සතකු සිය තිප්පොළ බලා ඇදෙන්නාක් මෙන් මහත් අමාරුවෙන් තමා කැටුව, විටින් විට ඇද වැටෙමින් සෙල්ලා වැදි ලෙණ බලා ඉදිරියටම ගමන් කළ සැටිත් අවසානයේ දී ඔහුගේ දෙපා පණ නැතිව යළි නොනැගිටින්නට ඔහු බිම ඇද වැටුණු සැටිත් නාලිනී ඉකිබිඳිමින් විස්තර කළාය.

ශිෂ්ට යයි සම්මත ලෝකය හා ගැටීමක් නැතිව වනචාරී ජීවිතයක් ගතකළ වැද්දකු හද තුළ එවැනි කරුණා මහිමයක් හා අනුකම්පාවක් හා වීරත්වයක් පහළවීම ගැන ඔවුහු පුදුම වූහ.

''ඔහු හරියට මා මෙහි ඉන්න බව දැන ගෙනම වගේ ඇවිත් තියෙන්නේ'' යි නාලිනී සිය ශෝකාත්මක කතාව අවසන් කළ පසු කල්පනාවෙන් බරවී සිටි හැන්ස් කීවේය.

''එහෙනම් ඔහු ඒ බව මට නොකීවේ ඇයි?'' යි නාලිනී ඇසුවාය. ''මා එන කල්ම ඔහුගෙන් ඇසුවා මාව කොහේද අරගෙන යන්නේ කියල. නමුත් ඔහු කිසිවක් ඒ ගැන කීවේ නැහැ.''

''සමහර විට කඩ විය හැකි බලාපොරොත්තුවක් ගැන ඔබ තුළ විශ්වාසයක් ඇති කිරීමට ඔහු අකමැති වෙන්ට ඇති'' යි එඩ්මන්ට් කීවේය.

''නමුත් ඔහු කොහොමද දන්නේ මා කොහේ ඉන්නවද කියල?'' යි හැන්ස් ඇසිය. ''ඔබ දෙන්නා වාසලින් පිට වෙලා මෙහි එන අතර තුරේ සෙල්ලා කවුරුත් එක්ක කතා කළාද?''

''සෙල්ලා අතර මග තැනක වැටුණාම හැරමිටිය දුන් හිඟන්-නයි, අපට වතුර බොන්නට නොදී එළවා ගත්ත කින්නරයොයි, අපි ක්ලාන්ත වෙලා ඉන්න කොට අපට කුරුම්බයි කෙසෙල් ගෙඩියි ගෙනැවිත් දුන්න ඒ කරුණාවන්ත සුදු මනුස්සයයි ඇරෙන්ට වෙන කවුරුවත්ම අප එක්ක කතා කළේ නැහැ. අපි කැලේට ඇතුල් වුණාම අපට කිසිම කෙනෙක් හමුවුණේ නැහැ. සෙල්ලා හැම විටම ගමන් කළේ ගම්මානයන් මඟ හරිමිනුයි'' යි නාලිනී කීවාය.

''ඇත්තෙන්ම මට නම් ඔහු ගැන හරිම පුදුමයි'' යි ගැස්පා කීය.

''කොහොම වුණත් හැන්ස් සොයාගෙන තමයි ඔහු ඇවිත් තියෙන්නේ. නාලිනී ඔබට විශ්වාසද සෙල්ලාට මග දී කිසිම කෙනෙක් හමු නොවූ එක ගැන? අතර මග දී ඔහු ටික වේලාවකට වත් ඔබට ඉන්නයි කියලා කොහාටවත් ගියේ නැද්ද? සමහර විට එවැනි අවස්ථාවක දී ඔහුට හමුවුණා ද දන්නවයැ හැන්ස් දුටු කෙනෙක්; නැත්නම් ඔහු අඟපු කෙනෙක්'' යි ගැස්පා මඳ වේලාවක් කල්පනා කරමින් සිට කීවේය.

නාලිනී කල්පනා කරන්නට වූවාය. ''ඔව් ඔව්, සමහරවිට මා නුදුටු කෙනෙක් ඔහුට හමුවෙන්ට ඇති. මං එහෙම කිව්වෙ මොකද දන්නවද? අපි කන්ද උඩරට ඉඳන් පහළට ඇවිත් දින දෙකකට විතර පස්සෙ අපට ඇහුණා බොහෝම ඈතින් බල්ලෙක් බුරන හඬක්. මට වැල් ගොමුවක හැංගිලා ඉන්නය කියල සෙල්ලා තනිවම ගියා ඒ පැත්තට. පැයකට විතර පස්සේ ඔහු තම්බාපු ඉරිඟු කරල් කීපයකුත් අරගෙන ආපසු ආවා. මට දැන් හිතෙනවා ඔහු කොහේ හරි හේනක පැලකට යන්න ඇති කියල.''

''අන්න හරි. ඒක තමා මේකේ රහස'' යි කී හැන්ස් ගේ දෙනෙත් දීප්තියෙන් බබළන්නට විය. ''සෙල්ලාට හමු වුණු අය ඔහුට කියන්න ඇති මා කොහේ දී හරි ඇතකු පිට යනවා ඔහුට දකින්නට ලැබුණු බව. මා වැද්දන් එක්ක ජීවත් වන බවත් ඔවුන් දැනගෙන තියෙන්න ඇති. වනකරයේ වුණත් ආරංචි පැතිරෙනවා.''

''ආ, මට දැන් මතක් වුණා සෙල්ලා ඒ ගමන ගිහින් එනකොට ඔහුගේ මුහුණේ තිබුණු ප්‍රීතිමත් ගතිය. ඊට පස්සෙ ඔහු මොනවා දෝ ලකුණු වගයක් බල බලා ගමන් කරන්න වුණා. මට මහ පුදුමයක් වුණේ ඔහු ඒ ලකුණු බල බලා ආවේ බිම නොවෙයි. අතු පතරයේ තිබුණු ගස් උඩයි. ඔහොම යනකොට වරක් ඔහු මා දිහා බලා මොකක්ද සලකුණක් මට පෙන්නුවා. නමුත් මට කිසිම අමුතු දෙයක් පෙනුණේ නැහැ. මං ඇසුවා මොකක්ද ඔහු පෙන්නුවේ කියලා. නමුත් ඔහු කිසිත් නොකියාම ගමන් කළා.''

''ගහක කොච්චර ඉහළින්ද ඔහු ඒ ලකුණ ඔබට පෙන්නුවේ?'' යි හැන්ස් ඇසීය.

''ඔබේ උසට වඩා ටිකක් ඉහළින් වගේ'' යි ඈ කීවාය.

''සමහර විට ඒ ලකුණ ඇතකු ගේ දළ පහරකින් වෙච්ච එකක් වෙන්ට පුළුවනි.''

''අපට දකින්ට ලැබුණා වගේම කැලේ ඕනෑ තරම් ඒ වගේ ලකුණු තියෙනව නොවැ'' යි එඩ්මන්ට් කීය. ''ඇත් දළ පහරකින් ඔහු කොහොමද සොයා ගත්තේ ඒක අසවල් ඇතා ගේ දළ පහර කියලා?''

හැන්ස් කල්පනා කරන්නට විය. ''ආ මට දැන් තේරෙනවා'' යි හැන්ස් හඬ නගා කීවේය.

''මගේ දිකුද් ගේ දළ අග කපල නොවැ තියෙන්නේ. රජ්-ජුරුවන් ගේ හැම ඇතකු ගේම දළ කපනව නොවැ. දිකුද් ගේ කපාපු දළවලට දමා තිබුණු යකඩ කොපු මං ගළවා දැම්මා. ඉතින් දිකුද් ගේ දළ වලින් තුවාල වුණු ගස් වල තියෙන ලකුණු අනෙක් දළකාරයින් ගේ දළ පහරවල්වලින් හඳුනා ගන්ට පුළුවනි. ඔබ දැක්ක ලකුණු පරණ එකක් ද නාලිනී? මීට අවුරුදු එකහමාරකට පමණ ඉහත දී දිකුද් මාව ඒ භයානක මරණයෙන් බේරා ගෙන කන්ද උඩරට ඉඳලා එන කොට ගස්වල වැදුණු උගේ දළ පහරවල් වෙන්ට ඕනෑ සෙල්ලා බල බලා එන්ට ඇත්තේ.''

''මොන තරම් පුදුමද?'' යි නාලිනී කීවාය.

''සෙල්ලා මහ පුදුම මනුෂ්‍යයෙක්'' යි හැන්ස් කීවේය.

''ඒ තරම් ගොරහැඩි, දැකීමට පවා බිය උපදවන මිනිහෙක් මට ඔය තරම් අනුකම්පාවක් දක්වයි කියල කාටද හිතන්ට පුළුවන්'' යි නාලිනී කීවාය.

''ඇත්ත වශයෙන්ම කිසි කෙනකුට එහෙම හිතන්ටවත් බැහැ'' යි කී හැන්ස් ඇය සමග එකඟ විය. ''මාව එද කැලේ දී කොටු කරලා අල්ලා රජවාසල සිරකරුවකු බවට පත්කළේ

ඔහුගේ ආධාරයෙන් වුවත් මා ඔහුට මහත් කැමැත්තකින් හිටියා. මා හිතන්නේ ඔහුත් මට ඇලුම් කරන්න ඇති කියල. ඔහු මට කළ දේ ගැන ඔහු පසුව කනගාටු වෙන්ට ඇති. අපේ පලා යාම ගැන ඔය ආරංචිය ඔහුගෙන් දැන ගත්තේ වදදීලා වුවත් ඔහු හිතන්න ඇති ඔහු එළි කළ දේවල් නිසා තමයි නාලිනිට මේ ඉරණම අත් වුණේ කියලා. ඒ නිසාම තමයි ඔහු ඔය තරම් ඔබ වෙනුවෙන් පරිත්‍යාගයක් කළේ.''

''සෙල්ලා වගේ වනචාරී මිනිහකුට හැඟීම් ඇති වෙන්ට පුළුවන්ද?'' යි එඩ්මන්ට සැකයෙන් ඇසීය.

''එඩ්මන්ට්, ඔබට ඒ බව දැන් හොඳටම තේරිලා තියෙන්ට ඕනැ''යි හැන්ස් එඩ්මන්ට් කී කතාවට විරුද්ධව කියා සිටියේය. ''ඔබ දැන් වැද්දන් එක්ක එකට ජීවත් වෙලා ඔවුන්ගේ ජීවිතය ගැන හොඳට දැනගෙන තියෙන්ට ඕනැ. ඔවුන්ගේ පෙනුම අවලක්ෂණ වෙන්ට පුළුවනි. ඔවුන්ගේ සිරිත් විරිත් ශීලාචාරයයි කියාගන්නා ලෝකය සමග නොගැළපෙන්නට පුළුවනි. එහෙත් එඩ්මන්ට්, ඔවුන්ට තිබෙන්නේත් අපට වගේම මිනිස් සිතක්'' යි හැන්ස් වේගවත්ව කීවේය.

''මා ඒ ගැන කනගාටු වෙනවා. මා එහෙම කතා කළ එක බොහොම වැරදියි. මා ඒ ගැන බොහොම තැවෙනවා'' යි එඩ්මන්ට් හැන්ස් ගේ උරහිසට තට්ටු කරමින් කීවේය.

හොඳටම සවස් විය. ඔවුහු ඉක්මනින් ලෙණ වෙත ගමන් ගත්හ. රාත්‍රිය එළඹෙත්ම ඔවුහු එහි පැමිණියහ.

දැන් වැදි ලෙණෙහි භාවිත වන ප්‍රධාන භාෂාව සිංහලයි. වැද්දන්ට එය තේරුම් ගැනීමට අපහසු විය. එඩ්මන්ට් සහ හැන්ස් පමණක් තනිව සිටින විට ඔවුහු සිය මවු බසින්ම, එනම් ලන්දේසි බසින් කතා කළහ. එඩ්මන්ට් සහ ගැස්පා තනිව සිටින විට ඔවුහු පෘතුගීසි බසින් කතා කළහ. හැන්ස් වැද්දකු මෙන් වැදි බසින්ම වැද්දන් ඇමතුවේය.

මෙම වනගත වැදි පවුලට යෝග්‍ය අන්දමින් ජීවත්වීමට නාලිනී සෑම උත්සාහයක්ම දැරුවාය. එහෙත් වැද්දන් ගේ සමහර සිරිත් විරිත්වලට ඇගේ තිබුණු අකමැත්ත හා පිළිකුල ඇට සඟවා ගත නොහැකි වූ වාර බොහෝයි. කිසිදු පිරිසිදු කමක් නැති බව හා විශේෂයෙන් ඔවුන් සතුන් පුලුස්සා උන්ගේ ඕනෑම පිළිකුල් සහගත කොටසක් කිසිදු බැලීමක් තැකීමක් නැතිව අනුභව කළ අන්දම ඇ පිළිකුල් කළාය. මේ බැව් වටහා ගත් හැන්ස් හොඳ හොඳ මස් කැබැලි වෙන් කොට වෙනම පුලුස්සා පිළියෙල කොට කැන්ද කොළයක තබා නාලිනීට පිළිගැන්නුවේය. ගැස්පා සහ එඩ්මන්ට් ද කෑම වේල එසේම ඔවුන් විසින්ම පිළියෙල කරගනු ලැබීය.

Scanned with CamScanner

රනි ඇගේ දිනපතා කටයුතුවල වෙනද මෙන් නිරත වූවාය. පෙමා ගේ බිරිය ද දහහතර හැවිරිදි කෙල්ලකි. රනී ඈත් සමග වනයට ගොස් අල සෑරීම, බෙහෙත් පැළෑටි එකතු කිරීම, විෂ දමා වළවල මාළු ඇල්ලීම, දර සෙවීම ආදී කුඩු මහත් කටයුතුවල යෙදුණාය. ඈ සමග එක්ව ආහාර පිළියෙල කිරීමෙහි ද රනී පුළුවන් තරම් වෙහෙස වූවාය.

කල් යාමේ දී නාලිනි වැදි ජීවිතයට හුරුපුරුදු වූවාය. නාලිනීට රනී ගෙන් ලැබුණු මෙහෙවර ස්වාමි දුවකට සිය හිතවත් මෙහෙකාරියක ගෙන් ලැබෙන මෙහෙවර බඳු විය. එහෙත් රනී එවැනි හැඟීමක් ඇතිකර නොගත්තාය. මේ මහා වනකරයේ මිනිස් ජීවිතය සාර්ථකව පවත්වා ගෙන යන ව්‍යායාමයේ දී නම් රනී නාලිනිය ගේ ස්වාමිදුවක මෙන් වූවාය. ලෙණෙහි දිනපතා වැඩ කටයුතුවලට සහභාගි වීමට නාලිනී වෙහෙස ගත්තාය. සාවකු හෝ මීමින්නකු වැනි කුඩා සතකු හම ගැසීම, කෝටු දෙකක් එකට අතුල්ලා ගිනි මෙළවීම වැනි දේ කරන්නට ඈ හුරු පුරුදු වූවාය. එහෙත් මෙවැනි දේ සඳහා ඇයට තිබුණු නුපුරුදු ගතිය රනී නිසා වඩාත් කැපී පෙනුණි.

දිනක් සවස නාලිනී සහ හැන්ස් වනයේ ඇවිදිමින් සිටිය දී ඔවුහු මුල් උඩට නෙරා ගිය ගසක් අසලට පැමිණියහ.

"මෙන්න අපට විඩා හරින්නට හොඳ තැනක්" යි හොඳට හැඩ ඇති මුලක් මත වාඩි ගත් නාලිනී කීවාය. හැන්ස් ස්වකීය වැලමිටට බර දී ඇය අසලින් ඇළවූවාය. අඩි පනහක් පමණ ඉහළට යන තෙක් අතුවලින් තොර වූ කෙළින් වැඩුණු විශාල රිටි ගසක් ඔවුන් ඉදිරියේ තිබුණි. ගස මුදුනින් පැත්තකට විහිදී ගිය අත්තක විශාල බඹර පැණි වදයක් එල්ලෙමින් තිබුණි. බඹරා මී මැස්සාට වඩා නපුරු එකෙකි.

"අන්න තියෙනවා ඔබටවත් කඩන්න බැරි වදයක්" යි නාලිනී නිකමට මෙන් කීවාය. හැන්ස් ඒ දෙස බැලුවේය.

"මොනවා ඒක කඩන්ට මට බැහැ"? යි ඔහු නැගිටිමින් කීවේය. "හොඳයි බලමු!"

"අනේ ඔය ගහට නම් නගින්න එපා!" යි නාලිනී බියෙන් කෑගැසුවාය.

එහෙත් හැන්ස් නාලිනී නොතකුවේය. ගසේ උඩ අත්තකින් විශාල ලියන් වැලක් පහතට එල්ලෙමින් තිබුණි. ඒ වැල අල්ලා ගත් හැන්ස් වඳුරකු මෙන් ගස දිගේ බඩ ගාන්නට වූයේය. ඔහු කිසිදු බියක් නැතිව වැල අල්ලමින් මහත් බිය උපදවන සේ ඒ

Scanned with CamScanner

අතට මේ අතට වැනෙමින් ඉහළට නගිනු දුටු නාලිනී මහත් සේ නැති ගෙන ඒ දෙස බලා සිටියාය. ඉහළට නගිමින් සිටි හැන්ස් එන්ට එන්ට ඇයට පෙනුණේ කුඩාවී යන්නාක් මෙනි. හැන්ස් බඹර වදය තිබුණු තැනට ළඟා වී සැණෙකින් එහි එල්ලී ගත්තේය.

ඇඟට නොදැනෙන සේ අත්ත දිගේ බඹර වදය දෙසට යන හැන්ස් දුටු නාලිනී ගේ හිස කැරකෙන්නාක් මෙන් ඇට දැනුණි. අත්ත උඩටම නැග ඒ මත දිගා වූ හැන්ස් ඉතා සෙමින් එහි වසා සිටි දහස් සංඛ්‍යාත බඹරුන් මැත් කරන්නට වූයේය. දහස් ගණන් බඹරු කෝපයෙන් මහ හඬින් නාද කරමින් හැන්ස් වසා ගත්හ. මෙවැනි භයානක දර්ශනයක් කිසි දිනක නුදුටු නාලිනී උන් හැන්ස්ට මැරෙන තෙක් දෂ්ට කරනු ඇතැයි සිතුවාය. ඇ බියෙන් සිය දෙනෙත් වසා ගත්තාය. තමා ඔහුට ඒ බඹර වදය ගැන එසේ නොකියා සිටියා නම් කොපමණ හොඳදැයි ඇට සිතුණි.

විශාල පැණි වදයක් කඩා ගත් හැන්ස් එය එක් අතකින් එල්ලා ගෙන පහළට බසින්නට විය. ඔහු මඳක් දුර බැස්සේය. එහෙත් එක් තැනක දී ඔහුගේ ග්‍රහණය ගැළ වී ගොස් ඔහු බිම පතිත වන්නට ගිය නමුත් ගසෙහි කඳෙහි තිබුණු අතු කොටයක යටි දණ නමා එල්ලී යන්තම් බේරුණේය. මෙහි දී වුව ද ඔහු අත තිබුණු පැණි වදය ගිලිහී නොවැටුණි.

පැණි වදයත් එල්ලාගෙන නාලිනී වෙත ගිය හැන්ස්ට ඇය සුදුමැලි වී සිටින අයුරු දක්නට ලැබුණි. ''නාලිනී බය වුණා ද මා වැටෙයි කියලා ?'' යි හැන්ස් සිනාසෙමින් ඇසුවේය.

''හැන්ස් ඔබ මා කොයි තරම් බය ගැන්නුවාද!'' යි ඇ කීවාය. ''මීට පස්සෙ එහෙම ඔය වගේ දේවල් කරන්ට එපා! හොඳයි පොරොන්දු වෙන්න කරන්නේ නැහැ කියල.''

''ඔබේ අර සූරය තමා මාව හැම වතාවක දීම ආරක්ෂා කරන්නේ'' යි සිය අතෙහි බැඳ තිබුණු රන් සූරය පෙන්වමින් හැන්ස් කීවේය.

ඔවුහු බොහෝ වේලාවක් එහි වාඩිගෙන කල් ගත කළහ.

''හැන්ස්, ඔබ මේ කැලෙන් පිටවෙලා ගියාම මොනවා කරන්න ද හිතාගෙන ඉන්නෙ ?'' යි ඇ මේ අතර ඇසුවාය.

''මා කවදාවත් හිතලා නැහැ මෙහෙන් යන්න. මා දවසින් දවසම මේ ජීවිතයට ඇබ්බැහි වෙනවා. මේ ජීවිතේ මට හොඳට ම ඔබිනවා.''

''නමුත් හැමදාමත් ඔබ මෙහෙම ජීවත් වෙන්න බලාපොරොත්තු වෙනවායැ?''

''කොහොමද දන්නෙ? මා ඒ ගැන තවම කල්පනා කරලා නැහැ. ඒක කොහොම වෙතත් මට මෙන්න මේ ටික කියන්ට පුළුවනි. ඔය කන්ද උඩරට ඉන්න මිනිස්සු මට තිත්ත වෙලයි තියෙන්නේ.''

''මට සිදුවුණු හදියට පස්සේ මටත් හිතෙන්නේ එහෙම තමයි'' යි නාලිනී කීවාය. ''මම දැන් පිටුවාල් කරපු නින්දිත කුලහීන ගැහැනියක් පමණයි. මගේ මුළු ජීවිත කාලෙම මා ඒ විදියට ජීවත් වෙන්ට ඕනෑ.''

''ඇයි ඔබට පුළුවන් නොව ඔබ නාඳුනන පලාතකට යන්ට?''

නාලිනී ඊට පිළිතුරු වශයෙන් කළේ හිස වැනීම පමණකි. මේ කතාවෙන් පසු ඔවුහු ලෙණ වෙත පිටත් වූහ.

Scanned with CamScanner

# 15

# ඈත ගමේ කම්මල

දැන් හැන්ස්, ගැස්පා සහ එඩ්මන්ට්, දඩයම් කිරීම සඳහා වැදි ලෙණෙන් පිටත් වන්නේ බොහෝ උදෙන්මය. අඳුරු වැටී ගෙන එත්ම ඔවුහු දඩයම් කරගත් සතුන් ද කර තබා ගෙන, විඩාවට පත්ව ආපසු පැමිණෙති. නාලිනී, රනී සහ පෙමා ගේ බිරියත් දවසේ වැඩි කාලයක් එකම වැඩෙහි යෙදුණෝය. කළ යුතු වැඩි වැඩක් නැති නාලිනී, වැදි තරුණියන් සමග වනයට ගොස් දිය හෙබවල මසුන් ඇල්ලීමටත් අල සෑරීමටත් ඔවුනට සහාය වූවාය. මී වදයක් කැඩීම සඳහා ගසකට නැගීමේදීත් බිහිසුණු වන සතකු ගේ තර්ජනයකදීත් රනී ගේ උපදෙස් අනුව අනෙක් තරුණියන් දෙදෙනා ක්‍රියා කළහ.

වැද්දන් ගේ ක්‍රියා පිළිවෙළ ගැන නාලිනී තුළ පිළිකුලක් ඇති වී තිබුණත් ඒ බැව් ඇ ඔවුනට දැන ගැනීමට ඉඩ නොතැබුවාය. එහෙත් ඔවුන්ගේ කටුක ආහාර කෙරෙහි ඇය තුළ වූ අප්‍රියාව නම් පැහැදිලිවම පෙනුණි.

දිනක් හැන්ස් ඊතල මුණතක මස් කුට්ටියක් දවටා එය නාලිනී සඳහා පුලුස්සමින් සිටියේය. මෙය දුටු නාලිනී කල්පනා කරන්නට වූවාය. ''අනේ අපට වළංවත් තිබුණා නම් කොයි තරම් රස ආහාර පිසින්නට පුළුවන්ද?'' යි කියමින් ඇ හැන්ස් දෙස බලා සුසුම් ලෑවාය.

''වළං හදන්නට මා උත්සාහ කළා'' යි හැන්ස් කීවේය. ''නමුත් ඉන් වැඩක් වුණේ නැහැ. ඇරත් අපි කල්පනා කළා මස් උයනවාට වඩා මේ විදියට පුලුස්සනවා වඩා රසයි කියල. නේද පෙමා ?''

''ඇයි මේ විදියට කාපුවාම තියෙන වැරැද්ද මොකද?'' යි කී පෙමා මස් කැබැල්ලක් රස කොට ගිල දැමුවේය.

වැද්දන්ට අවශ්‍ය ඊතල ලබා ගන්නා ලද්දේ ලෙණට සැතපුම් විසි පහක් පමණ ඈතින් පිහිටි ගම්මානයක ජීවත් වූ කම්මල් කරුවකු ගෙනි. ඊතල ගෙන ඒම සඳහා හැන්ස්, රන්දූනා සහ ඔහුගේ පුත් පෙමාත් ගම්මානයට යන්නට පිටත් වූහ. එද මස් පුලුස්සන විට නාලිනී තමාට කී කතාව හැන්ස්ට සිහි විය. කම්මල්කරු වෙත යන ගමන් ඔහු ගැස්පා සහ එඩ්මන්ට් කැඳවා නොගත්තේය. කවුරුන් විසින් හෝ ඔවුන් දකිනු ලැබෙතියි ඔහු බිය විය.

Scanned with CamScanner

කම්මල්කරු ගේ නිවහනට නුදුරු මග වනයෙන් මුවකු මරා ගත් ඔවුහු එය කදක බැඳගෙන කම්මල්කරු වෙත යන්නට වූහ. වැද්දන් ඔහු ගෙන් ඊතල ලබා ගත්තේ පුදුම විදියේ ගනුදෙනුවක් මගිනි. වල් ඌරකු හෝ මුවකු හෝ මරා ගන්නා වැද්දෝ රාත්‍රියෙහි කම්මල්කරු ගේ පැල්පත අසලට ගොස් මස් කද පැලේ තබා ආපසු එති. පසු ද උදේ කම්මල්කරු මස් කද දැක කාරණය වටහා ගනී. ඔහු ඊතල තනා නිම කොට වැද්දන් මස් ගෙනැවිත් තැබූ තැනින්ම එම ඊතල තබයි. කිහිප දිනකට පසු රාත්‍රියේ ආපසු කම්මල්කරු ගේ පැල්පත වෙත පැමිණෙන වැද්දෝ ඊතල රැගෙන යති. එහෙත් මෙ වතාවේ දි කෙසේ හෝ කම්මල්කරු හමු වන්නට හැන්ස්ට ඕනෑ කළේය.

''බොලා දෙන්නා මෙහේ නැවතියල්ලා. මං මේ බරත් අරන් කම්මල්කාරයා වෙත යන්නම්'' යි හැන්ස් රන්දූනා සහ පෙමා අමතා කීවේය.

''මොනවා! මේ මහ දවල්!'' යි රන්දූනා පුදුමයෙන් ඇසීය.

''ඒ ගැන කලබල වෙන්ට කාරියක් නැහැ. සිංහලයන්ට මාව හොඳට පුරුදුයි. ඇරත් ඔය කම්මල්කාරයා මිට ඉස්සරත් මං හමුවෙලා තියෙනවා. බොලා මෙහේ ඉන්න වගක් මං ඔවුන්ට කියන්නේ නැහැ'' යි කී හැන්ස් බර වූ මස් කද කර තබාගෙන යන්නට විය. කදෙහි බරට ඔහු ඒ මේ අත පැද්දෙන්නට විය.

සිය බල්ලා බුරනු ඇසී පැල්පතින් එළියට පැමිණි කම්මල්කරු කදත් කර තබාගෙන එන හැන්ස් දැක කුතුහලයෙන් බලා සිටියේය.

''ඒයි මෙහෙ වරෙල්ලා! මේ බලනවකො මේ කවුද කියල'' යි ඔහු සිය දියණියටත් බිරියටත් අඬගැහුවේය.

හැන්ස් දැක ඔවුහු පුදුම වූහ. එහෙත් ඔහු පිළිගන්නා ලද්දේ මහත් දයාවෙනි.

කම්මල්කරු කද හිස් කිරීමට හැන්ස්ට උදව් වූයේය. අනතුරුව සිය දියණිය විසින් සුදු රෙද්දක් දමා පිළියෙල කොට තැබූ බංකු පුටුවෙහි වාඩිවීම සඳහා හැන්ස් අයැදිය. ඉක්බිති ඔහු බුලත් වට්ටිය හැන්ස්ට පිළිගැන්නුවේය.

''බො ආයෙත් දකින්ට ලැබීම අපට ලොකු සන්තෝසයක්'' යි කම්මල්කරු කීවේය. හැන්ස් දිකුද් නමැති ඈතාත් සමග කන්ද උඩ රටින් පලා එන අතර එහි පැමිණි ඔහු ඔවුනට මුණ ගැසෙන්නට යෙදුණි.

''අපි හිත හිතා හිටියා බොට මක් උණාද කියලා.''

''ළඟදී ඔබට මාව දකින්නට නොලැබුණත් මටයි මගේ අනෙක් හවුල්කාරයන්ටයි ඕනෑ තරම් ඊතල හදන්නට ඇති.''

''හැබෑට! ඒව කෙරෙන්නෙ ඉතින් එහෙම තමා. ඉතින් බොට මෙහේ එන්න තිබුණා නොවැ. ඇයි නාවේ?''

''ඔබ දන්නව නොට වැද්දන් ගෙ හැටි.''

කම්මල්කරු සිනා සුණේය. ''මං හිතන්නෙ නැ බොත් වැද්දෙක් හැටියට හිනාගෙන ඉන්නවා කියල.''

''ඇයි බලන්නකො ටිකක් මා දිහා'' යි හැන්ස් කිවේය.

අම්මාත් දුවත් සිනාසෙන්නට වූහ.

''ඉතින් කොහොම ද තොරතුරු. මොනවද කන්ද උඩරට පැත්තෙ ආරංචි? මොකුත් අලුත් දෙයක් එහෙම නැද්ද දැන ගන්ට?'' යි මෑත දී රජවාසලෙහි සිදු වූ සිද්ධීන් ගැන යමක් මේ දුරස්තර ගම්මානයට ආරංචි වී ඇත්දැයි දැනගනු රිසියෙන් හැන්ස් ඇසුවේය.

''අපට ඒ තරම් මොකුත් ආරංචි වෙන්නේ නැහැ නොවැ. නමුත් මාලිගාවෙ සිදුවුණ මහ බයානක සිද්දියක් ගැන දූසමාන ආරංචි වගයක් පැතිරිලා තියෙනවා'' යි කම්මල්කරු කිවේය.

''ඒ මොකක්ද?''

''ආරංචියක් තියෙනවා කන්දේ නුවර රජ්ජුරුවෝ, උන්නාන්සෙ ගේ ලේලිය රජවාසලට මස් ගේන වැද්දට පාවාදීලා කුලයෙන් පිටමං කරලා රාජධානියෙන් පිටුවාල් කළයි කියල.''

''මොකක් නිසා කියනවද රජ්ජුරුවො ඒක කළේ?'' යි හැන්ස් මහත් පුදුමයට පත් වූ බවක් පළ කරමින් ඇසීය.

''අර යුරෝපා ජාතික කපිතාන්වරුන් දෙන්නා ගේ පලා යාමට උදව් කිරිම ගැන ඔවුන් සම්බන්ද වෙලා තියෙනවාලු'' යි කී කම්මල්කරු ඉතා ඕනෑ කමින් හැන්ස් දෙස බැලුවේය.

''මං හිතන්නෙ බො ඒ ගැන යමක් දන්නවා ඇති නොවැ?'' යි කම්මල්කරු යළිත් කීවේය.

''මම? ඇයි ඔබ එහෙම ඇහැව්වෙ?''

''ඔබත් ඒ දවස්වල කන්දේ නුවර උන්නු බවට ආරංචි පැතිරිලා තියෙනවා.''

''මගෙ අම්මෝ! වෙන මොනවද ආරංචි වෙලා තියෙන්නේ? මට ඔය කන්ද උඩ රට දී වෙච්ච දේවල්වල හැටියට මං ආයෙත් යනව ද ඒකෙ රිංගන්න? මෙහෙමත් කතන්දර හැදෙනව නොවැ.''

''මාත් ඒක තමයි කිව්වේ ඔය ආරංචිය කියාපු මිනිහට.''

''ඉතින් ඒ වැද්දයි තරුණියයි ගිය දිහාවක් ගැන ආරංචියක් නැගැයි කියනවද?''

''මොකුත්ම නෑ. එහෙම දෙයක් වුණාම මිනිසුන් ගේ මූණ බලන්ට බැහැ නොවැ. කොයි රට යනව ද කියන්න බැහැ.''

මේ අතර කම්මල්කරු ගේ බිරිය කැවුම්, කොකිස්, අතිරස සහ ඉදුණු කෙසෙල් ගෙඩි ඇවරියක් ද ඔහු ඉදිරියෙන් තැබුවාය. මෙවැනි කෑම වර්ග කන්ද උඩ රට දී ද ඔහුට පුරුදුය.

කටේ තිබුණු බුලත් හපය ඉවතට දැමූ හැන්ස් කම්මල්කරු ගේ දියණිය විසින් කොතලයකින් ඔහු ගේ අතට වත්කරන ලද වතුරෙන් කට සෝද ගත්තේය. ඉක්බිති ඔහු ඒ රසවත් කැවිලි වලින් මදක් අනුභව කළේය.

''මේ ඉතුරු ඒවා මට කැලේ දි කන්ට අරන් යන්නම්'' යි හැන්ස් ඇසුවේය.

''අනේ අහන්ඩත් දෙයක්ද! ගෙන ගියාම මොකද?'' යි ඔවුහු කීහ.

''මං මේ කැදරකමට ඉල්ලනවා කියල හිතන්න එපා. මට මෙන්න මේ වගේ වළං දෙකකුයි හාල් ටිකකුයි ලුණු පොඩ්ඩකුයි දෙනවද?''

හැන්ස් ඉල්ලූ සෑම දෙයක්ම පමණක් නොව, එලවලු, මිරිස්, තුනපහ ගොඩක් ද ඔවුහු ඔහුට පොදි බැඳ දුන්නෝය.

''මං ආයෙත් ඊතල ගෙනියන්ට එන කොට මේ බඩුවලට හරියන්ට මොනවද ගේන්නේ?'' යි තමාට ලැබුණු බඩු පොදිය කදට බැඳ ගනිමින් හැන්ස් ඇසුවේය.

''අපට තියෙන දේ බොහෝම සන්තෝසෙනුයි බෝට දුන්නෙ. ඒවට අපි මොකුත් බලාපොරොත්තු වෙන්නේ නැහැ'' යි කම්මල්කරු කීවේය.

''බිම්කොහොඹ ටිකක් ගේන්නද?'' යි මෙම බෙහෙත් වර්ගය සිංහලයන් විසින් ඉතා අගය කොට සලකනු ලබන බව දත් හැන්ස් ඇසුවේය.

''අනේ ටිකක් ගෙනාවොත් ලොකු උදව්වයි.''

''බිම්කොහොඹ තරම් මා කැමැති වෙනත් දෙයක් නැහැ'' යි හැන්ස් වලසුන් විසින් පහර දෙන ලද සිය අත ඔවුන්ට පෙන්වා සිනාසෙමින් කීවේය. වරක් බිම්කොහොඹ සෙවීමට ගොස් හැන්ස්ට වලසුන් කළ හදිය ඔහුට හොඳට මතකය.

''අපි මේ අහන්නට හිටියේ ඔය තුවාල කොහොම වුණාද කියල.''

''බිම්කොහොඹ හොයන්ට ගිහින් වෙච්ච දේ තමයි මේ වලසුන් ඊට විරුද්ද වුණා.''

Scanned with CamScanner

''අනේ එහෙනම් අපට බිම්කොහොඹ ඕනෑ නැහැ'' යි මවත් දියණියත් කීවෝය.

හැන්ස් හඬ නගා සිනාසුණේය. ''එහෙම කිව්ව නිසා ගේන්න හිතාගෙන හිටියටත් වැඩිය බිම්කොහොඹ ගෙනෙනවා. වැඩි පුර ඒවා ඔබට බඩුවලට හුවමාරු කර ගන්ට බැරියැ. මට ලොකු ලබු කැටයක් දුන්නොත් බඹර පැණිත් ගෙන හැකි.''

මේ සිංහල ගැමි පවුලෙහි කාරුණික භාවයට ස්තුති කළ හැන්ස් මහ වනය බලා යන්නට ඔවුන්ගෙන් සමුගත්තේය.

''ඇව්වො මෙච්චර වේලා මොකද කළේ?'' යි මග බල බලා සිටි රන්දූනා ඇසීය.

''මොනවද මේ සුදු හූරා අරන් ඇවිත් තියෙන්නේ?'' යි පෙමා ඇසීය.

''ලෙණට ගියාම බලන්ට බැරියැ. ඒත් මෙන්න උඹට මගට හරියන බඩුවක්'' යි හැන්ස් සිය කද තුළින් දුම්කොළයක් ඇද කඩා විටක් දෙකක් ඔවුනට දුන්නේය. දුම්කොළ සපා රස උරා කෙල ගසමින් යුහුසුලුව ඔවුහු ගමන් කරන්නට වූහ.

හැන්ස්ට ලැබී තිබුණු නැගී දුටු නාලිනී ප්‍රීතියෙන් උද්දාම වූවාය. හැම දෙනා අතර බෙදන්නට ප්‍රමාණ නුවූවත්, නාලිනී තිබෙන හැටියට කැවුම් කෙසෙල් ගෙඩි සියල්ල සැම දෙනා අතර සම සේ බෙදන්නට වූවාය. තමා කම්මල්කරු ගේ ගෙදර දී කැවුම් කෙසෙල් ගෙඩි කෑ බව කී හැන්ස් සිය කොටස ප්‍රතික්ෂේප කළේය. ගැස්පා සහ එඩ්මන්ට් ද ස්වකීය කොටස් ආදරයෙන් ප්‍රතික්ෂේප කළහ. රන්දූනා සහ පෙමා ද සුදු හූරා විසින් ගෙනෙනලද දුම්කොළ වඩා හොඳ බව කියා කැවුම් කෙසෙල් ගෙඩි ප්‍රතික්ෂේප කළෝය. නාලිනී, රන්දූනාට සහ පෙමාට කැවිලි බෙදන විට හැන්ස් ඔවුන් වෙත හෙලූ බැල්ම ඒ ප්‍රතික්ෂේප කිරීමට බොහෝ සෙයින් බලපෑවේය. ඒවා කෑවේ තරුණියන් තිදෙනා පමණි.

එදින සවස නාලිනී, රනී ගේ ද සහාය ඇතිව බතක් ද මුවමස් ව්‍යඤ්ජනයක් ද තැම්බූ අල ද පිළියෙල කළාය. නාලිනී ගේ කෑම පිසීමේ දක්ෂතාව එදින මොනවට පැහැදිලි විය. කැන්ද කොළවලට බෙද සියල්ලන්ටම කෑම පිළිගැන්වූ නාලිනී ඇති ඇති කියද්දීත් බලෙන් බෙදුවාය.

සිත් සතුටින් කල් ගෙවී යන්නට වූයේය. හැන්ස් ඊතල ගෙන ඒමට කම්මල්කරු වෙත යාමට පමා විය. කම්මල්කරු වෙත යාමට සුදුසු කාලය එළඹ තිබෙන බැව් ඔහුට මතක් කළේ රන්දූනාය.

Scanned with CamScanner

තමා දන් කම්මල්කරු සමග ඉතා කුලුපග හෙයින් තමා ගේ ආරක්ෂාවට කිසිවකු අවශ්‍ය නැතැයි කී හැන්ස් තනිවම පිටත් වූයේය.

පැණිවදවලින් පිරුණු ලොකු ලබු කැටයක් ද විශාල බිම් කොහොඹ මිටියක් ද කද බැඳගත් හැන්ස් කම්මල්කරු ගේ පැල්පත වෙත ආවේය. ඔහු එහි එන විට ඔවුහු දහවල් කෑම කන්නට සූදනමින් සිටියෝය. ඔවුහු මහත් ප්‍රීතියෙන් හැන්ස්ට ද කෑමට වාඩිවන ලෙස අයැද සිටියෝය. අහර ගැනීමෙන් පසු ඔවුහු නොයෙක් දේ ගැන කතා කරමින් සැන්දෑ වන තෙක් සිටියහ.

හැන්ස් පිටත්වන්නට සූදනම් වෙත්ම නාඳුනන තරුණයෙක් කම්මල්කරු ගේ වත්තට ඇතුළු වනු ඔහුට දක්නට ලැබුණි. තරුණයා ඔවුන් වෙත අවුත් යමක් විමසනවා වෙනුවට මහත් කනගාටුවකින් මෙන් ගසක් යටට වී වාඩි ගත්තේය.

''කවුද අර?'' යි හැන්ස් ඇසීය.

''අනේ, අපි කියන්ඩ දන්නේ නැහැ. ඔහු අතන මෙතන නාතර වෙමින් ගමක් ගානේ ඇවිදිනවා. මං හිතන්නේ මොනවා දෝ හොයනවා ඇති. ඔහොම ගිහින් අපරාදේ දවසක වලසකුට වත් කොහෙවත් අහුවෙනවා'' යි කම්මල්කරු කීවේය.

''ඔහු ඉස්සර වෙලාම මෙහාට ආවෙ කවද්ද?''

''මීට මාසෙකට විතර ඉස්සර'' යි කම්මල්කරු කීය.

මේ ඇසූ හැන්ස් කල්පනා සහිත විය. ඔහු වරින් වර තරුණයා දෙස බලමින් කම්මල්කරු සමග කතා කරන්නට විය. මේ අතර කම්මල්කරු හැන්ස් ගෙන් ඇසූ පැනයකට ඔහුගෙන් පිළිතුරු ප්‍රමාද වූ නිසා ඔහු යළිත් හැන්ස් ඇමතීය.

''ඇයි ඔබට මොකුත් කියන්ට තියෙනවද? එහෙම දෙයක් තියෙනවා නම් කියන්ට. අපට පුළුවන් දෙයක් කරන්නම්''යි හේ කීවේය.

''අනේ නැහැ'' යි හැන්ස් කීවේය. ''මට උඩමතා දේවල් පමණක් නොවෙයි ඊට වැඩියෙනුත් දීලා තියෙනවා. මං අර තරුණයාත් එක්ක වචනයක් දෙකක් කතා කරන්ටද?''

''ආ ඒකට මක් වෙනවාද?'' යි කම්මල්කරු කීය.

හැන්ස් නාඳුනන තරුණයා වෙත ගොස් කතා කළේය.

''ඇයි ඔබ මේ දුකෙන් වගේ ඉන්නේ?''

හැන්ස් දෙස බැලූ තරුණයා වහා නැගිට්ටේය.

''ආ මේ ඔබ ද?'' යි තරුණයා විස්මයෙන් හැන්ස් දෙස බලමින් කීවේය.

''ඔබ මා හඳුනනවාද?'' යි පුදුමයට පත් හැන්ස් ඇසීය.

''ඇයි නැත්තේ?''

''කොහේ දී ද ඔබ මා දැකලා තියෙන්නේ?''

''ඇයි කන්දේ නුවර රජවාසල දී! මට දැකපු හැටියෙ ඔබව හඳුනා ගන්ට පුළුවන්.''

හැන්ස් ගේ මනස කන්ද උඩරට රජ මාලිගය කරා දිවවේය. තමා එහි සිර කොට සිටිය දී මාලිගයේ හුන් තරුණයන් අතරින් මෙවැනි රූපත් තරුණයකු සිටි බව ඔහුට යන්තමින් මතකය.

''අපි ටිකක් ඉඳගනිමු'' යි හැන්ස් කීවේය. ''ඔබේ නම? ඔබට මෙහෙම එන්ට සිදුවුණේ ඇයි?''

''මම නීල, මේ ළඟ දී මාලිගාවේ සිදුවුණු භයානක සිද්දියෙන් පස්සෙ මා ඉන් පලා ආවා'' යි කී ඔහු, හැන්ස් නාලිනීට අත් වූ ඉරණම නොදනිතැයි සිතා ඒ පිළිබඳ සියලු පවත් කියන්නට වූයේය. හැන්ස් ඒ සිද්ධිය පිළිබඳ හැම දෙයක්ම නාලිනී ගේම මුවින් දැනගෙන සිටිතැයි හේ සිහිනෙනුදු නොසිතුවේය.

''ඇයි ඔබ මාලිගාවෙන් පැනලා ආවේ'' යි හැන්ස් ඇසීය.

''මං මේ යන්නේ නාලිනිව හොයා ගන්ටයි. ඇයටත් වැද්දටත් වෙච්ච දෙයක් ගැන හරියාකාරව දැන ගන්නා තෙක් මම ඔහේ යනවා. මගේ පණ තියෙන කල් මා ඇය සොයා ගෙන යනවා.''

හැන්ස් අතෙහි බැඳ තිබුණු සූරය ඔහු දුටුවේය.

''ඔබ දන්නව ද ඔය සූරය ඔබ වෙත එවීමෙන් ඈ ඇගේ ජීවිතය පවා පරදුවට තැබූ හැටි. ඔය සූරයත් සමග ඈ මාව තමයි ඔබේ සිර කුඩුවට එව්වේ. මාත් ඒක අරන් ආවේ මරුවා දැක දැකයි.''

''ඒ ගැන මා ඔබට පින් දෙනවා'' යි හැන්ස් කීවේය. ''නමුත් නාලිනීට සිද්දවුණු දේ ගැන ඔබ ඔය තරම් කැළඹිලා ඉන්නේ ඇයි? ඈ ඔබේ නංගීද?''

''මා ඇගේ මස්සිනා'' යි නීල ඉවත බලමින් කීවේය.

ඔහු යළිත් හැන්ස් දෙස දෙනෙත් අයාගෙන බලා සිටියේය. නීල ගේ සිතට කිසියම් බලාපොරොත්තු සහගත හැඟීමක් රිංගන්නට විය. ''සමහර විට ඔබ දැකලවත් අහලවත් තියෙන්ට බැරි ද නාලිනීත් වැද්දත් ඉන්න දිහාක්?''

හැන්ස් නිශ්ශබ්ද වූයේය.

''ඇයි ඔබ කතා නොකරන්නේ?'' යි නීල නොඉවසිල්ලෙන් ඇසීය.

''එන්න මාත් එක්ක යන්න. දැන් ඉතින් ඔබ සොයා වෙහෙසෙන්න ඕනැ නැහැ ඒ ගැන'' යි හැන්ස් කීවේය.

Scanned with CamScanner

# 16

## වැදි ලෙණ හැර යෑම

එදින හවස හැන්ස් සහ නිල වැදි ලෙණ වෙත ළඟා වූහ. ලෙණ කිට්ටුවට පැමිණි හැන්ස්, නිල අමතා, තමා ලෙණ වෙත ගොස් සංඥාවක් කරන බවත් එතෙක් මඟ රැඳී සිට ඔහුගේ සංඥාව ඇසුණු විට ලෙණ වෙත එන ලෙසත් දැනුම් දුන්නේය.

හැන්ස් තනිවම ලෙණ වෙත අවුත් ගැස්පාට සහ එඩ්මන්ට්ට ආචාර කොට දුනු හී පසෙකින් තැබුවේය. හේ කම්මල්කරු වෙතින් ගෙනා රීතලවල හොඳ නරක බැලීමට රන්දූනාට දුන්නේය.

ඉක්බිති හැන්ස් නාලිනි වෙත ගියේය. ''ඔබට අපූරු දෙයක් පෙන්වන්ට පුළුවන් දැන් මට. දැන් ඔතන හිටගෙන ඇස් දෙක වහගන්න.''

කිසිවක් තේරුම් ගත නොහැකි වූ නාලිනී හැන්ස්ට කීකරු වූවාය. හැන්ස් ද ඇ පිටුපසින් සිටගෙන ඇගේ දෙනෙත් සිය දෑතින් වැසුවේය. ඉක්බිති ඔහු මඟ නැවති සිටි අයට එන්නට සංඥා කළේය.

''ඔන්න දැන් ඇස් අරින්න!''

විස්මයෙන් හා කුතුහලයෙන් සිය මස්සිනා තමා ඉදිරියේ සිටිනු ඇට දක්නට ලැබුණි.

''අයියෝ නාලිනි මේ ඔබ ද?''

''ඔබ කොහොම ද මෙහි ආවේ?''

''හැන්ස් ගෙන් අහගන්න'' යි නිල හැන්ස් දෙස බලමින් කීවේය.

''කම්මල්කරු ගේ පැලේ දී මට ඔහු හමුවුණා. ඔහු ඔබ සොය සොයා ඇවිදිමින් හිටියා.''

මේ කුමක්දැයි කුතුහලයෙන් ඔවුන් දෙස බලා සිටින වැද්දන් දෙසත්, වැදි ලෙණ අවටත් නීල බැලුවේය.

''කෝ සෙල්ලා?'' යි නීල නාලිනී ගෙන් ඇසීය.

''ඔහු මළා.''

''කමක් නැහැ. එයත් හොඳකට වුණා වගේ'' යි නිල සැනසුම් සුසුමක් හෙළමින් කීවේය.

''එහෙම කතා කරන එක වැරදියි නීල. ඔහු නොසිටින්නට මා අද ජීවතුන් අතර නැහැ.''

''මට සමාවෙන්න නාලිනී ඒ ගැන. මගේ නොදැනුවත්කම නිසයි මා එහෙම කිවේ'' යි නිල පසුතැවිලි විය.

''අපි දැන් වාඩි වෙලා මොකුත් හරි කමු'' යි හැන්ස් යෝජනා කළේය. ''දැන් අපට බොහොම බඩගිනියි.''

නිලට වැදි කෑම නුපුරුදු වුවත් නාලිනී හමුවීම නිසා ඔහු තුළ තිබූ සතුට හේතු කොට ගෙන ඔහු ඒ ගැන වැඩි සැලකිල්ලක් නොදක්වා බඩ පිරෙන තෙක් කෑවේය. පසුගිය සති කිහිපය තුළ ඔහු හරිහැටි කෑමක් නොගත්තේය.

තමන්ගේ පලා යාමෙන් පසු කන්ද උඩ රට උද්ගත වී ඇති තත්ත්වය ගැන ගැස්පා නිල ගෙන් විපරම් කළේය.

රජු ඒ ගැන උදහස් වී සිටින සැටිත් මුළු රාජධානිය පුරා ඔවුන් සෙවීමට ගත් වෑයම ගැනත් දැන් ඔවුන් සොයා දුන් අයකුට රජු ගෙන් ලැබෙන තෑගි ගැනත් ඔහු විස්තර කළේය.

නිල සැණෙකින් කතාව නවතා සපිතාන්වරුන් දෙස ද නාලිනී දෙස ද දෙනෙත් අයා බැලුවේය.

''ඔබ දෙන්නයි නාලිනියි කොහොමද මෙහාට එක් වුණේ? මා හිතුවේ නැහැ නාලිනී මේ තරම් ආරක්ෂා සහිතව ඇතියි කියල.''

''ඒක අහන්න හැන්ස් ගෙන්.''

නිල හැන්ස් දෙස බලා සිටියේ මහා හාස්කම් කළ හැකි අයකු දෙස බලන්නාක් මෙනි. හැන්ස් දැන් ඔහුට පෙනෙන්නේ අද්භූත මිනිසකු ලෙසිනි. නිල ගේ බැල්මට නාලිනීටත් සිනා ගියේය.

''කොහොමද සුජාතා? සනීපෙන් ඉන්නවාද?'' යි හැන්ස් ගේ විස්තර කතාව අවසන් වූ පසු නාලිනී නිල ගෙන් ඇසුවාය.

''ඔබ පිටමං කළ ද ඉඳන් දවස් ගණනක්ම ඈ කිසිම දෙයක් නොකා අඬ අඬා හිටියා'' යි නිල කීවේය.

ඔවුන් එදා නින්දට යන විට හඳ පායා ඉහළ අහසේ බබළමින් තිබුණි. තරුණියන් තිදෙනා ලෙණෙහි එක් කෙළවරකටත් මිනිසුන් සය දෙනා අනෙක් කෙළවරටත් වී නිදාගත්හ.

දින දෙකක් පමණ ගත විය. ගැස්පා, එඩ්මන්ට් සහ හැන්ස් කෙරෙහි නිල ගේ සම්පූර්ණ විශ්වාසය ඇති විය. නාලිනී මෙන් නිල මුල පටන්ම රජගෙදර ජීවත් නොවූ බව ඔවුහු දැනගත්හ. නාලිනී ගේ දෙමාපියෝ ඇගේ ළාබාල වියෙහිදීම මිය ගියෝය. ඇගේ පියා ගේ ඉල්ලීම පරිදි රජතුමන් විසින් නාලිනී හදාවඩා ගන්නා ලද්දිය. නාලිනී ගේ පියා රජු ගේ ඉතාම කිට්ටු මිතුරා වූ අතර ඔහු රජු ගේ ප්‍රධාන අනුශාසකයා ද විය. උසස් පවුල්වල තරුණයන්, සිය රාජසභාවේත් යුද හමුදාවේත් උසස් තනතුරු සඳහා බඳවා ගැනීම සිරිත වූයේය. නිල ද එසේ රජ ගෙදරට

ගෙන්වා ගනු ලැබූ තරුණයෙකි. මෙවැනි තරුණයන් රජ මැඳුරට ගෙන්වා ගත් පසු යළිත් ඔවුන් ඔවුන්ගේ දෙමාපියන් වෙතට ගෙන යාමට ඉඩ නොලැබේ. ඔවුන් බැලීමට ඉඳ හිට පැමිණිය හැක්කේ ඔවුන්ගේ පිරිමි නෑදෑයන්ට පමණි. කිසිම තරුණයකු ගේ මවකට පවා රජවාසලට පැමිණීම තහනම් කොට ඇත.

නීල රජ වාසලට ගෙන එන විට ඔහු ගේ වයස අවුරුදු දහයක් විය. රජ අණින් ඔහු සිය දෙමාපියන් හැර දමා පිට වෙද්දී ඔහුත් ඔහු ගේ දෙගුරුනුත් හෙළු කඳුළු අපමණය. රජ වාසලට පැමිණ කලක් ඇවෑමෙන් ඔහු එහි ජීවිතයට පුරුදු විය. නාලිනී ගේ සමාගමය නිසා ඔහුට කාංසියක් නොවිය.

"අපි එකට වැඩුණා. එකිනෙකාට ඇලුම් කරන්නට පුරුදු වුණා" යි නීල කිවේය.

එවිට නාලිනී ඔවුන් අසලට පැමිණියාය.

"මම මේ ගොල්ලන්ට කීවා අපේ තොරතුරු" යි නීල කීය.

යළිත් ඔහු හැන්ස් වෙතට හැරී කතා කරන්නට විය. "ඔබට පුළුවන් නම් අප මේ වනකරෙන් පිටතට එක්කර ගෙන ගිහින් රජතුමා ගේ අණසකට අයිති නැති ගමකට, පහත රට ඕලන්ද-යන්ට අයිති පත්තුවකට ඇරලන්ට. අපට පුළුවනි එතකොට සැනසිල්ලේ ජීවත් වෙන්ට" යි ඔහු කිවේය.

"ඔව් හැන්ස්, අපේ ජීවිත ඔබට සම්පූර්ණයෙන්ම ණය ගැතියි. ඉතින් ඔබ අපට ඒ උපකාරය කළොත් ඒක ලොකු දෙයක්" යි නීල අනුමත කරමින් නාලිනී කීවාය.

වනය හැර දමා යන්නට දැන් සුදුසු කාලය බව එඩ්මන්ට් සහ ගැස්පා ද හැන්ස්ට කීහ. "අපි වනයට කොපමණ කැමති වුණත් අපි අපේ ගමරටවලටත් යන්නට එපායැ" යි එඩ්මන්ට් කීවේය.

"එහෙනම් අපි හෙට පාන්දරින්ම පිටත් වෙමු" යි කී හැන්ස් ඒ අදහස වැද්දන්ට ද සැල කළේය.

"ඒක හොඳයි" යි රන්දූනා කල්පනාවෙන් බරව කීවේය.

එදින සවස මහා වැදී යාගයක් විය. රන්දූනා යාගය පවත්-වමින් පසු ද අලුයම දීර්ඝ ගමනක් සඳහා පිටත් වෙන ඔහු ගේ අමුත්තන්ට දෙවියන් ගේ ආරක්ෂාව අයැද සිටියේය. බොහෝ වේලාවක් යාගය පැවැත් වූ රන්දූනා පසු ද ගමන පිළිබඳව ඇති පෙර නිමිති ඉතාමත් සුබ බව සැල කළේය.

සිය දුන්නත් හීතල කොපුවත් පොරොවත් සාරේ එල්ලාගත් හැන්ස් පාන්දරින්ම ගමනට සූදානම් වූයේය. සෙස්සෝ ද ඔවුනට

රිසි අන්දමින් සූදනම් වූහ. ඔවුහු වියලි මුවමස් පොදියක් හා දිය ගෙන යාමට ලොකු ලබුකැටයක් ද පිළියෙල කරගෙන සිටියහ. වැද්දන් විසින් තමාට දක්වන ලද කරුණාවන්ත ලීලාව වෙනුවෙන් ඔවුනට ස්තුති කළ නාලිනී, රනී වෙත ගොස් මහාර්ඝ මැණික් ඔබ්බවන ලද මාලයක් ඇගේ කරේ බැන්දය. ඈ මේ මාලය නිදන් වස්තු පිරුණු මල්ලෙන් තෝරා ගත්තාය. නාලිනී, ගැස්පා සහ එඩ්මන්ට්, රනීට එම මාලය පැළඳවීමට කල් තියා පිළියෙල කර ගත්හ. මේ බැව් නොදත් හැන්ස්, නාලිනී, රනීට මාලයක් පළඳවනු දැක මහත් සේ ප්‍රීති වූයේය.

සිංහල සිරිතට අනුව නාලිනී දැත් එක්කොට වැද්දන්ට ආයුබෝවන් කිවාය.

ගැස්පා, එඩ්මන්ට් සහ නීල ද වැද්දන්ට ස්තුති කොට ආචාර පවත්වා මගට පිළිපන්හ. නාලිනී ද ඔවුන් සමග එක්වූවාය. හැන්ස් මඳක් ලෙණ වෙත රැඳුණේය.

"සුදු හූරා, බෝ ආපසු අප වෙත එනවා නේද?" යි රන්දූනා ශංකාවෙන් ඇසීය. මේ ප්‍රශ්නය හැන්ස් ගෙන් අසන තෙක් රනී නොඉවසිල්ලෙන් සිටියාය.

"ඔව්, ඔව් අප්පොච්චෝ, ඒත් මට කියන්ට බැහැ කවදා එන්ට ලැබෙයි ද කියල. අපට ලොකු දුරක් යන්න තියෙනවා නොවැ" යි කී හැන්ස් රනී වෙත ළං වී ඇගේ උර හිසට අතක් තබා අනෙක් අතින් ඇගේ නිකට අල්ලා සෙලවූයේය. ඉතා බැගෑපත් බැල්මකින් ඈ ඔහු දෙස බලා සිටියාය.

"ගිහින් එන්න" යි රනී තොල් මතුළාය.

"මා ආපසු එනවා රනී. ආපසු එනවා."

හැන්ස් සියල්ලන්ටම ආචාර කොට ලෙණ ගලෙන් පහළට බසින්නට වූයේය.

ලෙණ දොර සිට ගත් රනී ඈත යන හැන්ස් දෙස බලා සිටියාය. යළිත් තමාට හැන්ස් දකින්ට ලැබේදෝයි ඇගේ සිතෙහි සැක පහළ වන්නට විය. මීට පෙර ද ඔහු ඇය හැර දමා ගොස් බොහෝ දවස් බැහැර ගත කොට නොයෙක් ගැහැටවලට මුහුණ පා ආපසු පැමිණියේය. එහෙත් මේ වර ඔහු යන ගමන ඒ සියල්ලටම වඩා දුර එකකි. සමහර විට ඔහුට එහි දී ඔහුගේ මිනිසුන් හමු වන්නට පුළුවනි. එහෙම වුණොත් ඔහු ආපසු නැවිත් සිටින්නටත් පුළුවනි. රනී සුසුම් ලෑවාය."

වැද්දෝ ලෙණ තුළ වාඩි ගත්හ. "අද ලෙණ හරිම පාළුයි" යි රන්දූනා කීවේය.

රනී සිය මාලය ඇඟිලිවලින් පිරිමදිමින් හැන්ස් ගිය දෙසට හැරී දුකින් බලා සිටියාය. පොතු වගයක් කටට දමා ගත් රන්දූනා ඒවා සපමින් ගිනි ගොඩක් ගැසීමට සූදානම් වූයේය. ගැස්පා තමාට තෑගි කොට ගිය කිනිස්ස එහි කොපුවෙන් එළියට ගත් පෙමා එහි දිලිසෙන තලය දෙස බලන්නට වූයේය. පෙමා ගේ බිරිය නාලිනී ගෙන් තෑගි ලැබුණු වළල්ල අල්ලා අත් ගොබයේ ඉහළ පහළ යැව්වාය.

පුරා සති දෙකක් ම හැන්ස් ගේ මෙහෙයීම අනුව ඔවුහු ගමන් කළහ. කලාතුරකින් හමු වූ වැද්දන් හැර අන් කිසිවෙක් ඔවුනට මුණ නොගැසුණහ. නාලිනී ගේ පහසුව තකා ඔවුහු කඩින් කඩ ගමන් කළෝය. ඒ අතර සතුන් සුලභ පෙදෙස් හරහා ද ඔවුනට යන්නට අවශ්‍ය විය. එසේ නොකළ හොත් ඔවුනට ආහාර නැතිව මිය යන්නට සිදුවනු ඇත. අතර මග දී හමුවෙන මී වදයක් හෝ අල ගෙඩි කිහිපයක් එකතු කර ගන්නා ඔවුහු සවස් වන තෙක් ගමන් කළෝය. ඉක්බිති නාලිනී සහ නිල ගේ ආරක්ෂාවට ගැස්පා හෝ එඩ්මන්ට් යන දෙදෙනා ගෙන් එකකු නවත්වා හැන්ස් අනෙකා සමග දඩයම් කිරීම සඳහා මහ වනයට වදින්නේය. මුවකු දඩයම් කර ගත් විට, එය ගිනි ගසා වේලා ගැනීම සඳහා ඔවුහු පුරා දවසක්ම ගෙවූහ. මහ වන මැද ඉණි දෙකක් සිටුවා ඒවා හරහා ලීයක් බැඳ දඩයම් කළ මුවා එහි එල්ලා ඊට යටින් කුඩා ගිනි ගොඩක් ගසන ඔවුහු මුවා පුලුස්සා ගනිති. මේ සඳහා ඔවුනට දින කිහිපයක් ගත වේ. ඒ දිනවල ඔවුනට විවේක සුවය ද ලැබේ.

නාලිනී ගේ විඩා ගතිය පහ කිරීම සඳහා එඩ්මන්ට් ගේ සහ ගැස්පා ගේ ඉල්ලීම පරිදි, හැන්ස්, වනයේ ජීවත්වන නා නා සතුන් පිළිබඳ අපූරු කතා කීවේය. ඔහු තමාට මහ වනයේදී මුහුණ පාන්නට වූ ත්‍රාසජනක සිද්ධීන් විස්තර කළේ ලොමු දැහැගන්වන ආකාරයෙනි. තමා නිතර යාමට බලවත් කැමැත්තක් දක්වූ මහ වන මැද විල් තෙර වටා ගෙතුණු නොයෙක් රස කතා ඔහු කීයේය. ඔහුගේ වන මිතුරන් වූ, සිය ජීවිතය බේරූ දිකුද් නමැති ඇතා, සුදු ගෝනා, දියායි සුරතල් නමින් අමතනු ලබන අඳුන් දිවියා, බිම්බි නමැති සුරතල් වැඳිරිය සහ ටිකී නමැති මුගටියා පිළිබඳ නොයෙක් කතා ඔහු විසින් කියන ලදී.

කොළඹ කොටුව අල්ලා ගැනීමේ දී ඇති වූ බිහිසුණු සටනේ දී තමා අභීතව සටන් වැදුණු සැටිත් තම සගයන්ව සිටි සයිමන් ද බස්තෝ, ඩේමියන් වයිරා පියතුමා, අන්තෝනියෝ තියුනා පියතුමා ආදීන් තම රට ජාතිය වෙනුවෙන් යුද වැදුණු සැටිත් ගැස්පා රසවත් ලෙස විස්තර කළේය. ඩේමියන් පියතුමා හා ගැස්පා සටනින් දිවි ගළවා ගත් කිහිප දෙනා අතර වූහ. එඩ්මන්ට්

මුහුදු සහ ගොඩ සටන් ගැනත් තමාගේ මෙන් ම හැන්ස් ගේත් මව් බිම වූ ඕලන්දය ගැනත් විස්තර කීවේය. සෑම රාත්‍රියකම, ඔවුහු, නාලිනී ගේ බිය පහකිරීම සඳහා විශාල ගිනිමැලයක් ගැසූහ. වල් අලියකු ගේ බෙරිහන් දීමෙනුත් භයංකර කොටියා ගේ ගෙරවීමෙනුත් ගෝනකු ගේ හඩිසි හැඬීමෙනුත් ඈ නින්දෙන් නිගැස්සී අවදි වූවාය.

දිනක් රාත්‍රියේ ඔවුන් නොදැනුවත්වම ගිනි මැලය නිවී ගියේය. ඊට මඳ වේලාවකට පසු දැවැන්ත වලසුන් දෙදෙනෙක් ගොරවමින් බිම පහුරු ගාමින් ඔවුන් වෙත ළං වන්නට වූහ. හැන්ස් වහා නැගිට සිය පොරොව අතට ගෙන වලසුන් වෙත ගොස් මොනවාදෝ කියා කෑ ගැසුවේය. උහු කෑ ගසමින් වනයට වැදුණෝය. මේ පුදුම තරුණයා තුළ ඇති වන සතුන් බිය වන අද්භූත බලය ගැන නාලිනී පුදුම වූවාය. මෙතරම් භයංකර වන සතුන් ඔහුගේ කට හඬට පමණක් බියෙන් පලා යාම අන්හැම දෙනාකු ගේමත් පුදුමයට කරුණක් වූයේය.

ඔවුන් මහ වන මැද ගත කළ හැම දිනකදීම ඔවුන් ගේ එකම මුරභටයා වූයේ හැන්ස්ය. ඔවුන් තුළ වරින් වර හටගත් බිය පහව ගියේ හැන්ස් නිසා විනා අන් කිසිවක් හේතු කොට ගෙන නොවේ. බීමට දිය හිඟ වූ විට ඔහු ඉවෙන් මෙන් දියඇති තැන් සොයා ගත්තේය. මී මැස්සකු මෙන් මී වද ඇති තැන් ද සොයා ගත්තේය. කෑදැත්තකු හෝ බටගොයකු හෝ අත්තක වසා සිටිනු හැන්ස් විසින් දකිනු ලැබුව හොත් ඌට ඔහුගේ හී පහර නොවරදින්නේය. අලුයම වලිකුකුළකු ගේ හඬලෑමක් අසලින් ඇසුණ හොත් හැන්ස් ඒ දෙසට යයි. පින්නෙන් තෙමුණු අකුලක් අස්සට රිංගා ගන්නා ඔහු ඉන් එළියට එන්නේ තවු ගසන වර්ණවත් වලිකුකුළකු අතින් එල්ලා ගෙනය.

දිනක් සවස ඔවුහු ඉතා උස් වූ පර්වත පාමුලකට පැමිණියෝය. පසු ද උදෑසන අනෙක් අය අවදි වීමට පෙර හැන්ස් පර්වත මුදුනට නැග ගත්තේය. ඔහු එහි මුදුනෙහි තිබුණු ගසකට නැංගේය. ඔහුට දකුණු පසින් මහා වන පෙතින් වැසී ගත් දර්ශනීය කඳු වැටි ඈතට විහිදී තිබුණි. කඳු වැටිවලට ඔබ්බෙන් නිල්වන් වන පෙත කෙළවරේ නිල්වන් මහ මුහුද ඔහු ගේ දෙනෙතට ලක් විය. ඈතින් නැවක් යාත්‍රා කරමින් තිබුණි. මුහුද දෙසින් ඔහු දෙසට හමා ආ සුළඟෙහි පහස විඳ එය උරා බීවේය. යළිත් ඒ මහ මුහුදේ නැවක යාත්‍රා කරන්නට ඇත්නම්යි හේ සිතිය. සිය යටගියාව ගැන කල්පනා කරමින් ඔහු කඳු මුදුනේ පැය කිපයක් ගත කළේය.

හැන්ස් ආපසු සිය සගයන් වෙත පැමිණෙන විට මද්දහන් වී තිබුණි. ඔවුහු හැන්ස් ගේ අතුරුදහන් වීම ගැන කලබල වී සිටියහ. තමා පර්වත මුදුනේ දී දුටු දර්ශනය ගැන ඔහු ඔවුනට විස්තර කළේය. ඕලන්දක්කාරයන්ට අයත් කිසියම් නැව් තොටක් සමීපයට ඔවුන් පැමිණ සිටින බව ඔවුහු කල්පනා කළහ.

මීට දින දෙකකට පමණ පසු පත්ල වියලී ගිය ගඟක් වෙත ඔවුහු පැමිණියහ. එහි වැල්ලේ එක් තැනක මිනිසකු ගේ පා සටහනක් ඔවුනට දක්නට ලැබුණි. තම සගයන් ගඟ අසල නවත්වා තනිව පිටත් වී ගිය හැන්ස් ආපසු පැමිණියේ සතුටු දයක පණිවිඩයක් රැගෙනය. තව සැතපුම් කිහිපයක් ගිය විට ගං මෝයක් අසල පිහිටා තිබෙන ගම්මානයක් ගැන ඔහුට දැන ගන්නට ලැබී ඇත.

එදින දහවල් කෑම ගත් ඔවුහු මහා ගස් සෙවණකට වී හිඳගෙන සිටියහ. හැන්ස් නාලිනි සහ නිල වෙතට හැරුණේය. "ඒ ගම්මානෙ ඔබ දෙන්නට පදිංචි වෙන්න තැනක් සොයා ගන්න අමාරු වෙන එකක් නැහැ. හෙට මං ඔබ ඒ ගම්මානය කිට්ටුවට ගිහින් ඇරලන්නම්. එහි කාටවත් ඔබ ගැන කිසිවක් දැනගන්ට පිළිවෙළක් නැහැ. ගම කිට්ටුවට ගිහින් ඇරලපුවාම එතැන ඉඳන් ඔබ කැමැති තැනකට ගිය හැකි නොවැ. එතැන සිට දිගටම ගෙවල් තියෙනවා. එඩ්මන්ට්! ගැස්පා! ඔබ දෙන්නාටත් ඒ විදියටම ඕනෑ තැනකට යන්නට පුළුවනි නොවැ."

"ඇයි ඔබ අපිත් එක්ක එන්නේ නැද්ද?" යි එඩ්මන්ට් ඇසීය.

ගැස්පා කිසිවක් නොකියා හැන්ස් දෙස ඉතා ඕනෑ කමකින් බලා සිටියේය. ඔවුන් ගේ වන සංචාරය නිම වූ විට හැන්ස් කුමක් කරන්නේ ද යන්න ගැන එඩ්මන්ට් සහ ගැස්පා නිතර පාහේ සාකච්ඡා කළහ. එහෙත් හැන්ස් සමග ඒ ගැන වැඩි යමක් ඔවුහු කතා නොකළහ. එය හැන්ස් විසින්ම තීරණය කළ යුතු දෙයක් හෙයිනි.

"අපිත් එක්ක යමු හැන්ස්!" යි එඩ්මන්ට් ඉල්ලා සිටියේය.

හැන්ස් හිස වැනුවේය. "මෙහි එන අතර මා ඒ ගැන බොහොම දේ කල්පනා කළා. අද මා අර කඳු මුදුනට නැංග වේලාවේ ඒ නැවත් මුහුදත් දැක්කාම මට හිතුණා මගේ රටට ආපසු ගිහින් මගේ මිනිසුන් හමුවෙන්ට ඕනෑ කියල. නමුත් මට එහි ගියොත් වෙන්නේ යුද්ද හමුදවට බැඳිලා නොයෙක් ජාතීන්ට අයත් රටවල් කොල්ල කන්නට හවුල් වෙන්නටයි. එවැනි නින්දිත දේවල්වලට මම කැමැති නැහැ."

"ඇයි ඔබ කැමැති නැද්ද ඔබගේ දෙමාපියන් බලන්ට?" යි එඩ්මන්ට් ඇසීය.

Scanned with CamScanner

''ඔව්, විසේසයෙන් මගේ අම්මා බලන්ට මා හරිම ආසාවෙන් ඉන්නෙ. නමුත් දැන් ඔවුන් මා ගැන හැම බලාපොරොත්තු-වක්ම අතහැරලා බොහොම කල් ඉකුත් වෙලා ඇති. මා වැඩ කරපු නැව් සමාගම දන්වල ඇති නැවේ හිටපු ඔක්කොම මිනිස්සුත් සමග නැව මුහුදු බත් වුණු බව.''

''ඇයි හැන්ස් ලියමනක් නොලියන්නේ? එතකොට ඔබට පුළුවන් නොවැ ඔබ ජීවතුන් අතර ඉන්න බව ඔබේ අම්මාට දන්වන්න'' යි නාලිනී කිවාය. ''එඩ්මන්ට්ට පුළුවන් නොවැ ඒ ලියමන අරන් යන්නට. ඔබ එහෙම කළොත් ඈට ලොකු සැනසිමක් ලැබේවි.''

''නැහැ නාලිනී. දැන් ඔය තියෙන හැටියටම කරුණු සිදු වුණාවේ. මා නැති වුණු එක ගැන ඔවුන් තුළ ඇතිවුණු දුක දැන් බොහෝ දුරට තුනී වෙලා ඇති. ඉතින් ලියමනක් යැව්වොත් ඔවුන් යළිත් මා ගැන බලාපොරොත්තු ඇතිකර ගනීවි. ඉතින් ඒ බලාපොරොත්තු නැති වෙන්නටත් පුළුවනි. එතකොට ඔවුන් නැවතත් මා ගැන දුක් වෙන්නට පටන් ගන්නවා.''

''උඹ මහ හිතුවක්කාරයෙක් හැන්ස්'' යි ගැස්පා කීවේය.

''ඔව්, එච්චරයි මට කියන්ට පුළුවන්. නමුත් ඔබ අපට අපේ ජීවිත තිබෙන තාක් අමතක නොවන කෙනෙක් බවට පත්වුණා. අප ප්‍රාර්ථනා කරනවා නැවතත් ඔබ අපට හමුවේවා කියා.''

එදින හවස ඔවුහු එළිමහන් තැනකට අවුත් නිධන් වස්තු මල්ල ලිහා ඒවා එළියට ගත්හ. ගැස්පා සහ එඩ්මන්ට් එක සමාන කොටස් හතරකට නිදන් වස්තු බෙදුවෝය.

''නාලිනී ඕනෑ ගොඩක් තෝරා ගන්න ඉස්සරවෙලා'' යි ගැස්පා සහ එඩ්මන්ට් ඇගෙන් ඉල්ලා සිටියෝය.

''ඇයි? ඔය වස්තුවට මට කිසිම අයිතිවාසිකමක් නැහැ නොවැ. ඒවා අයිති ඒවා සොයා ගත්තු අයට පමණයි'' යි නාලිනී කීවාය.

''එහෙනම් මේ ඔක්කොම අයිති හැන්ස්ට'' යි ගැස්පා කීවේය.

නාලිනී කිසිම දෙයක් නොපිළිගත්තාය. එහෙත් ඔවුන් ගේ බලවත් පෙරැත්තය නිසා, විශාල දියමන්තියක් සහිත මාලයක් ගෙන ඈ කරේ පැළඳ ගත්තාය.

රන් කාසි කිහිපයකුත් නොකපන ලද මැණික් ගල් කිහිපයකුත් ගන්නා ලෙස ඔවුහු නිල ගෙන් ඉල්ලා සිටියහ. නාලිනීත් ඔහුත් අලුතෙන්ම ජීවිතය ඇරඹිය යුතු බැවින් ඔවුනට මුදල් අවශ්‍ය බව ඔවුහු පෙන්වා දුන්හ. මේ වස්තුවෙන් ටිකක් විකුණා ඔවුනට පදිංචියට තැනක් සොයා ගත හැකි බව ඔවුහු කියා සිටියහ.

හැන්ස්ට ලැබුණු කොටස ඔහු ප්‍රතික්ෂේප කළේය. ''මේ මහ කැලේ ඕවායින් මට ඇති වැඩේ මොකක්ද?'' යි ඔහු කීවේය.

''කාටද කියන්ට පුළුවන් වැඩක් වෙයිද නොවෙයිද කියලා. කවද හරි ඔබට මේවා උවමනා වෙන්ට පුළුවනි. ඔන්න අපි එහෙම ඔය ගොඩ අරන් යන්නේ නැහැ'' යි එඩ්මන්ට් කීවේය.

ගැස්පා සහ එඩ්මන්ට් මුව සම්වලින් තනාගෙන තිබුණු මලුවලට ස්වකීය කොටස් දමා ගත්හ. හැන්ස් තමා ගේ කොටස අසල වූ ගස් බෙනයකට දැමුවේය.

නිල, ගැස්පා සහ එඩ්මන්ට් ගමන් කරන්නට වූහ. නාලිනී හා හැන්ස් ඔවුන් පසු පස ගියහ.

''හැන්ස් එන්න අපත් එක්ක යන්න'' යි නාලිනී ඔහු ගෙන් බැගෑපත්ව ඉල්ලා සිටියාය. ''මා හිතන්නේ නැහැ ඔබ සදකල්ම මේ වනයේ ජීවත් වෙයි කියල.''

''මා දන්නේ නැහැ නාලිනී. කොතරම් අවුරුදු ගණනක් මේ මහ වනයේ මා ඉඳී ද දන්නේ නැහැ. එච්චරයි මට කියන්ට පුළුවන්. මට ඒ තරම් මහ වනය පුරුදු වෙලා. මට හිතෙනවා මේ වනය අතහැරලා මගේ රටට ගිහින් මට ජීවත් වෙන්න බැහැ කියල. මගේ මිනිසුන් අතරට ගියාම ඔවුන්ගේ රණ්ඩු දබරවලටයි යුද්දවලටයි මට එක් වෙන්න බැහැ. ඊට වැඩිය දහෙන් සම්පතයි මේ වනයේ ලැබෙන සැනසීම.''

''ඇයි හැන්ස් ඔබ එහෙම කතාකරන්නෙ? මට හරි දුකයි ඔබ ගැන.''

''මා මේ වනයට ඇතුළු වෙන කොට මට වයස දහතරක්වත් නැහැ. මේ වනයේ දී මට මුහුණ පාන්නට වුණු ගැහැට අපමණයි. එහෙත් වනය කෙරෙහි මගේ ඇල්ම එන්ට එන්ටම වැඩි වුණා. මා දැන් හය අවුරුද්දක් වනයේ ජීවත් වෙලා තියෙන බව ගැස්පාලා කියනවා. ඔවුන් මට හමුවෙන කල් මා දැන සිටියේ නැහැ මා වනගත වෙලා කොපමණ කලක් ද කියල. දැන් මා තනි වුණාම නැවතත් මට කාලය අමතක වෙලා යනවා.''

''අයියෝ හැන්ස්!'' යි නාලිනී බියපත් එකියක මෙන් කීවාය. ''මේ මහ වනය ඔබේ ඇට කටුවලටත් කා වැදිලා තියෙනවා.''

''මාත් හිතන්නෙ එහෙම තමා.''

''ඔබ දැන් මොකද කරන්නේ? ඔබ නැවතත් වැද්දන් ළඟට යනවද?''

''ටික දවසකට යන්න ලැබෙන්නේ නැහැ. ඔබලා ගැන කල්පනා කරමින් මා මහ වනේ ටික දවසක් ඇවිදිනවා.''

''ඔබට හරිම පාළුවක් දැනෙයි නේද?''

''ඔව්, නමුත් කුස ගින්න නිවාගන්න දඩයම් කරන්න සිදු වෙනවා. වන සතුනුයි, කුරුල්ලොයි මහ රුක්ස ගසුයි තියෙන තුරු මේ මහ වනයේ මට පාළුවක් දැනෙන්නේ නැහැ.''

ඉක්බිති හැන්ස් නාලිනිය ගේ අතින් අල්ලා ගෙන සිය සගයන් කිට්ටු කිරීමට යුහුසුලු විය.

Scanned with CamScanner

# 17

## තිය්ගලා අලය්

පසු ද උදේ හැන්ස් ඇතුළු කණ්ඩායම ඔවුන්ගේ ගමනෙහි අවසානය දකිමින් ගමන් කළහ. ගම් කුකුළකු හඬලන හඬ ඔවුනට ඇතින් ඇසුණි. හැන්ස් හැර අන් හැමෙකකුගේම සිතෙහි අමුතු ප්‍රීතියක් ඇති වන්නට විය.

''මෙන්න මෙතැන දී තමයි අපි වෙන් වෙන්නේ'' යි හැන්ස් කීවේය. ''ඔබට දැන් තියෙන්නේ මෙන්න මේ අඩි පාර දිගේ යන එක පමණයි. ටික දුරක් ගියාම ගම්මානය හමුවෙයි.''

හැන්ස් මෙසේ කියනවාත් සමගම හදිසියේ අසලින් අතු සෙලවෙන හඬක් ඇසුණි. ඔහු පහත් වී අකුල් යටින් එබී බැලුවේය. කුඩා මුව පොව්වකු වැනි සතකු අකුල් අතරින් රිංගමින් ඔවුන් දෙසට එනු හැන්ස්ට දක්නට ලැබුණි. ඔහු දුන්න සූදනම් කළේය. ඒ බල්ලකු බව ඔහුට පෙනුණි. මේ සෙල්ලා ගේ බල්ලා නොවේදැයි ඔහු ඌ දුටු සැටියේම හැඳින ගත්තේය. එද තමා නාලිනී ඔසවා ගෙන එද්දී තමා සමග වැදි ලෙණට ආ මේ බල්ලා රනී සමග ඉතා කුලුපගව ජීවත්වුණු බව හැන්ස් දන්නේය. ඌ කිසි විටෙකත් රනී අත් නොහැරියේය.

හැන්ස් අසලට පැමිණි බල්ලා ඔහු ඉව කොට කෙඳිරි ගාමින් ආපසු බලන්නට විය. බල්ලා කෙඳිරි ගාමින් හැන්ස් දෙසත් තමා පසු කොට ආ මඟ දෙසත් බලන්නට විය. ඌ කුමක්දෝ හැන්ස්ට ඇඟවීමට තැත් කරන්නාක් මෙන් හැසිරෙන්නට විය.

''මොකද මේකෙ තේරුම?'' යි හැන්ස් කල්පනා කළේය. ''මට ඌ පස්සෙන් එන්ට කියනවා වගේ. ඔබ ගම්මානයට යන්න. මා බල්ලා එක්ක ඌ කැමැති වන දිහාවකට යන්නම්.'

''අපිත් එනවා'' යි ගැස්පා තීරණාත්මකව කීවේය.

''සමහර විට මෙය බොහෝ දුර ගමනක් වෙන්ටත් පුළුවනි. ඔබ හතර දෙනා යන්න. මා ගිහින් බලන්නම් බල්ලා මොකද කියන්නේ කියල'' යි හැන්ස් කීවේය.

''බැ, බැ. අපිත් එන්ටම ඕනැ ඔබත් එක්ක'' යි එඩ්මන්ට් ස්ථිරවම කීවේය.

''එතකොට නාලිනී? ඇට මේ හැටි මේ කැලේ ඇවිද්ද හැකිද?''

''අයියෝ නැහැ. මට දැන් කැලේ හොඳට පුරුදුයි'' යි නාලිනී කීවාය.

Scanned with CamScanner



බල්ලා පසු පස ගමන් කළ ඔවුනට බිම වැටී සිටි තරුණියක්
ඇස්නට ලැබිණි

''හොඳයි, එහෙනම් යමු'' යි බල්ලා පසු පස යාමට නො-ඉවසිල්ලෙන් සිටි හැන්ස් කීවේය. ''සමහර විට අප හිතනවාට වඩා ළඟ වෙන්ටත් පුළුවනි. හුඟක් දුර නම් ඔබට ආපසු එන්ට බැරියැ.''

තමා තේරුම් ගැනීම ගැන සතුටට පත් බල්ලා පෙරටුවෙන් ගමන් ගත්තේය. බල්ලා ගේ ගමන ඔවුන්ගේ ගමනට වඩා ඉක්මන් විය. මිනිසුන් කණ්ඩායම පසු වූ විට බල්ලා ඔවුන් එනතෙක් නැවති බලා සිටියේය. හැන්ස් සහ එඩ්මන්ට් පෙරටු-වෙන් ගමන් කළෝය. නාලිනී මැදි කොට ගත් නිල සහ ගැස්පා පිටු පසින් ගමන් කළෝය. සැතැපුම් පහක් පමණ ගමන් කළ ඔවුහු, අන්තිමට ඔවුන්ගේ ගමනේ දී අවසාන නවාතැන පිහිටි තැනට පැමිණියෝය. එහි බිම වැටී සිටි තරුණියක් ඔවුන්ට දක්නට ලැබුණි. ඈ අන් කිසිවකු නොව රනි වූවාය. ඇගේ ප්‍රාණය නිරුද්ධ වී ඇති බවක් පෙනෙන්නට තිබුණි. ඇය අසල ඇගේ පොරොවත් වියලි මුව මස් කැබැලි කිහිපයක් සහ හැන්ස් විසින් ඇට සාදා දෙන ලද මුව සම් බෑගයත් විය. මේ බෑගය අහුලා ගත් එඩ්මන්ට් නිකමට මෙන් ඊට අත දැමුවේය. ඔහු එය තුළින් අල ගෙඩියක් එළියට ගත්තේය.

''මොකක්ද මේ අලේ ?'' යි එය අත්ල උඩ තබා ගත් එඩ්මන්ට් ඇසුවේය.

එය දුටු හැන්ස් ගේ දෙබැම භීතියෙන් රැළි ගැසුණේය. මුහුණ මැලවී ගියේය.

''මොකක්ද ඒ හැන්ස්?'' යි නාලිනී ඇසුවාය.

''නියහලා අලයක්. කැලේ තිබෙන විසවලින් මාරක විස වර්ගය තමා ඒ'' යි හැන්ස් කීවේය.

''ඉතින් මේකෙන් ඇයට ඇති වැඩේ මොකක්ද?'' යි ඔවුහු කල්පනා කරන්නට වූහ.

ගැස්පා කතා කළේය. ''මට දැන් තේරෙනවා මේකෙ අදහස මොකක්ද කියල. ඈ අප පස්සෙන්ම ඇවිත් තියෙනවා. අපි නවාතැන් ගත් තැන්වලම නැවති නැවතී ඈ ඇවිත් තියෙනවා අපව හමුවෙන්න. ඈ හිතන්න ඇති හැන්ස් ඇය අවසානයට දමා යයි කියලා. ඒ බය නිසා තමයි ඈ මේ විදියට පස්සෙන්ම ඇවිත් තියෙන්නේ. ඈ තීරණය කරන්ට ඇති ඔබ හමු නුවූවොත් සිය දිවි හානි කර ගන්ට'' යි ඔහු හැන්ස් වෙත හැරෙමින් කීවේය.

''මට තේරුම් ගන්ට බැහැ ඇයි ඒ විදියට ඈ කල්පනා කළේ කියල'' යි හැන්ස් මහත් දුක් බර හඬකින් කීවේය. ''මා එද එන

කොට මා ඇට කිව්වා මා නොවරදවාම ආපසු එන බව'' යි හැන්ස් ගේ දෙනෙතින් කඳුළු බිඳු කඩා වැටුණේය.

''නමුත් ඈ මේ වතාවේ දී හිතන්ට ඇති ඔබ ආපසු එන එකක් නැහැයි කියල. ඈ ඔබ එන තෙක් කොහේ හෝ නැවතිලා ඉන්ට තීරණය කරන්ට ඇති. ඔබ නාවොත් මේ අලය කාල දිවි හානි කරගන්ට තීරණය කරන්ට ඇති'' යි කී ගැස්පා අල ගෙඩිය බිම දැමුවේය. ''නමුත් ඈ එය කාලා නැහැ. ඉතින් කොහොමද ඈ මළේ?''

''ඒක තමා මෙතැන තියෙන ගැටලුව ගැස්පා'' යි හැන්ස් කොඳුළේය. ''සාමාන්‍යයෙන් මේ අල බහින්නෙ දෙක දෙකයි. සමහර විට මේකෙ අනෙක් අලේ ඈ කෑවද දන්නේ නැහැ.''

දිනක් හැන්ස් විසින් ඇට ගෙන ගොස් දෙන ලද නියගලා මල දැක ඈ බියෙන් ඉවත ලූ සැටි ඔහුට සිහි විය. නාලිනී ගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙන්නට විය.

ගැස්පා, එඩ්මන්ට්ට සහ නීලට සංඥාවක් කළේය. ඔවුහු ඔවුනට සොයා ගත හැකි වූ ලී උල් ආදියෙන් වළක් කැපුවෝය.

වළ කපා අවසන් කළ ඔවුහු හැන්ස් දෙස බැලුවෝය. හැන්ස් රනී ගේ සිරුර එසවීමට සිය දෑත් ඇගේ ඇඟ යටින් දැමුවේය. ඔහු ඇගේ සිරුර ඔසවා සැණෙකින් බිම අතහැර ඉවතට පැන්නේය. ඇගේ සිරුර යට සිටි පොළඟෙක් ඒ සමගම ඔහු වෙත ගසා පැන්නේය. හැන්ස් ඉවත පැන උගෙන් බේරුණේය. පොළඟා ඉවතට ඇදෙනවාත් සමගම හැන්ස් සිය පොරොවෙන් උගේ හිස පොඩි කළේය.

රනීට සිදුවී තිබෙන දේ කාහටත් පැහැදිලිය. රනී ගේ සිරුර අනෙක් පසට පෙරළූ ඔවුනට පොළඟා ගේ දත් පහරවල් ඇගේ සිරුරට කාවැදී තිබෙන හැටි දක්නට ලැබුණි. රාත්‍රියෙහි ඈ මෙතැන නිදා සිටිය දී පොළඟා ඇගේ උණුසුමට ඇඟ යටට රිංගා ගන්නට ඇත. රාත්‍රියෙහි ඈ නින්දෙන් සෙලවීමක දී ඌ ඇට දෂ්ට කරන්නට ඇත.

''අර බලන්න! ඈ හුස්ම ගන්නවා නේද?'' යි නාලිනී කෑ ගැසුවාය.

සියල්ලෝම රනී වෙත නැඹුරු වී පරීක්ෂාවෙන් ඇය දෙස බලා සිටියහ. නාලිනී කීවේ ඇත්තකි. ඇගේ ආශ්වාස ප්‍රශ්වාස කිරීම ඉතාමත් දුර්වල වී තිබුණි. යමකුට, ඈ හුස්ම ඉහළ පහළ හෙළනවා ද කියා දැන ගත හැක්කේ ඉතා පරීක්ෂාවෙන් බලා සිටියොත් පමණි. වරක් නවතිමින් ද වරෙක යළි පණගැන්-වෙමින් ද හුස්ම ඉහළ පහළ වන්නට විය. ඇය තුළ තවමත් පණ

Scanned with CamScanner

තිබෙන බවට සැකයක් නැත. ගැස්පා රනී ගේ අත අල්ලා නාඩි පිරික්සන්නට විය. "මට දැනෙනවා ඇගේ නාඩි වැඩ කරනවා වගේ" යි හේ කීවේය.

"මං හිතන්නෙ හැන්ස් ඇය බිම දැමූ නිසා ඇතිවුණු ගැස්සීමෙන් ඇගේ හදවත ක්‍රියාකරන්නට පටන් ගන්න ඇති" යි එඩ්මන්ට් කීවේය.

"දෙවියන්ට පින් සිද්ද වේවා!" යි ගැස්පා සුසුම් ලෑවේය.

"අයියෝ අපි ඇ වැළලුවා නම්!" යි නාලිනී බියෙන් වෙව්ලමින් කීවාය.

"පොළඟා නොසිටින්නට ඒක තමා වෙන්ට තිබුණේ. ඒ අතින් අපි උඹට ණය ගැතියි" යි එඩ්මන්ට් කීවේය.

හැන්ස් කිසිදු කතා බහක් නැතිව දුක්බර මුහුණින් යුතුව රනී ගේ මුහුණ දෙස බලා සිටියේය.

"හැන්ස්, ඇයට සුවය ලැබේවි" යි ගැස්පා ඔහු සැනසුවේය.

"ඔබ දුටුවා නොවැ දත් වැදිලා තියෙන හැටි. ඒවා ඒ තරම් යටට කාවැදිලා නැහැ. සීරිලා ගිහින් විතරයි. සීරුණු තැන් වලින් හොඳටම ලේ ගලලා තියෙන නිසා ඒ හැටි විසක් ඇගේ ශරීර ගත වෙලා නැහැ."

"ඒ වුණත් අපි නාවා නම් ඇ මිය යන්ට තිබුණා. කොයිතරම් විස සහිත සතෙක් වෙන්ට ඕනෑ ද උඹ!" යි කියමින් නාලිනී රනී ළඟින් හිඳගෙන තමාගේ ඉරී ගිය වස්ත්‍රයේ කැබැල්ලකින් ඇගේ ඇඟ පිස ද ඇට පවන් සලන්නට වූවාය.

"ඇට බෙහෙත් කරන්නට විදියක් නැද්ද?" යි නාලිනී ඇසුවාය.

මේ ඇසුණු හැන්ස් වට පිට බැලුවේය. ඔහු, අසල තිබූ ගසකින් පළලැති කොළයක් කඩා ගොටුවක් ගැසුවේය. ඔහු ලබු කැටයෙන් දිය ටිකක් ගෙන කොළ ගොටුවට වත්කොට, ඉකුත් ද කැඩූ මී වදයෙන් මී පැණි ටිකක් ද පෙරා ඊට මිශ්‍ර කොට එය නාලිනී අතට දුන්නේය. ඇ එය ක්ලාන්තව සිටි රනී ගේ තොල් අතරට ටික ටික වත් කළාය. රනී එය ගිලින්නට වූවාය. වරක් දෙවරක් ඇ දිය මුසු මී පැණි ඔක්කාරයෙන් ඉවත දැමූ නමුත් මඳ වේලාවකින් ඉතා ඕනෑ කමින් එය පානය කරන්නට වූවාය. ඇය බලවත් පිපාසයකින් පෙළෙන බව ඔවුනට වැටහුණි. රනී ගේ දෙනෙත් වැසී තිබුණි.

"මා කොහේද මේ ඉන්නේ? මට මොකද මේ වෙලා තියෙන්නේ?" යි ඇ කෙඳිරි ගෑවාය.

"මට හරි නිදි මතයි."

"රනි, මම ඔබ ළඟ ඉන්නවා රනි."

"ඒ මගේ සුදු හූරා ද කතා කළේ?" යි රනි, හැන්ස් අමතන සුපුරුදු නමින් කොඳුළාය. "මං හරි බයෙන් හිටියා බො මාව දමලා යයි කියලා."

"රනි, මා එය කවදවත් නොකරන දෙයක් රනි. ඔය ඇස් දෙක ඇරලා මා දිහා බලන්න, රනි."

"අනේ, මට ඇස් අරින්න බෑ, සුදු හූරා" යි ඈ තතනමින් කිවාය.

හැන්ස් සිය ඇඟිලි තුඩුවලින් ඇගේ ඇසි පිහාටු මැත් කළේය. රනි හැන්ස් ගේ මුහුණ දෙස මඳ වේලාවක් සිය දෙනෙත් රඳවා සිට සිනාසුණාය. ඉක්බිති ඈ නින්දට වැටුණි. ඇගේ හිතවත් බල්ලා ද ඇය අසලින්ම නිදා ගෙන උන්නේය.

"මේ බල්ලා සෙල්ලා ගේ" යි නාලිනි කිවාය. "සෙල්ලා ඔත්පල වෙලා හිටිය දී මූ තමයි දඩයම් කරගෙන ඇවිත් මගේ ජීවිතය රැක්කේ. මේ වතාවේ දී ඌ රනි ගේ ජීවිතය බේරුවා. ඇය මැරෙන්නට යද්දී ඌ හැන්ස් සොයා ගෙන ආ එක නොවැ පුදුමේ!"

මඳ වේලාවකින් ගැස්පා කතා කළේය. "මීට වැඩිය බයානක සිද්දියක් ගැන මා අහලා තියෙනවා. මා එය කිව්වට ඔබ කවුරුවත් විශ්වාස කරන්නේ නැහැ."

"නෑ බලන්ට කියන්නකො" යි එඩ්මන්ට් කීවේය.

"දවසක් මට මිනිහෙක් හමුවුණා. මිනිහා එක පාරටම මට කිව්වා 'මහත්තය දන්නවද මේ ඔබ ඉදිරියෙ ඉන්න මම, එක වරක් මළ මිනිහෙක් බව?' කියල. මේ බව අහපු මාව උඩ ගියා. එතකොට ඔබ අවතාරයක් ද කියල මං ඇසුවා.

"ඒ ගණනකටවත් ගත්තෙ නැතුව ඒ මිනිහා මේ කතාව කියා ගෙන ගියා."

"මීට අවුරුදු පහකට ඉස්සර මට නයෙක් ගැසුවා. මට නොයෙක් බේත් කරන්ට පටන් ගත්තා. මහා සැර බෙහෙත් ජාති මගේ නාසයට පිම්බා. විසංඥව නින්දට වැටෙනවාට මගේ ඇස්වලට ගම්මිරිස් කුඩු දැම්මා. ඒවා ඇහුවෙ නැහැ. ටික වේලාවක් ගියාම මට මළාක් මෙන් සිහිය නැතුව ගියා. ඊට පස්සෙ කොපමණ වෙලා ගියා ද මා දන්නේ නැහැ. මට යාන්තම් ඇහුණා හාමුදුරු නමක් මතක බණ කියනවා. එත-කොට මට දනුණා මා පෙට්ටියක් ඇතුළේ ඉන්න බව. මට හරියට බය හිතුණා. මම දඟලන්නට පටන් ගත්තා. පෙට්ටිය සෙලවෙනවා දැකලද කොහේද මාව විගහට එළියට ගත්තා. මේ සහතික ඇත්ත මහත්තයා.' ඔන්න ඔය විදියටමයි මිනිහා ඒ කතාව කිව්වේ."

"මේ කතාව ඇත්ත බව මිනිහගෙ මළ ගෙදරට ගිය මිනිහකු ගෙන්ම දැන ගන්ට ලැබුණා" යි ගැස්පා කීවේය.

නිල හිඳගෙන හුන් තැනින් නැගිට ගොස් ඔවුන් විසින් සාරන ලද වළ වහ වහා වසා දමන්නට විය. රනී අවදිවන්නට පෙර එය වසා දැමීමට සියල්ලෝම වෙහෙස ගත්හ.

වරින් වර රනීට අවදිව සිටීමට ඔවුහු සැලැස්වූහ. ඔවුහු ඇය හිඳුවා මී පැණි ආදිය කන්නට දුන්හ. මඳක් එහාට මෙහාට සක්මන් කරන්නට සැලැස්වූහ.

පසු ද උදෑසන ඇයට හොඳ සනීපයක් දැනෙන්නට විය. එහෙත් ඇගේ හන්දිපත්වල වේදනාව බලවත්ව තිබුණි.

තෙදිනකට පසු රනීට ගමන් කිරීමට තරම් සුවයක් ලැබුණි. එදින උදෑසන ඔවුහු වෙන්වීමට තීරණය කර ගත්හ. හැන්ස් සහ රනී මහ වනයටත් ගැස්පා ඇතුළු කණ්ඩායම මුහුදු බඩ ගම්මානය කරාත් යාමට සූදානම් වූහ. ගැස්පා ඇතුළු කණ්ඩායම ඔවුන් සමග ගම්මානයට යන්නට එන ලෙස හැන්ස්ටත් රනීටත් ඇවිට්ලි කළහ. එහෙත් ඒ අදහස ගැන සිතන්නටවත් රනී රුචි නොකළාය.

එය ඉතා දුක්බර වියෝගයක් විය. එහෙත් සිදු වූ දුක් විපත් අවසන්ව මෙසේ වෙන්වී යාමට සිදුවීම ගැන සිතන ඔවුන්ට ලැබුණේ එක් විදියක සැනසීමකි.

Scanned with CamScanner

18

# වන සොළවර

නාලිනි ඇතුළු ඒ සිවුදෙන මහ වනය කෙළවරට පැමිණියහ. ඔවුන් ඉදිරියේ ගම්මානයක් විය. මැටි ගසා අතු සෙවිළි ගෙවල් අතර හොඳින් තැනුණු ගොඩනැගිල්ලක් තිබෙනු ඔවුනට දක්නට ලැබුණි. එහි ඉදිරිපස තොරණාකාර බිත්තියේ ශුද්ධ හුනු ගා තිබුණි.

''අර ගොඩනැගිල්ල දිහා බලන කෙනකුට එය පෙනෙන්නේ දෙව් මැදුරක් වගේ'' යි ගැස්පා කීවේය.

''එය දෙව් මැදුරක් නම් කිසිම අඩමානයක් නැතිව අප පිළිගනිවි. ඔබ ඔහොම ඉන්න ටිකක්. මං ගිහිං බලලා එන්නම්'' යි කී ගැස්පා පිටත් විය.

එය දෙව් මැදුරක් විය. ගැස්පා එහි බරාඳයට ගොඩ වී ඇතුළට විවෘතව තිබුණු දොරෙන් එබී බැලුවේය. යාච්ඤා පොත දිග හැර අත උඩ තබාගෙන අල්තාරය ඉදිරියේ සිට ගෙන සිටි පූජකවරයෙක් ඔහුගේ දෙනෙතට ලක් විය. ඔහුගේ දෙඋර පුළුල්ය. දේහය උසය. පූජක තුමා පිටු පස හැරී බැලුවේය. ගැස්පා දුවු ඔහු වහා ඔහු වෙතට ආවේය.

මඳ වේලාවක් යන තෙක් ඔවුන් දෙදෙනාට ඔවුනොවුන්ගේ දෙනෙත් අදහාගත නොහැකිවාක් මෙන් ඔවුනොවුන්ගේ මුහුණු දෙස බලාගත් වනම සිටියහ.

''ගැස්පා!''

''ඩේමියන් පියතුමනි!''

දෙදෙනා ගේ අත් තරයේ එකිනෙක වැළඳ ගති.

''මේක නම් පුදුමෙනුත් පුදුමයක්. මට ඔබ මේ විදියට මුණ ගැසෙයි කියලා මා සිහිනෙකින් වත් සිතුවේ නැහැ.''

''මටත් එහෙම තමා.''

ගැස්පා ගේ වැරහැලි ඇඳුම් දෙසත් දිගට වැඩුණු රැවුල සහ හිස කෙස් දෙසත් පූජකතුමා කුතුහලයෙන් යුතුව විපරම් කරන්නට වූයේය.

''හිතවත, මොකද ඔබ මේ ඇඳගෙන ඉන්න ඒවායේ හැටි?''

''මා මේ එන්නේ ඉතා දිග මහ වන මග ගෙවා ගෙනයි.''

''හැබෑට! මට ඒ ගැන විස්තර කරන්න. නෑ නෑ මෙතන බැහැ, එන්න යන්න මාත් එක්ක.''

''මගේ තව යාළුවො කීප දෙනෙක් අර වන කෙළවරේ බලා ඉන්නවා. අපි බොහොම දුරක් ගෙවා ගෙනයි මෙහාට ආවේ. ඔබට පුළුවන් ද අපට මෙහේ නවාතැන් දෙන්ට ?''

''මොනවද ඔබ මේ කතා කරන්නේ! කෝ ඒ ගොල්ල? මා ඔවුන් ඉන්න තැනට එක්ක යන්න.''

''මේ තමා මා ඔබට කලින් විස්තර සඳහන් කළ ඩේමියන් පියතුමා'' යි ගැස්පා, නාලිනි ඇතුළු පිරිසට පියතුමා හඳුන්වා දුන්නේය.

මඩ දූවිලිවලින් තැවරී, වීඩාවට පත් වී සිටි මොවුන් දෙස පියතුමා විස්මයෙන් බලා සිටියේය.

''ඇත්තටම අපූරු නඩයක් නේද?'' යි ඔහු සිනා සෙමින් කීවේය. ''දරුවා, ඔබට බොහොම තෙහෙට්ටු බව පෙනෙනවා'' යි පියතුමා නාලිනි දෙස බැලුවේය.

''එන්න ඔක්කොම මාත් එක්ක යන්න'' යි හෙතෙම ඔවුන් කැටුව දෙව් මැදුර වෙත යන්නට විය.

දෙව් මැදුර අසල පිහිටි කුඩා පොල් වත්තක කටු මැටි ගසා අතු සෙවිළි කරන ලද සිය කුඩා ගෙය වෙත පියතුමා ඔවුන් කැටුව පිවිසියේය. ඉඩකඩ ඇති අන්දමට ඔවුනට වාඩිවීමට සැලැස්සූ පියතුමා කෑම ටිකක් පිළියෙල කරන ලෙස සිය සේවකයා මෙහෙය වූයේය.

''අපි ඉස්සර වෙලා වැවර ගෙඩියක් බොමු. ඔබට බොහොම තිබහ ඇති නොවැ'' යි කී පියතුමා කොලුවකුට කතා කොට වැවර ගෙඩි කිහිපයක් කඩාගෙන එන ලෙස කීවේය. කොලුවා පොල් අත්තකින් කොළ කිහිපයක් ගළවා ගෙන එය අඹරා ඉන් වළල්ලක් තනා එය දෙකකුල්වලට දමා ගෙන වඳුරකු මෙන් ගසකට නගින්නට වූයේය. ඔහු හොඳ වැවර වල්ලක් තෝරා ගෙඩි එකින් එක නෙළා බිම හෙළුවේය.

ඔවුහු සුමිහිරි වැවර බීවෝය. ගෙඩිවල පහටියෙන් ගසා ගත් ලෙලි පෙතිවලින් ඒවායේ ලොඳ ද සූරාගෙන කෑහ. කුරුම්බා සංග්‍රහය විඳීමෙන් සිය සුදුම අමුත්තන් අමුතු පණක් ලද බව පියතුමාට පෙනුණි. පියතුමා ඔවුන් පිළිබඳ තොරතුරු ඇසීමට හරි බරි ගැහී වාඩි ගත්තේය.

''ඉතින් ගැස්පා කියන්න ඔබ ගැන සියලු තොරතුරු'' යි පියතුමා ගැස්පා දෙස ඕනෑ කමින් බලමින් කීවේය. ''මා හිතා ගෙන හිටියේ කොළඹ සතුරන් අතට පත් වුණායින් පසුව අනෙක් අය වගේ ඔබත් ඉන්දියාවට යවන්න ඇති කියල.''

"ඊට ඉස්සර වෙලා මං ඕලන්දක්කාරයන් ගෙන් බේරිලා ගියා."

"එහෙනම් මේ තරම කාලයක් ඔබ කොහේ ද හිටියේ?"

"කන්ද උඩ රට සිංහලේ රජු ගේ රාජ සේවයට බැඳී හිටියා."

"මොනවා? එහි සිටි හැම දෙනා ගෙන් ඔබ විතරයි ඒ?"

ගැස්පා සිනා සුණේය. "ඔව් මා රජු යටතේ සේවය කළා. මේ ඉන්න මගේ මිත්‍ර එඩ්මන්ට් වැන් ස්ටියර්වෙල්ට් ද මා සමග රාජ සේවයේ හිටියා."

"ඕලන්ද ජාතිකයෙක්?" යි ඇසූ පූජක තුමා මහත් ඕනෑකමින් ඔහු දෙස බලා සිට නාලිනී වෙත හැරුණේය.

"එතකොට මේ රූමත් නෝනා?" යි ඔහු විමසුවේය.

"ඇය රජතුමා ගේ ලේලි. මේ තරුණයා ඇගේ මස්සිනා" යි ගැස්පා නිල වෙත අත දිගු කර කියේය.

"ඉතින් කොහොම ද දෙවියනේ ඔබ හැම දෙනා මෙහෙම එකතු වුණේ? ඔබගේ හැටියට ඔබ දවස් ගාණක්ම මහ වනේ ගත කොට තිබෙන හැඩයි පේන්නෙ."

"ඒක ඇත්තයි පියතුමනි" යි ගැස්පා කිය. "මීට මාස දෙක-කට උඩ දී අපි සිටියේ කන්ද උඩ රට."

"ඉතින් ඔබ එක් වී මෙහෙම නඩේ හැදිලා ආවා? ඉතින් ඔබ එන තෙක් රජතුමා මොනවද කළේ?"

"නෑ නෑ, අපි එකට හමුවුණේ මහ වනේ දී. එක් එක් දිහා-වෙන් ඇවිත්, වෙන වෙන දවස්වල දී තමයි අපි එකට හමුවුණේ."

ඩේමියන් පියතුමා මහත් පුදුමයෙන් ඔවුන් දෙස බලන්නට විය. "මට ඔබ කියන දේ මොකුත් තේරෙන්නේ නැහැ. මා හිතන්නෙ ඔබට මොකුත් කන්නට සලස්වලා ටිකක් විඩා හැරියාට පස්සේ ඊ කෑමත් අරගෙනම කතා කරන එක වඩා හොඳයි කියල. එතකොට මට මුල හිටන්ම මේ ගැන දැන ගන්ට පුළුවනි."

ඉක්බිති ඔහු නැගිට කුඩා කාමරයකට ඇතුළු වී පෝච් වයින් බෝතලයක් සහ කුඩා වීදුරු දෙකක් ද රැගෙන ආවේය. "අපි මේ පුදුම හමුවීම ගැන ප්‍රීතිවෙමු. මෙන්න ඉස්සර වෙලා ඔබට පොඩ්ඩක්" යි කී පූජකතුමා බෝතලයෙන් ටිකක් වීදුරුවකට වත්කොට නාලිනීට පිළිගැන්නුවේය. නාලිනී එය පිළිගැනීමට මැලිවූවාය. "හා හා, ඒකට කමක් නැහැ. ගන්න! ගන්න! මේක ඇඟට බොහොම හොඳයි" යි කී පියතුමා වයින් ස්වල්පයක් ගන්නා ලෙස ඇට පෙරැත්ත කළේය. නාලිනී එය පිළිගත්තාය.

"මෙන්න ඊළඟට ඔබට" යි ඔහු මඳක් වැඩිපුර වත් කොට නිල අතට දුන්නේය.

ඉක්බිති බෝතලය සෙසු අයගේ අතින් අතට හුවමාරු වන්නට විය. එඩ්මන්ට්, ගැස්පා සහ ඩේමියන් පියතුමාත් වරින් වර හිතේ හැටියට බොමින් බෝතලය හිස් කළෝය.

''ෂා, මේක තමා බීම!'' යි ගැස්පා සිය දෙතොල ලෙවකමින් කීවේය. ''මට එය පාතුගාලය සිහි කරවනවා. මේ පාළු පිටිසරට ඔබ තුමා කොහොමද මේවා ගෙන්වා ගන්නේ?''

''ආ, අපට ඒවාට මාර්ග තියෙනවා'' යි පියතුමා කීය. ''ඒත් මා ළඟ වයින් ගබඩාවක් පුරවලා තියෙනවා කියල හිතන්න එපා! හැබැයි, ඕලන්ද නැව්වලින් එහෙම නොවෙයි මේවා ගන්නේ'' යි ඔහු එඩ්මන්ට් දෙස බලා සිනා සෙමින් කීවේය. ''ඒ ගොල්ල දන්නේ නැහැ මා මෙහේ ඉන්න බවක්.''

''දැන් ඉතින් සුරුට්ටුවක් බොන එක හොඳ නේද?'' යි කී පියතුමා කළු සුරුට්ටු දෙළහකින් යුත් මිටියක් නූල කඩා දිග හැර සිය අත්ල උඩ තබා අමුත්තන්ට ඇල්ලුවේය. නීල දුම් නොබොන බැව් කීවේය. ගැස්පා සහ එඩ්මන්ට් මහත් ආසාවකින් සුරුට්ටු පිළිගෙන කොලුවකු විසින් ගෙනෙන ලද ගිනි පෙණෙල්ලකින් ඒවා දල්වා ගත්හ. ඔවුහු සැර ගඳ හමන සුරුට්ටු දුම් නිවිහිල්ලේ පිට කරමින් ඒවායේ ප්‍රීතිය භුක්ති වින්දහ. ඩේමියන් පියතුමා ද සුරුට්ටුවක් දල්වා ගත්තේය.

''මා හිතනවා මේ නෝනාට හුහක් තෙහෙට්ටු ඇති කියලා. ටිකක් නිදා ගත්තොත් හොඳ නේද?'' යි කී පියතුමා හිඳගෙන සිටි අසුනින් නැගිට්ටේය.

''ගැස්පා, ඇගේ සැප පහසුව ගැන බලන්නට ඕනෑ. ඕනෑ කරන දෙයක් මගේ වැඩ කාරයින්ට කියල ගෙන්වා ගන්න. මා ගම්මානයට ගිහින් ඇට නිදා ගන්නට ඇඳකුයි ඇතිරිලි දෙකකුයි ඇගේ අත් උදව්වට කෙල්ලකුයි හොයා ගෙන එන්නම්. ඇට ඕන නම් නා ගන්ට හොඳට ආවරණය කරපු ළිඳක් තිබෙනවා. මේ මගේ පුංචි ගේ ඇගේ සැප පහසුවට ඇතිද මන්ද? මේක මට විතරක් හදපු ගෙයක් නොවෑ. නමුත් අපට පුළුවනි ඔය අල්ලපු ගෙදරකින් ඉඩ පහසු කම් ලබා ගන්ට. මෙහේ ඉන්න මිනිස්සු බොහොම කරුණාවන්තයි.''

ඩේමියන් පියතුමා ගේ පුදුම අමුත්තන් ගැන ඇසූ ගම්මු එහි රොක්වන්නට වූහ. මේ ගම මස් මරන්නන් ගේ ගමකි. සිය දැල් සහ ඔරුවල වැඩ කරමින් සිටි ධීවරයන්ට මේ අමුත්තන් ගැන ආරංචිය ලැබී වහා පියතුමා ගේ පැල වෙත රොක්වූහ. උඩු කය නොවසා හිණට වතක් පමණක් හැඳ සිටි මිනිස්සු අමුත්තන් දෙස පුදුමයෙන් බලා සිටියෝය. මහත් ගෞරවයෙන් පූජක

තුමා දෙස බැලූ ඔවුනට ඉවත්ව යන ලෙස කියමින් එතුමා ගම් ගොඩ දෙසට ගමන් කළේය.

නාලිනිය ගේ පහසුව සඳහා ගම්මානයෙන් තරුණියක් පැමිණියාය. ඉන් පසු ගැස්පා ඇතුළු පිරිස මුහුදු වෙරළ කරා ගියෝය. මහ වනයේ අඳුරු නිල්ලට පුරුදු වී සිටි ඔවුනට වෙරළ බිඳෙන රළ මාලා ඇති තෙරක් නැතිව විහිද ගිය නිල් මහ මුහුදත් අහසත් අමුතු ප්‍රබෝධයක් ගෙන දුන්නේය. ගැස්පා සහ එඩ්මන්ට් රළ ගෙඩිත් සමග පොර බදමින් පිනා වෙරළට මදක් ඈතින් තිබුණු ගල් පරයක් වෙත ගියහ. මුහුදෙන් ඈත ඇතුළු රටේ හැදුණු නීල මුහුද දුටු පළමු වතාව මෙය විය. ඔහු වැල්ලේ වැතිර ගෙන වැල්ලට ගසන රළ පහරින් නැවුණේය.

ගැන්දෑවේ ඔවුහු ඉතා රසවත් මාළු පිණි සහිත බතක් අනුභව කළහ. අලුත් මුහුදු මාළු හොද්දත් ඉස්සන් බැදුමත් ඔවුනට දෙව් බොජුනක් මෙන් රසවත් විය. මහ වනයේ කටුක දිවි පෙවෙතින් දවස් යවා එළි මහනට පැමිණීමෙන් පසු ඔවුනට ලැබුණු මේ ප්‍රථම සංග්‍රහය ඔවුහු සිත් සේ ප්‍රීතියෙන් භුක්ති වින්දහ.

''දැන් ඉතින් මට ඔක්කොටම ඉස්සර කියන්න ඕනැ මෙහාට එන්න පාර හොයා ගත්තේ කොහොම ද කියලා'' යි ආහාර ගැනීමෙන් පසු හරි බරි ගැහී වාඩිගත් ඩේමියන් පියතුමා ඔවුන් ගෙන් ඉල්ලා සිටියේය.

''ඒක බොහොම දිග කතාවක්'' යි ගැස්පා කීය.

''ඉතින් කියන්න බලන්න.''

දක්ෂ කතාකරුවකු මෙන් ගැස්පා මුල පටන්ම කතාව කියන්නට විය. ඔහු පළමුවෙන් හැන්ස් පිළිබඳ කතාව කීවේය. නැවකින් අතරමං වී මහ වනයේ ජීවත් වූ කොලුවකු වන හැන්ස් රජ මාලිගයට අල්ලා ගෙන ගොස් සිර කොට සිටි සැටිත්, ඉන් පසු ඔහු රජු ගේ බිහිසුණු දඬුවමෙන් ගැළවී ගොස් අවුරුදු එකහමාරකින් පමණ පසු ආපසු රහසේ කන්ද උඩ රටට අවුත් තමා සහ එඩ්මන්ට් මුදා ගෙන ආ සැටිත්, ඔවුන්ගේ පලායාමෙන් නාලිනිට අත් වූ ඉරණම ගැනත්, එතැන් පටන් ඔවුන්ගේ දෛවෝපගත ගමනෙහි අවසානය තෙක් ගත වූ කාලය තුළ සිදු වූ සිද්ධීන් ගැනත්, ඔවුන් පියතුමා වෙත පැමිණීමට පෑ කිහිප-යකට පෙර ස්වකීය ගැළවුම් කාරයාව සිටි හැන්ස් යළිත් මහ වනය වෙතම ආපසු ගිය සැටිත්, ගැස්පා විස්තර කළේය.

''හැන්ස් ඔබ ගෙන් වෙන්ව යළිත් වනයට යන්නට ඉඩ දී බලා ඉඳීමෙන් කර තිබෙන්නේ ලොකු වරදක්'' යි ඩේමියන් පියතුමා වේගවත්ව කීවේය. ''ඔබට හොඳට පුළුවන් කම තිබුණා ඔහු මෙහි එක්කර ගෙන එන්ට. ඔහුට නැවතත් ඒ

වනචාරි ජීවිතයට යන්නට ඉඩ හරින්නට ඔබට කිසිම යුතුකමක් තිබුණේ නැහැ. කොහොම කළා ද ඔබ ඒක ගැස්පා? මහත්මයා ඔබ වූ කල කොහොම නම් ඉඩ දුන්නා ද ඔහුට එසේ කරන්නට? ඔබේම රටේ දරුවා'' යි පියතුමා එඩ්මන්ට් දෙස බලමින් කීවේය.

ගැස්පා ගේ සහ එඩ්මන්ට් ගේ මුහුණු රතු විය.

''පියතුමනි, කියන්ට නම් බොහොම ලෙහෙසියි. නමුත් කරන එක තමා අමාරු'' යි ගැස්පා කීවේය. ''අපි ඔහුට නිකම්ම යන්ට ඇරියා නොවෙයි. ඔබ දන්නේ නැහැ ඔහුගේ හැටි! ඔහුට තියෙන්නේ මහා පුදුම ගල් හිතක්. කිසිම කෙනකුට බැහැ ඔහුට කරුණු කියා අවබෝධ කරවලා ඔහු නම්මා ගන්ට. ඔහුට පුදුම අදිස්ඨාන සක්තියක් තිබෙනවා. ඔහු මෙහි එක්කර ගෙන එන්ට අපි ඔහුට නොකී දෙයක් නැහැ, පියතුමනි.''

''ඔබ මට සමාවෙන්න ඕනැ'' යි පියවි සිහියට පත් ඩේමියන් පියතුමා කීවේය. ''ඔබට මා කතා කළ විදිය වැරදියි මා හිතන්නේ. එහෙම කතා කරන්ට මට යුතු කමක් නැති බව මට වැටහෙනවා.''

''ආ, පියතුමනි, ඒක බොහොම සුළු දෙයක් නොවැ. අපට වැටහෙනවා ඔබ කී දේවල්'' යි ගැස්පා කීවේය.

එඩ්මන්ට් ද ගැස්පා අනුමත කරමින් හිස වැනුවේය.

''අනේ, අසරණ තරුණයා. මට ලොකු ආශාවක් උපන්නා ඔය හැන්ස් දැක ගන්නට. ඇත්තටම ඒ වැදි කෙල්ල ඔහු ගේ බිරියද?''

''එහෙමයි පියතුමනි'' යි ඔවුහු පිළිතුරු දුන්හ.

දීර්ඝ නිශ්ශබ්දතාවක් ඔවුන් අතර පැතිර ගියේය. ඉක්බිති ඩේමියන් පියතුමා නැගිට විඩාව පහ වී යාමට සියල්ලන්ම නිදා ගතහොත් හොඳයයි යෝජනා කළේය.

භක්තිමත් කතෝලිකයෙක් වූ ගැස්පා පසු ද උදේ දෙව් මැදුරේ පූජාවට සහභාගි වූයේය. පූජාවට හෝ දුක් විපත්වලින් මුදා ඔවුනට මෙහි ළඟාවන්නට සිද්ධ කර වීම ගැන කළ දේව ස්තෝත්‍රයට හෝ සම්බන්ධ වීමට ඔවුන්ට ඉඩක් නොහැකි වුවද ඩේමියන් පියතුමා ගේ ඉල්ලීම පරිදි සෙස්සෝ ද දෙව් මැදුර කරා ගියහ. පියතුමා ලතින් බසින් කළ යාච්ඤාවෙන් පසු ඔහු සිංහලෙන් සියල්ලන්ම ඇමතුවේය. ඔහුගේ වාග් චාතුර්යයෙනුත් ගම්භීර කට හඬිනුත් ඔවුන්ගේ හදවත් ස්තුති පූර්වක හැඟීම්වලින් උතුරා ගියේය.

පසුව ඔවුහු උදෑසන තේ පානය සඳහා වාඩිවූහ. ''මම ඊයේ රාත්‍රිය තිස්සේම කල්පනා කළේ හැන්ස් ගැනමයි. මට හිතෙනවා මා ඔහු වෙනුවෙන් යමක් කළ යුතුයි කියල. ගැස්පා, ඔබත් මේ

මහත්මයත් සමග මා යන්ට ඕනෑ ඔහු හමු වෙන්න'' යි පියතුමා එඩ්මන්ට් දෙසට හැරෙමින් කීවේය. ''ඔබ අන්තිමට නවාතැන් ගත් තැනට ගියාම ඔහු හමුවෙන්ට පුළුවන් වෙයි. මගේ සේවකයා අපට ගෙනියන්ට කෑම මොකුත් සූදානම් කරල දේවි.''

ඔවුහු ඉතා කැමැත්තෙන් පියතුමා ගේ යෝජනාවට එකඟ වූහ. ඔවුන්ගේ දෛවෝපගත ගමනෙහි අවසාන නැවතුම් පොළත් ස්වකීය අසහාය ආරක්ෂකයා වූ හැන්ස් පිළිබඳ ඔවුන් තුළ තිබූ මතකත් මේ ගමන සඳහා ඔවුන් තව තවත් දිරිගැන්වීය. නොවැරදීම පසු ද ආපසු පැමිණෙන බව නෑලනිට සහ නීලට කී ඔවුහු හැන්ස් හමුවීමට මහ වනය බලා පිටත් වූහ.

මිනිස් ස්වභාවය පිළිබඳ තියුණු අවබෝධයකින් යුක්ත වූ ඩේමියන් පියතුමා හොඳ උගතෙක් විය. හැන්ස් සිටිනු ඇතැයි පියතුමා අනුමාන කළ ස්ථානයෙහිම ඔහු සිටිනු ඔවුනට දක්නට ලැබුණි. ඔවුන් අන්තිම වරට හැන්ස්ටත් රනීටත් ආයුබෝවන් කී තැනම ඔවුන් සිටිනු දුටු ගැස්පා සහ එඩ්මන්ට් පුදුම වූහ. ඔවුන් එනු දුටු හැන්ස් නැගී සිටියේය.

ඩේමියන් පියතුමා සිය සුරත ඔහු වෙත දිගු කොට ''පුතා, ඔබ ගැන සියලු තොරතුරු මා ඔබේ මේ යහළුවන් ගෙන් දැන ගෙන, මා ඔවුන් ගෙන් ඉල්ලා හිටියා මා ඔබ වෙත එක්කරගෙන එන ලෙස'' යි කියා හැන්ස් දෙස බලා සිටියේය. පියතුමා බිම හිඳ ගෙන සිටි රනී දෙස බලා සිනාසුණේය. මෙ වැනි ලෝගු ඇඳුමකින් සැරසුණු දන්ත පුරුෂයකු කිසි දිනක නුදුටු රනී ලජ්ජාවෙන් මෙන් ඉවත බලා ගත්තාය.

''ඔබතුමා මා බැලීමට ඒම ගැන මා බොහොම සතුටු වෙනවා. ගැස්පා, එඩ්මන්ට්, මේ පියතුමාත් එක්ක ඔබ ආ එක මට ලොකු ප්‍රීතියක්. මා හිතුවේ නැහැ ඔබ මට නැවතත් දකින්ට ලැබේවි කියල'' යි හැන්ස් කීවේය.

''පියතුමනි, ඉතින් වාඩි වෙන්න. බිම තමයි මෙ කැලේ වාඩි වෙන්ට තියෙන්නේ'' යි ගැස්පා විහිළුවට මෙන් කීවේය.

''දැන් මද්දහනත් වෙලා. බොහොම බඩගිනියි.''

ඔවුහු ගෙන ආ කෑම බඳුන් විවෘත කළෝය. පිරුණු බත් මුට්ටියක් සහ සුවඳ වහනය වූ මුදු මාළු සහ එලවලු හට්ටි කිහිපයක් ද ඒ අතර විය. කැව්ලි වගයෙන් හකුරු ගෙනැවිත් තිබුණි. රනී ඉතා ආශාවෙන් හකුරු කෑවාය. ඩේමියන් පියතුමා ඇතුළු සෙස්සෝ විශාල ලබු කැටයක ගෙනා ආ මීරා සිත් සේ පානය කළහ. ඉක්බිති ඔවුහු සුරුට්ටු දල්වා ගත්හ. හොඳ ආහාර පානයන් ගෙන් සන්තර්පණය වූ ඔවුහු කතාවට වන්හ. රනී ද උද්‍යෝගිමත් බවක් පළ කළාය.

ඔවුහු රාත්‍රිය, කතාවෙන්ම පහන් කළහ. ඩේමියන් පියතුමා හැන්ස් ගේ ජීවිත තොරතුරු ඔහුගෙන්ම විමසා දැන ගත්තේය.

පසුදා උදේ හැන්ස් ගේ යහළුවනට කරන්නට නොහැකි වූ දෙයක් කිරීමට පියතුමා සමත් වූ බව පෙනුණි. හැන්ස් ගම්මානයට එක්කරගෙන යාමට පියතුමා විසින් ඔහු කැමති කරවා ගන්නා ලදී. එහෙත් රනි ගේ විරුද්ධත්වයට ද ඔහුට අවනත වීමට සිදු විය. රනි කිසි දිනක වනයෙන් පිට ගොස් නැත. වනයෙන් පිටත මිනිස් වාසයකට යාම පිළිබඳ පුවත අසන විට ඇ බියෙන් කුප්පන්නට වූවාය. එහෙත් ඔවුහු ඇය සනසාලූහ. හැන්ස් ගම්මානය වෙත ගොස් රාත්‍රියෙහි දී ඇය වෙත පැමිණෙන තෙක් ඇට ගම්මානය අසල වනයේ ගුහාවක සැඟවී සිටිය හැකි බැව් කී ඔවුහු, හැන්ස් සමග ගම්මානය දෙසට යාමට ඇය කැමති කරවා ගත්හ.

රනිට යන්තමින් හෝ මුහුද පෙන්විය යුතු බව ඔවුහු තීරණය කළහ. වෙරළ පාළු පෙදෙස දෙසට වනය තුළින් ගමන් කළ ඔවුහු, ගස් අතරින් පෙනුණු මුහුද රනිට දැක්වූහ. නගින බහින රළ ගෙඩි ඇති, අනන්තව විහිද ගිය නිල් මහ මුහුද දුටු රනී ගේ ඇස් ගෙඩි එළියට පනින්නට මෙන් සූදනම් විය. ඈ මද වේලාවක් ඒ දෙස බලා බියට පත් මුව දෙනක මෙන් වනය තුළට දුව ගොස් සැඟවී ගත්තාය. හැන්ස් සිනා සෙමින් ඇය පසු පස ගියේය. රනි වෙව්ලමින් ඔහුගේ අත තරයේ අල්ලා ගත්තාය. ''අනේ සුදු හුරා අපි ආපහු යමු. අනේ ආපහු යමු'' යි ඈ හැන්ස්ට ඇවිටිලි කරන්නට වූවාය.

''බය වෙන්න එපා රනි!'' යි ඔහු රනි සනසන්නට විය.

''මා ආයෙත් එහේ යන්නේ නැහැ'' යි ඔහු මහ මුහුද දෙසට අත දිගු කරමින් කීවේය.

ඔවුහු රනි මිනිසුන්ට නොපෙනෙන තැනක රඳවා පූජක තුමා ගේ නිවහන වෙත ගියහ.

එදින සවස මේ යුරෝපියයන් සතර දෙනා මුහුදු වෙරළ වෙත ගියහ. පින්තූරයක් බඳු හැන්ස් ගේ රූපත් දේහයෙන් වශී වූ ගැමි තරුණයන් කිහිප දෙනෙක් ඔවුන් පසු පස එන්නට වූහ. එහෙත් ඩේමියන් පියතුමා ගේ ඉල්ලීම අනුව ඔවුහු ඉවත්ව ගියහ. පාළු තැනකට පැමිණි ඔවුහු වැල්ලේ වාඩි [illegible]න්හ. වැල්ලේ අතන මෙතන තිබුණු කක්කුටු බෙනවලින් ඒ[illegible]යට ආ කක්කුට්ටෝ ඒ මේ අත දිව ගියහ. ඉරු බැස යන්න [illegible] විය. ඈත අහස රත් පැහැයෙන් අඳුරු පැහැය නැගෙමින් තිබුණි. පියතුමා ඇතුළු යුරෝපියයන් හතර දෙනා ඔවුනොවුන් ගේ අනාගතය පිළිබඳව සාකච්ඡා කරන්නට වූහ. හමුදත් [illegible]මග